206 වන කාණ්ඩය - 6 වන කලාපය
தொகுதி 206 - இல. 6
**Volume 206 - No. 6**

2012 පෙබරවාරි 09 වන බ්‍රහස්පතින්දා
2012 பெப்ரவரி, 09 வியாழக்கிழமை
**Thursday, 09th February, 2012**

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

ගරු රවි කරුණානායක මහතාගේ පෞද්ගලික කරුණු පැහැදිලි කිරීම

ජාතික මංමාවත් පනත:
නියෝග

කල්තැබීම:
ශ්‍රී ලංකා රජය සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල අතර වූ සමීපස්ථ ණය ගිවිසුම

---

# பிரதான உள்ளடக்கம்

வினாக்களுக்கு வாய்மூல விடைகள்

மாண்புமிகு ரவி கருணாநாயக்கவினது சொந்த விளக்கம்

பொது வழிகள் சட்டம் :
ஒழுங்குவிதிகள்

ஒத்திவைப்புப் பிரேரணை:
இலங்கை அரசாங்கத்துக்கும் சர்வதேச நாணய நிதியத்துக்குமிடையிலான துணைநில் கடன்வசதி உடன்படிக்கை

---

# PRINCIPAL CONTENTS

ORAL ANSWERS TO QUESTIONS

PERSONAL EXPLANATION BY HON. RAVI KARUNANAYAKE

NATIONAL THOROUGHFARES ACT:
Regulations

ADJOURNMENT MOTION:
Standby Agreement between Government of Sri Lanka and International Monetary Fund

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2012 පෙබරවාරි 09 වන බ්‍රහස්පතින්දා***
*2012 பெப்ரவரி 09, வியாழக்கிழமை*
*Thursday, 09th February, 2012*

***අ. භා. 1.00 ට පාර්ලිමේන්තුව රැස් විය. නියෝජ්‍ය කථානායකතුමා [ගරු චන්දිම වීරක්කොඩි මහතා] මූලාසනාරූඪ විය.***
*பாராளுமன்றம் பி. ப. 1.00 மணிக்குக் கூடியது. பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சந்திம வீரக்கொடி] தலைமை வகித்தார்கள்.*
*The Parliament met at 1.00 p.m., MR. DEPUTY SPEAKER [THE HON. CHANDIMA WEERAKKODY] in the Chair.*

## උපදේශක කාරක සභා වාර්තා
## ஆலோசனைக் குழு அறிக்கைகள்
## CONSULTATIVE COMMITTEE REPORTS

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகாலமைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් හා ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

( i) 2010 වර්ෂය සඳහා ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ වාර්ෂික වාර්තාව;

(ii) 2010 වර්ෂය සඳහා මහජන බැංකුවේ වාර්ෂික වාර්තාව;

(iii) 2010 වර්ෂය සඳහා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ වාර්ෂික වාර්තාව;

(iv) 2010 වර්ෂය සඳහා ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ වාර්ෂික වාර්තාව;

(v) 2009 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුවේ වාර්ෂික වාර්තාව;

(vi) 2010 වර්ෂය සඳහා ජාතික ලොතරැයි මණ්ඩලයේ වාර්ෂික වාර්තාව;

(vii) 2010 වර්ෂය සඳහා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ වාර්ෂික වාර්තාව;

(viii) 2010 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව;

(ix) 2010 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව;

(x) 2010 වර්ෂය සඳහා සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ වාර්ෂික වාර්තාව;

(xi) 2010 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව;

(xii) 2010 වර්ෂය සඳහා දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ වාර්ෂික වාර්තාව;

(xiii) 2010-2011 වර්ෂය සඳහා ඩී.එෆ්.සී.සී. බැංකුවේ විගණකවරුන්ගේ වාර්තාව හා ගිණුම්;

(xiv) 2010 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්;

(xv) 2010 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුවේ වාර්ෂික වාර්තාව; සහ

(xvi) 2010 වර්ෂය සඳහා කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු ගාමිණී ලොකුගේ මහතා (කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு காமினி லொக்குகே - தொழில், தொழில் உறவுகள் அமைச்சர்)
(The Hon. Gamini Lokuge - Minister of Labour and Labour Relations)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) වත්තල, හැඳල අල්විස් ටවුන්, අංක 120/7හි පදිංචි එල්.පී. පියසේන මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) බොරලැස්ගමුව පිරිවෙන පාර, අංක 43/7හි පදිංචි ඒ. ෆීලික්ස් ජේ. ප්‍රනාන්දු මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා (විදුලිබල හා බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு பிரேமலால் ஜயசேகர - மின்வலு, எரிசக்தி பிரதி அமைச்சர்)
(The Hon. Premalal Jayasekara - Deputy Minister of Power and Energy)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පහත සඳහන් පෙත්සම් දෙක මම පිළිගන්වමි.

(1) හිඟුරක්ගොඩ, ආර්බී 01, 27/45හි පදිංචි එන්.ජී. පුංචිමැණිකේ මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) රත්නපුර, කරඳන, කන්දවත්තහි පදිංචි යූ.ජී.එල්.ටී. නිරෝෂණී මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
# வினாக்களுக்கு வாய்மூல விடைகள்
# ORAL ANSWERS TO QUESTIONS

## ගාල්ල - මාතර දක්වා හරස් මාර්ග : ආරක්ෂිත ගේට්ටු
## காலி- மாத்தறை புகையிரதப் பாதையிலுள்ள குறுக்கு வீதிகள் :பாதுகாப்புக் கடவைகள்
## LEVEL CROSSINGS FROM GALLE TO MATARA: PROTECTIVE GATES

1400/'11

2. **ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) ගාල්ල සිට මාතර දක්වා දුම්රිය මාර්ගය නවීකරණය කර ඇතත්, එම මාර්ගයේ දුම්රිය හරස් මාර්ග විශාල සංඛ්‍යාවක ආරක්ෂිත ගේට්ටු සහ සංඥා ලාම්පු සවි නොකිරීම හේතුවෙන් එම ප්‍රදේශවල ජනතාවගේ ජීවිත දැඩි අනතුරුදායක තත්ත්වයකට පත්ව ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ස්ථානවල ආරක්ෂිත ගේට්ටු සහ සංඥා ලාම්පු කඩිනමින් සවි කිරීම සඳහා කටයුතු කරන්නේද;

(ii) ඒ සඳහා මේ වන විටත් සැලසුම් සකස් කර තිබේද;

(iii) එසේ නම්, ඒවායෙහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினா:

(அ) காலியில் இருந்து மாத்தறை வரையிலான புகையிரதப் பாதை நவீன மயமாக்கப்பட்டுள்ளபோதிலும், அப் பாதையில் பெரும் எண்ணிக்கையிலான புகையிர தக் குறுக்கு வீதிகளில் பாதுகாப்புக் கடவைகளும் சமிக்ஞை விளக்குகளும் பொருத்தப்படாமை காரண மாக அப்பிரதேச மக்களின் வாழ்க்கை கடும் அபாய நிலைக்கு உள்ளாகியுள்ளதென்பதை அவர் அறிவாரா?

(ஆ) (i) அவ்விடங்களில் பாதுகாப்புக் கடவைகளையும் சமிக்ஞை விளக்குகளையும் பொருத்த நடவடிக்கை எடுப்பாரா;

(ii) இதற்காக ஏற்கெனவே திட்டங்கள் தயாரிக்கப் பட்டுள்ளனவா;

(iii) ஆமெனில், அவற்றின் நிர்மாணப் பணிகள் ஆரம்பிக்கப்படும் திகதி யாது

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Transport:

(a) Is he aware that the lives of the people living in the areas from Galle to Matara have been put at great risk as a result of not fixing protective gates and signal lights at a large number of level crossings on the railway track from Galle to Matara, despite the modernization of that track?

(b) Will he inform this House-

(i) whether measures will be taken to fix protective gates and signal lights at those places speedily;

(ii) whether plans in that respect have already been made; and

(iv) if so, the date on which the work related to fixing of those gates and lights will be started?

(c) If not, why?

**ගරු කුමාර වෙල්ගම මහතා (ප්‍රවාහන අමාත්‍යතුමා)**
(மாண்புமிகு குமார வெல்கம - போக்குவரத்து அமைச்சர்)
(The Hon. Kumara Welgama - Minister of Transport)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) ඔව්.

(ආ) (i) ඔව්, ගාල්ල-මාතර අතර හඳුනා ගෙන ඇති අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ග 61ක් සඳහා ආරක්ෂාව සැපයීමට නියමිතය.

(ii) ඔව්. නියමිත සැලසුමක් සකස් කර ඇත.

(iii) දැනටමත් ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇත. ලංසු ඇගැයීමේ කටයුතු අවසන් කර ටෙන්ඩරය ප්‍රදානය කිරීමෙන් පසුව ඉදි කිරීමේ කටයුතු ආරම්භ කරනු ඇත.

(ඇ) අදාළ නොවේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
පළමුවෙනි අතුරු ප්‍රශ්නය.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ප්‍රශ්නය යොමු කරන මොහොත වන විට ගාල්ල - මාතර දුම්රිය මාර්ගය තමයි අධිවේගී තත්ත්වයට පත් කරලා තිබුණේ. මේ වන විට එය තවත් ඉදිරියට ගිහින් තිබෙනවා. ඒ නිසා මේ මොහොත වන විට මෙය මීටත් එහාට වලංගු වනවා. දැන් ඔබතුමාගේ දිස්ත්‍රික්කයටත් වැඩියෙන් වලංගු වන තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමා සඳහන් කරන්නට යෙදුණා හරස් මාර්ග විශාල සංඛ්‍යාවක ආරක්ෂිත ගේට්ටු සහ සංඥා ලාම්පු සවි කරන්නට නොහැකි වීමෙන් අනතුරුදායක තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා කියන කාරණය පිළිගන්නවා කියලා. ඒ වාගේම ඒ සඳහා මුදල් ප්‍රතිපාදන වෙන් කරලා තිබෙනවා කියන එකත් සඳහන් කළා. මම අහන්නේ අධිවේගී තත්ත්වයට පත් කරලා තිබෙන සමස්ත කොටස තුළම මේ කටයුත්ත අවසන් කරන්න කොපමණ කාලයක් යයිද කියලායි. බැරි නම් අඩුම ගණනේ මේ ප්‍රශ්නය-

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
මම පළමුවෙන්ම මේ කාරණය කියන්න ඕනෑ. ගාල්ල - මාතර අතර ඇති දුම්රිය මාර්ගයේ ඇති මුළු දුම්රිය හරස් මාර්ග සංඛ්‍යාව 90යි. එයින් දුම්රිය හරස් මාර්ග 29ක් සඳහා ආරක්ෂාව දැනටමත්

සපයා තිබෙනවා. ඉතිරි 61 සඳහා ආරක්ෂිත පද්ධතිය ඉහත සඳහන් කළ ව්‍යාපෘතිය යටතේ ස්ථාපිත කිරීමට නියමිතය. ඉහත සඳහන් ව්‍යාපෘතිය කියන්නේ, රජය රුපියල් මිලියන 1,000ක් වෙන් කරලා තිබෙනවා. දැන් අපි tenders call කරලා tenders open කරනවා. ඒකෙන් අපි බලාපොරොත්තු වනවා දුම්රිය හරස් මාර්ග 200ක් සහ 30ක් වශයෙන් 230ක් ආරම්භ කරන්නට. එතැනදී අපි මේ කොටසට තමයි ප්‍රමුඛතාව දෙන්නේ. මේ කොටසට ප්‍රමුඛතාව දීලා -මාතර සිට කොළඹට එනකම් ප්‍රමුඛතාව දීලා- ඒ හරස් මාර්ගවලට දුම්රිය ගේට්ටු දානවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. ආකාර දෙකක ආරක්ෂිත දුම්රිය ගේට්ටු තිබෙනවා. එකක් තමයි අදාළ ස්ථානයට යම් පුද්ගලයකු යොදවලා, දුම්රිය එන අවස්ථාවලදී ඒ පුද්ගලයා විසින් වහන ගේට්ටු. අනික් එක ස්වයංක්‍රීය ගේට්ටු. මේ සියල්ලට යොදවන්න බලාපොරොත්තු වන්නේ ස්වයංක්‍රීය ගේට්ටුද, එහෙම නැත්නම් සේවකයන් යොදවන ගේට්ටුද කියලා දැන ගන්න කැමැතියි.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
Bell and Light System කියන ගේට්ටු තමයි අපි යොදන්න යන්නේ. Bell and Light ක්‍රමය අනුව දුම්රිය එනකොට බෙල් එක වදිනවා, රතු ලයිට් එක පත්තු වෙනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
වහන ගේට්ටුවක් නැහැ?

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
වහන ගේට්ටුවක් නැහැ. වහන ගේට්ටුවල මිල අධිකයි. මේ ගේට්ටුවක් සාමාන්‍යයෙන් ලක්ෂ 60ක් -මිලියන 6ක්- විතර වෙනවා. ඉතින් අපි දමන්නේ Bell and Light ගේට්ටු.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ තුන්වන අතුරු ප්‍රශ්නය මෙයයි. සීනුවක් නාද වන සහ විදුලි බල්බ දැල්වෙන ගේට්ටු සමහර අවස්ථාවලදී සමහර ස්ථානවලට ගැළපෙන්නේ නැහැ. වහන ගේට්ටුම අවශ්‍ය ස්ථාන තිබෙනවා. විශේෂයෙන්ම පාසල් අවට ස්ථාන සහ ඒ වාගේ තැන්. නමුත් ඒ වාගේ තැන්වලටවත් තවම ගේට්ටු යොදවපු බවක් පෙනෙන්න නැහැ. 1989 වකවානුවේදී -

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නය අහන්න.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ප්‍රශ්නය අහනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ ප්‍රශ්නය අහගෙන සිටියොත් ඔබතුමාටත් තේරෙයි මේ ප්‍රශ්නයේ තිබෙන සාධාරණකම. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා නියෝජනය කරන ගාල්ලේ අහුන්ගල්ලේදී 1989 දී මහා ඛේදවාචකයක් වුණා.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ඒවා ඕනෑ නැහැ. දැන් ප්‍රශ්නය අහන්න. තව ටික වෙලාවක් යන කොට tube light - [බාධා කිරීමක්]

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
මේකට tube light උත්තරයක් බලාපොරොත්තු වෙන්නේ නැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
කරුණාකරලා ප්‍රශ්නය අහන්න.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
Bell and Light ගැන tube light ප්‍රශ්නයක් අහලා වැඩක් නැහැ නේ. ගරු ඇමතිතුමාගෙන් මම අහන්නේ මේකයි. එවැනි ස්ථානවලට දැනට ගේට්ටු යොදා නැත්නම්, විශේෂයෙන් පාසල් ආසන්න ස්ථානවලටවත් ගේට්ටු යොදන්න අමාත්‍යාංශයේ අවධානය යොමු කරන්න පුළුවන්ද?

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
දැන් ඔබතුමාට මම පැහැදිලිව කිව්වා, අපේ ප්‍රතිපත්තිය. අපි දමන්නේ,- [බාධා කිරීමක්] ගරු මහත්තයෝ පොඩ්ඩක් ඉන්න. අපි දමන්නේ Bell and Light system එක. ඔබතුමාට පැහැදිලියි නේ? Bell and Light system එක දැම්මාම සංඥාව එනවා,- [බාධා කිරීමක්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, ගේට්ටු දමන විධිය අහගන්න ගරු ඇමතිතුමාගෙන්.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ඒ විධියේ සංඥා ක්‍රමයක් තමයි අපි දමන්න යන්නේ. අපි ගේට්ටු දමන්නේ නැහැ. ගේට්ටුවට මනුෂ්‍යයෙක් දැම්මාම ඒ මනුෂ්‍යයාට වරු තුනකට - shifts තුනකට- සල්ලි ගෙවන්න වෙනවා. ඒක නිසා අපි දමන්නේ Bell and Light system එක. ඒක දැන් ඔබතුමාට කිව්වානේ. [බාධා කිරීමක්] ඒ Bell and Light system එක හොඳටම ඇති. ඔබතුමාට කථා කරන්න දෙයක් නැතිවයි බොරුවට කථා කරන්නේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 4 -1693/'11- (1), ගරු අනුර දිසානායක මහතා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සතියක් කල් ඉල්ලනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## හිඟුරාන උක් ගොවීන් : ඉල්ලීම්
## ஹிங்குரான கரும்புச் செய்கையாளர்கள்: கோரிக்கைகள்
## HINGURANA SUGARCANE FARMERS : DEMANDS

1727/'11

6. **ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) හිඟුරාන සීනි කර්මාන්තශාලාවේ අයිතිකරුවන් සහ උක් ගොවීන් අතර ගිවිසුමක් තිබේද;

(ii) එසේ නම්, එම ගිවිසුම සභාගත කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) උක් ගොවීන් අදාළ ඉඩම්වල උක් වගා කිරීම ප්‍රතික්ෂේප කරන බව එතුමා දන්නෙහිද?

(ඇ) (i) එම උක් ගොවීන්ගේ ඉල්ලීම් කවරේද;

(ii) එම ඉල්ලීම්වලට සාධාරණ විසඳුමක් ලබා දීමට පියවර ගන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

அரச வளங்கள், தொழில் முயற்சி அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) ஹிங்குரான சீனித்தொழிற்சாலை உரிமையாளர்களுக்கும் கரும்புப் பயிர்ச் செய்கையாளர்களுக்கும் மத்தியில் உடன்படிக்கையொன்று உள்ளதா;

(ii) அவ்வாறாயின் அந்த உடன்படிக்கையை சபையில் சமர்ப்பிப்பாரா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) கரும்புப் பயிர்ச் செய்கையாளர்கள் இக்காணிகளில் கரும்பு பயிரிட மறுக்கின்றனர் என்பதை அவர் அறிவாரா?

(இ) (i) இக்கரும்புப் பயிர்ச் செய்கையாளர்களின் கோரிக்கைகள் யாவை;

(ii) இக்கோரிக்கைகளுக்கு நியாயமான தீர்வு களை வழங்க நடவடிக்கை மேற் கொள்வாரா;

(iii) அவ்வாறாயின் அத்திகதி யாது என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of State Resources and Enterprise Development:

(a) Will he inform this House-

(i) whether the owners of the Hingurana Sugar Factory and the sugarcane farmers have reached an agreement ; and

(ii) if so, whether he will table that agreement?

(b) Is he aware that sugarcane farmers refuse to grow sugarcane in relevant lands?

(c) Will he state-

(i) the demands made by those sugarcane farmers ;

(ii) whether he will take steps to provide reasonable solutions to these demands ; and

(iii) if so, the date on which it will be done?

(d) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලය, ශ්‍රී ලංකා සීනි සමාගම හා සී/ස හිඟුරාන සීනි කර්මාන්තායතනය යන නම්වලින් හිඟුරාන සීනි කර්මාන්තශාලාව ක්‍රියාත්මකව පැවති අවධියේදී උක් වගාව සඳහා ඉඩම් දීම පිළිබඳව ගොවීන් සමඟ ගිවිසුමක් තිබුණි. වර්තමානයේ මෙම කර්මාන්තශාලාව රාජ්‍ය-පුද්ගලික හවුල් ව්‍යාපාරයක් ලෙස, 51% කොටස් ප්‍රමාණයක් රජයටත්, 49% කොටස් ප්‍රමාණයක් පුද්ගලික අංශයටත් බෙදී යන ආකාරයට මහා භාණ්ඩාගාරය මඟින් සී/ස ගල්ඔය පුද්ගලික වැවිලි සමාගම වෙත ලබා දී ඇත.

(ii) ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලය ලෙස රජය මඟින් මෙම කර්මාන්තශාලාව පවත්වා ගෙන යන අවධියේ දී ගොවීන් සමඟ තිබූ ගිවිසුමේ පිටපතක් මේ සමඟ ඉදිරිපත් කරමි. එය **සභාගත*** කරමි. දැනට තිබෙන ගිවිසුම සංශෝධනය කිරීමට සී/ස ගල්ඔය වැවිලි සමාගම විසින් උක් ගොවීන් සමඟ සාකච්ඡා කරමින් සිටින බව දන්වා ඇත.

(ආ) සී/ස ගල්ඔය වැවිලි සමාගම විසින් පහත තොරතුරු වාර්තා කර ඇත.

---

*** පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

* 2010-2011 වර්ෂවලදී ගල්ඔය (පුද්) වැව්ලි සමාගම මඟින් වරිපතන්වෙන කලාපයේ තෝරා ගත් ඉඩම් කට්ටි 429ක ප්‍රමාණයකින් ඉඩම් කට්ටි 19ක් හැර ඉතිරි ඉඩම් කට්ටි සියල්ල වගා කිරීම.
* 2010-2011 වර්ෂවලදී සී/ස ගල්ඔය වැවිලි (පුද්) සමාගම මඟින් එක්ගල්ඔය උප කලාපයේ තෝරා ගත් ඉඩම් කට්ටි 192ක් අතුරින් ඉඩම් කට්ටි 26ක් හැර ඉතිරි ඉඩම් කට්ටි සියල්ල වගා කිරීම.
* ඉහත වර්ෂවලදී වගා කිරීම සැලකිල්ලට ගැනීමේ දී අතිබහුතරයක් ගොවීන් උක් වගා කිරීම ප්‍රතික්ෂේප නොකරන ලද බවට ඉහත කරුණු මත තහවුරු වේ.

(ඇ) (i) ගොවීන්ගේ විශේෂ ඉල්ලීම් නැත.

සී/ස ගල්ඔය වැවිලි (පුද්) සමාගම මඟින් ගොවීන් සමඟ සාකච්ඡා කොට උක් වගා කිරීම සඳහා අවශ්‍ය පහසුකම් ණය පදනම යටතේ සහ ඇතැම් සේවා පහසුකම් සහ ද්‍රව්‍ය නොමිලේ සැපයීමට කටයුතු කර ඇති බවත්, ගොවීන්ගේ විශේෂ ඉල්ලීම් මේ වන තෙක් ඉදිරිපත් කර නොමැති බවත් වාර්තා කර ඇත.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(ඈ) පැන නොනඟී.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් මේ ගොවියන් වගා කළාට වැඩක් වෙන්නේ නැති ප්‍රශ්නයක් තිබෙන්නේ. හිඟුරාන සීනි කර්මාන්තශාලාවේ වැඩ කටයුතු තවම ආරම්භ කරලා නැහැ. මේක ආරම්භ කරන්නේ නැතිව මේ ක්‍රියාවලිය පවතින්නේ නැහැ නේ. ඒක නිසා ගැටලු ගොඩක් මතු වෙනවා. අර මම මීට කලින් අහපු උත්තර නොලැබිච්ච ප්‍රශ්නයත් මේකට සම්බන්ධයි. ඒ කියන්නේ ඒ ගොවීන්ගේ දේවල් මිලදී ගන්නේ කොහේද කියන ප්‍රශ්නය තිබෙනවා. ඔබතුමාගෙන් මම දැන ගන්න කැමැතියි, දැනට වැඩ නතර කරලා තිබෙන Hingurana Sugar Factoryයේ වැඩ කටයුතු ආරම්භ වෙන්නේ කොහොමද කියලා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මන්ත්‍රීතුමා අහන ප්‍රශ්නය හිඟුරාන සීනි කර්මාන්තශාලාවේ උක් අඹරන යන්ත්‍ර සූත්‍ර පටන්ගෙන තිබෙනවාද කියන කාරණයද කියා මට පැහැදිලි නැහැ. දැන් එතුමා අහපු ප්‍රශ්නයට උත්තරය දුන්නා. දවසකදී අඹරන්න බැහැ. උක් වගා කරන්න ඕනෑ. උක් වැවෙන්න ඕනෑ. උක් මෝරන්න ඕනෑ. ඊට පස්සේ තමයි යන්ත්‍රානුසාරයෙන් එය පරිවර්තනය වන්නේ. ඔබතුමා අහපු ප්‍රශ්නයට පිළිතුරු දීලා තිබෙනවා. ඉඩම් කට්ටි -

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ඉඩම් කට්ටි බෙදා ගෙන වගා කරන්න පටන් ගෙන තිබෙනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ඉඩම් කට්ටි 44ක් හැර අනික් සියල්ල වගා කරලා තිබෙනවා. අම්පාර දිස්ත්‍රික්කය නියෝජනය කරන ගරු ඇමතිතුමා ඉන්නවා. මමත් ඇමතිතුමාත් එක්ක ගිය සතියේ එතැනට ගියා. ජුනි මාසය වන කොට උක් නෙළලා ඔබතුමා කියන උක් අඹරන යන්ත්‍රයෙන් වැඩ කරන්න පටන් ගන්නවා. ඔබතුමා කලබල වන්න එපා. උක් වැවෙන්න ඕනෑ. වගා කටයුතු කරනවා. ගොවීන් සමහර අයෙකුගේ ප්‍රශ්න තිබෙනවා. නමුත් ගොවීන් දැනට සහයෝගය දීලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් තවත් වැදගත් කාර්යයක් කර තිබෙනවා. ගරු ඇමතිතුමාත්, මමත් ගිය සතියේ එහි ගියා. ඉතාම පැරණි යන්ත්‍ර අලුත්වැඩියා කරලා හිඟුරාන යන්ත්‍ර අංශයෙන් මහ ජනතාවට ජල සැපයුම පවා ලබා දෙන්න දැන් පටන් අරගෙන තිබෙනවා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

හොඳයි. ගරු ඇමතිතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මේකයි. ඒකත් මේ සීනි කර්මාන්තයට අදාළවයි මා අහන්නේ. හිඟුරානේ සීනි කර්මාන්තශාලාවේ වාගේම ප්‍රශ්නයක් කන්තලේ සීනි කර්මාන්තශාලාවේත් තිබෙනවා. කන්තලේ සීනි factory එකත් දැනට මොකක් හරි ගනුදෙනුවකට -පවරා දීමකට- යන්න ගිහිල්ලා මඟ නතර වෙලා තිබෙනවාද කියලා මා දැන ගන්න කැමැතියි. විදේශ සමාගමකට පවරන ගිවිසුමක් පටලැවිල්ලක් වෙලා අඹරා ගන්නත් බැරිව, වවා ගන්නත් බැරිව, හදා ගන්නත් බැරිව නතර වෙලා තිබෙනවාද කියලා ඔබතුමාගෙන් මම දැන ගන්න කැමැතියි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

මේකට මට උත්තර දෙන්න පුළුවන්. නමුත් මේ ප්‍රශ්නය ඔබතුමා මුලින් අහපු ප්‍රශ්නයට සම්බන්ධ නැහැ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

නමුත් මේ ප්‍රශ්නය සීනි කර්මාන්තයට සම්බන්ධයි නේ. ඔබතුමන්ලා කියන්නේ ස්වයංපෝෂිත කරන්න යනවා කියලා නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

කන්තලේ-

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

කන්තලේ මොකෝ, හිඟුරාන මොකෝ?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

එතකොට පැල්වත්ත සීනි කර්මාන්තශාලාව ගැනත් අහයි. සෙවණගල තිබෙන සීනි කර්මාන්තශාලාව ගැනත් අහයි. තිබෙන ඔක්කෝම උක් කර්මාන්තශාලා ගැන අහයි.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

කන්තලේ එක ගැන විතරක් කියන්නකෝ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔබතුමා ප්‍රශ්නය අහලා තිබෙන්නේ හිඟුරාන සීනි කර්මාන්තශාලාව ගැන විතරයි.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඔබතුමා අපට දැන ගන්න කියන්න, කන්තලේ ගැන.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
කන්තලේට යෝජනාවක් ඉදිරිපත් කර තිබුණා. ඒ යෝජනාව යළි සංශෝධනය විය යුතුය කියලා අමාත්‍ය මණ්ඩලයේ අදහසක් තිබෙනවා. ඒ අනුව දැනට කර තිබෙන යෝජනාව එලෙස සකස් වුවක් නොවන නිසා -

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
නතර කර තිබෙනවා නේ?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඉදිරියේදී සංශෝධිත යෝජනාවක් සැලකිල්ලට ගැනීමටයි අප බලාපොරොත්තු වන්නේ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඒත් ඒ සමාගමෙන්මද? ඒ සමාගමෙන්මද සැලකිල්ලට ලක් කරන්නේ?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඕනෑම සමාගමකට අවස්ථාව ඇති වන්න පුළුවන්.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
විකුණන්න?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
කලබල වෙන්න එපා. කිසි දෙයක් විකුණන්නේ නැහැ. අතිගරු ජනාධිපතිතුමා කන්තලේ උක් වගාවට සම්බන්ධ අක්කර විසිදහසක් පිළිබඳව විශේෂයෙන් සොයා බලා ඉතාම උනන්දුවෙන් අලුත් යෝජනාවක් ගැන කරුණු කියා තිබෙනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
තුන්වන අතුරු ප්‍රශ්නය.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
විකුණන්න දෙයක් ඉතුරු වන්නේ නැහැ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔබතුමන්ලා විකුණපුවා ආපහු ගන්න වෙලා තිබෙන්නේ. ඒවා විකුණලා, හොරකම් කරලා, පිට රටට සල්ලි යවලා. ඔබතුමන්ලා පින් දෙන්න පිට රටට සල්ලි යවපු අයට.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Order, please! දැන් තුන්වන අතුරු ප්‍රශ්නය.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
දැන් ඔබතුමා කියනවා, හිඟුරාන, පැල්වත්ත - [බාධා කිරීමක්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
කාටද දුන්නේ?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
දුන්න අය රටිනුත් පැන්නා. තමුන්නාන්සේලා දුන්නු අය. රටින් පැනපු අයගේ නම් ටික දන්නවා නේ. කියන්න ඕනෑ නම් ඒ ටිකත් කියන්නම්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
කියන්නකෝ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
දන්නේ නැහැ නේ? පොඩි බබා නේ. පොඩි බබා දන්නේ නැහැ. [බාධා කිරීමක්]

තමුන්නාන්සේලා දුන්නු අය රටින් පැනලා, රටට එන්නේ නැතුව ඉන්නවා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ තුන්වන අතුරු ප්‍රශ්නය.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
රටට ඇවිල්ලා ඉන්න කියන්න. එතකොට බලන්න, නීතිය අනුව මොකද වෙන්නේ කියලා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මගේ තුන්වන අතුරු ප්‍රශ්නය, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දැන් තුන්වන අතුරු ප්‍රශ්නය.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
රටේ නීතියේ රැහැනට අහු වෙන්නට ඉස්සර වෙලා පැනපු අයට තමුන්නාන්සේලා එන්න කියන්න.[බාධා කිරීමක්]අපි කියලා තිබෙනවා, එන්නේ නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
කියන්න, කවුද කියලා?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
තමුන්නාන්සේලාගේ ගෝල බාලයෝ නේ පැනලා තිබෙන්නේ. ඒකයි වෙලා තිබෙන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
කවුද, කේපීද?

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මෙතැන වෙන පටලැවිල්ලක් නේ.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
දුමින්දද? ඇයි දුමින්ද ගැන කියන්නේ නැත්තේ?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
කේපීව අල්ලලා තිබෙනවා. කේපී අපි අල්ලා ගත්තා. තමුන්නාන්සේලාගේ අය අල්ලා ගන්න මේ මහ පොළොවේ නැහැ. පිට පැනලා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මගේ තුන්වන අතුරු ප්‍රශ්නය, ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමා. ඔබතුමා මේ පැත්ත බලන්නේ නැතුව මොනවා අහන්නද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අහන්න.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි. පැල්වත්ත සීනි කර්මාන්තශාලාව ගැනත් අහන්නම වෙනවා. ඔබතුමන්ලා කිව්වා රජයට පවරා ගත්තාට පස්සේ ඒවායේ -විශේෂයෙන්ම පැල්වත්ත කර්මාන්තශාලාවේ- නිෂ්පාදන කටයුතු පටන් ගන්නවා, සේවකයන්ට ගෙවන්න තිබෙන ඔක්කෝම ජාති ගෙවනවා කියා. නමුත් එය රජයට පවරා ගැනීමෙන් පස්සේ සේවකයන්ගේ ETF, EPF හිඟ මුදල වශයෙන් තිබෙනවා, රුපියල් දෙකෝටි හතළිස් ලක්ෂයක්. ඒ මුදල් තවම යවලා නැහැ. නිෂ්පාදන පටන් ගෙනත් නැහැ. ජනවාරි තමයි පටන් ගන්නවා කිව්වේ. ඒ ගැන මොකක්ද කියන්න තිබෙන්නේ?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මොකක්ද ප්‍රශ්නය, ගරු මන්ත්‍රීතුමා? ආපසු අහන්න.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
පැල්වත්ත කර්මාන්තශාලාව ගැනයි ඇහුවේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
දැන් ප්‍රශ්න රාශියක් ඇහුවා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
පැල්වත්ත කර්මාන්තශාලාවේ සේවකයන්-

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ප්‍රශ්න රාශියක් ඇහුවා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
දැන් ඔබතුමන්ලාට සීනි මදාසාර වෙලායි තිබෙන්නේ. ඒකයි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
එක ප්‍රශ්නයක් අහන්න.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
සීනි මදාසාර වුණාම තේරෙන්නේ නැහැ. පැල්වත්ත සීනි කර්මාන්තශාලාවේ සේවකයන්ගේ වැටුපෙන් ETF, EPF අරමුදලට යවන්න කපාපු, එහෙත් එම අරමුදලට තවම නොයවපු රුපියල් දෙකෝටි හතළිස් ලක්ෂයක් තිබෙනවා. ඒවා යවන්න කටයුතු කරනවාද? ජනවාරි මාසයේ ඉඳලා නිෂ්පාදන ආරම්භ කරනවා කිව්වා. ආරම්භ කරලා නැහැ. එය ආරම්භ කරන්නේ කවදාද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉතාම වැදගත් ප්‍රශ්නයක් අහන්නේ. මොකද, එතුමා සනාථ කරනවා කම්කරුවන්ගේ මුදල් රුපියල් දෙකෝටි පනස්ලක්ෂයක වංචාවක් තිබෙනවා කියලා. මේක රජය ඒ ගැන සොයා බලමින් තිබෙන වෙලාව. සේවක අර්ථ සාධක අරමුදලට වංචා කරපු හැම හාම්පුතකුගෙන්ම ඒවා අය කර ගෙන වැඩ කරන ජනතාවට ලබා දෙනවා කියන සහතිකය මා ඔබතුමාට දෙනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ප්‍රශ්න අංක 7-1860/'11- (1), ගරු සිවශක්ති ආනන්දන් මහතා.

**ගරු සිවශක්ති ආනන්දන් මහතා**
(மாண்புமிகு சிவசக்தி ஆனந்தன்)
(The Hon. Sivasakthi Ananthan)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, நான் அந்தக் கேள்வியைக் கேட்கிறேன்.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක් කල් ඉල්ලනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## රාජ්‍ය දූත මෙහෙවරෙහි යෙදෙන පුද්ගලයන්ගේ ගමන් මලු මෙහෙය වන ආයතන : ගෙවීම්
## தூதுவராலய பணிகளில் ஈடுபடும் நபர்களின் பிரயாணப் பொதிகளை நெறிப்படுத்தும் நிறுவனம்: கொடுப்பனவு
## INSTITUTIONS HANDLING BAGGAGES OF PERSONS ENGAGED IN DIPLOMATIC MISSIONS : PAYMENTS

1873/'11

8. **ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා රාජ්‍ය දූත මෙහෙවරෙහි යෙදෙන පුද්ගලයන්ගේ පුද්ගලික ගමන් මලු මෙහෙයවීම සිදු කරනු ලබන ආයතනය කවරේද;

(ii) එම ආයතනය තෝරා ගැනීමේදී විධිමත් ටෙන්ඩර් ක්‍රියා පටිපාටියක් අනුගමනය කළේද;

(iii) එසේ නම්, එම ගමන් මලු මෙහෙයවීම සිදු කරමින් සිටි ආයතනය ඉවත් කර වෙනත් ආයතනයක් වෙත පවරනු ලැබූ පදනම කවරේද;

(iv) පසුගිය වර්ෂය තුළදී එම කාර්යය සඳහා නව ආයතනය වෙත ගෙවන ලද මුදලත්, ඊට පෙර ක්‍රියාත්මක වූ පුද්ගලික ආයතනය වෙත වර්ෂයක් සඳහා ගෙවූ මුදලත් අතර වෙනස කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வெளிநாட்டலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வெளிநாட்டலுவல்கள் அமைச்சின் ஊடாக தூதுவராலய பணிகளில் ஈடுபடும் நபர்களின் பிரத்தியேக பிரயாணப் பொதிகளின் நெறிப் படுத்துதலை மேற்கொள்கின்ற நிறுவனம் யாது;

(ii) மேற்படி நிறுவனத்தைத் தேர்ந்தெடுக்கையில் முறைசார்ந்த கேள்விப்பத்திர நடைமுறை பின்பற்றப்பட்டதா ;

(iii) ஆமெனில், மேற்படி பிரயாணப் பொதிகளை நெறிப்படுத்திய நிறுவனத்தை நீக்கிவிட்டு, பிறிதொரு நிறுவனத்துக்கு கையளிக்கப்பட்டதன் அடிப்படை யாது;

(iv) கடந்த வருடத்தினுள் மேற்படி கருமத்துக்காக புதிய நிறுவனத்துக்கு செலுத்தப்பட்ட பணத் துக்கும், இதற்கு முன்னர் இயங்கிய தனியார் நிறுவனத்துக்கு ஒரு வருடத்துக்காக செலுத்தப் பட்ட பணத்துக்கும் இடையிலான வித்தியாசம் யாது

என்பதை அவர் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of External Affairs:

(a) Will he inform this House-

(i) the institution that handles the baggages of persons engaged in Diplomatic Missions through the Ministry of External Affairs;

(ii) whether a formal tender procedure was followed in selecting that institution;

(iii) if so, the basis on which the institution, which hitherto handled baggages was dropped and the task was entrusted to some other institution;

(iv) the difference between the payment made to the new institution for performing that task during the last year and the amount paid to the previous private institution per year?

(b) If not, why?

**ගරු නියෝමාල් පෙරේරා මහතා (විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நியோமால் பெரேரா - வெளிநாட்டலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Neomal Perera - Deputy Minister of External Affairs)

Sir, on behalf of the Minister of External Affairs, I answer Question No. 8.

(a) (i) Ceylon Shipping Corporation Limited.

(ii) No.

(iii) The decision to transport the baggage through Ceylon Shipping Corporation Limited was taken in accordance with the provisions of the Public Finance Circular No.415 dated 06th May, 2005 and continued this service as per the Cabinet decision No.අමප/10/0268/352/005/TBR dated 18.02.2010.

(iv) The cost incurred by the Ministry for the last year in handling baggage of diplomatic and other members of staff engaged in Diplomatic Missions through the Ceylon Shipping Corporation Limited is Rs. 82,440,791.11 for 262 officers.

Since 2006, services of a private institution for baggage handling of in and outgoing officers to Missions abroad has not been utilized.

(b) Not applicable.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් මම අතුරු ප්‍රශ්න අහන්න කැමැතියි. Personal baggages handle කරන ටෙන්ඩර් එක මීට පෙර ලබා දීලා තිබුණේ පෞද්ගලික අංශයට. නියෝජ්‍ය ඇමතිතුමා ප්‍රකාශ කරන ආකාරයට Ceylon Shipping Corporation Limited ආයතනය තමයි දැනට ඒ කටයුතු කරන්නේ. මට කරුණාකරලා දැන ගන්න පුළුවන්ද, ඇයි මේ පෞද්ගලික අංශය ඉවත් කරලා රජයට අයත් Ceylon Shipping Corporation Limited වෙත පවරා ගත්තේ කියලා. ඊට අමතරව මට දැන ගන්න ලැබිලා තිබෙනවා, පෞද්ගලික අංශයට වඩා වැඩි මුදලක් මේ Ceylon Shipping Corporation Limited එක භාරයට ගත්තාම රජය විසින් ගෙවනවා කියලා. ඒක සත්‍යක් ද කියලා මට දැන ගන්න ඕනෑ.

**ගරු නියෝමාල් පෙරේරා මහතා**
(மாண்புமிகு நியோமால் பெரேரா)
(The Hon. Neomal Perera)
Hon. Deputy Speaker, a Cabinet decision had been taken to give it to the Ceylon Shipping Corporation Limited because the private sector was charging a higher amount at that time. So, this was a decision of the Cabinet to give it to a Government institution, which is the Ceylon Shipping Corporation Limited, from 2005. Therefore, we cannot identify the difference today. So, we do not call for private tenders for the same destination.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේකේදි අපට දැන ගන්න තිබෙන එක කාරණයක් තමයි රජය විශාල වියදමක් දරමින් මේ Ceylon Shipping Corporation Limited එක මේ කටයුතු කරන බව. අනෙක් කාරණය නම්, මේ බඩු කටයුතු හරියාකාරව වෙන්නේ නැහැ කියලා පැමිණිලි සංඛ්‍යාවක් ලැබිලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ඔබතුමා පියවර ගන්නවාද කියලා මම අහන්න කැමැතියි.

**ගරු නියෝමාල් පෙරේරා මහතා**
(மாண்புமிகு நியோமால் பெரேரா)
(The Hon. Neomal Perera)
If there are any complaints, we will certainly look into them. But, definitely we will have to ship through the Ceylon Shipping Corporation Limited and, they are giving competitive rates, according to what I understand. But, we are not in a position to get individual rates for every trip. But, certainly we will look into the grievances, if any, if brought to our notice.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඊළඟට, ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතාගේ ප්‍රශ්නය.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම තුන්වැනි අතුරු ප්‍රශ්නය අහනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔය වාගේ කටයුතු සම්බන්ධයෙන් රජයේ ආයතන දානවා. නමුත් බෙල්පොටින්ජර් වැනි ආයතන පිළිබඳව-

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
No, that is not relevant.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමාත් හරස්ව කටයුතු කරනවා නේ. It is relevant, Sir.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 9-1912/'11- (1), ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ලසන්ත අලගියවන්න මහතා (ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லசந்த அலகியவன்ன - நிர்மாண, பொறியியல் சேவைகள், வீடமைப்பு, பொதுவசதிகள் பிரதி அமைச்சர்)
(The Hon. Lasantha Alagiyawanna - Deputy Minister of Construction, Engineering Services, Housing and Common Amenities)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක් කල් ඉල්ලනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## බණ්ඩාරගම පොලිස් ස්ථානය : ගොඩනැඟිල්ල
### பண்டாரகம பொலிஸ் நிலையம்: கட்டிடம்
### BANDARAGAMA POLICE STATION : BUILDING

1914/'11

11. **ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) බණ්ඩාරගම පොලිස් ස්ථානය පිහිටි වත්මන් ගොඩනැගිල්ල ඉදි කරන ලද වර්ෂය කවරේද;

(ii) එම ගොඩනැගිල්ල මේ වන විට දිරාපත්ව, අබලන්ව ඇති බව දන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) බණ්ඩාරගම පොලිසියේ කටයුතු නිසි පරිදි කර ගෙන යාම සඳහා ප්‍රමාණවත් පහසුකම් සහිත නව ගොඩනැගිල්ලක් ඉදි කිරීමට කටයුතු කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் புத்தசாசன, மத அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) பண்டாரகம பொலிஸ் நிலையம் அமைந்துள்ள தற்போதய கட்டிடம் நிர்மாணிக்கப்பட்ட வருடம் யாது;

(ii) மேற்படி கட்டிடம் தற்போது சிதைவடைந்துள்ளதை அறிவாரா

என்பதை அவர் இச் சபைக்கு அறிவிப்பாரா?

(ஆ) பண்டாரகம பொலிஸ் நிலையத்தின் பணிகளை ஒழுங்கான விதத்தில் முன்னெடுத்து செல்வதற்காக போதியளவு வசதிகளுடன் கூடிய புதிய கட்டிடமொன்றை நிர்மாணிக்க நடவடிக்கை எடுப்பாரா என்பதை அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs:

(a) Will he inform this House-

(i) of the year in which the building that houses the Bandaragama Police Station was constructed ; and

(ii) whether he is aware that this building decayed and in a dilapidated condition?

(iii) Will he state whether action will be taken to construct a new building with sufficient facilities to carry out the functions of the Bandaragama Police Station properly?

(c ) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) 1948 වර්ෂය.

(ii) ඔව්.

(ආ) බණ්ඩාරගම පොලිස් ස්ථානය සඳහා නව ගොඩනැගිල්ලක් ඉදි කිරීමේ ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන ලබා ගැනීමට 2013 වර්ෂයේ ඉදි කිරීම් යෝජනාවලියට ඇතුළත් කර ඇති අතර, නව ගොඩනැගිල්ල ඉදි කරන තෙක් දැනට පවතින ගොඩනැගිල්ලේ කළ යුතු අලුත්වැඩියාවන් සිදු කිරීමට දැනටමත් පියවර ගෙන ඇත.

(ඇ) අදාළ නොවේ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමනි. ඒක ඉතා අත්‍යවශ්‍ය දෙයක්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට අතුරු ප්‍රශ්නයක් අහන්නට තිබෙනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මේක පොලීසියට සම්බන්ධ ප්‍රශ්නයක් නිසා මම මේ කාරණය අහන්න කැමැතියි. මහියංගනය පොලීසියේ 132ක් transfer කර තිබෙනවා. මොනවාද මේ සම්බන්ධයෙන් කියන්න තිබෙන්නේ? ඇයි මෙහෙම වෙලා තිබෙන්නේ? එක තැනක පොලීසිය සම්පූර්ණයෙන්ම -

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ප්‍රශ්නය සහ පිළිතුර අනුව පැන නඟින දෙයක් අතුරු ප්‍රශ්නය හැටියට අහන්න.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ඇමතිතුමාගෙන් පොඩි පැහැදිලි කර ගැනීමක් කර ගන්න කැමැතියි. ගරු ඇමතිතුමා 2013 වර්ෂය ගැන කථා කළා. එම වර්ෂයේ අය වැය ලේඛනයක්, ඒ කිසිවක් නැතිව එවැනි ප්‍රකාශයක් කරන්නේ කොහොමද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

නව ගොඩනැඟිලි ඉදි කිරීම සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ වැඩසටහනක් තිබෙනවා. එන අවුරුද්දේ අය වැයට තමුන්නාන්සේලාත් අපට සහයෝගය දෙනවා නේ.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ඒක ඉස්සරහට තිබෙන දෙයක් නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මේ අවුරුද්දේ දෙසැම්බර් මාසයේ නේ සම්මත කරන්නේ.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ඒක ඉස්සරහට තිබෙන දෙයක් නේ. ඒකයි මා ඇහුවේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අපි වැඩේ කථා කර ගෙන නේ තිබෙන්නේ.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ඒක හරි. ඒ ගැන මෙතැන කියන්න බැහැ නේ. ඒක කියන එක වැරැදියි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
කියන්න එපා, මෙතැන.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
පළමුවන අතුරු ප්‍රශ්නයට ඇමතිතුමා උත්තර දෙනවාද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
දෙවන අතුරු ප්‍රශ්නයට ජෝන් අමරතුංග මන්ත්‍රීතුමාට උත්තර දෙනවා. පළමුවන අතුරු ප්‍රශ්නයට ගරු ඇමතිතුමාට උත්තර දෙන්න බැරි නම් අගමැතිතුමා උත්තර දෙයි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
නැහැ, නැහැ. අගමැතිතුමාත් ඉන්නවා, මමත් ඉන්නවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
එක තැනක, 132 දෙනෙක් එක පාරට මාරු කරන්නේ කොහොමද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
යම් කිසි පැමිණිල්ලක් ලැබුණාම ඒ පිළිබඳව විභාග කරලා, සමහර විට ඒ සම්බන්ධයෙන් හදිසි පියවරවල් ගන්න රජයට සිද්ධ වනවා. ලැබී තිබෙන වාර්තා අනුව විනය පියවරයන් හදිසියේ ගැනීමට සිද්ධ වීම නිසා මහියංගන පොලීසියේ මාරු කිරීම් සිදු වෙලා තිබෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඉතින් එම පොලිස් නිලධාරින් මහියංගනයට හොඳ නැත්නම් තවත් පොලීසියකට හොඳ වන්නේ කොහොමද? ඒක හරි වැඩක් නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
දැන් තමුන්නාන්සේ කියන්නේ පොලීසියේ ඉන්න අය ගෙදර යවන්න කියලාද? අපි හරියාකාරව පරීක්ෂණය කරලා තමයි ඔවුන් ගෙදර යවනවාද, නැද්ද කියලා තීරණයක් ගන්නේ. ඔබතුමා දන්නවා, ඒ සම්බන්ධයෙන් පළමුවෙන් කරන්න තිබෙන්නේ මාරු කිරීමක් හෝ වැඩ නැවැත්වීමක් කියලා. ඔබතුමා කියන්නේ පළමුවෙන්ම ගෙදර යවන්න කියලායි. එහෙම රාජකාරි ක්‍රියාවලියක් අනුගමනය කරන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒ පැතිවල නිධන් හාරනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 12-1978/'11-(1), ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M.Ranjith Madduma Bandara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා. ඇමතිතුමා නැහැ වාගෙයි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 13-1989/'11-(1), ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
நான் அந்தக் கேள்வியைக் கேட்கின்றேன். அது சாவகச்சேரி சம்பந்தமான கேள்வி.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක් කල් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## නව විදුලි උත්පාදක ව්‍යාපෘති : ඒකකයක පිරිවැය
## புதிய மின்வலுப் பிறப்பாக்கக் கருத்திட்டங்கள்: அலகொன்றுக்கான செலவு
## NEW POWER GENERATION PROJECTS : UNIT COST

1132/'11

1. **ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) වර්තමානයේ පවතින ඉතා අධික විදුලි ගාස්තු අඩු කර පාරිභෝගිකයන්ට සහනයක් ලබා දෙන දිනය කවරේද;

(ii) ලංකා විදුලිබල මණ්ඩලය හා පෞද්ගලික අංශය මඟින් ඉදිරි වර්ෂ 10 තුළ ඇති කිරීමට යන නව විදුලි උත්පාදක ව්‍යාපෘති කවරේද;

(iii) ඉහත සඳහන් ව්‍යාපෘති මඟින් උත්පාදනය කරනු ලබන විදුලි ඒකකයක අපේක්ෂිත පිරිවැය කොපමණද; සහ

(iv) ඉහත පරිදි උත්පාදනය කෙරෙන විදුලි ඒකකයක සාමාන්‍ය විකුණුම් මිල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ලංකා විදුලි බල මණ්ඩලයේ සේවක අතිරික්තයක් පවතීද; සහ

(ii) එසේ නම්, එම තත්ත්වය නිවැරදි කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

மின்வலு, எரிசக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அதிகூடுதலான மின்சார விலைகள் நுகர்வோருக்கு எப்போது குறைக்கப்படும் என்பதையும்;

(ii) இலங்கை மின்சார சபையினாலும் தனியார் துறையினாலும் அடுத்துவரும் 10 வருடங்களில் ஆரம்பிக்கப்படவுள்ள புதிய மின்வலுப் பிறப்பாக்கக் கருத்திட்டங்களையும்;

(iii) மேற்குறிப்பிடப்பட்டுள்ள கருத்திட்டங்களினால் பிறப்பிக்கப்படும் மின்வலு அலகிற்கான எதிர்பார்க்கப்படும் செலவினையும்;

(iv) மேற்கூறிப்பிடப்பட்டவாறாகப் பிறப்பிக்கப்பட்ட மின்வலு அலகின் சராசரி விற்பனை விலையினையும்

அவர் கூறுவாரா?

(ஆ) (i) இலங்கை மின்சார சபை அதன் தேவைக்கு அதிகமாகப் பணியாளர்களைக் கொண்டுள்ளதா என்பதையும்;

(ii) அவ்வாறாயின் நிலைமையினைச் சீர்படுத்துவதற்கு எடுக்கப்படுகின்ற நடவடிக்கையினையும்

அவர் கூறுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Power and Energy:

(a) Will he state-

(i) as to when consumers get a reduction in the exorbitant electricity prices;

(ii) the new power generation projects to be originated in the next 10 years by CEB and private sector;

(iii) the expected cost of the power unit generated by aforesaid projects; and

(iv) the average selling price of a power unit generated as per above?

(b) Will he also state-

(i) whether the Ceylon Electricity Board is over staffed; and

(ii) if so, the action being taken to rectify the situation?

(c) If not why?

**ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා**
(மாண்புமிகு பிரேமலால் ஜயசேகர)
(The Hon. Premalal Jayasekara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) විදුලි අය ක්‍රම තීරණය කරනු ලබන්නේ 2002 අංක 35 දරන පනත යටතේ පිහිටුවා ඇති ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව (PUCSL) විසිනි. එය අප අමාත්‍යාංශයට අදාළ නැත.

(ii) ලංකා විදුලිබල මණ්ඩලය විසින් ඉදිරි වර්ෂ 10 (2012-2021) තුළ ආරම්භ කිරීමට නියමිත සාම්ප්‍රදායික විදුලි උත්පාදන ව්‍යාපෘති පිළිබඳ විස්තර පහතින් දක්වා තිබේ.

| වර්ෂය | විදුලි බලාගාරය | හිමිකාරත්වය |
|---|---|---|
| 2012 | මෙ.වො. 150 ඉහළ කොත්මලේ (ජල විදුලිය) | ලංකා විදුලිබල මණ්ඩලය |
| 2014 | 1 X මෙ.වො.75 ගෑස් ටර්බයින්<br>4 X මෙ.වො. 6 චුන්නාකම් දිගුව<br>2 X මෙ.වො. 315 පුත්තලම් ගල්අඟුරු (II අදියර)<br>ඉන්ධන විදුලිබලාගාර ස්වාභාවික ද්‍රවීකෘත විදුලිය (LNG) බවට පත් කිරීම (මෙ.වො 700) | ලංකා විදුලිබල මණ්ඩලය |

| | | |
|---|---|---|
| 2015 | 2 X මෙ.වො. 35 ගෑස් ටර්බයින් | තීරණය කර නැත |
| 2016 | මෙ.වො. 35 බ්‍රෝඩ්ලන්ඩ් (ජල විදුලිය) මෙ.වො. 120 උමා ඔය (ජල විදුලිය) | ලංකා විදුලිබල මණ්ඩලය (උමා ඔය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරෙනුයේ වාරිමාර්ග හා ජල සම්පත් අමාත්‍යාංශය යටතේය) |
| 2017 | 2 X මෙ.වො. 250 ත්‍රිකුණාමලය ගල් අඟුරු විදුලි බලාගාරය | පෞද්ගලික විදුලි නිෂ්පාදන (IPP) සමාගම්, [ඉන්දියානු ජාතික තාපබල සමාගම (NTPC) සහ ලංකා විදුලිබල මණ්ඩලය අතර බද්ධ ව්‍යාපාරය] |
| 2018 | මෙ.වො.49 ගිංගඟ (ජල විදුලිය) 1 X මෙ.වො.250 ත්‍රිකුණාමලය ගල් අඟුරු හෝ ස්වාභාවික ද්‍රවීකෘත වායු (LNG) තාප විදුලි බලාගාරය | තීරණය කර නැත |
| 2019 | 1 X මෙ.වො.250 ත්‍රිකුණාමලය ගල් අඟුරු හෝ ස්වාභාවික ද්‍රවීකෘත වායු (LNG) තාප විදුලි බලාගාරය | තීරණය කර නැත |
| 2021 | 2 X මෙ.වො.300 ගල් අඟුරු හෝ ස්වාභාවික ද්‍රවීකෘත වායු (LNG) තාප විදුලි බලාගාරය | තීරණය කර නැත |

(iii) තිබෙන දත්ත අනුව ඉහත කී විදුලි ව්‍යාපෘතිවලින් ජනනය කෙරෙන විදුලි ඒකකයක අපේක්ෂිත පිරිවැය.

ඉහත ව්‍යාපෘතිවල ඇස්තමේන්තුගත පිරිවැය පහතින් දක්වා තිබේ.

| ව්‍යාපෘතිය | ඒකක පිරිවැය (රුපි/කිවොපැ) |
|---|---|
| ගෑස් ටර්බයින් - මෙ.වො. 75 | 26.50 |
| ගෑස් ටර්බයින් -මෙ.වො.35 | 28.90 |
| ත්‍රිකුණාමලය ගල් අඟුරු බලාගාරය - මෙ.වො. 250 | 8.40 |
| පුත්තලම ගල්අඟුරු බලාගාරය -2 x මෙ. වො. 315 | 9.00 |
| චුන්නාකම් දිගුව -මෙ.වො. 24 | 19.20 |
| බ්‍රෝඩ්ලන්ඩ් -මෙ.වො. 35 | 7.70 |
| උමා ඔය - මෙ.වො. 120 | 18.55 |
| ගිං ගඟ -මෙ.වො. 49 | 6.40 |

අනෙක් ව්‍යාපෘති සඳහා ශක්‍යතා අධ්‍යයනයන් සිදු කෙරෙමින් පවතී. ඉන් අනතුරුව අයක්‍රමය තීරණය කළ හැකි වනු ඇත.

(iv) කිසියම් වර්ෂයක සිටින බලපත්‍රලාභීන් විසින් ලබා දෙන තාක්ෂණික හා මූල්‍ය තොරතුරු මත පදනම්ව අළෙවි කරන මිල ගණන් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව අපේ අමාත්‍යාංශයට සම්බන්ධ නැහැ.

(ආ) (i) නැත.

(ii) අදාළ නොවේ.

(ඇ) අදාළ නොවේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
අතුරු ප්‍රශ්න අංක 1.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මගේ අදහස වුයේ පාරිභෝගිකයන්ට පුළුවන් තරම් මිල අඩු කර විදුලිය විකුණන්නේ කොහොම ද කියන එක ගැන ප්‍රශ්න කරන්නයි. ඔබතුමාගෙන් ලැබුණු උත්තරය තුළින් මට පෙනෙන්නේ වැඩිකල් යන්නට ඉස්සෙල්ලා ඔබතුමන්ලා විදුලිය බිල වැඩි කරන්නට යනවාය කියන එකයි.

**ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා**
(மாண்புமிகு பிரேமலால் ஜயசேகர)
(The Hon. Premalal Jayasekara)
කිසි සේත්ම වැඩි කරන්නේ නැහැ. [බාධා කිරීමක්]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම අතුරු ප්‍රශ්නය අහන්නේ නියෝජ්‍ය ඇමතිතුමාගෙන්. වෙන පනින අය උත්තර දෙන්නට ඕනෑ නැහැ නේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා උත්තර දෙන්න. ඔබතුමා ප්‍රශ්නය අහන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(iii) இதற்கு எதிர்ப்புத் தெரிவித்த ஊழியர்கள் சிலருக்கு இடமாற்றம் வழங்கப்பட்டுள்ளது என்பதையும்;

(iv) மேற்படி நிதியத்தை இலங்கை மத்திய வங்கியின் கீழ் கொண்டுவர நடவடிக்கை மேற்கொள் ளப்பட்டு வருகின்றது என்பதையும்

அவர் ஏற்றுக் கொள்வாரா?

(ஆ) (i) 1991ஆம் ஆண்டில் இ.போ.ச. மக்கள் மயமாக்கப்பட்ட கம்பனியாக மாற்றியமைக்கப் பட்டபோது அதன் சேமலாப நிதியத்தில் காணப்பட்ட மொத்தப் பணத்தொகை எவ்வளவு என்பதையும்;

(ii) இதனை அடுத்து, அதன்மூலம் நலவுரிமைகளைப் பெற்று அங்கத்துவத்திலிருந்து நீங்கியவர்களின் எண்ணிக்கை மற்றும் இவர்களுக்குச் செலுத்தப் பட்ட பணத்தொகைகள் எவ்வளவு என்பதையும்;

(iii) தொடர்ச்சியாக மேற்படி நிதியத்தில் அங்கத் துவம் வகித்தவர்களின் எண்ணிக்கை மற்றும் அவர்களின் பெயரில் மீதியாக இருந்த பணத்தொகைகள் எவ்வளவு என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) (i) சேவை வழங்குனர் மேற்படி நிதியத்திலிருந்து அடிக்கடி பெற்றுக்கொண்டுள்ள பணத்தொகை மற்றும் நிதி பெற்றுக்கொள்ளப்பட்டதன் அடிப்படை யாது என்பதையும்;

(ii) பெறப்பட்ட பணத்தொகை மீளளிப்புச் செய்யப்பட்டுள்ளதா என்பதையும்;

(iii) மேற்படி நிதியம் இலங்கை மத்திய வங்கியின்கீழ் கொண்டுவரப்படுமெனில், இதுவரைகாலம் ஊழியர்கள் பெற்றுவந்த சிறப்புரிமைகளை இழக்க நேரிடுமா என்பதையும்;

(iv) அவ்வாறாயின், மேற்படி சிறப்புரிமைகளை பாதுகாப்பாரா என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Transport:

(a) Will he accept that-

(i) money has been drawn illegally, out of the SLTB Provident Fund, for the use of employers on several previous occasions;

(ii) there are similar moves to draw such money once again;

(iii) several employees who opposed to the aforesaid move have been transferred;

(iv) there are moves to bring the said Fund under the control of the Central Bank ?

(b) Will he state-

(i) the total amount of money which was in the provident fund at the time when the Sri Lanka Transport Board was peoplized;

(ii) the number of employees who have left the membership, having received benefits out of that and the amount of money paid to them; and

(iii) the number of employees who continued to retain membership and the balance amounts left in their names?

(c) Will he state-

(i) the amount of money drawn by the employers from time to time and the basis on which such money had been drawn;

(ii) whether such money had been reimbursed;

(iii) whether the employees will lose their benefits, enjoyed so far, if the Fund comes under the Central Bank of Sri Lanka; and

(iv) if so, whether such benefits will be protected?

(d) If not, why ?

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம )
(The Hon. Kumara Welgama)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) නැත.
(ii) නැත.
(iii) නැත
(iv) නැත.

(ආ) (i) 1991.05.15 දිනට රුපියල් 3,168,414,200.00කි.
(ii) ඉවත් වූ සංඛ්‍යාව 24,871කි.
ගෙවන ලද මුදල රුපියල් 2,002,532,598.08කි.
(iii) 2010.12.31 දිනට සේවක සංඛ්‍යාව 2308කි.
ඉතිරිව තිබෙන මුදල 2,544,979,661.78

(ඇ) (i) අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 10-1219-445-023 පිළිබඳව වූ 2010.06.23 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව අර්ථසාධක අරමුදලේ අතිරික්ත මුදල ශ්‍රී ලංගම සංවර්ධන කටයුතු සඳහා ප්‍රාග්ධන යෙදවීම් වශයෙන් යෙදවීමට අනුමැතිය දෙන ලදි.
(ii) අදාළ නැත.
(iii) අදාළ නැත.
(iv) අදාළ නැත.

(ඈ) දැනට එම අරමුදලේ භාරකාරත්වය දරන්නේ කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශයයි.

## ගරු රවි කරුණානායක මහතාගේ පෞද්ගලික කරුණු පැහැදිලි කිරීම
## மாண்புமிகு ரவி கருணாநாயக்கவினது சொந்த விளக்கம்
## PERSONAL EXPLANATION BY HON. RAVI KARUNANAYAKE

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ සම්බන්ධයෙන් වචනයක් කථා කිරීමට අවශ්‍ය හේතුව මෙයයි. ගරු ජගත් පුෂ්පකුමාර අමාත්‍යතුමා මගෙන් පාර්ලිමේන්තුවේදී ප්‍රශ්නයක් අහලා ඉන් පසුව මම ඒ ගැන පැහැදිලි කිරීමක් කළා. නමුත් මේ අවස්ථාවේදී එය විකෘති කරලා තිබෙනවා. මේ සම්බන්ධයෙන් මට මේ වාගේ ප්‍රකාශයක් කරන්න අවසර ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අවස්ථාවේදී මා විසින් ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වන්නේ මෙම උත්තරීතර පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙක් විධියට වසර 18ක් කටයුතු කරන මා පිළිබඳව පසු ගිය දිනවල සිංහල භාෂාවෙන් පළ වන දින පතා පුවත් පතක සහ ඉංග්‍රීසි භාෂාවෙන් පළ වන සති අන්තයේ පුවත් පතක පළවූ ප්‍රවෘත්තියක් සම්බන්ධ කරුණක් පිළිබඳව අවධානය යොමු කර වීමටයි.

පුවත් පත් කලාව යනු ඉතාම ගෞරවණීය එකක්. එසේම පුවත් පත් කලාවට හිමි ආචාර ධර්ම පද්ධතියක් ඇති බවද අපි දනිමු. එහිදී කෙනෙකුගේ පෞද්ගලිකත්වයට හානි සිදු කිරීමට ක්‍රියා කිරීම ආචාර ධර්ම කඩ කිරීමක් වන අතරම, නොකළ දෙයක් කළ දෙයක් සේ සලකා පුද්ගල නාමයට හානි කරමින් ප්‍රවෘත්ති පළ කිරීමද ආචාර ධර්ම පද්ධතියට පටහැනිව ක්‍රියා කිරීමක් සේම පෞද්ගලික කීර්තිනාමයටද හානියක් වන ක්‍රියාවලියකි.

ඉහතින් සඳහන් කළ පුවත් පත් දෙකම පසු ගිය 19වන දින සහ ජනවාරි 22වන දින එම ආචාර ධර්ම පද්ධතියටද පටහැනිව ක්‍රියා කළා සේම මා සම්බන්ධයෙන් ව්‍යාජ ප්‍රවෘත්තියක්ද පළ කර ඇත. එය නම්, දක්ෂිණ අධිවේගී මාර්ගයේ අධික වේගයෙන් රිය පදවා මා විසින් දඩ මුදලක් ගෙවූ බවට වූ ප්‍රවෘත්තියක් පළ කිරීමයි.

ජනවාරි 19වන දා "රිවිර" පුවත් පතෙහි, " අධිවේගී මාර්ගයේ දී වේගය වැඩි වී රවි කරුණානායක මන්ත්‍රීට දඩයක්" කියලා තිබෙනවා. ඒකේ තිබෙන කරුණු මම කියවන්නේ නැහැ. මම එය **සභාගත*** කරනවා. එය හැන්සාඩ්ගත කරන මෙන් ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම ජනවාරි 22වන දා "Ceylon Today" පුවත් පතේ "Ravi exceeds his limits" කියලා තිබෙනවා. It is another character assassination. නීති ගරුක සහ චරිත ඝාතන අකැමැති පුද්ගලයෙකු ලෙස මම මේ ප්‍රවෘත්තිය පිළිකුල් සහගතව ප්‍රතික්ෂේප කරමි. එසේම එහිදී මගේ මන්ත්‍රී වරප්‍රසාද කඩ වීමක්ද සිදු වී ඇති බැවින් ඒ පිළිබඳව ඔබතුමාගේ ගෞරවණීය අවධානය යොමු කරනු කැමැත්තෙමි.

ජනමාධ්‍ය ආයතන සමඟ මෙන්ම අපේ මාධ්‍යවේදීන් සමඟද මා කිට්ටුවන්ත, සුහදශීලී සම්බන්ධයක් පවත්වා ගෙන යනු ලබන බවත් මේ මොහොතේ ගෞරවයෙන් සිහිපත් කළ යුතුයි. යුක්තිගරුක, ගුණගරුක, අදීන මාධ්‍යවේදීන්ට මා හැම විටම ගරු කරනු ලබනවා. නමුත් පුවත් පත්වලින් දේශපාලනය කරන්න හදන එක අපි අනුමත කරන්නේ නැහැ. මේ කාලයේදී සමහර පුවත් පත් කරන්නේ මාධ්‍ය කලාව වෙනුවට දේශපාලනයයි. පසු ගිය කාලය පුරාවට මට පෙනී ගිය කරුණක් තමයි පෞද්ගලික චරිත පුම්බන්න සමහර පුවත් පත් විශාල වෙහෙසක් ගන්නා බව. ඒ අපරාධයට විරුද්ධව තමයි අපි කටයුතු කර ගෙන යන්නේ. ඒ නිසා මා ආදරයෙන්, කරුණාවෙන් ඉල්ලා සිටින්නේ අපට දරා ගන්න බැරි දේවල් කරන්න එපා කියලායි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාතික පුවත් පතක් යනු රටේ සංවර්ධනයටත්, ජනතාවගේ පැවැත්මටත් කැපවීම් සහගත කාර්ය භාරයක් ඉටු කරන දෙයක්. එහෙත් අද වන විට මේ රටේ ජාතික පුවත් පත්වලට විවිධ පුද්ගලයන් විසින් තම තමන්ට ආවේණික නිර්ණායක හදා ගෙන තිබෙනවා. තමන්ගේ පෞද්ගලික න්‍යාය පත්‍ර සාක්ෂාත් කර ගැනීම සඳහා මෙවැනි පුවත් පත් එකක් හෝ දෙකක් කටයුතු කරන්න ගිය විට සිදුවන්නේ න්‍යාය පත්‍රය අවසන් වනවාත් සමඟම පුවත් පතත් අවසන් වීමයි.

රටකට තීරණාත්මක බලපෑමක් කරන්නට මාධ්‍යයට පුළුවන් බව ඇත්තයි. එහෙත් රටවල් පෙරළන්න, පක්ෂ විනාශ කරන්න, බොල් චරිත යෝධ චරිත බවට පත් කරන්න මාධ්‍යයට පුළුවන් වෙතැයි කියා මා විශ්වාස කරන්නේ නැහැ. ඒ මන්ද, මේ සියලුම ක්‍රියාවලීන් තුළ තීරණාත්මක සාධකය වන්නේ ජනතාව වන නිසායි.

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ජනතාවාදී පුවත් පතක් කියන්නේ මිනිසුන්ගේ දුක සැප අතින් අරගෙන පාලකයන්ට පෙන්වන්න පුළුවන් ශක්තියක් තිබෙන පුවත් පතක්. නමුත් අද පුවත් පත් කරන්නේ ඉහතින් සඳහන් කළා වාගේ මිනිසුන්ගේ දුක සැප සොයා බලන එක වෙනුවට තමන්ගේ පෞද්ගලික න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කරවීමට කටයුතු කිරීමයි. මේ අය පුවත් පත් කලාව හැර අන් සියලුම කලාවන් කිරීමට පෙළඹී සිටිනවා. එය මුළුමහත් රටටම අවාසනාවන්ත තත්ත්වයක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පිළිබඳ ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කරමින් සමස්ත පාර්ලිමේන්තුවේ ගෞරවයත්, මන්ත්‍රීන්ගේ ගෞරවයක් රැකෙන සේ නිසි ක්‍රියාදාමයක් ගනු ඇතැයි අපේක්ෂා කරමි. බොහොම ස්තුතියි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
අද දිනට නියමිත කටයුතු.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
What is your point of Order?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා නැඟිටිනකොට විපක්ෂ නායකතුමා යන්න යනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඔබතුමාට අමාරුද? [බාධා කිරීමක්] ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 111 කෙරෙහි ඔබතුමාගේ අවධානය යොමු කරන්න මම බලාපොරොත්තු වෙනවා. එහි මේ විධියට සඳහන් වෙනවා:

"111. සෑම උපදේශක කාරක සභාවක් ම, සභාපතිවරයා විසින් කැඳවනු ලබන කවර හෝ විටෙක රැස්විය යුත්තේ ය.

උපදේශක කාරක සභාවේ සභාපතිවරයා සහ පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා සමඟ සාකච්ඡා කොට සභාපතිවරයා විසින් යටත් පිරිසෙයින් මාසයකට වරක් හෝ රැස්වීමක් කැඳවා අර්ථවත් වැඩසටහනක් සකස් කරන බවට සහතික වීම සෑම අමාත්‍යාංශයක ම ලේකම්වරයකුගේ වගකීම විය යුත්තේ ය."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඔබතුමාගේ අවධානය යොමු කරනවා, උපදේශක කාරක සභා කාර්යංශයෙන් අප වෙත ලබා දී තිබෙන තොරතුරු කෙරෙහි.

ඒ තොරතුරුවලට අනුකූලව හැම අමාත්‍යාංශයකම - අමාත්‍යාංශ 54ක- උපදේශක කාරක සභා මාසිකව පැවැත්විය යුතු අතර, අද එය සිදු වන්නේ නැත. විශේෂයෙන්ම මා මේ කරුණ ඔබතුමාගේ අවධානයට යොමු කරන්න කැමැතියි. අද උපදේශක කාරක සභා පැවැත්වීම ඉතා වැදගත් වෙලා තිබෙනවා. ඇයි මම එහෙම කියන්නේ? මම එහෙම කියන්නේ අද පාසල් යන හතළිස්තුන් ලක්ෂයක් වන දූ දරුවන්ට නිල ඇඳුම් ටික ලබා දීලා නැති නිසා; පවුල් ලක්ෂ දහසයකට සමෘද්ධි සහනාධාරය මාස තුනක් ලබා දීලා නැති නිසා; උපාධිධාරීන් අසූදහසකට රැකීරක්ෂා ලබා දීලා නැති නිසා. ඒ වාගේම ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමය අහෝසි කරලා. අද අපේ රටේ බරපතළ ඖෂධ හිඟයක් තිබෙනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා,-

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට මේ කරුණ ඉදිරිපත් කරන්න අවස්ථාව දෙන්න. [බාධා කිරීම්] ස්ථාවර නියෝග අංක 111 යටතේයි මම කථා කරන්නේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, කථාවක් කිරීමට මේ ස්ථාවර නියෝගය යටතේ ඔබතුමාට අවස්ථාව නැහැ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ කරුණ ඉදිරිපත් කරන්න මට අවස්ථාව දෙන්න. ඔබතුමන්ලා මූලාසනයේ ඉඳ ගෙන අපට කියනවා, උපදේශක කාරක සභාවේදී අපේ ප්‍රශ්න අහන්න කියලා. උපදේශක කාරක සභා රැස්වීම් මාසිකව පවත්වන්නේ නැත්නම්,- [බාධා කිරීමක්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඒ පිළිබඳව ගරු කථානායකතුමාගේ අවධානයට යොමු කොට, සියලුම උපදේශක කාරක සභාවල සභාපතිවරු දැනුවත් කිරීමට කටයුතු කරනවා, මාසයකට වරක් උපදේශක කාරක සභා කැඳවිය යුතුයි කියන කාරණය පිළිබඳව.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මේ කරුණ ඉදිරිපත් කරන්න පොඩ්ඩක් අවස්ථාව දෙන්න. මේ උපදේශක කාරක සභා විහිළුවක් බවට පත් වෙලා තිබෙන්නේ. [බාධා කිරීම්] ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පරිසර කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව 2010 වසරේ දෙවතාවයි රැස් වෙලා තිබෙන්නේ. 2011 වසරේ එක වතාවයි රැස් වෙලා තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ ඉදිරිපත් කරන කරුණ ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. ස්ථාවර නියෝග අංක 111 යටතේයි මා මේ කරුණ යොමු කරන්නේ. ඉවක් බවක් නැතිව නොවෙයි. [බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේදීත් මේ පිළිබඳව සාකච්ඡා කිරීමට හැම පක්ෂයකටම අවස්ථාව තිබේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට පොඩ්ඩක් සවන් දෙන්න.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

මම ප්‍රකාශ කළ පරිදි, ගරු කථානායකතුමාගේ අවධානයට මේ තත්ත්වය යොමු කොට, උපදේශක කාරක සභා මාසිකව පැවැත්වීම පිළිබඳව තීරණයකට එළැඹීමට කටයුතු කරනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට අවස්ථාව දෙන්න. මොකද, ඔබතුමන්ලා මූලාසනයේ ඉඳ ගෙන හැම දාම කියනවා-

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ඒ හන්දා තමයි ඔබතුමා කියන දේ-

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මට කථා කරන්න අවස්ථාව දෙන්න. උපදේශක කාරක සභා පවත්වන්නය කියලා ඔබතුමන්ලා නියෝග දෙනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ඔව්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මේ පාර්ලිමේන්තුවට ප්‍රශ්නයක් යොමු කරලා පිළිතුරක් ලබා ගන්න මාස හයක්, හතක් ගත වනවා. හතළිස් තුන් ලක්ෂයක් වන මේ රටේ පාසල් යන දූ දරුවන්ට නිල ඇඳුම් ටික ලබා දෙන්නේ නැත්නම්, රැකියා නොමැතිව උපාධිධාරීන් අසූ දහසක් ඉන්නවා නම්, පවුල් ලක්ෂ දහසයකට සමෘද්ධි සහනාධාරය මාස තුනකින් දීලා නැත්නම්-

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමනි, මේ කථාවක් කිරීමට අවස්ථාව නොවෙයි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

එහෙම නම් අපි කොහේද මේවා කථා කරන්නේ?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

What is your point of Order?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Sir, I am sorry to say that you should have allowed me to raise the point of Order much earlier than this. My point of Order is that the Hon. Member is doing a procedural mistake. No Member can get up suddenly, quote Standing Orders and go on speaking. He must submit a -

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

Order, please! That is not a point of Order.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Sir, I have not finished.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

The Hon. Sajith Premadasa's point has been taken note of. I have given an Order.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක අතිශයින්ම වැදගත් ප්‍රශ්නයක්. 2011 දීත් මේ ප්‍රශ්නය මතු වුණු වෙලාවේ අපි පක්ෂ නායක රැස්වීමේදී කථා කළා. [බාධා කිරීමක්] ඒ වෙලාවේ අපේ ගරු සභානායකතුමාත්, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාත් අපට පොරොන්දුවක් දුන්නා හැම මාසයකට වරක්ම උපදේශක කාරක සභාව රැස් වන්න කියලා අමාත්‍යාංශ සියල්ලටම දැනුම් දෙනවා කියලා. ඒක කර ගෙන ආවා. නමුත් පසු ගිය කාලයේ ඒක නතර වෙලා තිබෙනවා අපි දැක්කා. ඒක නිසා තමයි මෙතුමා මේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්නේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ඒ පිළිබඳව-

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා සාධාරණ නිසා මට අවස්ථාවක් ලබා දෙන්න. [බාධා කිරීම්] මේ ඇමතිවරු ඔබතුමන්ලාවත් විහිළුවට ගණන් අර ගෙන තිබෙන්නේ. අපේ ගරු සභානායකතුමාගෙන් සහ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගෙන් මම අහනවා,- [බාධා කිරීමක්] මම මේ

ප්‍රශ්නය මතු කළේ ස්ථාවර නියෝග අංක 111 යටතේයි. මම මේ ඉවක් බවක් නැතිව කථා කරනවා නොවෙයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග අංක 111හි මේ විධියට පැහැදිලිව සඳහන් වනවා:

"...මාසයකට වරක් හෝ රැස්වීමක් කැඳවා අර්ථවත් වැඩ සටහනක් සකස් කරන බවට සහතික වීම සෑම අමාත්‍යාංශයක ම ලේකම්වරයකුගේ වගකීම විය යුත්තේ ය."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා මට පැහැදිලි කරන්න, උපදේශක කාරක සභා රැස් වන්නේ නැත්නම් හතළිස්තුන් ලක්ෂයක් වන පාසල් දරුවන්ගේ නිල ඇඳුම් ප්‍රශ්නය ගැන කථා කරන්නේ කොහේද කියලා. සමෘද්ධි සහනාධාරය ගැන කථා කරන්නේ කොහේද?

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, පැහැදිලි කිරීමක් ලබා දෙන්න මම බැඳිලා නැහැ. මම ඔබතුමාට කියා සිටියා ඔබතුමා යොමු කරන ලද ප්‍රශ්නය ගරු කථානායකතුමාගේ අවධානය යොමු කොට ඒ අනුව ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම එක කරුණක් දැන ගන්න කැමැතියි. ඔබතුමාට ඔය මූලාසනයේ ඉඳ ගෙන නියෝගයක් දෙන්න බැරි ඇයි, මේ මාසයේ ඉඳලා සෑම අමාත්‍යාංශයකම උපදේශක කාරක සභා-

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඒ පිළිබඳව කටයුතු කිරීමට තමයි ගරු කථානායකතුමාගේ අවධානය යොමු කරවන්නේ. එතුමා විසින් එවන් නියෝගයක් ලබා දෙනු ඇති.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තවත් පොඩි කාරණයක් කියන්න තිබෙනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
මෙය මූලාසනයෙන් ප්‍රශ්න ඇසීමට තිබෙන අවස්ථාවක් නොවෙයි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග අංක 111 යටතේ-

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
අද දින න්‍යාය පත්‍රය පරිදි දිනට නියමිත කටයුතු.
විෂය අංක 1. ජාතික මංමාවත් පනත යටතේ ඇති නියෝග අනුමත කිරීම.

## ජාතික මංමාවත් පනත: නියෝග
## பொது வழிகள் சட்டம் : ஒழுங்குவிதிகள்
## NATIONAL THOROUGHFARES ACT : REGULATIONS

[අ.භා. 1.48]

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා )**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි අනුව්‍යවස්ථාව සහ 2008 අංක 40 දරන ජාතික මංමාවත් පනතේ 13 සහ 14 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එම පනතේ 89 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ, ගාස්තු ගෙවිය යුතු ජාතික මහාමාර්ගයේ භාවිතා කරන සෑම වාහනයකම රියදුරකුගෙන්ම අය කළ යුතු ගාස්තු පිළිබඳව ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2011 නොවැම්බර් 18 දිනැති අංක 1732/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2012.01.17 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය."

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

[අ.භා. 1.49]

**ගරු නිර්මල කොතලාවල මහතා (වරාය හා මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல - துறைமுகங்கள், நெடுஞ்சாலைகள் பிரதி அமைச்சர்)
(The Hon. Nirmala Kotalawala - Deputy Minister of Ports and Highways)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධිවේගී මාර්ගය භාවිත කරන වාහනවල රියදුරන්ගෙන් ගාස්තු අය කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය නීතිමය රාමුව සකස් කිරීම පිණිස, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි අනුව්‍යවස්ථාව සහ 2008 අංක 40 දරන ජාතික මංමාවත් පනතේ 13 සහ 14 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එම පනතේ 89 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ මෙම නියෝග ගරු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙන අවස්ථාවේදී ඒ පිළිබඳව වචන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

ලාංකීය ඉතිහාසයට අලුත් පිටුවක් එකතු කරමින් අපේ රටේ මාර්ග ක්ෂේත්‍රය තුළ අධිවේගී මාර්ගයක් ඉදි වුණා. විශේෂයෙන්ම අධිවේගී මාර්ග අපේ රටට අලුත් දෙයක්. මේ අධිවේගී මාර්ග ඇති වීමට පෙර අපේ රටේ විවිධ මාර්ග තිබුණා. වතු ක්ෂේත්‍රය, ප්‍රාදේශීය සභාව, පළාත් සභාව සහ මාර්ග සංවර්ධන අධිකාරිය සතු මාර්ග අතිවිශාල ප්‍රමාණයක් අපේ රටේ තිබුණු අතර, රටේ දියුණුවට දායක වන මාර්ග පද්ධතිය දියුණු කිරීම සඳහා වර්තමාන රජය ගෙන යන කටයුතුවල ප්‍රතිඵලයක් විධියට අද අපේ රටට අධිවේගී මාර්ගයක් හිමි වෙලා තිබෙනවා. මේ අධිවේගී මාර්ගයේ

[ගරු නිර්මල කොතලාවල මහතා]

ගමන් කරන රියදුරන්ට ගමන් පහසුව ලැබෙන අතර, ඒ ගමන් පහසුව සඳහා ගාස්තු අය කිරීමක් මේ ජාතික මංමාවත් පනත යටතේ නියෝග ඉදිරිපත් කිරීමෙන් බලාපොරොත්තු වනවා. අපේ රටේ ඕනෑම මාර්ගයක් ජාතික මාර්ගයක් ලෙස නම් කිරීමෙන් පසුව තමයි අධිවේගී මාර්ගයක් බවට පත් කරන්න හැකියාව ලැබෙන්නේ. මේ රටේ පවතින අනිකුත් මාර්ග සඳහා කිසිදු ගාස්තුවක් අය කිරීමකින් තොරව ගමන් කිරීමට අපේ රටේ ජනතාවට හැකියාව ලැබෙනවා.

අද ඉදිරිපත් කරන මේ නියෝග යටතේ බලාපොරොත්තු වන්නේ මේ මාර්ගය භාවිත කරන රියදුරන්ගෙන් අදාළ ගාස්තුව අය කිරීමෙන් පසුව ගමන් කිරීමට ඉඩ දීමත්, ඒ වාගේම මේ ගාස්තුව නොගෙවා ගමන් කිරීමක් සිදු වුණොත් අවශ්‍ය නීතිමය කටයුතු කිරීම සඳහා අදාළ බලය පැවරීමයි. මේ අධිවේගී මාර්ගය අපි 2011 නොවැම්බර් මාසයේ අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් විවෘත කරලා මාස දෙකක් වැනි කාලයක් ගත වෙලා තිබෙන මොහොතක, එහි ආදායම අපි බලාපොරොත්තු වන මට්ටමට ළඟා වෙලා තිබෙනවා.

ඒ වාගේම දවසකට වාහන 9,000ක් විතර මේ මාර්ගයේ ගමන් කරනවා. මේ මාස දෙක තුළ අප මෙම අධිවේගී මාර්ගයෙන් අතිවිශාල ආදායමක් ලැබුවා. ඒ ආදායම තුළ රටේ ජනතාව පහසුවක් ලබනවා වාගේම, මේ මාර්ගය නඩත්තු කිරීම සඳහා මේ අය කිරීම්වලින් අදාළ වෙන් කිරීම් සිදු වෙනවා. මේ අධිවේගී මාර්ගයේ වැඩ කරන සේවක පිරිසට අවශ්‍ය පහසුකම් සපයන්න, මාර්ගයට ආරක්ෂාව සපයන පොලිස් නිලධාරින්ගේ පහසුකම්, ඉන්ධන, දුරකථන සහ අනිකුත් නවාතැන් පහසුකම් සහ වාහන සැපයීමටත්, ඒ නඩත්තු කටයුතු සඳහාත් මේ මුදල යොදවන්න අවශ්‍ය සියලු කටයුතු අප මේ වන විට සූදානම් කර තිබෙනවා. ඒ අදාළ කටයුතු දැන් සිදු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීම සඳහා මේ වන විට ක්‍රියාත්මක වන්නේ මාර්ග සංවර්ධන අධිකාරියයි. "ඒ" සහ "බී" ශ්‍රේණියේ පාරවල් තමයි මාර්ග සංවර්ධන අධිකාරියට අයත් වන්නේ. අද අපේ රටේ මාර්ග පද්ධතියේ සිදු වන සංවර්ධනයේ එක ඉලක්කයක් සපුරාලමින් මේ දක්ෂිණ ලංකා අධිවේගී මාර්ගයේ කිලෝමීටර් 96ක් දැන් ඉදි වෙලා තිබෙනවා. ඉන් පසුව ගාල්ල සිට මාතර දක්වා තවත් කිලෝමීටර් 30ක් අප 2013 දී ඉදි කර අවසන් කරනවා. ඒ වාගේම කොළඹ පිටත වටරවුම් මාර්ගය කිලෝමීටර් 29ක්. කොළඹ-කටුනායක මාර්ගය කිලෝමීටර් 26ක් -ඒකෙත් වැඩ අප 2013 වසරේදී අවසන් කරනවා- කොළඹ පිටත වට රවුම් මාර්ගයේ දෙවැනි අදියර ලෙස කිලෝමීටර් 26ක් ඉදි කිරීම් කටයුතු මේ මාසයේ 18වැනි දා අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ආරම්භ කරනවා. මේ සමස්ත අධිවේගී මාර්ගයේ දුර ප්‍රමාණය ආසන්න වශයෙන් කිලෝමීටර් 300ක් පමණ වෙනවා. 2013, 2014 වර්ෂ වෙන කොට අප එය අවසන් කරන්න බලාපොරොත්තු වෙනවා. ඉදිරියේදී මාර්ග සංවර්ධන අධිකාරියට මේ මාර්ග නඩත්තු කිරීම හා පාලනය කිරීමේ අපහසුතාවක් ඇති වෙනවා. මේ අමාත්‍යාංශයේ අමාත්‍යවරයා විධියට අතිගරු ජනාධිපතිතුමාගේ මහ පෙන්වීම යටතේ මාර්ග සංවර්ධන අධිකාරියට සමගාමීව ඉදිරියේදී අධිවේගී මාර්ග සංවර්ධන අධිකාරියක් පිහිටුවන්නත් කටයුතු සූදානමින් පවතිනවා. ඒ සඳහා අදාළ නීති කටයුතු දැන් සකස් කෙරෙමින් පවතිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම මා සඳහන් කරන්න ඕනෑ ජාතික මාර්ගයක් ලෙස නම් කර තිබෙන අධිවේගී මාර්ගය හැර වෙන කිසිදු මාර්ගයකට මුදල් අය කිරීමට මේ පනතින් ඉඩ ලැබෙන්නේ නැති බව. මේ නීතිරීති යටතේ ඒ සඳහා ඉඩ ලැබෙන්නේ නැහැ. ඒ කාරණය අදාළ අධිවේගී මාර්ගයකට විතරක් සීමා වෙනවාය කියන එක සඳහන් කරන අතර, මේ අදාළ නීතිරීති යටතේ මේ මාර්ගය දෙපස -විශේෂයෙන්ම දක්ෂිණ ලංකා අධිවේගී මාර්ගයේ- කිසිදු සංවර්ධන කටයුත්තක් කිරීමට ඉඩක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම මේ අධිවේගී මාර්ග තුළ කිසිදු වෙළෙඳ දැන්වීමක් ප්‍රදර්ශනය කරන්න කිසිදු ආකාරයකින් ඉඩක් ලැබෙන්නේ නැහැ. එසේ කළහොත් මහා මාර්ග අමාත්‍යාංශය ඊට අදාළව නීතිමය පියවර ගන්නවා. මොකද, එහි ගමන් කරන රියැදුරන්ගේ අවධානය ඒ වෙළෙඳ දැන්වීම් සහ අනෙකුත් සංවර්ධන කටයුතු නිසා බිඳ වැටෙනවා. එය ඒ මාර්ගයේ ගමන් කරන රියැදුරන්ගේ හා ඒ ජනතාවගේ ආරක්ෂාව සම්බන්ධයෙන් කටයුතු කිරීමක් විධියටයි අප දකින්නේ.

මේ අධිවේගී මාර්ගයේ ගමන් කරන ජනතාව ඒ පහසුකම් ලබනවා වාගේම, ඔවුන්ට ක්ෂණිකව අවශ්‍ය වන ගිලන් රථ සේවාවන්, සෞඛ්‍ය සේවාවන් ඒ වාගේම හදිසි අවස්ථාවකදී ගිනි නිවන්න අවශ්‍යතාවක් ඇති වුණොත් ඒ සඳහා අවශ්‍ය පහසුකම් ලබා දෙන්නත් මේ අධිවේගී මාර්ගය තුළ කටයුතු යොදා තිබෙනවා. එහි ගමන් කරන ජනතාවගේ ආරක්ෂාව සඳහාත්, ඒ වාගේම අනෙකුත් රාජකාරිමය අවශ්‍යතාවන් සඳහාත් පොලිස් ඒකකයක් පිහිටුවලා ඒ පොලිස් ඒකකය තුළින් ඒ අදාළ පහසුකම් ලබා දෙන්න කටයුතු කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම සඳහන් කරන්නට ඕනෑ, අපේ රටේ මේ අධිවේගී මාර්ගය ඉදි වන්නට පෙර විවිධ මතිමතාන්තර සහ විවිධ අදහස් උදහස් ඉදිරිපත් කළ බව. නමුත් අද අධිවේගී මාර්ගය නිසා ලබන පහසුව මේ රටේ ජනතාවගේ ජනප්‍රියම විෂයය විධියට අද මේ රටේ ජනතාව කථා කරනවා. විශේෂයෙන්ම පැය විසිහතරකට සීමා වෙච්ච දවසේ කාලයෙන් තවත් යම් කිසි කාර්යයක් සඳහා පැය ගණනක් ඉතුරු කර ගන්නට අවස්ථාව අද අපේ රටේ ජනතාවට මේ අධිවේගී මාර්ග නිසා ලැබිලා තිබෙනවා. ඒක අපේ රටේ ජනතාව ලැබූ ජයග්‍රහණයක් කියන එක සඳහන් කරනවා. මේ අධිවේගී මාර්ගය තුළ ඉදිරි සංවර්ධනය සිදු කරනවා වාගේම සමස්ත රට තුළම අධිවේගී මාර්ග ජාලයක් ඉදි කරලා මුළු රටේම සංවර්ධනයට දායක වන්න කටයුතු කරනවා කියන එකත් සඳහන් කරනවා. විශේෂයෙන්ම කොට්ටාවෙන් අවසන් වෙලා තිබෙන අධිවේගී මාර්ගය, 2013 වසරේදී කොළඹ-කටුනායක අධිවේගී මාර්ගයට සම්බන්ධ කරලා ඒ මාර්ගයේ පහසුකම් ලබා දෙන්නත් අපි කටයුතු කරනවා. දක්ෂිණ ලංකා අධිවේගී මාර්ගයේ වාහනවල ගමන් කරන රියැදුරන්ගෙන් ගාස්තු අය කිරීම සහ ඒ වාගේම ඒ ගාස්තු ගෙවීම පිළිබඳව නීතිමය පැත්තෙන් යම් කිසි ගැටලුවක් ඇති වනවා නම් ඒ සඳහා නීතිමය ආවරණ ලබා ගැනීම සඳහා මේ ජාතික මංමාවත් පනත යටතේ නියෝග මා මේ ගරු සභාවට ඉදිරිපත් කරනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
මීළඟට, ගරු ජෝන් අමරතුංග මහතා.

Order, please! Hon. Deputy Chairman of Committees will now take the Chair.

***අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා] මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு முருகேசு சந்திரகுமார் ] தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. MURUGESU CHANDRAKUMAR] *took the Chair.*

[අ.භා. 1.58]

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ඉදිරිපත් කරන ලද නියෝග පිළිබඳව අපේ විරුද්ධතාවක් නැහැ. නමුත් මා කාරණයක් මතක් කරන්න කැමැතියි. මීට අදාළ පනතත් මීට කලින් ඉදිරිපත් කරලා තිබුණා. ඒකට අදාළ නියෝග කීපයක් තමයි අප මේ ගැසට් පත්‍රයේ දකින්නේ. අධිවේගී මාර්ග සංකල්පය ආරම්භ කළේ, එයට මූලාරම්භය සැපයුවේ එක්සත් ජාතික පක්ෂයයි කියන එක මතක් කරන්න කැමැතියි. තමුන්නාන්සේලා ඒක හදලා අවසන් කළා. අපි ඒ ගැන වරදක් කියන්නේ නැහැ. ඒක හොඳයි. නමුත් අද අපට ප්‍රශ්නය වෙලා තිබෙන්නේ, දකුණු අධිවේගී මාර්ගය තැනීමේදී නියමිත ප්‍රමිතියට තනලා තිබෙනවාද කියන එකයි. අද ලැබෙන වාර්තා අනුව වාහන සට්ටන-

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)

ඔබතුමාට බාධා කිරීමක් නොවෙයි මා කරන්නේ ගරු මන්ත්‍රීතුමා. ප්‍රමිතිය නැහැ කියලා ඔබතුමා අදහස් කරන්නේ මොකක්ද?

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

මා ඒ ගැන කියන්නම්. ප්‍රමිතිය නැහැ කියන්න එක හේතුවක් තමයි අධිවේගී මාර්ගයකට අවශ්‍ය සේවාවන් සියල්ලම සම්පූර්ණ කරලා නැති එක. වෙනත් රටවල අධිවේගී මාර්ග සකස් කරලා තිබෙන ආකාරයත්, ඒවා භාවිත කරන රියැදුරන්ට ලබා දෙන සේවාවනුත් බැලුවාම අවම වශයෙන් අවශ්‍ය සේවාවන්වත් තමුන්නාන්සේලා අපේ රටේ අධිවේගී මාර්ගය භාවිත කරන රියැදුරන්ට -එම මාර්ගයේ- සකස් කර දීලා නැහැ.

අනෙක් කාරණය මේකයි. එක පැත්තක තිබෙන්නේ lanes දෙකයි. ඒ වාගේම වාහන නවත්තන්න තිබෙන තීරුව බොහොම පටුයි. ඒක ආරම්භයක් වන නිසා ඒ අඩු පාඩුව තිබියදී වුණත් අපි එහි ගමන් කරනවා. නමුත් වාහන සට්ටනවලට එක හේතුවක් තමයි ඒක. අධිවේගී මාර්ගයේ දැනට වාහන සට්ටන 26ක් සිදු වෙලා තිබෙනවා. ඒ කියන්නේ සෑහෙන ප්‍රමාණයක්. ඊයේ-පෙරේදා එක මරණයකුත් සිද්ධ වුණා.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)

ගරු මන්ත්‍රීතුමා, ඊයේ-පෙරේදා වූ සිදුවීම මාර්ගයේ අඩු පාඩු නිසා වුවක් නොවෙයි. එම මාර්ගය ආරම්භයේ පටන් අනතුරු සිදු වෙලා තිබෙනවා, අධික වේගය නිසා. ඒ මාර්ගය මං තීරු හයකින් සැලසුම් කරලා තිබෙනවා. දැනට මං තීරු හතරක් නිර්මාණය කරලා තිබෙනවා. මීට පෙරත් විවිධ පෞද්ගලික බස් රථ නියෝජනය කරන වෘත්තීය සමිති කිව්වා එහි බස් රථ ගමන් කරන්න බැහැ කියලා. නමුත් ඒ කථාව අද අවලංගු වෙලා තිබෙනවා. අද ඔවුන්ම බස් රථ ධාවනය කරනවා. ඒ නිසා මේ මාර්ගය පිළිබඳ ගැටලුවක් නැහැ ගරු මන්ත්‍රීතුමා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ඒ හැම දෙයක්ම වෙන්න පුළුවන්. නමුත් අප කියන්නේ, අධිවේගී මාර්ගයක් කියලා නම් කරනවා නම්, ඒ සඳහා යම් මුදලක් අය කරනවා නම් ඒකට වුවමනා කරන පහසුකම, සේවාව ඒ මාර්ගය තුළ තිබෙන්න ඕනෑ කියන එකයි. දැන් ඒ මාර්ගය හදලා ඉවරයි. ඒකට තවත් මං තීරු දමන්න ආයේ ඉඩක් හම්බ වන්නේ නැහැ. නමුත් අප දැන ගන්න ඕනෑ කාරණයක් තිබෙනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, දැන් තමුන්නාන්සේ කිව්වා තවත් අධිවේගී මාර්ග කීපයක් මේ රටේ ඇති කරන්න බලාපොරොත්තු වනවා කියලා. එහෙම නම් ඒවා ආරම්භ කරන්න ඉස්සර වෙලා ඒවා මොන ප්‍රමිතියටද හදන්නේ කියන එක ගැනවත් කරුණාකර මේ සභාවේදී අපට දැනුම් දෙන්න.

අපට ඒ පිළිබඳව සාකච්ඡා කරන්න අවස්ථාවක් ලබා දෙන්න. ඒක වැදගත් කාරණයක්. තමුන්නාන්සේලා ඉදි කරලා තිබෙන අධිවේගී මාර්ගය නැවත පළල් කරන්නවත්, මං තීරු වැඩි කරන්නවත් බැහැ. මේ අඩු පාඩුව අපට බොහොම පැහැදිලිව පෙනෙනවා.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)

අධිවේගී මාර්ගයේ තව මං තීරු 2ක් වැඩි කරන්න අවශ්‍ය ඉඩම් අත් පත් කරන්න සියලු කටයුතු කරලා තිබෙන්නේ. මං තීරු 6ක් හදන්න තමයි සැලසුම් කරලා තිබෙන්නේ. දැනට 4ක් හදලා තිබෙනවා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

මං තීරු 4 මදි හින්දානේ මේ කියන්නේ. ඒ ප්‍රමාණය වැඩි කරන්න කියලායි ඉල්ලීමක් කරන්නේ. [බාධා කිරීමක්] පස්සේ හදන්නේ කොහොමද, දැන් තිබෙන එකවත් හරියට නඩත්තු කර ගන්න බැරිව.

ඊ ළඟ කාරණය මේකයි. නියෝජ්‍ය ඇමතිතුමාගේ කථාවේදී කිව්වා, අධිවේගී මාර්ගය භාවිත කරන අයගෙන් මුදල් අය කරනවා කියලා. මම දැක්කා ගැසට් නිවේදනයේ තිබෙනවා, ජනාධිපතිතුමාගේත්, අගමැතිතුමාගේත් වාහනවලින් මුදල් අය කරන්නේ නැහැ කියලා. ඒකේ කිසි ප්‍රශ්නයක් නැහැ. නමුත් ඇමතිවරුන්ගේ වාහනවලිනුත් මුදල් අය කරන්නේ නැහැ කියන එකයි අපට ලැබිලා තිබෙන ආරංචිය.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)

ගරු මන්ත්‍රීතුමා, අපි ඒක කෙළින්ම ප්‍රතික්ෂේප කරනවා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

නැත්නම් නැහැ කියන්න.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawela)
නැහැ, පැහැදිලිවම නැහැ. [බාධා කිරීමක්] සියලුම මන්ත්‍රීවරුන්ගේ සහ ඇමතිවරුන්ගේ වාහනවලින් මුදල් අය කරනවා. හැබැයි, මන්ත්‍රීවරුන්ගේ වාහනවලින් මුදල් අය නොකර ගමන් කරන්න අවසර දෙන්න කියලා පක්ෂ නායකයන්ගේ රැස්වීමේදී යෝජනාව කළේ කවුද කියන එක ඔබතුමා මේ ගරු සභාවට හෙළි කරන්න.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ඇමතිවරුන්ටත් අවසරය දෙනවා නම් පාර්ලිමේන්තුවේ ඉන්න සෑම මන්ත්‍රීවරයකුටම ඒ අවස්ථාව දෙන්න කියලායි මම කියන්නේ. ඒ අවස්ථාව සෑම මන්ත්‍රීවරයකුටම විවෘත කරනවා නම් හොඳයි. මොකද, මහ ජනතාව වෙනුවෙන් මන්ත්‍රීවරුත් කරන්නේ ඇමතිවරුන්ගේ රාජකාරියමයි.

**ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය (පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன - பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Mrs.) Sumedha G. Jayasena - Minister of Parliamentary Affairs)
ගරු මන්ත්‍රීතුමා, දැන් අපට බෙහොම පහසුයි දකුණේ ඉඳලා කොළඹට එන්න. ඒක පේන්නේ නැද්ද?

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
මමත් සතියකට දෙතුන්වරක් ඔය පාරේ යන එන කෙනෙක්. මමත් හැමදාම මුදල් ගෙවලා තමයි යන්නේ. ඒ විතරක් නොවෙයි, දන්නේ නැතිව නියමිත වේගයට වඩා ටිකක් හයියෙන් ගියාම ඒවාටත් දඩ ගෙවන්න වෙනවා. ඒකටත් තරාතිරමක් නැහැ. සමානාත්මතාව ඒ විධියට තිබෙන එක හොඳයි. කාටවත් විශේෂ වරප්‍රසාද ඕනෑ නැහැ.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
එහෙම වරප්‍රසාද දෙන්නේ නැත්නම් ඒකේ තර්කයක් නැහැ.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawela)
මම අද ආවේ ගමේ ඉඳලා; දොඩංගොඩ ඉඳලා. මම දොඩංගොඩ ඉඳලා එන කොට කොට්ටාව පිටවීමේ මධ්‍යස්ථානයට ගෙවපු මුදලට අදාළ ටිකට් පත මෙන්න. ඔබතුමා ඔය විධියට කිව්වාට, මම වරාය හා මහාමාර්ග නියෝජ්‍ය ඇමතිවරයා වෙලාත් මම මුදල් ගෙවලායි ගමන් කරන්නේ.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජාතික මං මාවත් පනතේ 54 වැනි වගන්තියේ බොහොම පැහැදිලිව සඳහන් කරලා තිබෙනවා, මෙන්න මෙහෙම:

"යම් මාර්ගයක්, මහා මාර්ගයක් හෝ ජාතික මහා මාර්ගයක් බාධාවකින් හෝ අපහසුතාවයකින් තොරව භාවිත කිරීම සඳහා මහජනතාවට අවශ්‍ය ඉඩ ප්‍රස්ථා සලසාදීම සහ එකී අයිතිය ආරක්ෂා කර දීම අධිකාරියේ කාර්යය විය යුතු ය."

ඒක කෙරෙන්නේ නැති කොට මොකද වෙන්නේ? මේ වෙන කොට ගල් ගහලා වාහන කීයකට අලාභ වෙලා තිබෙනවාද? [බාධා කිරීමක්]

මේ මාර්ගය පාවිච්චි කරන අයට තමුන්නාන්සේලා එම පනතේ 54 වැනි වගන්තියෙන් සහතිකයක් දෙනවා, එවැනි බාධක ඇති නොවන්න කටයුතු කරනවා කියලා. මම කියන්නේත් ඒ බාධක වළක්වන්න ඕනෑ බවයි. වාහන 19ක windscreen කැඩිලා ඒවාට damage වෙලා තිබෙනවා. මේක තව ඉදිරියටත් යන්න ඉඩ දෙන්න එපා, ඒක වළක්වන්න පියවර ගන්න කියන එකයි මම කියන්නේ. ඊයේ-පෙරේදා මම දැක්කා, තව ප්‍රවෘත්තියක් තිබෙනවා, මාර්ග දෙපස ගහලා තිබෙන දැල් ටික ගලවලා කියලා. අපි ඒ කාර්යය අනුමත කරන්නේ නැහැ. එවැනි දේවල් නොවෙන්න කටයුතු කරන්න ඕනෑ. දැල් ගැහුවේ සත්තු පාරට පනින හින්දයි. නමුත් මට පෙනෙන්නේ නැහැ, ඒකෙන් සත්තු පනින එක නතර වෙලා තිබෙනවාය කියලා. දැල් ගලවා ගෙන ගියාම අහන්න දෙයක් නැහැ නේ. මේ වාගේ මූලික ප්‍රශ්න කිහිපයක් අද පැන නැඟලා තිබෙනවා. වෙන රටවල ක්‍රියාත්මක කරන පිළිවෙලට අපේ රටේ මේ අධිවේගී මාර්ගයේත් කටයුතු ටික, අවශ්‍ය දේවල්, අවශ්‍ය සේවාවන් ලබා දෙන්න කියන එක තමයි අපි මේ පිළිබඳව සාකච්ඡා කිරීමෙන් බලාපොරොත්තු වෙන්නේ.

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මේ අධිවේගී මාර්ගයේ ගියාද?

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
මම ගියා. අපි අධිවේගී මාර්ගය ගැන සන්තෝෂ වෙනවා.

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ඔබතුමාට කිසියම් බාධකයක් ආවාද, මේ අධිවේගී මාර්ගයේ යන කොට?

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
මෙන්න මේ ස්ථානවල බාධකයක් ආවා. පිවිසුම් මාර්ගයේ ඇතුළු වෙන තැන බෝතල් කටක් වාගේයි. ඒ නිසා පොඩි හිරවීමක් තිබෙනවා. ඒවා තව හදන්න පරක්කු වෙනවා. මට පෙනුණා, ඒවා හදා ගෙන යන බව. නමුත් පිවිසුම් මාර්ගයේ තිබෙනවා, ලොකු පෝළිමක්. අහපු හින්දයි මම ඒ ගැන කිව්වේ.

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
අධිවේගී මාර්ගයේ යන්න විශාල ඉල්ලුමක් තිබෙන නිසා එහෙම එකක් තිබෙන්න පුළුවන්. ආරම්භ කරන තැන තදබදයක් තිබුණට පස්සේ යන වේගයත් එක්ක ඒක ඇරිලා යනවා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ප්‍රශ්නය තිබෙන්නේ ඒක නොවෙයි. ඒවා ඔක්කෝම සම්පූර්ණ කරලා මේක විවෘත නොකරපු එකයි වැරැද්ද. ඒක තමයි වෙලා තිබෙන්නේ. බොහොම හදිසියෙන් මේ පාර විවෘත කෙරුවා. ඒ ටිකත් සම්පූර්ණ කරලා විවෘත කෙරුවා නම් මේ ප්‍රශ්නය එන්නේ නැහැ නේ. එහෙම නම් කොච්චර හොඳයිද?

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)

ගරු මන්ත්‍රීතුමනි, කොට්ටාවේ පිවිසුම සකස් කරලා තිබෙන්නේ තාවකාලික පිවිසුමක් හැටියටයි. ඒක 2013 වන කොට අංග සම්පූර්ණ වෙනවා. මොකද එතැන කොළඹ පිටත වටරවුම් මාර්ගයට පිවිසෙන ස්ථානයයි. අනෙක් ස්ථානවල කිසි ප්‍රශ්නයක් නැහැ, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

හොඳයි. අපි ඒවා හදනවා කියමු කෝ. මම තමුන්නාන්සේට කියන්න කැමැතියි, මේ පිවිසුම් මාර්ගවල -විශේෂයෙන්ම කොළඹින් බැහැරව එළියට යන මාර්ගවල- එළි පහළි වීම දුර්වල වීම නිසා මං කොල්ල දෙක, තුනකුත් ඇති වෙලා තිබෙනවා කියන එක. මම දන්නේ නැහැ, තමුන්නාන්සේලාට ඒක ආරංචි වෙලා තිබෙනවාද කියලා. ඒ කියන්නේ වීදි ලාම්පු නැතිකම. කරුණාකරලා ඒක සොයලා බලන්න, මේ ප්‍රශ්නයේ ඇත්තක් තිබෙනවාද නැද්ද කියලා. මේවා අපට ලැබෙන පැමිණිලි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම තමයි මේ අධිවේගී මාර්ගයට ඉඩම් පවරා ගැනීමේ දී ඇති වූ ප්‍රශ්න. දැන් ඒ ප්‍රශ්නය ඇවිල්ලා තිබෙනවා, කොළඹ-කටුනායක අධිවේගී මාර්ගය සඳහා ඉඩම් පවරා ගැනීමේ දීත්. ඒ, භුක්තියටම අයිතිවාසිකම් කියන ඉඩම් පවරා ගැනීමේ දී ඒවාට වන්දි ගෙවීමක් කරන්න බැහැ කියලා කියන එක. හුඟාක් අපේ ගම්වල සිටින ඉඩම් අයිතිකරුවන්ට සමහරවිට ඔප්පු නැහැ. කාලාන්තරයක් තිස්සේ පරම්පරාවෙන් ඔවුන් පදිංචි වෙලා සිටින එම ඉඩම්වලින් යම් ඉඩම් ප්‍රමාණයක් පවරා ගැනීමේ දී ඒ සඳහා වන්දි ඉල්ලන්න ගියාම වන්දි ගෙවන්න බැහැ යි කියනවා. මොකද, මේවාට ඔප්පු නැහැ, ඔප්පු නැති නිසා වන්දි ගෙවන්න බැහැ කියලා කියනවා. ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලීමක් කරනවා, කරුණාකරලා එහෙම කරන්න එපා කියලා. කාලාන්තරයක් පදිංචිව සිටි බව ඔප්පු කරන්නට පුළුවන් නම්, තවත් කෙනෙක් ඒ ඉඩමට අයිතිවාසිකම් කියන්නේ නැත්නම්, ඒ අයට ලැබිය යුතු වන්දිය ලබා දෙන්න කටයුතු කරන්න කියලා ඉල්ලීමක් කරනවා. මේක විශාල ප්‍රශ්නයක්. අද ඒ මිනිස්සු ඇවිල්ලා අපට කියනවා, "බලන්න, අපේ ඉඩම් පවරා ගන්නවා. අපිට සල්ලි දෙන බැහැ කියනවා, ඔප්පුවක් නැති නිසා" කියලා.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)

රජයේ ඉඩමක් නම් වන්දි ගෙවන්න විධියක් නැහැ, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

රජයේ ඉඩම් නොවෙයි. පෞද්ගලික ඉඩම්.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)

අදාළ පිඹුරුපත් සහ අදාළ pedigree එක සහතික කරනවා නම් අපිට දෙන්න පුළුවන්. කිසි ගැටලුවක් නැහැ.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ඕනෑ තරම් සහතික කරන්න පුළුවන්. නමුත් ප්‍රාදේශීය ලේකම් අනුමත කරන්නේ නැහැ. ඒ ගැන අවධානය යොමු කරන්නය කියලා මා තමුන්නාන්සේගෙන් ඉල්ලීමක් කරනවා.

ඊළඟට තමුන්නාන්සේලා සඳහන් කළා, තව අධිවේගී මාර්ග කිහිපයක් ආරම්භ කරන්නට බලාපොරොත්තු වනවා කියලා. මම ඒකයි ඉස්සෙල්ලාත් කිව්වේ. කරුණාකරලා ඒ පිළිබඳව විස්තරයක් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න, කොහොමද මේවායේ පිළිවෙළ කියලා; ප්‍රමිතිය මොකක්ද, අනුගමනය කරන වැඩ පිළිවෙළ මොකක්ද කියලා. මාර්ග කීයක් එක පැත්තකට ඇතුළත් කරනවාද කියන එකත් අපට දැන ගන්නට පුළුවන් නම් එය ඉදිරියේ දී ප්‍රයෝජනවත් වනවා කියලා මා හිතනවා.

ඊළඟට මා දැන ගන්නට කැමැතියි, මේ වනකොට -

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர )
(The Hon. Chandrasiri Gajadeera)

ඔබතුමා මේ අධිවේගී මාර්ගය අගය කරනවාද?

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

අගය කරන නිසා තේන්නම් කියන්නේ. මේක වැඩිදියුණු කර ගන්න වුවමනා කරන අඩු පාඩු පෙන්වා දෙන්නේ ඒක නිසා නේ. නැත්නම් කට පියා ගෙන ඉන්න තිබුණා නේ. තමුන්නාන්සේ ඒක පිළිගන්නට ඕනෑ. අපි මේ වාගේ මාර්ගවල පිට රටවලදී ගමන් කර තිබෙනවා. තමුන්නාන්සේත් ගමන් කරලා ඇති. ඉතින් ඒ නිසා මේ මාර්ගයත් ඒ තත්ත්වයට ගෙනෙන්න කියන ඉල්ලීම තමයි මේ කරන්නේ. නැතිව වෙන කිසි දෙයක් නොවෙයි. අපි ඒ අඩු පාඩු පෙන්වා දීලා, ඒවා හදා ගන්න මාර්ගයක් කියන්නේ.

ඊළඟට විශේෂ කාරණයක් තමයි, මේ වනවිට අනෙකුත් මාර්ගවල භයානක තත්ත්වයක් තිබෙනවා කියන එක. අනෙකුත් මහා මාර්ගවල තත්ත්වය දිහා බැලුවාම, එහි සිදු වන මාර්ග සට්ටන සංඛ්‍යාව දිහා බැලුවාම අපිට පුදුම හිතෙනවා.

ඊයේ පෙරේදා පත්තරවල පළ වෙලා තිබුණා, මේ මාර්ග අනතුරු නිසා 2011 වර්ෂයට පාසල් ළමුන් 225 දෙනකු අනතුරට පත් වෙලා තිබෙනවාය කියලා. අධිවේගී මාර්ගය ගැන නොවෙයි මා කථා කරන්නේ. මා කථා කරන්නේ අද මේ රටේ අනිකුත් මාර්ගවල තිබෙන තත්ත්වය ගැනයි; වාහන සට්ටන ප්‍රමාණය ගැනයි. තමුන්නාන්සේලාට මේ ගැන මොකක් හෝ කරන්න වෙනවා. මා දන්නේ නැහැ, තමුන්නාන්සේලා ගන්න පියවර මොකක්ද කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම පසු ගිය අවුරුද්දේ පාසල් ළමුන් හැරෙන්න තවත් 4,100 දෙනෙක් මාර්ග සට්ටනවලින් තුවාල ලබා තිබෙනවා. වාහන තදබදය නිසා අද පාරක යන්න බැරි තත්ත්වයක් ඇති වෙලා තිබෙන්නේ. ආර්ථිකය දියුණු වනවාත් එක්කම ඒ ප්‍රශ්න පැන නඟිනවා තමයි. නමුත් ඒකට විසඳුම් සෙවීම රජයේ යුතුකමක්. මීට පෙර කාරක සභාවලදීත් මා කිව්වේ, කොළඹින් උතුරු මාර්ගයේ මීගමුව දක්වාත්, ඒ වාගේම කොළඹින් දකුණු මාර්ගයේ රත්මලාන හා මොරටුව දක්වාත් අඩුම තරමේ උදේ 6.00 සිට හැන්දෑවේ 7.00 දක්වා containers සහ මහා පරිමාණයේ ලොරි යෑම නතර කරන්න කියලායි; රාත්‍රී 7.00න්, 8.00න් පස්සේ ඒවා ධාවනය කරන්න අවසර දීලා, උදේ 6.00 වන කොට ධාවනය නතර කරන්න කියලායි. මේක අපි ඉස්සරත් ක්‍රියාත්මක කළා.

[ගරු ජෝන් අමරතුංග මහතා]

අද ආසියාවේ රටවල් කිහිපයකම මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වනවා. Trailers, containers, මහා පරිමාණයේ ලොරි ධාවනය කරන විට දැනට තිබෙන මං මාවත්වල පළල මදියි. ඉතින් උදේ පාරට බැස්සාම විශේෂයෙන්ම කොළඹින් උතුරේ ජීවත් වන අපට විශාල ප්‍රශ්නයක් පැන නඟිනවා. අපටත් වඩා පාසල් ළමයින් ගෙන යන වෑන්වලට ප්‍රශ්නයක් තිබෙනවා. එදා ගල්කිස්සේ ඇති වුණු සට්ටනයෙන් ළමයින් කී දෙනකු අනතුරට පත් වුණාද? එම නිසා ඒ පිළිබඳව එක විසඳුමක් හැටියට තමයි මා ඉල්ලා සිටින්නේ, පුළුවන් නම් උදේ 6.00 සිට රාත්‍රී 7.00 වන කල්වත් ඒ මාර්ගයේ containers සහ මහා පරිමාණයේ ලොරි ධාවනය කිරීම පාලනය කරන්න කියලා. අධිවේගී මාර්ගය හැදුවාට පස්සේ ඒ වාහනවලට ඒ මාර්ගය විවෘත කළාට කමක් නැහැ. කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය හැදුණාම ඒකේ ප්‍රශ්නයක් නැහැ. කොළඹ සිට රත්මලාන දක්වාත් ඒ ප්‍රශ්නය තිබෙනවා. එම නිසා මා ඉල්ලීමක් කරනවා මේ ගැන සලකා බලන්න කියලා. මේක අත්‍යවශ්‍යයි. ඒ කාලයේත් මේ ප්‍රශ්නය තිබිලා අපි ඒක නතර කළා. එදා ඒක සාර්ථකව ක්‍රියාත්මක වුණා. අද ඒ ප්‍රශ්නය දෙගුණ තෙගුණ වෙලා තිබෙනවා. මා දන්නේ නැහැ, මොන හේතුවක් නිසාද කියලා. ඒ ගැන අපට කරන්න දෙයක් නැහැ. ආනයන අපනයන කටයුතු දියුණු වන කොට ඒ ප්‍රශ්නය ඇති වනවා.

ඊ ළඟ කාරණය තමයි, රියැදුරු බලපත්‍ර -driving licence - දෙන එක. අපි දන්නේ නැහැ driving licence එක ලැබෙන්නේ හරියටම රියැදුරු පුහුණුවක් ලබන, සුදුසුකම් තිබෙන අයටද කියලා. අද මුදලට driving licence ලබා ගන්න පුළුවන් කියලා විවිධාකාර චෝදනා තිබෙනවා. දූෂණ රාශියක් ගැන කථා කරනවා. ඒ නිසා හරිහමන් සුදුසුකම් තිබෙන අයට රියැදුරු බලපත්‍ර ලබා දීමට සුපරීක්ෂාකාරීව කටයුතු කළ යුතුයි කියලායි මම හිතන්නේ. එසේ නොවීමත් හේතුවක් තමයි මාර්ග සට්ටන ඇති වීමට.

ගරු ඇමතිතුමනි, මම මේ විෂයයට අදාළ නිසා කියන්නම්, පසු ගිය කාල සීමාව තුළ සිදු වෙලා තිබෙන මාර්ග අනතුරු පිළිබඳ සංඛ්‍යා ලේඛන අරගෙන බැලුවොත්, 2009 දී මරණ සිද්ධ වෙලා තිබෙනවා 2,263ක්. මේ මහ පාර මැද්දේ. ඒ වාගේම 2010 දී 2,579ක් මැරිලා තිබෙනවා වාහන සට්ටනවලින්. 2011දී මරණ 2,506යි. බරපතළ තුවාල 2009දී 5,379යි; 2010 දී 6,124යි; 2011 දී 7,168යි. මේ විධියට ඒ සංඛ්‍යාව එන්න එන්න වැඩි වෙනවා. අපි මුළු මරණ සංඛ්‍යාව බැලුවොත් මේ අවුරුදු 3ට 7,348ක් වෙනවා. ඒ වාගේ විශාල අනතුරු ප්‍රමාණයක් සිදු වෙලා තිබෙන බව අද සංඛ්‍යා ලේඛනවලින් පෙනෙනවා. දැන් මේකේ භයානකම දේ තමයි අද කෙනෙකුට පාර හරහා යන්න බැරි තත්ත්වයක් ඇති වෙලා තිබීම. විශේෂයෙන්ම මහා පරිමාණයේ containers ගෙන යන trailers, ඒ වාගේම ගෑස් පටවා ගෙන යන bowsers, පෙට්‍රල් ගෙන යන bowsers දහවල් කාලයේ ධාවනය වීම තුළින් තමයි මේ ප්‍රශ්නයට තුඩු දෙන තත්ත්වයක් ඇති වෙලා තිබෙන්නේ.

අපි ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ, මේ අධිවේගී මාර්ගය ජනතාවට මීට වඩා සුරක්ෂිත ලෙස පාවිච්චි කරන්න වැඩ කටයුතු වහාම නිර්මාණය කරන්නය කියලායි. දැන් මම දැන ගන්න කැමැතියි අද වන කොට මේ අධිවේගී මාර්ගය පාවිච්චි කිරීම තුළින් කොපමණ මුදලක් එකතු වෙලා තිබෙනවාද කියලා.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
රුපියල් මිලියන 180යි.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
හොඳයි. මම කල්පනා කරනවා ඒ මුදල් පාවිච්චි කරයි කියලා මේ කියපු අවශ්‍යතා සම්පූර්ණ කරලා දෙන්න. මාර්ග හදනවා, විවෘත කරනවා, ඒ පිළිබඳව ප්‍රචාරයක් ලබා දෙනවා වාගේම අවශ්‍යම දේ තමයි ඒ සේවාව හරියට පවත්වා ගෙන යාම.

එහෙම නොතිබුණොත් මහා විශාල ප්‍රශ්නයක් වෙනවා. මේ ගල් ගැසීම නවත්වන්න. මේ ගල් ගැසීම නිසා වාහනවල windscreens 19ක් කැඩිලා තිබෙනවා. [බාධා කිරීමක්] කියන්න බැහැ. තමුන්නාන්සේලාගේ ස්වාමීන් වහන්සේ නමක් ගියපු වාහනයකටත් පහර දුන් බව පසු ගිය දවස්වල ප්‍රවෘත්තිවලින් අප දැක්කා. [බාධා කිරීමක්] ඊර්ෂ්‍යාකාරයෝ හිටියාට කරන්න දෙයක් නැහැ.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
ඔබතුමාලා මොකුත් සම්බන්ධයක් නැහැ නේ. [බාධා කිරීමක්]

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
කෙනෙකුට භය නැතිව මේ අධිවේගී මාර්ගය පාවිච්චි කරන්න පුළුවන් විධියේ තත්ත්වයක් සලස්වා දීමට තමුන්නාන්සේලා බැඳී ඉන්නවා; ජාතික මං මාවත් පනතෙන් බැඳී ඉන්නවා. 2008 අංක 40 දරන ජාතික මංමාවත් පනතේ 54 වන වගන්තියේ ඒ ගැන බොහොම පැහැදිලිව සඳහන් කර තිබෙනවා. අධිවේගී මාර්ගය පාවිච්චි කරන රියැදුරන්ට අවහිරයක් බාධාවක් නැතිව එම මාර්ගයේ ගමන් කිරීමේ සහතිකය දෙන්නට තමුන්නාන්සේලා නීතියෙන් බැඳී ඉන්නවා. අධිකාරියක් පිහිටුවනවා නම් ඒ අධිකාරියට විරුද්ධව වන්දි ඉල්ලා නඩු පවරන්නට පුළුවන්, මෙවැනි සිද්ධීන් ඇති වුණොත්. තමුන්නාන්සේලා ඒ ගැන කටයුතු කරාවිය කියා මා බලාපොරොත්තු වෙනවා.

මීන් ඉදිරියට තවත් අධිවේගී මාර්ග සකස් කරන්නට බලාපොරොත්තු වෙනවා නම් කරුණාකර ඒ පිළිබඳව විවෘත සාකච්ඡාවක් ගේන්න. උපදේශක කාරක සභාවට මේ කාරණා ඉදිරිපත් කර ඒවා ගැන කටයුතු කරන්න. ඒ කාරණා පෙන්වා දෙන්න. අප මෙහෙම පාරක් විවෘත කරන්නට යනවාය කියා කරුණු පෙන්වන්න. දැන් කොළඹ - මීගමුව අධිවේගී මාර්ගය හදද්දී අප දන්නේ නැහැ මං තීරු කීයක් තමුන්නාන්සේලා ඇති කරනවා ද කියා. දකුණු අධිවේගී මාර්ගයේ ඇති වෙච්ච අඩු පාඩු කොළඹ - කටුනායක අධිවේගී මාර්ගයේ ඇති නොවන්නට කටයුතු කරන්නට කියායි මම ඉල්ලීමක් කරන්නේ. දකුණු අධිවේගී මාර්ගයටත් වඩා වාහන විශාල සංඛ්‍යාවක් ඒ අධිවේගී මාර්ගය පාවිච්චි කරාවි. එම නිසා ඒ පිවිසෙන මාර්ගවලට වුවමනා කරන පහසුකම ඇති කරන්නය, ඒ වාගේම බාධකයක් ඇති වුණොත් එම වාහනය නවත්වා ගැනීමට දෙපැත්තේ සුදුසු ඉඩ ප්‍රමාණය ඇතිව මාර්ගය සකස් කරන්නය කියන එක -

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
එම මාර්ගයේ මුළු දිග කිලෝ මීටර් 25.8යි. එයින් පළල මං තීරු හයකට එක කොටසකුත් ඒ වාගේම මං තීරු හතරකට තවත් කොටසකුත් ඇතිව ඉදි වෙනවා. ඒ කියන්නේ මං තීරු හයක් සහ මං තීරු හතරක් ඉදි වෙනවා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
විවෘත කරන්නට ඉස්සෙල්ලා ඒකත් ඉවර කරලාම විවෘත කරන්න.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
නැහැ. සියලු දෙයම කරනවා. ඔබතුමා මටත් වඩා හොඳට දන්නවා ඇති ඒ ප්‍රදේශය වගුරු බිම් සහිත ප්‍රදේශයක් බව. එම නිසා ඒ අදාළ ඉදි කිරීම් ඒ ප්‍රමිතියත් එක්කයි කර ගෙන යන්නේ. 2013 වර්ෂය අවසාන වන විට මේ මාර්ගයේ වැඩ අවසන් කරනවා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ඒක අවශ්‍යමයි. අද කොළඹ - මීගමුව පාරේ ගමන් කරන්න බැහැ. අප බලාපොරොත්තු වෙනවා, හැකි ඉක්මනින් මේ කටයුත්ත ආරම්භ කරාවිය කියා. ඒකට අවශ්‍ය සුදුසුකම්, පහසුකම්, ප්‍රමිතිය ඇතිව එම කටයුත්ත ආරම්භ කරන්නය කියන එකයි අද මේ ගරු සභාවේදී අපි සඳහන් කරන්නේ.

තමුන්නාන්සේලා මේ කාරණය වරදවා තේරුම් ගන්නට එපා. මේ කරන්නේ අඩු පාඩු සොයා විවේචනය කිරීමක් නොවෙයි. කරන දෙය හරියට කරන්න කියායි ඉල්ලන්නේ. මොකද, මේවා මහ ජනයාගේ සල්ලිවලින් හදන්නේ. කාගේවත් පෞද්ගලික සල්ලි නොවෙයි. තමුන්නාන්සේලා විනයෙන් ණයට ගත්තත්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ණයට ගත්තත් මේවා ආපසු ගෙවන්නට ඕනෑ. මේවා මහ ජනයා බදු ගෙවන සල්ලිවලින් තමයි ගෙවන්නට ඕනෑ. එම නිසා මෙහි අඩු පාඩුවක් තිබෙනවා නම්, මේ ගරු සභාවට ඇවිත් ඒවා පෙන්නුම් කර දීලා ඒවායේ අඩු පාඩු සම්පූර්ණ කරන්න කියා ඉල්ලීමක් කරන්න අපට අයිතියක් තිබෙනවා. ඒ බව කියමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 2.20]

**ගරු ලසන්ත අලගියවන්න මහතා (ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லசந்த அலகியவன்ன - நிர்மாண, பொறியியல் சேவைகள், வீடமைப்பு, பொதுவசதிகள் பிரதி அமைச்சர்)
(The Hon. Lasantha Alagiyawanna - Deputy Minister of Construction, Engineering Services, Housing and Common Amenities)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද දින ජාතික මං මාවත් පනත යටතේ නියෝග - එනම් ගාස්තු ගෙවිය යුතු, ජාතික මහා මාර්ගයේ භාවිත කරන සෑම වාහනයකම රියදුරකුගෙන්ම අය කළ යුතු ගාස්තු- පිළිබඳව සාකච්ඡා කරන මේ අවස්ථාවේදී ප්‍රථමයෙන් අතිගරු ජනාධිපතිතුමාට, ඒ වාගේම එම අමාත්‍යාංශයට අපේ ගෞරවය පුද කරන්නට ඕනෑ. රටක් විධියට මීට දශක ගණනාවකට පෙර අපට උරුම විය යුතු ඒ අධිවේගී මාර්ග සංකල්පය මේ රටට දායාද කර දීම පිළිබඳව අපේ ගෞරවය හා ප්‍රණාමය එතුමාට පුද කරන්නට ඕනෑ.

අද මේ නියෝග මඟින් ඉදිරිපත් කරන ලද සියලුම අය කිරීම් ඉතාමත් සාධාරණ බවත් අප සඳහන් කරන්නට ඕනෑ. ලෝකයේ සෑම රටකම පාහේ අධිවේගී මාර්ගවල -සියයට අනූනවයක්ම වාගේ- මුදල් අය කරලා තමයි යන්නට අවස්ථාව සලසා දී තිබෙන්නේ. ඒ වාගේම ජනතාවට විකල්ප තිබෙනවා.

ගාල්ලට යද්දී අපට අවශ්‍ය නම් විතරයි අධිවේගී මාර්ගයේ යන්නේ. එහෙම නැත්නම් අපට දැනට තිබෙන සාමාන්‍ය ගාලු පාරේ යන්න පුළුවන්. මේ අධිවේගී මාර්ගය පාවිච්චි කිරීම තුළින් කාලය ඉතිරි වනවා. මා හිතන විධියට සාමාන්‍ය පාරේ යන්න පැය තුනහමාරක් විතර යනවා. නමුත් අධිවේගී මාර්ගයේ විනාඩි 55කින් අපට ගාල්ලට යන්න පුළුවන් වාගේම දැනට කර තිබෙන සමීක්ෂණ අනුව, ඉන්ධන අතින් තුනෙන් එකක ඉතිරියක් අනිවාර්යයෙන්ම ලැබෙන බව පෙනෙනවා. අද මුළු ලෝකයම ඉන්ධන පරිභෝජනය පිළිබඳව දැවැන්තම අර්බුදකාරී තත්ත්වයකට මුහුණ පා තිබෙනවා. එම නිසා මේ මාර්ගය වැනි අධිවේගී මාර්ග සකස් කිරීම නිසා ඉන්ධන පරිභෝජනය අතිනුත් ආර්ථිකමය වශයෙනුත් විශාල වාසිදායක තත්ත්වයක් ඇති වනවා. ඒ වාගේම විශාල විදේශ විනිමය ප්‍රමාණයක් ඉතිරි කර ගන්නට පිටුවහලක් වනවා. ඒ නිසා මේ මුදල ගෙවීම ජනතාවගේ පැත්තෙන්, ආර්ථික පැත්තෙන් සහ කාලය පැත්තෙන් මොනම ආකාරයකවත් පාඩුවක් සිද්ධ නොවන බව අපි සඳහන් කරන්න ඕනෑ. විශේෂයෙන්ම මම පාර්ලිමේන්තුව නියෝජනය කරන මහජන නියෝජිතයෙක් විධියට කියන්න ඕනෑ, අපේ රටේ අධිවේගී මාර්ග පද්ධතියේ මේ එක් අධිවේගී මාර්ගයක් පමණයි කියන එක.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම අපේ ජෝන් අමරතුංග මන්ත්‍රීතුමා සඳහන් කළා, තවම කොට්ටාවේ විවිධ ප්‍රශ්න තිබෙනවා කියා. නමුත් මේ කොළඹ පිටත වටරවුම් මාර්ගය සමස්ත පද්ධතියක්. කොට්ටාවෙන් කඩුවෙලට එනවා. කඩුවෙලින් කඩවතට එනවා. කඩවතින් කටුනායක කොළඹ අධිවේගී මාර්ගයට සම්බන්ධ වනවා. මේකේ ප්‍රධාන පිවිසුම එන්නේ මහර කඩවත. ඒ වාගේම ඉදිරි යෝජිත අනෙකුත් අධිවේගී මාර්ග -නුවර කොළඹ අධිවේගී මාර්ගය, උතුරු නැඟෙනහිර ප්‍රදේශවලට යෝජිත අධිවේගී මාර්ග පද්ධතිය- ආරම්භ වන්නේ කඩවතින්. ඒ අනුව දැනට කටුනායක-කොළඹ අධිවේගී මාර්ගයත් මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය මතින් යනවා. පිටත වටරවුම් මාර්ගයේ පිවිසුමත් මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට එනවා. අනෙකුත් අධිවේගී මාර්ග පටන් ගන්නෙත් කඩවත මහරින්. ඒ අනුව අපේ රටේ ඉදිවන සියලුම අධිවේගී මාර්ගවල යම්කිසි කොටසක් හෝ නියෝජනය වන එකම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය බව මම ඉතාම සතුටින් මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න ඕනෑ. ඒ අනුව ලබන 18වන දා අතිගරු ජනාධිපතිතුමා කොළඹ පිටත වටරවුම් මාර්ගයට කඩවතදී මුල් ගල් තියලා ඒ ව්‍යාපෘතියත් කඩිනමින් ආරම්භ කරන්න මේ වන විට කටයුතු සූදානම් කර තිබෙන බව අපි ඉතාමත් සතුටින් මෙම ගෞරවණීය සභාවට මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න ඕනෑ.

අපේ රටේ ඉතිහාසය දිහා බැලුවොත්, 50 දශකයේ අපේ රටේ වාහන 80,000ක් පමණ තමයි තිබුණේ කියලා පෙනෙනවා. මේ රට ජන ඝණත්වයෙන් විශාල රටක්. එම නිසා අපි ප්‍රවාහනය පිළිබඳව විශාල අවධානයක්, බර තැබීමක් කළ යුතුව තිබෙනවා. ඒ වාගේම 50 දශකයේ ජනගහනය සිටියේ 8,000,000ක් විතර ප්‍රමාණයක්. ඒ වාගේම 70 දශකයේ වාහන තිබුණේ 1,94,000ක් විතර ප්‍රමාණයක්. ඒ වාගේම 90 දශකය වන විට මෙය 8,00,000 දක්වා පමණ වැඩි වෙලා තිබෙනවා. අද වන විට මිලියන 4කට ආසන්න වාහන ප්‍රමාණයක් අපේ රටේ ලියා පදිංචි වෙලා තිබෙනවා. ඒ වාගේම ජනගහනයත් මිලියන 20 කට ආසන්න ප්‍රමාණයක් සිටිනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එම නිසා මේ ආකාරයෙන් ප්‍රවාහනයේ ඇති වන විශාල දියුණුවත් සමඟ දැනට තිබෙන මාර්ග පද්ධති පමණක් ප්‍රමාණවත් වන්නේ නැහැ. මුළු රටේම මේ වන විට RDA එක සතු මාර්ග පද්ධති තිබෙන්නේ 12,000ක් විතර ප්‍රමාණයක්. PRDA එක සතුව 16,000ක් විතර

[ගරු ලසන්ත අලගියවන්න මහතා]

තිබෙනවා. ගණන් බලා තිබෙන අනෙකුත් මාර්ග 80,000ක් විතර සමඟ 1,10,000ක විතර මාර්ග පද්ධතියක තමයි මේ වාහන මිලියන 4 දැනට ගමන් කරන්නේ. එම නිසා මේ අධිවේගී මාර්ග පද්ධතිය නොමැති වීම නිසා ඉන්ධන පැත්තෙන්, ජනතාවගේ කාලය පැත්තෙන් ආර්ථික වශයෙන් විශාල වශයෙන් හානියකට අද රටක් විධියට අපි මුහුණ දෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ ගරු ජෝන් අමරතුංග මන්ත්‍රීතුමා විශේෂයෙන්ම රිය අනතුරු පිළිබඳව සඳහන් කළා; රියදුරු බලපත්‍ර පිළිබඳව සඳහන් කළා. ලෝකයේ සෑම රටකම රිය අනතුරු සිද්ධ වෙනවා. එහෙමයි කියලා අපේ රටේත් විය යුතුයි කියන එක නොවෙයි මම කියන්නේ. රජයක් විධියට රිය අනතුරු අවම කිරීම සඳහා විශාල පියවරයන් රැසක් ගෙන තිබෙනවා. විශේෂයෙන් ඔබතුමා රියදුරු බලපත්‍ර ගැන සඳහන් කළා. මීට අවුරුදු කිහිපයකට පෙර තිබුණු ක්‍රමය නොවෙයි අද තිබෙන්නේ. අපි මේ පාර්ලිමේන්තුවෙන් පනත් සකස් කරලා, නීති සකස් කරලා රියදුරු බලපත්‍ර ලබා දීමේදී තිබුණු අක්‍රමිකතාවන්වලට වාගේම මේ නිසා ඇති වුණු විවිධ ප්‍රශ්නවලට විසඳුම් ලැබෙන පරිදි නව රියදුරු බලපත්‍ර ලබා දීමේ ක්‍රමය අද මේ රට තුළ ක්‍රියාත්මක වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම රිය අනතුරුවලින් මිය යන සංඛ්‍යාව අපේ වැඩි වන ජනගහනයත් සමඟ, වැඩි වන වාහන සංඛ්‍යාවත් සමඟ අධ්‍යයනය කළොත් පසු ගිය අවුරුදු 20ක විතර කාලය තුළ 2,000 - 2,500 අතර ප්‍රමාණයක් මිය ගියා. ඒ වාගේම මේ පාර්ලිමේන්තුවේ අපේ දිවංගත ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ අමාත්‍යතුමාගේ සභාපතිත්වයෙන් පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් ක්‍රියාත්මක වුණා. වර්තමානයේදී අපේ ගරු දයාරත්න අමාත්‍යතුමා ඒකේ විශාල කාර්ය භාරයන් ප්‍රමාණයක් ඉටු කරනවා. මේ පාර්ලිමේන්තුවේ සියලුම දේශපාලන පක්ෂ අද මේ ප්‍රධාන ප්‍රශ්නයට විසඳුම් ලබා දීම සඳහා විශාල කාර්ය භාරයන් ප්‍රමාණයක් ඉටු කරනු ලබනවා. එම නිසා මේවා පිළිබඳව වගකීමකින් යුතුව ආණ්ඩුවක්, රජයක් විධියට අප කටයුතු කරනවා. මම හිතන්නේ මේ පිළිබඳව අපේ ජෝන් අමරතුංග මන්ත්‍රීතුමාත් මීට වඩා අවබෝධයක් ලබා ගත යුතුව තිබෙනවා කියලායි. අපි බොහොම අවංකව, සද්භාවයෙන් කියන්නේ. අපි ඔබතුමන්ලාගේ චෝදනා, විවේචන පිළිගන්නවා. ඒ වාගේම ඒ චෝදනා, විවේචනවල සැබෑ තත්ත්වයන් පිළිබඳව අපි අවබෝධයක් ලබා ගත යුතුව තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම මේ අධිවේගී මාර්ග පද්ධතිය මේ රටට උරුම කර දීමත් සමඟම විවිධ මාධ්‍යවලින්, විවිධ අයගේ කථාවලින් අපි දැක්කේ මේ පාරේ කවුරුවත් යන එකක් නැහැ කියලායි. මේ මාර්ගයේ ගියොත් අනතුරු වෙයි කියන බියක් තමයි මේ රටේ ජනතාව තුළ ඇති වුණේ. නමුත් එහෙම සිද්ධ වුණේ නැහැ. ඊයේ වන විට වාහන 6,50,000ක් විතර මේ අධිවේගී මාර්ගයේ ගිහින් තිබෙනවා. මේ අධිවේගී මාර්ගයේ දවසකට වාහන 7,000ක් විතර ගමන් කරනවා. නමුත් 200කට විතර ආසන්න රිය අනතුරු සංඛ්‍යාවක් තමයි සිද්ධ වුණේ. ඒ වාගේම එකම මරණයයි සිද්ධ වෙලා තිබෙන්නේ. මේ ප්‍රමාණයට වඩා වැඩි රිය අනතුරු ප්‍රමාණයක් දැනට තිබෙන ගාලු පාරේ සිද්ධ වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම රිය අනතුරු නිසා මිය යන ප්‍රමාණයෙන් වැඩි ප්‍රමාණයක් සිද්ධ වෙලා තිබෙන්නේත් දැනට තිබෙන ගාල්ල-කොළඹ මහා මාර්ගයේයි.

ගරු ජෝන් අමරතුංග මන්ත්‍රීතුමා කිව්වා මේ මාර්ගයේ තිබෙන සේවාව පිළිබඳව. මේ අධිවේගී මාර්ගයේ මුළු දුර ප්‍රමාණය කිලෝ මීටර් 95යි. එයට පිවිසුම් ස්ථාන 8ක් තිබෙනවා. සාමාන්‍යයෙන් ලෝකයේ කිලෝමීටර් තුන්සියය, හාරසියය තරම් දිග අධිවේගී මාර්ග තමයි තිබෙන්නේ. කිලෝමීටර් තුන් හාරසීයක් තරම් දිග අධිවේගී මාර්ගයකට පිවිසුමක් තිබෙන්නේ කිලෝමීටර් 50ක්, 100ක් වාගේ දුරකින්. නමුත් කිලෝමීටර් දහයක්, දොළහක් අතරේ තමයි අපේ මේ අධිවේගී මාර්ගයේ පිවිසුම් තිබෙන්නේ. එම නිසා කිලෝමීටර් 900ක්, 1000ක් තරම් දිග අධිවේගී මාර්ගයක තිබිය යුතු සේවාව අපේ මේ අධිවේගී මාර්ගය තුළ තිබීමේ අවශ්‍යතාවක් නැති බව බොහොම සරල උදාහරණයකින් අවබෝධ කර ගත යුතුව තිබෙනවා.

අද මේ රටේ සෑම අංශයකම ශීඝ්‍ර දියුණුවක්, සංවර්ධනයක් ඇති වෙනවා වාගේම, මාර්ග පිළිබඳව කතා කරනකොට අතිගරු ජනාධිපතිතුමාගේ මහින්ද චින්තන වැඩසටහන තුළින් වග කීමකින් යුතු සැබෑ මාර්ග සංවර්ධනයක් ක්‍රියාත්මක වෙන බව ඉතා සතුටින් ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

[අ.භා. 2.30]

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජාතික මංමාවත් පනත යටතේ ඉදිරිපත් කර ඇති නියෝග පිළිබඳව කථා කරන මේ අවස්ථාවේ, විශේෂයෙන්ම අධිවේගී මාර්ග හා ඒවාට අය කරන මුදල් පිළිබඳව තමයි සාකච්ඡා වෙන්නේ. විශේෂයෙන්ම එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරයකු හැටියට මා සතුටු වෙනවා, අධිවේගී මාර්ග සම්බන්ධයෙන් යමක් ප්‍රකාශ කරන්න ලැබීම ගැන.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ පක්ෂය තමයි හැම දාම රට ගැන ඉදිරි දැක්මක් ඇතිව හැම දෙයක්ම මුලින් ආරම්භ කරපු දේශපාලන පක්ෂය. එදා 1948 දී ඩී.එස්. සේනානායක මැතිතුමාගේ යුගයේ කෘෂි කර්මාන්ත අංශයෙන් රට සංවර්ධනය කරන්න මේ රටේ විශාල අඩිතාලමක් දැම්මා. ඒ අනුව ගල්ඔය ව්‍යාපාරය පටන් ගත්තා; ගොවි ජනපද ඇති කළා. පසු කාලයක ඒ කටයුතු කඩිනම් මහවැලි සංවර්ධන ව්‍යාපාරය දක්වා දිග්ගැස්සුණා. එවැනි දැවැන්ත සංවර්ධන වැඩ පිළිවෙළකට අපි මුල පිරුවා. අද සහලින් රට ස්වයංපෝෂිත වීම ගැන බොහෝ දෙනෙකුට කතා කරන්න ලැබුණේත් එදා ඒ මූලික අඩිතාලම දමපු නිසාය කියලා අපි කල්පනා කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ ආණ්ඩු ලිං මැඩි සංකල්පයෙන් තොරව, ලෝකය ගමන් කරන දිහාව දැකලා, මුලින්ම නිවැරදි තීන්දු තීරණ ගන්න කටයුතු කළා. ඒ අනුව තමයි එදා ලෝකයේ තෙල් බැරල් එකක් ඩොලර් 8ට, 9ට තිබෙද්දී, අල්ලපු රට වන ඉන්දියාවත් කල්පනා නොකරපු වෙලාවක ආසියාවේ පළමු වැනි තෙල් පිරිපහදුව ලංකාවේ ඇති කරන්න එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවට පුළුවන්කම ලැබුණේ. ඒ වාගේම 1977 දී විවෘත ආර්ථික ක්‍රමය ඇති කරලා, මහවැලි සංවර්ධන ව්‍යාපාරය කඩිනම් කරලා, විදුලිය උත්පාදනය කරන්න, ගමට කර්මාන්ත ගෙන යන්න අපි වැඩ කටයුතු ආරම්භ කළා.

1969 දී ඩඩ්ලි සේනානායක මැතිතුමාගේ රජය අධිවේගී මාර්ගවල අවශ්‍යතාව හඳුනා ගත්තා. කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය ආරම්භ කරන්න එදා පැවති අපේ ආණ්ඩුව මුල්ගල තැබුවා. ඒ මාර්ගය හදන්න වත්තල ආසනයේ ඔලියමුල්ලේ මුල්ගල තියලා වැඩ පටන් ගන්නකොට විවිධ විවේචන ආවා. විශේෂයෙන්ම වාමාංශික පක්ෂවල උදවිය කිව්වා, බටහිර ධනපතියන්ට සුපිරි මාර්ග හදන්න යූඑන්පී ආණ්ඩුව කටයුතු කරනවා කියලා.

ඒ අධිවේගී මාර්ගයට මුල්ගල තිබ්බා විතරක් නොවෙයි, ජනතාවට අවම හානියක් වන විධියට සියයට 80ක්ම වගුරු බිම්

ආශ්‍රිතව ඒ මාර්ගය හදන්නත් සැලසුම් සකස් කළා. ඒ වාගේම ඊට සම්බන්ධ පාලම් කීපයකුත් හැදුවා. ගරු ජෝන් අමරතුංග මන්ත්‍රීතුමාගේ ආසනයට ගිහින් බැලුවොත් අදටත් මීගහවත්ත ප්‍රදේශයේ, තොරණ හන්දියේ, නුගේ පාරේ ඒ පාලම් තිබෙන බව පෙනෙනවා. ඩඩ්ලි සේනානායක මැතිතුමා අවුරුදු ගණනාවකට ඉස්සෙල්ලා කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය ආරම්භ කරන්න හදපු ඒ පාලම් අදටත් දකින්න පුළුවන්. නමුත් අවාසනාවකට ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එදා 1970 දී සමගි පෙරමුණු රජය දේශපාලන කුහකත්වයෙන් වාගේම ළිං මැඩි සංකල්පයේ ඉඳ ගෙන, මඤ්ඤොක්කා, අල, බතල ජනතාවටත්, සුපිරි ජීවිත පාලකයන්ටත් ලැබෙන විධියේ සංකල්පයක් ආරම්භ කරපු නිසා, අවුරුදු ගණනාවකට පෙර යූඑන්පී ආණ්ඩුව සැලසුම් කරපු කොළඹ - කටුනායක අධිවේගී මාර්ගයේ කටයුතු පැත්තකට වීසි වුණා.

1996 දී චන්ද්‍රිකා කුමාරතුංග මැතිනියගේ ආණ්ඩුව කොළඹ- කටුනායක අධිවේගී මාර්ගයක අවශ්‍යතාව ගැන කථා කරන්නත්, ඒ වැඩ පටන් ගන්නත් යම් කිසි උත්සාහයක් දැරුවා අපට මතකයි. ඒ සඳහා ඉඩම් පවරා ගන්න විට ගෙවල්, පන්සල්, පල්ලි, පාසල් හසු වෙනවා කියලා ඒ යෝජනාව ක්‍රියාත්මක කරන්න ඒ වෙලාවේ පුළුවන්කමක් ලැබුණේ නැහැ. ඒ වෙලාවේත් මාර්ග සංවර්ධන අධිකාරිය නිර්දේශ කළා, 1969 දී සැලසුම් කරපු මාර්ගය තමයි මේ අධිවේගී මාර්ගය හදන්න වඩාත්ම සුදුසු කියලා. ඒත් 1969 දී පටන් ගත්ත මේ කිලෝමීටර් 25 හදා ගන්න බැරිව තමයි තට්ටු මාරු ක්‍රමයට ආපු මේ ආණ්ඩු තවමත් කථා කර කර ඉන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2001 දී රනිල් වික්‍රමසිංහ මැතිතුමා අගමැති වෙලා ආණ්ඩුවක් පිහිටුවපු වෙලාවේ දක්ෂිණ අධිවේගී මාර්ගය ආරම්භ කරන්න එතුමාට අවශ්‍යතාවක් ආවා. ඒ අනුව ඉඩම් අත් පත් කර ගත්තා; සැලසුම් හැදුවා; මුල්ගල් තියලා වැඩ ආරම්භ කළා. එහි පළමු වැනි අදියරට, මාතර ඉඳලා කුරුඳුගහ හැතැප්ම දක්වා කොටසට සියයට එකක ඉතාම අඩු පොලියට ආසියානු සංවර්ධන බැංකුවෙන් ණය ලබා ගත්තා. දෙවැනි අදියරට, කුරුඳුගහ හැතැප්ම සිට කොට්ටාව දක්වා කොටසට ජපන් සංවර්ධන බැංකුවෙන් ආධාර ගත්තා. ඉඩම් අත් පත් කර ගැනීමේදී දෙන වන්දිය දෙගුණයකින් වැඩි කරන්නත් කැබිනට් තීරණයක් අරගෙන, ඒ මාර්ගය සඳහා ඉඩම් ලබා දීපු ජනතාවට දුන් වන්දිය දෙගුණයක් කරලා ගෙවන්න එදා එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව ක්‍රියා කළා.

මගේ මතකයට අනුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එවකට හිටපු මහාමාර්ග ඇමති තිලක් මාරපන ඇමතිතුමා, වජිර අබේවර්ධන ඇමතිතුමා, මහින්ද විජේසේකර ඇමතිතුමා, ඒ වාගේම විපක්ෂයේ මන්ත්‍රීවරයකු හැටියට හිටපු රිචර්ඩ් පතිරණ මැතිතුමා සහභාගි වෙලා, - එතුමා අපට ආශීර්වාද කළා- අපි ඔක්කෝම එකතු වෙලා මේ වැඩ කටයුත්ත ආරම්භ කරන්න 2003 මාර්තු 09 වැනිදා සවස 3.00ට බද්දේගම නයාපාමුලදී සුබ මොහොතින් මුල්ගල් තිබ්බා.

2004 ජනවාරි මාසයේ මාරපන ඇමතිවරයාට පුළුවන්කම ලැබුණා කුරුඳුගහහැතැප්ම ඉඳලා බද්දේගමට නිරීක්ෂණ චාරිකාවක නිරත වෙන්න. 2007 වන විට ඒ මාර්ගයේ පළමු වැනි අදියර ඉවර කරන්න තමයි සියලුම සැලසුම් හදලා තිබුණේ. නමුත් 2004 දී අපේ ආණ්ඩුව වෙනස් වුණා. ඒ ආණ්ඩුව පෙරළුණායින් පස්සේ ඒ වැඩ සියල්ලම ඉබි ගමනින් තමයි සිද්ධ වුණේ. ඊට පස්සේ සැලසුම් සියල්ලම වෙනස් වුණා. එදා රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා අධිවේගී මාර්ගය සැලසුම් කළේ ලෝකයේ වෙනත් රටවල්වල අධිවේගී මාර්ග හදන විධිය කල්පනා කරලායි. අධිවේගී මාර්ගයේ සෑම පිවිසුම් ස්ථානයකටම කිලෝමීටර් 10ක් ආවරණය වන පරිදි නගර නිර්මාණය කරලා, කර්මාන්තපුර ඇති කරන්න තමයි එදා සැලසුම් කළේ. දක්ෂිණ අධිවේගී මාර්ගයේ සිට ප්‍රධාන මාර්ගවලට සම්බන්ධ වෙන්න පුළුවන් පාරවල් 16ක් ඒ සැලැස්මේ තිබුණා. නමුත් එදා එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේ හදාපු පාරවල් දෙකක් විතරයි මේ අධිවේගී මාර්ගය විවෘත කළාට පස්සේ අදත් දකින්න තිබෙන්නේ. මම නියෝජනය කරන බෙන්තර - ඇල්පිටිය ආසනයේ ඇල්පිටිය නගරයේ ඉඳලා අම්බලන්ගොඩ දක්වා මාර්ගයක වැඩ රුපියල් ලක්ෂ දහදාහක් වැය කරලා අවසන් කළා. පානදුර - ඉංගිරිය මාර්ගය රුපියල් ලක්ෂ හයදහසක් විතර වියදම් කරලා වැඩ අවසන් කළා. ඒ සැලැස්මේ තිබුණු අනෙක් මාර්ග සියල්ලම දැන් පැත්තකට විසි කරලා තිබෙනවා. භාගෙට වැඩ අවසන් කරලා තමයි මේ අධිවේගී මාර්ගය දැන් විවෘත කරලා තිබෙන්නේ. ඒක භාගෙට හදාපු ව්‍යාපෘතියක් හැටියට තමයි අදත් අපි දකින්නේ. අපි තියාපු මුල්ගල් දැන් පැත්තකට දමලා තිබෙනවා. ඒ සැලසුමත් වෙනස් කරලා තිබෙනවා. ඒ මාර්ගයේ වැඩ ආරම්භ කරපු අයත් අමතක කරලා, තමන්ගේ වැඩක් විධියට පෙන්නලා මේ මාර්ගය විවෘත කරපු එක විතරයි අපි දකින්නේ.

එක්සත් ජාතික පක්ෂ රජය බියගම ආයෝජන කලාපය ඇති කළා. කොක්ගල නිදහස් වෙළෙඳ කලාපය ඇති කළා. සියලුම උපනගර දියුණු කරලා, ආයෝජකයෝ ගෙනැල්ලා, කර්මාන්ත ඇති කරලා, ඒ ප්‍රදේශවල ජනතාවට රැකියා උත්පාදනය කරලා, දකුණු පළාත දියුණු කිරීමේ අරමුණ ඇතිවයි මේ අධිවේගී මාර්ග සංකල්පය අපි එදා ආරම්භ කළේ. නමුත් දැන් ඉදි කරලා තිබෙන දකුණු අධිවේගී මාර්ගයේ බොහොම ප්‍රශ්නකාරී තැන් රාශියක් අද වන කොට කතා බහට ලක් වෙලා තිබෙනවා. ශ්‍රී ලංකාවේ ගමනාගමන සැලසුම් සම්පාදන වරලත් ආයතනය - CILT - දක්ෂිණ අධිවේගී මාර්ගයේ සුරක්ෂිතභාවය ගැන සහතික කරගෙන නැති බවට චෝදනා නඟන හැටි අපි දැක්කා.

ජනතාව අතරත් බොහොම ප්‍රචලිත වෙච්ච කාරණයක් තමයි බොහෝ දෙනෙක් කොමිස් වැඩියෙන් ලබා ගැනීම නිසා -කොමිස් වැඩි වෙච්ච නිසා- මේ අධිවේගී මාර්ගය පටු වෙලා තිබෙනවා කියන එක. ජනතාව අතර එහෙම මතයක් ගොඩ නැඟිලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජාත්‍යන්තර පිළිගැනීමට අනුව අධිවේගී මාර්ගයක මං තීරුවක පළල මීටර් 3.7ක් විය යුතුයි. මං තීරුවේ පළල මීටර් 3.7ක් වියයුතු ලෙසට ජාත්‍යන්තර පිළිගැනීමක් තිබුණත් මෙතැන සැලසුම් වෙනස් වීම නිසා, මුදල් අපතේ යවපු නිසා මෙම ඉදි වෙච්ච මාර්ගයේ මං තීරුවක පළල මීටර් 3.5ට අඩු වෙලා තිබෙනවා. මේ නිසා වාහන ගමන් කරන විටත්, විශේෂයෙන්ම අධිවේගී මාර්ගයේ දී වාහනයක් ඉස්සර කරන විටත් බොහොම අනතුරුදායක තත්ත්වයක් තමයි දකින්න තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අධිවේගී මාර්ගයේ ගමන් කරන කොට වාහනයක් යම් කාර්මික දෝෂයකට ලක් වුණොත් නැවැත්වීමට තිබෙන service lane එක ජාත්‍යන්තර ප්‍රමිතියට අනුකූලව ඉදි කරලා නැහැ. වාහනයක් -කාර් එකක්- නතර කරලා දොර අරින්න අඩු තරමින් මීටර් දෙකක්වත් පළල තිබෙන්න ඕනෑ. නමුත් මේ දකුණු අධිවේගී මාර්ගයේ වාහනයක කාර්මික දෝෂයක් ඇති වුණොත් නතර කරන්න තිබෙන තීරුව මීටර් 1.75ක පළලකින් තමයි තිබෙන්නේ. මේක බොහොම අනතුරුදායකයි.

පෙරේදා "ඩේලිමිරර්" පත්‍රයේ මේ අධිවේගී මාර්ගය ගැන විස්තරයක් තිබෙනවා මම දැක්කා. ඒ අනුව මේ දක්වා වාහන 1,900ක් කාර්මික දෝෂවලට ලක් වෙලා තිබෙනවා. කාර්මික දෝෂයක් ඇති වෙලා වාහනයක් නතර කරන්න වුණොත් රියදුරාටවත් දොර ඇර ගෙන බහින්න බැරි තත්ත්වයේ අනතුරුදායක තැනක් බවට ඒක පත් වෙලා තිබෙනවා.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)

ගරු මන්ත්‍රීතුමනි, මම පොඩි පැහැදිලි කිරීමක් කරන්නම්. ඔබතුමා කිව්වා මේ දක්වා කාර්මික දෝෂවලට ලක් වුණු වාහන සංඛ්‍යාව 1,900ක් කියලා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
එහෙම නම් ඊටත් වැඩියිද?

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
කාර්මික දෝෂයක් ඇති වෙලා වාහනයක් නවත්වන්න බැහැයි කියලා ඔබතුමා කියන service lane එකේ එහෙම නවත්වන්න බැරි නම්, ඒ අය නැවැත්වුවේ කොහොමද? ඒ විධියට breakdown වුණු වාහන, tyre puncture වුණු වාහන, ඒ වාගේම තෙල් දහනය පිළිබඳව ප්‍රශ්න ඇති වුණු වාහන ගණනාවක් තිබෙනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මගේ කාලය මට ලබා දෙන්න.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
ඒ නිසා ඔබතුමා කියන කාරණය සත්‍යයක් නොවෙයි. ඒ service lane එක නිවැරදි ප්‍රමිතියට තිබෙනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
මෙතැන දී අවශ්‍ය වන්නේ අපි දෙදෙනාගේ තර්කයක් නොවෙයි. ජනතාවගේ ආරක්ෂාවයි මෙතැන දී වැදගත් වන්නේ. දැන් ඔබතුමා පිළිගන්නවාද, ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව ඒ service lane එක මීටර් දෙකක්වත් පළලට තියෙන්න ඕනෑ කියලා.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
ගරු මන්ත්‍රීතුමනි, මීට කලිනුත් මේ කාරණයම ඔබතුමාගේම පක්ෂය නියෝජනය කරන පෞද්ගලික බස් හිමියන්ගේ සංගමයක සභාපතිවරයෙක් කිව්වා. එතුමා කිව්වා, මේ මාර්ගයේ බස් ගමන් කරන්න බැහැයි කියලා. නමුත් අද එතුමාම බස් දමන්න කථා කරනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
බස් රථයක් අනතුරකට ලක් වුණොත්-

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
වාහනයක් නවත්වන්න ඒ මං තීරුව ප්‍රමාණවත් වෙලා තිබෙනවා. ඔබතුමා කියන කාරණය ප්‍රායෝගිකව අසත්‍යයි කියන එක මේ මාර්ගයේ ගමන් කරන ඕනෑ කෙනෙකුට පැහැදිලි වෙනවා. ඔබතුමා කියන්නේ සත්‍ය දෙයක් නොවෙයි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
අධිවේගී මාර්ගයක් කියන කොට අපි ජාත්‍යන්තර ප්‍රමිතිය ගැනත් අවධානය යොමු කරන්න ඕනෑ. ඒ ප්‍රමිතියට නැහැයි කියලා අද චෝදනාවක් තිබෙනවා. ඔබතුමන්ලාගේම විමල් වීරවංශ ඇමතිතුමාත් මේ ප්‍රමිතිය ගැන කියනවා.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
ඒක නියම ආකාරයට සැලසුම් කරලා, නිර්මාණය කරලා වැඩ අවසන් කරලා තිබෙනවා. මාර්ගයේ අදාළ පළල පැහැදිලිව තිබෙනවා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Member, you have only two more minutes.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමාගේ වෙලාවෙන් විනාඩි පහක් ගන්න කිව්වා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
ඔබතුමාගේ ඉතිරි විනාඩි දෙකත් තිබෙනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ පිළිතුරු කථාවේදී උත්තර දෙන්න.

කාර් එකක් නවත්වලා දොරක් ඇර ගෙන බහින්න වුණත් මීටර් දෙකක් පළල ඕනෑ. බස් එකක් හරි, කන්ටේනර් එකක් හරි වුණොත් තවත් ප්‍රශ්නයක් ඇති වනවා. ඒ නිසා කාර්මික දෝෂයක් ඇති වුණොත් නතර කරන්න ප්‍රමාණවත් මං තීරුවක්ද තිබෙන්නේ කියලා මේ මාර්ගයේ යන එන ඕනෑ කෙනකුට ප්‍රායෝගිකව දකින්න පුළුවන්. අපි දිනපතා මේ මාර්ගයේ යන එන නිසා මේවා හොඳට බලා ගෙනයි යන්නේ. ඒ වාගේම මං තීරු හයක් තිබෙන්න ඕනෑ එක දැන් මං තීරු හතරට අඩු වෙලා තිබෙනවා. ඒකෙත් පළල අඩු කරලා තිබෙනවා. ඒ නිසා කාර් විතරක් නොවෙයි, කන්ටේනර්, බස් වාගේ ඒවා යන කොට කොහොම තියේවිද කියලා තමුන්නාන්සේ හොඳට කල්පනා කරලා බලන්න.

මේ අධිවේගී මාර්ගය නිසා දැන් පවුල් 1,338ක් විතර අවතැන් වෙලා තිබෙනවා. ඒ අය පාරම්පරික නිවස, තේ, කුරුඳු, රබර් වාගේ වගාවන් සහිත ඉඩම් අහිමි කර ගත්තා. ඒ විතරක් නොවෙයි, මේ මාර්ගය හදන කාලයේ ගල් පුපුරවපු නිසා, දූවිල්ල නිසා ඒ ප්‍රදේශවල මිනිස්සු විවිධ රෝගාබාධවලට මුහුණ දුන්නා. අනපේක්ෂිතව ගංවතුර වාගේ ඒවාටත් දැන් ඒ ගොල්ලන්ට මුහුණ දෙන්න සිදු වෙලා තිබෙනවා. නමුත් අධිවේගී මාර්ගය විවෘත කරලා රක්ෂා දෙන කොට ඒ ප්‍රදේශවල ජනතාව සහමුලින්ම අමතක කර තිබෙනවා.

මම ඒ මාර්ගයේ යන කොට ටිකට් දෙන අයගෙන් අහනවා, ඒ අයගේ ගම් ප්‍රදේශය කොහේද කියලා. හැමෝම හම්බන්තොට පැත්තේ; තිස්සමහාරාමයේ, බෙලිඅත්තේ. ඒක නිසා සමහරු ඒ කේන්තියට දැන් පාරේ යන අහිංසක මිනිසුන්ට කළු ගල්වලින් ගහනවා. ඒ, කේන්තිය පිරී මහගන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ජාතික මංමාවත් පනතේ සඳහන් කරලා තිබෙනවා, අධිවේගී මාර්ගයේ අය කරන

මුදල ගැන. ඒක බොහොම වැදගත්. මොකද, ලංකාවේ මුදල් අය කරලා ගමන් කරන පළමුවැනි මාර්ගය තමයි මේ අධිවේගී මාර්ගය. ඒ අය කරන මුදල මේ මාර්ගය සඳහාම යොදවනවාද කියන ප්‍රශ්නයත් අපට අහන්න සිද්ධ වනවා. ඔබතුමාගේ පිළිතුරු කථාවේදී ඒක කියන්න. මොකද එයින් හොඳ ආදායමක් ලබනවා. මේ ආණ්ඩුවේ වැඩ දිහා බලන කොට මේක හොඳ ඉල්ලමක් කියලා හිතලා තමන්ගේ නාස්තිය, දූෂණය, ගිනි පොලියට ගත්ත ණය පියවා ගන්නත් මේවා යොදවයිද කියලා අපට සැකයක් තිබෙනවා. මේ රටේ පිරිපහදුවෙන් තමයි දැන් සියයට සියයක්ම භූමිතෙල් නිෂ්පාදනය කරන්නේ. හැබැයි සිංගප්පූරුවේ මිල පෙන්වලා තමයි අහිංසක සමෘද්ධිලාභියාගෙන්, වතුකරයේ ජනතාවගෙන්, ධීවර කාර්මිකයාගෙන් භූමිතෙල්වලට මිල අය කරන්නේ.

ඊ ළඟට මේ කාරණය ගැනත් විශේෂයෙන්ම සැලකිලිමත් වෙන්න ඕනෑ. මේ දඩ ගැසීම ඇත්ත වශයෙන්ම සිදු කරන එක හොඳයි. මොකද, මේක කොහොම හරි පාලනය කරන්න ඕනෑ. හැබැයි අද මේ ආණ්ඩුව පොලීසිවලට නියම කරලා තිබෙන්නේ "පුළුවන් තරම් දඩ ගහපන්" කියලායි. මාසය අන්තිමට මෙච්චර ප්‍රමාණයක් දඩ කොළ තිබෙන්න ඕනෑය කියලා targets දීලා තිබෙනවා. හැබැයි අපි කියන්නේ මේකයි. මේ targets දීලා දඩ ගහනවාට වඩා අද පොලීසියට සිද්ධ වෙලා තිබෙනවා පඳුරක් අස්සේ හැංගිලා ඉන්න. අද එක වංගුවක හිටියා නම් ඊ ළඟ දවසේ ඉන්නේ වෙනත් වංගුවක. හැංගිලා ඉඳලා මීටරය අල්ලලා දඩ කොළය දෙන්න තමයි අද පොලීසිය බලන්නේ. නමුත් පොලීසිය පෙනෙන්න ඉන්නවා නම් දඩ කොළය කොහොම වෙතත් වාහන නිවැරදි විධියට ගමන් කරයි. අධිවේගයෙන් ගමන් කරන එක නවතියි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒක නිසා පුළුවන් තරම්, දඩ කොළයෙන් ලැබෙන මුදලට වඩා ජනතාවගේ ආරක්ෂාව ගැන හිතන්න පියවර ගන්නය කියලා මම ඔබතුමාට කියනවා.

ඊ ළඟ කාරණය මේකයි. මේ අධිවේගී මාර්ගයේ රාජකාරි කරන පොලිස් නිලධාරින් මට ලියුමක් දුන්නා. ඒ අයට පොරොන්දු වෙච්ච හුඟක් දීමනා තවම දෙන්න පටන් ගෙන නැහැයිලු. පොලිස් නිලධාරින් 300 ගණනක් විතර මෙය කියනවා. ඒ ගොල්ලන්ට අධිවේගී මාර්ගයේ රස්සාව කරන කොට විශේෂ රක්ෂණයක් ලබා දෙනවාය කියලා කිව්වාලු. ඒවා දැන් අමතක වෙලාය කියලා විවිධ කතා තිබෙනවා. ඒවා පිළිබඳවත් සොයා බලන්නය කියලා මා ඔබතුමාට කියනවා. රජයේ හැම එකකටම බදු ගහනවා වාගේ හෙට අනිද්දා පෙට්‍රල් වැඩි වුණාම ඒක පිට දාලා අධිවේගී මාර්ගයේ ගණන් වැඩි කරයිද කියලා අපි දන්නේ නැහැ. මොකද, මේ ජාතික මංමාවත් පනතේ ඒවා පැහැදිලි කරලා නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ නිසා අපි කියනවා දූෂණ සිද්ධ වෙලා, කොමිස්වලට ගිහිල්ලා, සැලසුම්ගත මුදලට වඩා අසීමිත මුදලක් ගෙවලා සෑහෙන කලක් ගත වෙලා ප්‍රමිතියෙන් තොරව නියමිත පළලවත් නැතිව හදපු පාරකටයි මේ ජනතාව මෙච්චර මිලක් ගෙවන්නේ, ඒ නිසා හිතුණු හිතුණු වෙලාවට ඒවායේ ගණන් වැඩි කරන්නේ නැතිව ක්‍රියා කරන්නය කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මහාමාර්ග ගැන කථා කරන කොට අද මේ රටේ නාස්තිය, දූෂණය සිදු වෙන ප්‍රධානම තැනක් බවට මාර්ග පත් වී තිබෙනවාය කියා ජනතාව අතර මතයක් තිබෙනවා. අපි දැක්කා, පාර්ලිමේන්තුවේදී සමහර පාරවල්වලට ගිය වියදම් ගැන ප්‍රශ්න අහන කොට දී තිබෙන උත්තර. ඒවා රත්තරන්, රිදී කලවම් කරලා හදපු පාරවල්ද කියලා සැක හිතෙන විධියට තමයි අපට ඒ උත්තර ලබා දී තිබෙන්නේ. ඒ කාලයේ අපේ ආණ්ඩු තියෙන කොට පාරවල් හදන විට සියයට 40ක් විතර ජනතා සහභාගිත්වයට අඩු කරලා තමයි මුදල් වෙන් කළේ.

අද තමුන්නාන්සේලා ගමක පාරක් හැදුවත් සමෘද්ධි නිලධාරියාට එහෙම නැත්නම් ප්‍රාදේශීය දේශපාලනඥයාට කොන්ත්‍රාත් දීලා අඩි 14 පාර අඩි 11ට 12ට තමයි කොන්ක්‍රීට් කරලා තිබෙන්නේ. ඉතින් ගමේ පාර හදනවාට වඩා ගමේ දේශපාලනඥයින්ට හම්බ කර ගන්න පාර හදන එක තමයි අද බොහෝ දුරට සිද්ධ වෙන්නේ කියලා ලොකු චෝදනාවක් හැම පැත්තෙන්ම ඇහෙනවා. ඒ වාගේම තමුන්නාන්සේලා නිතරම කියන්නේ මේ පාරවල් හදන හැටි පෙනෙන්නේ නැද්ද, පාලම් හදන හැටි පෙනෙන්නේ නැද්ද කියලා තමයි. දැන් තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ බලවතුන් විවිධ අවස්ථාවලදී කියනවා අපි මේ රටේ භාරකරුවන් මිස අයිතිකරුවන් නොවෙයි කියලා. හැබැයි ගිනි පොලියට ණය අරගෙන රටම ණය උගුලක දමලා තියෙන විධිය බලන කොට නම් හරියට භාරකාරයා හැටියට නොවෙයි අයිතිකාරයෙක් හැටියට තමයි ක්‍රියා කරලා තිබෙන්නේ කියලා අපට පෙනෙන්න තිබෙනවා.

2010 මග නැඟුමට රුපියල් මිලියන තුන්දාහක් වෙන් කළා. මෙයින් වැඩ ඉවර කරලා තිබෙන්නේ මාර්ග කිලෝමීටර් 703ක විතරයි. හැබැයි හරියට කළා නම් ප්‍රමිතියෙන් යුතු පාරවල් කිලෝමීටර් 985ක් හදන්න තිබුණා කියලා වග කිව යුතු උදවිය ප්‍රකාශ කරලා තිබෙනවා. ඒ නිසා මම ඔබතුමාගේ අවධානයට යොමු කරනවා, මාර්ග සංවර්ධනය හරහා සංවර්ධනය වුණේ කවුද, ණයකාරයෝ වෙලා තියෙන්නේ කවුද කියන එක පිළිබඳවත් අවබෝධයක් අරගෙන මේ වැඩ කටයුතුවලට මුදල් යොදවන්නය කියලා.

අධිවේගී මාර්ගයේ පවා සිදු වූ රිය අනතුරකින් මේ වෙන කොට එක ජීවිතයක් අහිමි වෙලා තිබෙනවා. තවත් අනතුරු ගණනාවක් මේ වෙන කොට වාර්තා වෙලා තිබෙනවා. අපට ඇසුණා ගරු ඇමතිතුමාත් සඳහන් කරනවා, -අපේ ගරු ලසන්ත අලගියවන්න නියෝජ්‍ය ඇමතිතුමාත් මේ පිළිබඳව කථා කළා.- ගිය වසරේ -2011 දී- රිය අනතුරු විශාල සංඛ්‍යාවක් සිදු වෙලා තිබෙන බව. මාර්ගවල සිදු වුණු අනතුරුවලින් පාසල් දරුවන් පමණක් 233 දෙනෙක් මිය ගිහින් තිබෙනවා. මාර්ගවල සිදු වන අනතුරුවලින් මිය ගිය සම්පූර්ණ සංඛ්‍යාව 2,697ක් කියලා මේ වාර්තාවල තිබෙනවා. ඒ නිසා මේ අධිවේගී මාර්ගයේ-

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි, ඔබතුමා විනාඩි පහක් වැඩිපුර අරගෙන තිබෙනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එහෙනම් මම දැන් කථාව අවසන් කරන්නම්.

අවසාන විනාඩියේ මම මේ කාරණයත් කියන්න ඕනෑ. මේ අධිවේගී මාර්ගය ප්‍රමිතියෙන් තොරවයි හදලා තිබෙන්නේ. මේ වෙන කොට එයින් විශාල ආදායමක් ලබලා තිබෙනවා. මම හිතන හැටියට පෙරේදා වෙන කොට එයින් රුපියල් මිලියන 176ක ආදායමක් ලබා තිබෙනවා. කරුණාකරලා මේ දඩ කොළය ගැනම විතරක් හිතන්නේ නැතිව මිනිසුන්ගේ ආරක්ෂාව පිළිබඳව මීට වඩා කටයුතු කරන්න. විශේෂයෙන්ම වාහන එලවන රියැදුරන්ට පොඩි පත්‍රිකාවක් වාගේ එකක් දෙනවා නම් හොඳයි. මොකද මුලින්ම අධිවේගී මාර්ගයේ යන කොට පත්‍රිකාවක් දුන්නා. ඒකෙන් අප හුඟාක් දැනුවත් වුණා. නැත්නම් එක ළඟ වාහන ඉස්සර කරනවා. එහෙම පත්‍රිකාවක් දුන්නොත් හුඟක් අනතුරු වළක්වා ගන්න පුළුවන් කියන එකත් මතක් කරමින්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට කථා කරන්න අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

[අ. භා. 2.50]

**ගරු (පූජ්‍ය) එල්ලාවල මේධානන්ද හිමි**
(மாண்புமிகு (வண.)எல்லாவல மேதானந்த தேரர்)
(The Hon. (Ven.) Ellawala Medhananda Thero)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජාතික මංමාවත් පනත යටතේ නියෝග පිළිබඳව කෙරෙන විවාදයේදී ඒ ගැන වචන ස්වල්පයක් කථා කරන්න අවස්ථාව ලැබීම පිළිබඳව මා සන්තෝෂ වෙනවා.

විශේෂයෙන් රටක සංවර්ධනය ගැන කථා කරන විට ඒ රටේ මාර්ග පද්ධතිය විවිධ අංශයෙන් සංවර්ධනය කිරීම අත්‍යවශ්‍යයි. එහි එක් පියවරක් වශයෙන් මා කල්පනා කරනවා, මේ අධිවේගී මාර්ග පද්ධතිය මේ රටේ ක්‍රියාත්මක කිරීමේ පළමුවෙනි පියවර තබා තිබෙන බව. අපේ රටේ මාර්ග ඉතිහාසය ගැන කල්පනා කරන කොට, ලෝකයේ නොයෙක් රටවල බොහෝ අතීතයට අපේ අවධානය යොමු කළොත්, ඉන්දියාවේ ඉන්දු නිම්න ශිෂ්ටාචාරයෙන් හමු වී තිබෙන ඒ නෂ්ටාවශේෂ පරීක්ෂා කරන බලන කොට දියුණු මාර්ග පද්ධතියක් ඒ ශිෂ්ටාචාරය තුළ තිබුණු බව අපට පේනවා.

අපේ රටේ මාර්ග පද්ධතිය පිළිබඳව කථා කරන විට, මාර්ග ඉතිහාසය පිළිබඳව කථා කරන විට අපේ රටේත් ජනාවාස ආරම්භයේ සිට මේ රටේ සංවර්ධනයේ එක ව්‍යාපෘතියක් හැටියට මාර්ග පද්ධතිය දියුණු කිරීමේ කටයුතු කර තිබෙන බව අපේ ඉතිහාසය තුළ ලියැවී තිබෙනවා. බොහෝ දෙනෙක් කල්පනා කරන්නේ, බොහෝ තැන්වල කථා කරන කොට අපට ඇහෙන්නේ මේ නවීන මාර්ග ක්‍රම, මාර්ග විධි, මාර්ග සකස් කරන ක්‍රමය විදේශිකයන්ගේ ආක්‍රමණ නිසා, නැත්නම් අපේ රට විදේශිකයන්ට යටත් වීමෙන් පස්සේ -ලංකාව එංගලන්තයට යටත් වුණාට පස්සේ- අපේ රටේ මාර්ග පද්ධතිය ඉදි කරලා තිබෙන්නේ සුද්දන් විසින් කියන එක. ඒක සම්පූර්ණ වැරැදි කථාවක්. සුද්දෝ කළේ අපේ මාර්ග විනාශ කරපු එක. ඔවුන් මාර්ග හැදුවා. ඒ මාර්ග ඔවුන් හැදුවේ අපේ සංස්කෘතික අංග, අපේ ආර්ථිකයේ අංග විනාශ කරමින්. නිදර්ශනයක් වශයෙන් කිව්වොත්, අනුරාධපුරයේ සිට ත්‍රිකුණාමලයට යන පාර ඔවුන් හැදුවේ මහා විශාල වැවක් මැද්දෙන්, ඒ වැව විනාශ කරලායි. මඩකළපුවේ ඉඳලා පේරාදෙණියට දළු ගෙනියන්න -ඒ ගොල්ලන්ගේ පෞද්ගලික ප්‍රයෝජනයට- ඉංග්‍රීසීන් පාර හැදුවේ -මහ ඔය හරහා එන පාර; ඒ කියන්නේ පේරාදෙණිය පාර- බෞද්ධ සිද්ධස්ථාන කඩලා, ඒවායේ තිබුණු ගල් කණු, ගල් පුවරු ආදිය අරගෙන පාලම්වලට දමලායි.

අපේ ආර්ථික හා සංස්කෘතික අංග විනාශ කරමින් තමයි ඒ කටයුතු සිදු කර තිබෙන්නේ. ඒ බව අපේ ඉතිහාසයේ ලියැවී තිබෙනවා. නමුත් ක්‍රිස්තු පූර්ව තුන්වන සියවස තරම් අතීත යුගයකදීත් මාර්ග කටයුතු පිළිබඳ අධ්‍යක්ෂවරයෙක් අපේ රටේ සිටියායි කියලා ශිලා ලේඛනවල සඳහන් වනවා. මේ රටේ මාර්ග නිර්මාණය කිරීම පිළිබඳව, මාර්ග තනන, මාර්ග තැනීම පිළිබඳව වග කීම භාරව සිටි මාර්ග කටයුතු පිළිබඳ අධ්‍යක්ෂවරයෙක් ක්‍රිස්තු පූර්ව තුන්වන සියවසේ පමණ අපේ රටේ සිටි බව අපේ ශිලා ලේඛනවල සඳහන් වෙලා තිබෙනවා. ඒක වැදගත් ප්‍රවෘත්තියක්.

අතීතයේ සිටි ඒ නිලධාරින් තුළ පවා මාර්ග සංවර්ධනය පිළිබඳව තිබුණු දක්ෂතාව දැනට ලංකාවේ ඉතිරි වෙලා තිබෙන මාර්ග අධීක්ෂණය කිරීමෙන් අපට තේරුම් ගන්නට පුළුවන්කම තිබෙනවා. එදා යාපනයේ සිට අනුරාධපුරය දක්වා එන්නට තිබුණු පාර, මන්නාරමේ සිට අනුරාධපුරය දක්වා එන්න තිබුණු පාර, ඒ වාගේම දෙවුන්දර තුඩුවේ සිට යාපන තුඩුව දක්වා ගමන් කරන්න තිබුණු මාර්ග, කෝට්ටේ රාජධානිය කාලයේ පවා අපේ පොත පතේ සඳහන් වන ඒ මාර්ග, ඒ වාගේම රෝහණයේ සිට අනුරාධපුරය දක්වා ගමන් කරන්න තිබුණු මාර්ග පිළිබඳව අපේ වංශ කථාවල, ඉතිහාස පොත පතේ සඳහන් වෙලා තිබෙනවා. අපේ මාර්ග නිර්මාණය පිළිබඳව තිබුණු, කලාත්මකභාවය, සුරක්ෂිතතාව සහ ශක්තිමත්භාවය නිරූපණය කරන ඕනෑම කෙනෙකුට අවබෝධ කර ගන්නට පුළුවන් හොඳම අවස්ථාවක් තමයි -හොඳම නිදර්ශනයක් තමයි- රිටිගල කන්ද පාමුල සිට කන්ද මුදුනට නැඟීමට සකස් කර තිබෙන පාර. වටරවුම් සහිත එම මාර්ගය විශ්මය සහගත නිර්මාණයක්. වර්තමාන මාර්ග දියුණුව පිළිබඳ කථා කරන විට මීට ශත වර්ෂ ගණනාවකට පෙරාතුව අපේ රටේ එබඳු දියුණු මාර්ග පද්ධතියක් ක්‍රියාත්මක කරලා තිබුණු බව අපට පැහැදිලිව පෙනෙනවා. ඒ නිසා අපේ රටේ මාර්ග දියුණුව සහ මාර්ග ආරම්භය අද ඊයේ පටන් ගත් එකක් නොවෙයි.

වර්තමාන සමාජය දිහා බලන විට යාන වාහන වැඩි වන විට, ඒ වාගේම ජනතාව වැඩි වන විට, ජනතාවගේ කාලය බොහෝ කටයුතුවලට යෙද විය යුතු වකවානුවක අපට අවශ්‍ය වනවා, වඩාත් සංවර්ධනය වුණු මාර්ග පද්ධතියක්. එහි පළමු පියවර තමයි අධිවේගී මාර්ග හැටියට දැන් ක්‍රියාත්මක කර ගෙන යන වැඩසටහන.

මේ මාර්ග ගැන කථා කරන කොට කිව යුතු තවත් කරුණක් තමයි දැනට අප රට තුළ තිබෙන වාහන ප්‍රමාණයට දැනට අප රට තුළ තිබෙන මාර්ග පද්ධතිය කිසිසේත් ප්‍රමාණවත් වන්නේ නැහැයි කියන එක. සාමාන්‍යයෙන් කොළඹ නගරයට පිවිසෙන ඕනෑම මාර්ගයක් බැලුවොත් එය තේරුම් ගත හැකියි. ගාල්ල පැත්තෙන් එන මාර්ගය බැලුවත්, මීගමුව පැත්තෙන් එන මාර්ගය බැලුවත්, රත්නපුර පැත්තෙන් එන මාර්ගය බැලුවත්, ඒ වාගේම මහනුවර පැත්තෙන් එන මාර්ගය බැලුවත් -කොළඹ නගරයට පිවිසීමට තිබෙන මේ ප්‍රධාන මාර්ග බැලුවොත් - දැන් තිබෙන වාහන ප්‍රමාණයේ හැටියට සහ මහ ජනතාවගේ ප්‍රමාණයේ හැටියට මේ මාර්ග ප්‍රමාණවත් වන්නේ නැහැයි කියන එක කියන්න ඕනෑ. ඒ නිසා මේ මාර්ග පද්ධතිය විවිධ ක්‍රමවලින් සංවර්ධනය කරන්නට අවශ්‍යයි.

අනතුරු සිදු වීමට හේතු වන ප්‍රධාන කරුණක් තමයි මේ මාර්ග භාවිත කිරීමේදී -අධිවේගී මාර්ගය කෙසේ වෙතත් අනෙකුත් මාර්ගවල- රියැදුරන් මාර්ග නීති හරිහැටි ක්‍රියාත්මක නොකිරීම. අපි දැකලා තිබෙනවා, වාහනයක් තවත් වාහනයකට ඉස්සර කරන්නට එන විට රියැදුරාට නියමිත පැත්තෙන් ඉස්සර කරන්නේ නැතුව, දකුණත් භාවිත කරමින් වමත් භාවිත කරමින් ඉස්සර කරන්නට යනවා. ඒ නිසා මහා බරපතළ හානි සිද්ධ වන ආකාරය අපට පෙනෙනවා. අන්න ඒ නිසා ඒ පිළිබඳවත් අවධානය යොමු කළ යුතුව තිබෙනවා. රියැදුරන් විසින් මාර්ග නීති අනුගමනය නොකර, මාර්ග නීති කඩ කරමින් තමන්ගේ වාහනය ඉස්සර කර ගෙන යෑමට ගන්නා උත්සාහයන්, මාර්ග අනතුරු බොහෝ සෙයින් වැඩි වීමට හේතු වෙලා තිබෙන බැවින් ඒ ගැන යම් කිසි ක්‍රියා මාර්ගයක් ගැනීමට අවශ්‍ය බවත් මා කියා සිටිනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම අධිවේගී මාර්ග තැනීමෙන් පසු ඒවායේ ගමන් කරන වාහනවලින් විශේෂ මුදලක් අය කිරීම අත්‍යවශ්‍ය කාරණයක්. අපේ රට දැනට හුරු වෙලා තිබෙනවා හුඟක් දේවල් නොමිලයේ ලබා ගන්න. මේක මේ රටේ පරිහානියට එක ලකුණක් හැටියටයි මා නම් දකින්නේ. නොමිලයේ ලැබෙන විට නොමිලයේ ලැබෙන දෙයෙහි කිසිම අගයක් නැතිව යනවා. අපේ රටේ දැන් බොහෝ විට බොහෝ දේවල් නොමිලයේ දෙනවා. පාසල් සිසුන්ට පොත් නොමිලයේ දෙනවා; ඇඳුම් නොමිලයේ දෙනවා; සමෘද්ධිය දෙනවා; බෙහෙත් ටික නොමිලයේ දෙනවා; අධ්‍යාපනය නොමිලයේ දෙනවා. තවත් නොයෙක් විධියේ නොමිලයේ දෙන ඒවා අපේ රටේ තිබෙනවා. මේ කාරණය නිසා ජනතාව තුළ තිබෙන ආකල්පය සතුටුදායක අන්දමට වර්ධනය වෙලා නැහැ කියන එකයි මා කියන්නේ. රටේ දියුණුවට හේතු වන පරිදි ජනතාවගේ ආකල්ප වර්ධනය වෙලා නැහැ කියායි මා කල්පනා කරන්නේ.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Order, please! Hon. (Ven.) Ellawala Medhananda Thero, please wind up.

**ගරු (පූජ්‍ය) එල්ලාවල මේධානන්ද හිමි**
(மாண்புமிகு (வண.)எல்லாவல மேதானந்த தேரர்)
(The Hon. (Ven.) Ellawala Medhananda Thero)

හොඳයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

මා විශේෂයෙන් සඳහන් කරනවා අධිවේගී මාර්ගය සම්බන්ධයෙන් දැනට අය කරන මුදලට වැඩි මුදලක් අය කළත් ප්‍රශ්නයක් නොවෙයි කියලා. පහසුකම් සලසන විට ඒ පහසුකම් ඉදිරියට පවත්වා ගෙන යාමටත්, එම මාර්ගය නඩත්තු කිරීමටත් ආදායමක් අවශ්‍ය නිසා එබඳු ක්‍රියා මාර්ගයක් අනුගමනය කිරීම සුදුසුයි කියන එකයි මගේ වැටහීම. මේ රටේ අධිවේගී මාර්ගය ඇතුළු මාර්ග පද්ධතියම දියුණු කිරීම සඳහා වර්තමාන ජනාධිපතිතුමාගේ මෙහෙයවීම මත ක්‍රියාත්මක වන මේ වැඩ පිළිවෙළ අප අගය කරන අතර එයට පක්ෂ විපක්ෂ භේදයක් නැතිව සියලු දෙනාගේම සහයෝගය ලැබෙනු ඇතැයි අපේක්ෂා කරමින් මම නිහඬ වෙනවා.

[අ. භා. 3.01]

**ගරු ජයන්ත කැටගොඩ මහතා**
(மாண்புமிகு ஜயந்த கெடகொட)
(The Hon. Jayantha Ketagoda)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජාතික මංමාවත් පනත යටතේ නියෝගයි අද සාකච්ඡාවට බඳුන් වන්නේ. ජාතික මාවතක් හැටියට නම් කරලා තිබෙන අධිවේගී මාර්ගයේ ගාස්තු අය කිරීම පිළිබඳව කථා කරන අවස්ථාවේ විශේෂයෙන්ම මතක් කළ යුතු කාරණයක් තිබෙනවා. අධිවේගී මාර්ගය ඇති කරන්නට මූලික වෙච්ච, මා එවකට නියෝජනය කරපු එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව ඒ කටයුතු ආරම්භ කරලා ඉදිරියට ගෙන යන්න විශාල කාර්ය භාරයක් කළා. අද ඒ අධිවේගී මාර්ගයේ කටයුතු අවසන් කරලා එහි ප්‍රතිඵල ජනතාවට දෙන අවස්ථාව. ගාස්තුව වශයෙන් රුපියල් 400ක් වැනි මුදලක් අය කරලා දැනට එම මාර්ගය පාවිච්චි කිරීමට ඉඩ සලසා දී තිබෙනවා. නමුත් අපි දකිනවා තවත් විශාල අඩු පාඩු රැසක් දවසකට දෙකකට සැරයක් මාධ්‍ය මඟින් අනාවරණය වන ආකාරය. එම මාර්ගය තුළ සතුන් පීඩාවට පත් වෙනවා. ඒ හේතුවෙන් වාහනවලටත්, මගීන්ටත් විශාල ගැටලු සහගත තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ඉදිරියේදී ඒවා ක්‍රමක්‍රමයෙන් මඟ හරවමින්, විශේෂයෙන්ම ජනතාවට ආරක්ෂිතව ඒ මාර්ගයේ ගමන් කිරීම සඳහා අවශ්‍ය කටයුතු කළ යුතුය කියන මතයේ අපි ඉන්නවා. ඒ සඳහා වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කර ගෙන යනවා කියලා අපේ ඇමතිවරු නිතර නිතර කියනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අධිවේගී මාර්ගය තුළ පළමුවැනි මරණය මීට ටික දවසකට ඉස්සර වෙලා සිදු වුණා. අධිවේගී මාර්ගය අප කාටත් අලුත් අත් දැකීමක්. අද අධිවේගී මාර්ගයේ විතරක් නොවෙයි සාමාන්‍ය මාර්ගවල පවා ඉතාම අවිනීත සහ අපරීක්ෂාකාරී ලෙස වාහන ධාවනය කරනවා. අවුරුද්දක් ගණනේ ගණන් බලන කොට අනතුරු රාශියක් සිදු වී තිබෙන බව අපට දකින්න ලැබුණා. ගරු ජෝන් අමරතුංග මන්ත්‍රීතුමාත් මේ පාර්ලිමේන්තුව තුළ එම සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කළා. අධිවේගී මාර්ගයේ ඒ මරණය සිදු වුණේ කොහොමද කියන එක සම්බන්ධයෙන් අවධානය යොමු කර අප ඉදිරි කාලය තුළදී පාඩම් ඉගෙන ගත යුතු වෙනවා. මාර්ගවලට අදාළ වේග සීමා තිබෙනවා. ඒ සීමාවන් ඉක්මවලා යන නිසා තමයි බොහෝ දුරට අනතුරු සිද්ධ වෙලා තිබෙන්නේ.

විශේෂයෙන්ම අධික ලෙස මත්පැන් පානය කරලා අධිවේගී මාර්ගයේ පිවිසුම් දොරටුවලින් එම මාර්ගයට පිවිසෙනවා නම්, ඇතුළු වීම සඳහා අදාළ ටිකට් පත නිකුත් කරන විටම ඒ තත්ත්වය හඳුනා ගැනීමට යම් කිසි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා නම් ඉතාමත් වටිනවා. මොකද, ඒ අයට අධිවේගී මාර්ගයට ඇතුළු වීමට ඉඩ නොදී නීත්‍යානුකූලව කටයුතු කරන්න සූදානම් කළොත් ඒ අය අධිවේගී මාර්ගයට ඇතුළු වන්නේ නැහැ. සමහර අය රාත්‍රී කාලයේ භෝජන සංග්‍රහවලට ගිහිල්ලා රෑ දෙක තුන වන කල් සම්භාෂණයේ යෙදිලා ගෙදරින් දුරකථන පණිවුඩ දෙක තුනක් දුන්නාම විනාඩි පහෙන් ගෙදර යන්න හදනවා. විනාඩි පහෙන් ගෙදර යන්න ගියාම තමයි අනතුරු සිද්ධ වන්නේ. විනාඩි පහෙන් ගෙදර යන්න පිටත් වුණාම පරලොව තමයි යන්න සිද්ධ වෙන්නේ. එහෙම ගිය අය අපි දැකලා තිබෙනවා. ඒ නිසා විශේෂයෙන්ම රියැදුරා මත් පැන් පානය කරලා පිවිසුම් දොරටුවලින් අධිවේගී මාර්ගයට ඇතුළු වෙනවා නම් එසේ ඇතුළු වීම වැළැක්වීම සඳහා විශේෂ අවධානයක් යොමු කරලා, රථ වාහන පොලිසියේ සහයෝගයත් අරගෙන අවශ්‍ය කරන නීති රාමුවක් හදලා කටයුතු කරන්න කියලා ඉල්ලීමක් කරනවා.

ගරු පාලිත තෙවරප්පෙරුම මන්ත්‍රීතුමාගේ මතුගම නිවසට යන්න මමත් ඒ මාර්ගයේ එක් වතාවක් ගියා. පාර මැද්දේ වැටක් ගහලා තිබෙනවා. බල්ලෝ ඒ වැට අයිනට වෙලා ඉන්නවා. කොයි වෙලාවේ පනීද කියලා දන්නේ නැහැ. ඔවුන් ඉන්නවා පෙනි පෙනී අපි යනවා. මාර්ගයෙන් ආදායම ලැබෙන කොට සතුන්ට ඇතුළු වීමට නොහැකි වන අන්දමට ඒවා ආවරණය කිරීමට ඇමතිතුමන්ලා කටයුතු කරාවි කියලා අපි බලාපොරොත්තු වෙනවා.

ඒ එක්කම ඒ පාරට අමතරව ඉදිරියේදී කොළඹ වටරවුම් පාර, මීගමු පාර, නුවර කොළඹ මාර්ගය ජාතික මාවත් විධියට නම් කරන්නත් පුළුවන් වේවි. අපට දැන ගන්න අවශ්‍යතාවක් තිබෙනවා, අනෙකුත් මාර්ගත්, සාමාන්‍යයෙන් A-9 වාගේ මාර්ගත් අනාගතයේදී මේ ගණයට ඇතුළත් කරනවාද කියලා. මොකද, එහෙම ඇතුළත් කළොත් රියැදුරන්ට ගෙවීමක් කරලා තමයි එන්නට වෙන්නේ.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)

අධිවේගී මාර්ගයට පමණයි ඒ ගාස්තු අය කිරීම අදාළ වෙන්නේ. අනෙකුත් ජාතික මාර්ගවලට සහ වෙනත් මාර්ගවලට ඒක අදාළ වෙන්නේ නැහැ.

**ගරු ජයන්ත කැටගොඩ මහතා**
(மாண்புமிகு ஜயந்த கெடகொட)
(The Hon. Jayantha Ketagoda)

එහෙම නම් හොඳයි. මොකද, කඩුවෙල අපේ ප්‍රදේශය දක්වාත් අධිවේගී මාර්ගයේ පිවිසුම් මාර්ග ඇවිල්ලා තිබෙනවා. විශේෂයෙන්ම අධිවේගී මාර්ගය ඔස්සේ පැයකින්, විනාඩි 45කින්, පැය භාගයකින් ඇවිල්ලා එතැනින් එහාට කොළඹ දක්වා ගමන් කරන කොට තවත් පැය එකහමාරක් දෙකක් ගත වන තත්ත්වයක් තිබෙනවා. විශේෂයෙන්ම මා නියෝජනය කරන කඩුවෙල ආසනයේ මාලඹේ සිට කඩුවෙල දක්වා උදේ වරුවටත්, හවස් වරුවටත් ජනතාව පැය එකහමාරක් දෙකක් පාරේ රස්තියාදු වෙනවා.

විශේෂයෙන්ම ගම්පහ දිස්ත්‍රික්කයේ බියගම පැත්තේ ඉඳලා එන වාහන බෙල්ල කපාපු හන්දියටත් එහා කිලෝ මීටර් තුන හතරක දුර ඇති වන වාහන පෝලිම නිසා සැහෙන්න වෙලාවක් එක තැන නවත්වා ගෙන ඉන්න සිදු වනවා. මෙයින් පීඩාවට පත් වන්නේ කඩුවෙල ආසනයේ ජනතාව විතරක් නොවෙයි. කොළඹ-නුවර අලුත් පාර හැටියට සලකන කඩුවෙල ප්‍රධාන මාර්ගයේ

[ගරු ජයන්ත කැටගොඩ මහතා]

වාහන තදබදය ඇති වුණාට පස්සේ පැය දෙක තුනක කාලයක් වාහන එක තැන නවත්වා ගෙන මගී ජනතාව පසු තැවෙමින් ඉන්නවා. එතකොට ඉන්ධන විශාල ප්‍රමාණයක් වැය වෙනවා. විශාල වශයෙන් engines ගෙවී යනවා. ඒ නිසා විශේෂයෙන්ම බත්තරමුල්ලේ සිට මාලබේ දක්වා මාර්ගය වෙනුවට වෙනත් විකල්ප මාර්ග නිර්මාණය කරන ලෙස ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. බත්තරමුල්ලේ සිට අතුරුගිරිය පැත්තට යනවා නම් පැලවත්ත හරහා පොතුඅරාව පාර පුළුල් කරලා ඒ මාර්ගය පාවිච්චි කරන්න පුළුවන්. මාලබේ මංසන්ධිය පසු කරලා යන වාහනවලට මාලබේ ප්‍රධාන මාර්ගයට අමතරව විකල්ප මාර්ගයක් තිබෙනවා නම් හොඳයි. මෙතැන ඉන්න මන්ත්‍රීවරු, ඇමතිවරු ඒ වාහන තදබදයට නිරන්තරයෙන්ම අහු වෙලා ඇති.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)

කඩුවෙල සිට කඩවත දක්වා අධිවේගී මාර්ගයක් ඉදි කරන්න මේ මස 18වැනි දා අපි වැඩ ආරම්භ කරනවා. ඒ වාගේම කොට්ටාව සිට කඩුවෙල දක්වාත් මේ වන විට කොළඹ පිටත වටරවුම් මාර්ගයේ වැඩ අපි ආරම්භ කරලායි තිබෙන්නේ.

**ගරු ජයන්ත කැටගොඩ මහතා**
(மாண்புமிகு ஜயந்த கெடகொட)
(The Hon. Jayantha Ketagoda)

කඩුවෙල මංසන්ධිය තුළ තිබෙන තදබදය නවත්වන්න ඒ මාර්ග උපයෝගී වෙයිද?

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)

පැහැදිලිව උපයෝගී වෙනවා.

**ගරු ජයන්ත කැටගොඩ මහතා**
(மாண்புமிகு ஜயந்த கெடகொட)
(The Hon. Jayantha Ketagoda)

මොකද අවිස්සාවේල්ල ප්‍රධාන මාර්ගයත්,-

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)

කඩුවෙල සිට කඩවත දක්වා ගමන් කරන මාර්ගය තුළ ඔබතුමා කියන ඔය තදබදයට පිළියමක් විධියට තමයි ඒක කරන්නේ.

**ගරු ජයන්ත කැටගොඩ මහතා**
(மாண்புமிகு ஜயந்த கெடகொட)
(The Hon. Jayantha Ketagoda)

මම විතරක් නොවෙයි, හැන්දෑවට ඔබතුමන්ලා වුණත් ඒ පාරේ ගියොත් හිර වේවි. ඇමතිවරුන්ට නම් ප්‍රශ්නයක් නැහැ, සියලුම මාර්ග නීති කඩ කරලා අත පය දාලා වාහන ටික අයින් කරලා යන්න පුළුවන්. විශේෂයෙන්ම මේ මාර්ග හැදුවා වාගේම ඒ මාර්ගවල යන පිරිසට මේ පාර්ලිමේන්තුවෙන් ආදර්ශයක් දිය යුතුය කියලා මම හිතනවා. මාර්ග නීති අනවශ්‍ය විධියට කඩා බිඳ දමමින් ඇමතිවරුන්ගේ වාහන පාරේ ගමන් කරන කොට ඒ පස්සෙන් තවත් වාහන යනවා. අපි ඒක හොඳට දැකලා තිබෙනවා. අපේ රියදුරාත් සමහර වෙලාවට කියනවා, "නැහැ, ඒක ගියා නම් අපිත් පස්සෙන් යන්න ඕනෑ" කියලා. විශේෂයෙන්ම මේ උත්තරීතර පාර්ලිමේන්තුව රටට ආදර්ශයක් දෙන ස්ථානයක් හැටියට, මන්ත්‍රීවරු සහ ඇමතිවරු පාරේ ගමන් කරන කොට ඒ විනය රටේ ජනතාවට පෙන්විය යුතුයි; අපි යන්නෙත් නියමාකාරයෙන් කියන පණිවුඩය දිය යුතුයි. ගරු ඇමතිතුමනි, ඒක තමයි ආදර්ශය වෙන්න ඕනෑ. සියලුම මාර්ග නීති කඩා බිඳ දමමින් ආරක්ෂක නිලධාරින්, ඒ ආරක්ෂක වාහන පාරේ තිබෙන වාහන තල්ලු කරන් තමයි යන්නේ. එවැනි කටයුතු නොකර මාර්ග නීති ආරක්ෂා කිරීමේ ආදර්ශය පාර්ලිමේන්තුවෙන් දිය යුතුයි කියලා මම හිතනවා. සමහර විට උත්සවයකට යන්න පුළුවන්; සමහර විට වෙනත් හදිසි කටයුත්තකට යන්න පුළුවන්. නමුත් එහෙම යන්න තිබෙනවා නම් ජනතාවට වැරදි ආදර්ශයක් නොදී වේලාසනින් ගියා නම් හොඳයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම හිතන්නේ රථ වාහන සම්බන්ධයෙන් රථ වාහන පොලිසියක් රටේ වෙනම ඇති කළ යුතුය කියායි. විශේෂයෙන් පාරේ රථ වාහන හසුරුවන ඒ නිලධාරින් සෞඛ්‍ය වශයෙනුත් ඉතා දුර්වල තත්ත්වයකට පත් වෙනවා. මොකද මේ වාහනවල තිබෙන දුමාරය වැඩියෙන්ම ගිල ගන්නේ ඒ රථ වාහන හසුරුවන පොලිස් නිලධාරින්. අපි දකිනවා,-

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

ගරු මන්ත්‍රීතුමා, රථ වාහන සම්බන්ධයෙන් වෙනම අංශයක් තිබෙනවා. ඒ ගොල්ලන් තමයි ඒ රාජකාරි හරියට කරන්නේ.

**ගරු ජයන්ත කැටගොඩ මහතා**
(மாண்புமிகு ஜயந்த கெடகொட)
(The Hon. Jayantha Ketagoda)

ඔබතුමා කියන එක ඇත්ත. පොලිසියේ රථ වාහන අංශයක් තිබෙනවා. නමුත් රටේ ජනතාවට රථ වාහන පිළිබඳ වෙනම පොලිසියක් -වෙනම ඒකකයක්- ඇති කරනවා නම් හොඳයි. දැන් ඔබතුමා කියන කථාව ඇත්ත. නමුත් කාටහරි දඩයක් ගැහුවොත්, licence එක ගත්තොත් ඒ මනුස්සයා මාතර නම් ඒ මනුස්සයා දවස් තුනක් එන්න ඕනෑ, රථ වාහන අංශයේ කවුරු හරි හම්බ වෙන්න. දවස් තුන, හතරක් රස්තියාදු වෙන්න වෙනවා, දඩය ගෙවලා තමන්ගේ licence එක ගන්න. එහෙම නොවෙයි විය යුත්තේ. මොකද ඒ නිලධාරියා තවත් තැනකට යවනවා. මම හිතන්නේ, රථ වාහන පිළිබඳව විතරක්-

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

එක රටකට පොලිසි දෙකක් තිබෙන්න බැහැ. එක පොලිසියයි තිබෙන්නේ.

**ගරු ජයන්ත කැටගොඩ මහතා**
(மாண்புமிகு ஜயந்த கெடகொட)
(The Hon. Jayantha Ketagoda)

ඒ පොලිසියේම තමයි රථ වාහන පොලිසියක්-

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

සමහර අය වෙනම පොලිසියක් ඉල්ලන්නේ. ඒ වාගේ එකක්ද?

**ගරු ජයන්ත කැටගොඩ මහතා**
(மாண்புமிகு ஜயந்த கெடகொட)
(The Hon. Jayantha Ketagoda)

ඔබතුමා වරද්දා ගෙනයි දහලන්නේ. මම කියන්නේ, ඒ පොලිසියේම වෙනම රථ වාහන ඒකකයක් ගැනයි.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
තිබෙනවා.

**ගරු ජයන්ත කැටගොඩ මහතා**
(மாண்புமிகு ஜயந்த கெடகொட)
(The Hon. Jayantha Ketagoda)
මොකද පොලිසිවල ඉන්න රථ වාහන අංශයේ නිලධාරින් අනෙකුත් වැඩවලට අනුයුක්ත කරනවා. අපි දන්නවා, එහෙම කළාම පොලිසියේ ස්ථානාධිපතිලා බොහොම අසීරුතාවට පත් වෙනවා කියලා. ඒ නිලධාරින් පාරේ රාජකාරිවලට දාන්න විධියක් නැහැ. වෙන වෙන උත්සවවලට යවනවා; ආරක්ෂක කටයුතුවලට යවනවා. ඒකයි මම මේ ඔබතුමාට පැහැදිලි කරන්නේ. ඒ සඳහා,-

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
DIG ඉන්නවා. Traffic Police SPලා ඉන්නවා. Traffic Police Sergeantsලා ඉන්නවා.

**ගරු ජයන්ත කැටගොඩ මහතා**
(மாண்புமிகு ஜயந்த கெடகொட)
(The Hon. Jayantha Ketagoda)
ඒ අය උඩින් ඉන්නේ. මම මේ කියන්නේ පාරේ රාජකාරි කරන අය ගැනයි. Traffic Police SP පාරට වෙලා ඉන්නේ නැහැ නේ. පාරේ වාහන හසුරුවන අය ගැනයි මම කථා කරන්නේ. යම් කිසි වැරැද්දක් කරලා වාහනයකට දඩයක් නියම කළාට පස්සේ ඒ අය ඒ දඩය ගෙවලා පොලිසියට ගියාම තමන්ගේ හැඳුනුම්පත හරි, රියදුරු බලපත්‍රය හරි ලබා ගන්න හැකියාවක් තිබෙන්න ඕනෑ.

අද පොලිසිවලට ගිහිල්ලා ඒ අය රස්තියාදු වෙනවා. ඒ නිසා ඒ කටයුතු සඳහායි මම මේ කියන්නේ. ඔබතුමා වරද්දා ගන්න එපා. ඒ සඳහා අපි යම් කිසි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතුයි. මේ දියුණු වන රටේ, ඔබතුමන්ලා කියන විධියට ආශ්චර්ය කරා යන ගමන් මගේ, ඒකට යම් කිසි වැඩ පිළිවෙළකුයි මම මේ යෝජනා කරන්නේ. තමුන්නාන්සේලා ඒ පිළිබඳව කල්පනා කර බලාවිය කියා මා හිතනවා. අපි දන්නවා, මිනිසුන් විශාල වශයෙන් රස්තියාදු වෙන බව. අපටත් ඇවිල්ලා කියනවා, "දවස් තුන හතරක් පොලිසියට ගියා, licence එක අරන් දෙන්න කෝ" කියලා. ඒ නිලධාරින්ගේ වැරැද්දකුත් නොවෙයි. ඒ නිලධාරින් වෙන වෙන වැඩවලට යොදවලා. උත්සවයක් තිබුණොත් නැත්නම් වෙනත් කටයුත්තක් තිබුණොත් ඒ අය යවනවා. ඒ වාහන පාලනය කිරීම සම්බන්ධව පමණක් යම් කිසි පිරිසක් අනුයුක්ත කරලා ඒ කටයුතු කළොත් වැදගත් වෙනවා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! Hon. Member, you have to wind up now.

**ගරු ජයන්ත කැටගොඩ මහතා**
(மாண்புமிகு ஜயந்த கெடகொட)
(The Hon. Jayantha Ketagoda)
මොකද, ඒ නිලධාරින් පාරේ ඉඳගෙන අපා දුකක් විඳිනවා. අපි යන්නේ වාහනවල AC දාගෙන, කවුළු වහ ගෙන. ඒ අය තමයි අපේ වාහනවල දුමාරයත් ආශ්වාස කරන්නේ. ඒ නිසා ඒ අය කරන විශේෂ කැපවීම වෙනුවෙන් දීමනාවක් ගෙවිය යුතුයි. ඒ ගැනත් අවධානය යොමු කරන්නය කියලා ඉල්ලමින්, මාළඹේ - කඩුවෙල මාර්ගය සම්බන්ධයෙනුත් කඩිනම් පියවරක් ගන්නය කියලා ඉල්ලීමක් කරනවා. විශේෂයෙන් මේ රටේම ජනතාව ඒ පාරවල් පරිහරණය කිරීමෙන් විශාල අපහසුතාවකට පත් වෙලා තිබෙනවා. ඒ ගැනත් ඔබතුමාගේ අවධානය යොමු කරලා කඩිනමින් විසඳුමක් ලබා දෙනු ඇතැයි අපි විශ්වාස කරනවා. ස්තුතියි.

[අ. භා. 3.15]

**ගරු පී. දයාරත්න මහතා (ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு பீ. தயாரத்ன - உணவுப் பாதுகாப்பு அமைச்சர்)
(The Hon. P. Dayaratna - Minister of Food Security)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පසු ගිය වර්ෂයේ නොවැම්බර් 27වැනි දා මේ රටේ ප්‍රවාහන ක්ෂේත්‍රයේ විශාල වෙනසක් ඇති කරවමින් අතිගරු ජනාධිපතිතුමා අතින් අපේ පළමුවැනි දක්ෂිණ අධිවේගී මාර්ගය විවෘත වුණා. ඒ ගැන අපි සියලු දෙනාම ආඩම්බර වනවා. අපි කවුරුත් අද ඒ පිළිබඳව සතුටු වනවා කියලා මා හිතනවා. ඇත්ත වශයෙන්ම මේ අධිවේගී මාර්ගයේ කොටසක් සම්පූර්ණ කර තිබෙන මේ අවස්ථාවේදී විශේෂයෙන්ම එම අධිවේගී මාර්ගය පාවිච්චි කරන රියදුරන්ගෙන් -රථවාහන අයිතිකරුවන්ගෙන්- යම් කිසි මුදලක් අය කිරීම සඳහා රෙගුලාසි පනවන්නට අතිගරු ජනාධිපතිතුමා ඇමතිවරයා වශයෙන් ඉදිරිපත් කර තිබෙන නියෝග පිළිබඳව සාකච්ඡා කරන්නටයි අද අපි සියලු දෙනාම රැස්ව සිටින්නේ.

මේ අධිවේගී මාර්ගය තවදුරටත් දීර්ඝ කරන්නට පුළුවන්කම තිබෙනවා. ඇත්ත වශයෙන්ම අනාගතයේ දී තවත් ප්‍රධාන ගුවන් තොටුපොළක් ඇති වන, ඒ වාගේම දෙවැනි ප්‍රධාන වරාය ඇති වන හම්බන්තොට දක්වා මේ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමෙනුත් අනාගතයේ දී මේ රටේ ආර්ථිකයට විශාල පිටුවහලක් ඇති වන බවට අප තුළ විශ්වාසයක් තිබෙනවා.

අධිවේගී මාර්ගය නඩත්තු කිරීම සඳහා විශාල මුදලක් වැය වනවා. සාමාන්‍ය මහා මාර්ගයක් නඩත්තු කිරීම සඳහාත් මුදල් වැය වනවා. නමුත් ඊට වඩා විශේෂ මුදලක් මේ සඳහා වැය වන්නට, නැත්නම් වියදම් කරන්නට සිදු වෙලා තිබෙන්නේ ඒ ගමන් කරන අය වෙනුවෙන්මයි. ඒ අයගේ ආරක්ෂාව සැලසීම සඳහා, ඒ වාගේම තමන් බලාපොරොත්තු වන ස්ථානය කරා වේගයෙන් යන්නට ඒ පාරවල් ඒ ආකාරයෙන් සකස් කර තිබිය යුතු නිසා විශාල මුදලක් වැය වනවා.

විශේෂ පොලිස් කණ්ඩායමක් ඒ මාර්ගයට යොදවලා, ගිලන් රථ යොදවලා, ඒ වාගේම පණිවුඩ හුවමාරු කිරීමේ පහසුකම් ඇති කරලා, හදිසි අනතුරක් සිදු වුණොත් ඒ හදිසි අනතුරට භාජනය වන උදවිය සුදුසු ස්ථානවලට ගෙන යාම සඳහා අවශ්‍ය පහසුකම් සලස්වන්නට කටයුතු කරලා තිබෙනවා. ඉතින් සාමාන්‍යයෙන් ලෝකයේ හැම තැනම අධිවේගී මාර්ග පවත්වාගෙන යන ආකාරයට අපිත් ඒ කටයුත්ත අද ක්‍රියාත්මක කරන්නට ඇත්ත වශයෙන්ම මහජනතාව වෙනුවෙන් බැඳී සිටිනවා. ඒ නිසා ඒ වෙනුවෙන් යම් කිසි මුදලක් අය කිරීම පිළිබඳව කිසිවෙකුගේ විරුද්ධත්වයක් නැහැ කියලා මා හිතනවා. විශේෂයෙන්ම අපි ඒ දිහා බලනකොට ඒ අය කරන මුදල බොහොම ලෙහෙසියෙන්ම අපට සොයා ගන්නට පුළුවන්. තමන්ගේ ගමන වේගයෙන් අවසන් කිරීම නිසා කාලය ඉතිරි කරගන්නටත්, ඒ වාගේම ඉන්ධන විශාල ප්‍රමාණයක් ඉතිරි කර ගන්නටත් අපිට ඒ අධිවේගී මාර්ගය නිසා අවස්ථාව සැලසෙනවා.

මේ අධිවේගී මාර්ගයෙන් මුදල් අය කිරීම කිසිසේත්ම අධිවේගී මාර්ගයට වියදම් කළ මුදල සොයා ගන්නට කරන උත්සාහයක් නොවෙයි. එවැනි දෙයක් කොයි රටකවත් සිදු වන්නේ නැහැ. මා හිතන හැටියට මේ අධිවේගී මාර්ගය සඳහා රුපියල් බිලියන 70ක පමණ විශාල මුදලක් දැනට වියදම් කරලා තිබෙනවා.

එම මුදල මහ ජනතාවගේ පහසුව සඳහා, විශේෂයෙන්ම ආර්ථිකයේ වර්ධනය සඳහා ඉවහල් වන නිසා තමයි ඕනෑම රටක

[ගරු පී. දයාරත්න මහතා]

මේ වාගේ මාර්ග ඇති කරලා ඒවා නඩත්තු කරන්නට කටයුතු කර ගෙන යන්නේ. මේ වන කොට ඒ මාර්ගයේ ආදායම විශාල මුදලක් එකතු වෙලා තිබෙන බව ගරු නියෝජ්‍ය ඇමතිතුමා ප්‍රකාශ කළා. ඇත්ත වශයෙන්ම ආරම්භක අවස්ථාවට වඩා බොහෝ දෙනෙක් දැනට මේ මාර්ගය පාවිච්චි කරනවා; එම මාර්ගය ජනප්‍රිය වෙලා තිබෙනවා. එම නිසා අපට හිතෙනවා, අනාගතයේදී තවත් විශාල පිරිසක් මේ මාර්ගය පාවිච්චි කරන්නට උනන්දු වේවි කියලා.

අපි මේ අධිවේගී මාර්ගයේ වැඩ කටයුතු ආරම්භ කළේ කුරුඳුගහහැතැප්මෙන්. ඒ කාලයේ බොහෝ දෙනෙක් ප්‍රශ්න කළා, මේ අධිවේගී මාර්ගය කොළඹ පැත්තෙන් පටන් ගන්නේ නැතුව කුරුඳුගහහැතැප්මෙන් පටන් ගන්නට හේතුව මොකක්ද කියලා. ඇත්ත වශයෙන්ම ඒ කථාවේ තේරුමක් තිබෙනවා. මොකද, විශේෂයෙන්ම ප්‍රධාන නගරය කොළඹ වන නිසා. ඒ නිසා කොළඹ සිට පිට වන්නයි මේ වාගේ මාර්ගයක් අවශ්‍ය වන්නේ. එම නිසා කුරුඳුගහ හැතැප්මෙන් ආරම්භ කරපු එක පිළිබඳව ප්‍රශ්න කළා. නමුත් එදා ඒ ආකාරයට කටයුතු කරන්නට සිද්ධ වුණේ, අපට ඒ සඳහා ආධාර ලබා දෙන යම් යම් ආයතනවල අදහස් අනුවයි. විශේෂයෙන්ම ඒ කොටසේ ඉඩම් පවරා ගැනීමේ වැඩ කටයුතු යනාදිය ඉතා ඉක්මනින් සිද්ධ වුණා. එම නිසා ඒ කොටසේ වැඩ කටයුතු අවසන් කරන්න පුළුවන් වුණා.

ඇත්ත වශයෙන්ම අපේ ක්‍රමානුකූල සැලැස්මක් නැත්තේ නැහැ. කොහොම වුණත් අධිවේගී මාර්ගයට තිබෙන පිවිසුම් මාර්ග සම්බන්ධයෙන් අද එක්තරා ප්‍රශ්නයක් පැන නැඟිලා තිබෙනවා.

අද ප්‍රධාන වශයෙන්ම කොළඹ - අවිස්සාවේල්ල -රත්නපුර මාර්ගයේ, හෝමාගමට කිට්ටු ස්ථානයකින් තමයි මේ අධිවේගී මාර්ගයට ඇතුළු වන්නේ. මේ මාර්ගය කලින් සකස් වෙන්නට තිබුණු මාර්ගයක්. මා දන්නවා, මාර්ග සංවර්ධන අධිකාරියේ ඉංජිනේරු මහත්වරු ඒ ආකාරයෙන් ක්‍රියාත්මක කරන්නට යෝජනා කළ බව. නමුත් යම් යම් හේතු නිසා ඒ ආකාරයෙන් කටයුතු සිදු වෙලා නැහැ. සමහර විට ඒ අවස්ථාවලදී ඒ ඒ රජයන් ගත්ත තීන්දු නිසා එසේ සිද්ධ වුණා වෙන්න පුළුවන්. කෙසේ වුවත් ප්‍රධාන පිවිසුම් මාර්ගය දැනට සකස් වෙමින් පවතිනවා. නමුත් ඒ පිවිසුම් මාර්ගය සකස් වන ආකාරය අනුව, අද තිබෙන වාහන ප්‍රමාණය අනුව එයත් මදි වෙයි කියලා මා හිතනවා.

මේ අධිවේගී මාර්ගයේ පිවිසුම් මාර්ග හතරක් විතර තිබෙනවා. මේ පිවිසුම් මාර්ග හතරේ වැඩ කලින් අවසන් කරලා තිබුණා නම්, විශේෂයෙන් කොළඹ වට රවුම මාර්ගයේ වැඩ කලින් අවසන් වෙලා තිබුණා නම්, මෙය බොහොම ක්‍රමානුකූල වැඩ පිළිවෙළක් බවට පත් වනවාය කියලා මා හිතනවා. මොකද, ඒ පිවිසුම් මාර්ග හතරෙන් පිට වෙලා, වට රවුම් මාර්ගයට ඇතුළු වෙලා, දක්ෂිණ අධිවේගී මාර්ගයට හෝ උතුරට යන මාර්ගයකට පිවිසෙන්නට හැකියාව තිබුණා. නමුත් හැම විටම ඒ වැඩ කටයුතුවලදී ප්‍රශ්න මතු වුණේ, අපට ආධාර කරන, ඒ සඳහා මුදල් යොදවන්නට බලාපොරොත්තු වන ආයතනවල යම් යම් අදහස් නිසා බව අපට දැන ගන්නට ලැබෙනවා.

මේ අධිවේගී මාර්ගය විවෘත වීමෙන් පසුව, කොට්ටාවට එන පිවිසුම් මාර්ගයට අමතරව දෙවනුවට තිබෙන කොළඹ - හොරණ පිවිසුම් මාර්ගයේ අද බරපතළ විධියට වාහන විශාල ප්‍රමාණයක් තිබෙන බව අපි දකිනවා. නමුත් ඒ මාර්ගයේ කිසිම සංවර්ධනයක් සිදු වෙලා නැහැ. අන්න ඒ හේතුව නිසා අද කොළඹ - හොරණ මාර්ගයේ කහතුඩුව දක්වා මාර්ගයේ අවහිරකම් රාශියක් තිබෙනවා. සවස් වරුවේ කොළඹ සිට එම ස්ථානයට ඇති හැතැක්ම 15ක් -කිලෝමීටර් 25ක් පමණ- යන්න හුඟක් දෙනකුට පැය දෙකකට වඩා කාලයක් ගත වනවා.

මේක විශාල ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. මීට කලිනුත් හැම දාම මේ මාර්ගය හවසට අවහිර වෙනවා. දැන් ඒ මාර්ගය මං තීරු හතරක් දක්වා පුළුල් කිරීමට -කොළඹ සිට කහතුඩුව දක්වා- යෝජනා වෙලා තිබෙනවා. නමුත් තවම ඒ පිළිබඳව කටයුතු සිදු වන බවක් පෙනෙන්නට නැහැ. මම දන්නේ නැහැ ඒ වැඩ ආරම්භ වෙන්නේ කවදාද කියලා. නමුත් අපි දන්නා තරමින් නම් එවැනි කටයුත්තක් ළඟදී ක්‍රියාත්මක වෙයි කියලා පෙනෙන්නට නැහැ. විශේෂයෙන්ම ඒ මාර්ගයේ අවහිරකම් හවස් වරුවේ තමයි ඇති වෙන්නේ. උදේ වරුවේත් ඒ වාගේමයි. මම ඒ බව දැක තිබෙනවා. මොකද, එය අපි නිතර යන එන මාර්ගයක් නිසා. විශේෂයෙන්ම අධිවේගී මාර්ගය විවෘත කළාට පස්සේ ඒ මාර්ගයේ වාහන විශාල ප්‍රමාණයක් ගමන් කරන බව අද අපි දකිනවා. ඒක නිසා ඉක්මනින්ම ඒ හොරණ - කොළඹ මාර්ගය මං තීරු හතරකින් හෝ සකස් කිරීම අවශ්‍යයි. ඒ මාර්ගය ඒ ආකාරයට සකස් වෙනවා නම් උදේ වරුවේ සහ සවස් වරුවේ ඇති වන වාහන තද බදය හුඟක් දුරට අඩු කර ගන්න පුළුවන් වෙයි කියලා මම හිතනවා. (4th Start)

අද මේ රටේ වාහන විශාල ප්‍රමාණයකින් වැඩි වෙලා තිබෙනවා. පසු ගිය වර්ෂය තුළ මේ රටට අලුතින් ගෙන්වා ලියා පදිංචි කරන ලද වාහන ප්‍රමාණය 5,25,000යි. මිලියන හතරහමාරකට වැඩි වාහන ප්‍රමාණයක් අද මේ රටේ පාරවල්වල ගමන් කරනවා. මේ විධියට වාහන වැඩි වීමත් සමඟම පාරේදී විශාල මරණ සංඛ්‍යාවක් සිදු වෙලා තිබෙන බව අපි පසු ගිය කාලය තුළදී දැක්කා. මීට ඉස්සෙල්ලා කථා කළ ගරු ජෝන් අමරතුංග මන්ත්‍රීතුමා කිව්වා, එක අවුරුද්දක ශිෂ්‍ය ශිෂ්‍යාවන් 300කගේ ජීවිත වාහන අනතුරු නිසා නැති වුණා කියලා. ඒක සත්‍යයක්. ඇත්ත වශයෙන්ම ඒ අනතුරු වැඩි වීම නතර කර ගැනීම අපේ යුතුකමක්.

පසු ගිය කාලය තුළදී ශීඝ්‍රයෙන් ඉහළ යන රථවාහන අනතුරු පිළිබඳව කරුණු විමර්ශනය කිරීම සඳහා පාර්ලිමේන්තුවේ පත් කරන ලද විශේෂ කාරක සභාව මේ පිළිබඳව විශාල අධ්‍යයනයක් කරලා තිබෙනවා. අපි මාස කිහිපයක් සාකච්ඡා කරලා විමර්ශන වාර්තාවක් පිට කළා. එය ගරු ජනාධිපතිතුමාටත් ඉදිරිපත් කරලා යම් යම් යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා අවසන් වාර්තාව දැනට සකස් කර ගෙන යනවා.

අපි දැක්කා පසු ගිය වර්ෂයේ අනතුරු 2,400ක් පමණ. වාහන වැඩි වීමත් සමඟ මේ වර්ෂයේ ඊට වඩා වැඩි වෙනවා නම් ඒ තත්ත්වය ඉතාම භයානකයි. අද පාරවල් විශාල ප්‍රමාණයක් හොඳට සකස් වෙලා තිබෙන නිසාම වාහන හුඟක් වේගයෙන් යනවා. ඒ වේගය නිසා තමයි හුඟක් දුරට අනතුරු සිදු වෙන්නේ. ඒ එක්කම තවත් කාරණා කීපයක් අපි දකිනවා. විශේෂයෙන්ම ඒවා තමයි රථයක් පදවන අතර cell phones නැත්නම්, hand phones පාවිච්චි කිරීම. බීමත්ව රථ පැදවීම. ඒ වාගේ දහසක් හේතු නිසා මාර්ග අනතුරු සිදු වන බව අපි සොයා ගෙන තිබෙනවා. ඒවා පිළිබඳව පොලීසියත් සමඟ හුඟක් දුරට අපි කටයුතු කරනවා. ඒ වාගේම වාහනවල තත්ත්වය පිළිබඳව සොයා බැලීම අඩුයි. ලොරි සහ බස් රථවල තත්ත්වය පිළිබඳව සොයා බැලීමක් තිබෙනවා. නමුත් සාමාන්‍ය බර අඩු වාහනවල, වෑන් හා කාර් වැනි ඒවායේ තත්ත්වය පිළිබඳව වර්ෂ කීපයකට වරක් සොයා බැලීමක් සිදු වෙන්නේ නැහැ. ඒ නිසා අපි ඒ පිළිබඳව අලුත් නීති, අණපනත් සකස් කරලා ඒවා ක්‍රියාත්මක කරන්නට යෝජනාවක් පාර්ලිමේන්තුවට ගෙනෙන්නට බලාපොරොත්තු වෙනවා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Minister, now please wind up.

**ගරු පී. දයාරත්න මහතා**
(மாண்புமிகு பீ. தயாரத்ன)
(The Hon. P. Dayaratna)

මේ අවස්ථාවේදී මේ වචන ස්වල්පය කථා කරන්නට ලැබීම ගැන සතුටු වෙනවා.

අධිවේගී මාර්ගය මහ ජනතාව වැඩි වැඩියෙන් ප්‍රයෝජනයට ගන්නා අවස්ථාවේදී ප්‍රවේශමෙන් ඒ කටයුත්ත කිරීම වඩා හොඳයි කියා අප හැම විටම යෝජනා කරන බව ප්‍රකාශ කරමින් මම නවතිනවා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

The next speaker is the Hon. Ajith P. Perera. You have 10 minutes.

[අ.භා. 3.29]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු පී. දයාරත්න අමාත්‍යතුමාගේ කථාවෙන් පසුව මට මේ විවාදයට සහභාගි වන්නට ලැබීම ගැන මා බෙහෙවින්ම සතුටු වෙනවා. මීට මාස කිහිපයකට කලින් එතුමා මේ ගෞරවනීය සභාවේදී අය වැය විවාදයට සහභාගි වෙමින් අධිවේගී මාර්ග ගැන කථා කළා මට මතකයි. අධිවේගී මාර්ගයේ සැලසුම්වල තිබෙන යම් යම් අඩු පාඩුකම් ගැන එතුමා ඉංජිනේරුවරයකු හැටියටත්, ඒ පිළිබඳව ප්‍රායෝගික දැනුමක් තිබෙන කෙනකු හැටියටත් එතුමාගේ නිරීක්ෂණයන් මේ ගරු සභාවේදී ඉදිරිපත් කළා. එම නිසා එතුමාගේ ඉතා වටිනා අදහස්වලින් පසුව මට කථා කරන්නට ලැබීම සතුටක්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙම මාර්ගයේ තිබෙන වටිනාකම පිළිබඳව අප කවුරුත් ප්‍රායෝගිකව අත් දැක තිබෙනවා. මම අදත් බණ්ඩාරගම සිට පාර්ලිමේන්තුවට පැමිණෙන්නට පාවිච්චි කළේ මේ අධිවේගී මාර්ගයයි. හැබැයි මේ අධිවේගී මාර්ගය සැලසුම් කිරීමේදී ඒ මුල් සැලසුමෙන් බැහැර වීම නිසා ඇති වෙලා තිබෙන ප්‍රශ්න දිහා බැලුවාම විශේෂයෙන්ම හදිසියකදී මාර්ගය අයිනේ වාහනයක් නතර කිරීම සඳහා ඇති කර තිබෙන මං තීරුවේ පළල මදිකම නිසා ඇති වී තිබෙන ප්‍රශ්නය ඒ විධියටම තිබෙනවා. ඒකට විසඳුමක් ලැබෙය කියා අපට පෙනෙන්නට නැහැ.

අධිවේගී මාර්ගය අයිනේ හදිසියේ වාහනයක් නතර කරන්නට සිද්ධ වුණොත්, ඒ වාහනයෙන් කොටසක් අධිවේගී මාර්ගයේ එක තීරුවක් තුළයි නතර වන්නේ. හදිසියකදී වාහනයක් නතර කිරීමට තිබෙන්නේ අඩි හතරක් පමණ පළල තීරුවක්. වාහන විශාල ප්‍රමාණයක් දැන් මේ අධිවේගී මාර්ගයේ ගමන් කරනවා. බස් රථ ගමන් කරනවා. ඒ තත්ත්වය යටතේ අනතුරු සිදු වීමේ ප්‍රවණතාව වැඩි වෙලා තිබෙනවා. මේ ගැන ඉක්මනින්ම අවධානය යොමු කළ යුතුය කියන කාරණය මා මතක් කරන්නේ සුහදවාදීව සහ ඒ පිළිබඳව රජයේ අවධානය ලක් කිරීමේ අදහසිනුයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු දයාරත්න ඇමතිතුමා ඉතාම වැදගත් ප්‍රශ්නයක් ගැන අවධානය යොමු කළා. අනාගතයේදී මේ මාර්ග සැලසුම් කිරීමේදී වැදගත් වන, ඒ වාගේම දැනට තිබෙන ප්‍රශ්න ඉක්මනින් විසඳා ගැනීමට වැදගත් වන නිරීක්ෂණයන් කිහිපයක් පෙන්වා දුන්නා. එතුමා සඳහන් කළා, කහතුඩුව ප්‍රවේශය සිදු වන ස්ථානයේ තිබෙන ඉතාම දැඩි තදබදය ගැන. මා එතුමාත් එක්ක සියයට සියයක් එකඟ වෙනවා. වෙනදා කොළඹ සිට හොරණට යන්න, කොළඹ සිට කැස්බෑව හරහා බණ්ඩාරගමට යන්න උදයටත්, සවසටත් අධික කාලයක් ගත වෙනවා. අප පාසල් යන කාලයේ තිබුණු පාරමයි තවමත් තිබෙන්නේ. අතිවිශාල ජනගහනයක් ඉන්න මේ ප්‍රදේශවලට ඒ වාගේම වැඩි වැඩියෙන් අලුතෙන් නිවාස ඉදි කරන මේ ප්‍රදේශවලට ගමන් කිරීම සඳහා කොළඹ සිට හොරණ දක්වා සහ කැස්බෑව සිට බණ්ඩාරගම දක්වා වන මේ මාර්ග සකස් කිරීම පිළිබඳ විශේෂ ප්‍රමුඛතාවක් ලබා දිය යුතුය කියන කාරණය මා කියන්නට අවශ්‍යයි. වරාය හා මහාමාර්ග පිළිබඳ උපදේශක කාරකසභාවේදී මම මේ ප්‍රශ්නය අතිගරු ජනාධිපතිතුමාගේ අවධානයට යොමු කළා. හැබැයි අතිගරු ජනාධිපතිතුමා ඒ අවස්ථාවේ මේ සඳහා ප්‍රමුඛතාවක් දෙන බව කිව්වත් දැන් වසරකටත් වැඩි කාලයක් ගත වෙලා. තවමත් එහි මූලික කටයුතුවත් ආරම්භ වෙලා නැහැ. අඩු ගණනේ කැස්බෑවේ සිට කහතුඩුව ප්‍රවේශය පසු වන තුරු ඒ ප්‍රමාණයවත් පුළුල් කළොත් යම් තරමකින් හෝ අර bottleneck තත්ත්වය වළක්වා ගන්නට පුළුවන්. මුළු පාරම හදන්න කාලය ගත වන නිසා, අඩු ගණනේ ඒ කිලෝ මීටර් තුන හතරක ප්‍රමාණයවත් පුළුල් කිරීමෙන් යම්තාක් දුරකට මේ ප්‍රශ්නය ඉක්මනින් විසඳා ගැනීමට පුළුවන්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම මෙම උපදේශක කාරක සභාවේ අවධානයට මම මීට කලිනුත් ප්‍රශ්නයක් යොමු කළා. ප්‍රාදේශීය සංවර්ධන කමිටුවේ අවධානයත් මා මේ සඳහා යොමු කළා. මේ රටේ තිබෙන ප්‍රධාන මාර්ගයක් වන A-8 මාර්ගයේ, පානදුර -රත්නපුර මාර්ගයේ ගැලනිගම ප්‍රවේශය තිබෙන ස්ථානයේ දී හොරණ සිට පානදුර දෙසට ගමන් ගන්නා වාහන කිසිම හේතුවක් නැතිව, එක වාහනයක්වත් අධිවේගී මාර්ගයේ සිට A-8 මාර්ගයට ප්‍රවේශ වන්නේ නැතිව විනාඩි ගණනක් එකක් පස එකක් නතර කර ගෙන ඉන්න සිදුවී තිබෙනවා. ඒකට හේතුව මේකයි. හොරණ ඉඳලා පානදුර දක්වා තිබෙන්නේ එක මං තීරුවක් පමණයි.

පානදුර ඉඳලා හොරණ දෙසට මං තීරු දෙකක් තිබෙනවා. අධිවේගී මාර්ගයට හැරෙන තැන වාහන නතර වී තිබියදී අනෙක් වාහනවලට ගමන් කරන්න පුළුවන්කම තිබෙනවා. හැබැයි, ඉදිරියෙන් ඇති රථයක් අධිවේගී මාර්ගයට හැරුණත් නැතත්, හොරණ පැත්තෙන් නැත්නම් රත්නපුර සිට පානදුර දෙසට ගමන් ගන්නා වාහනවලට එකක් පස එකක් නතර කර බලා ගෙන ඉන්න ඕනෑ. මාර්ගය විවෘත කරන්න කලින් මම මේ කාරණය පිළිබඳව කිව්වා. ඒ ප්‍රදේශයේ ජීවත් වන කෙනෙක් විධියට, භූමිය දන්නා කෙනෙක් විධියට, අනාගතයේ මේ මාර්ගය නිසා ප්‍රදේශයේ ඇති වන දියුණුව පිළිබඳ ඉදිරි දැක්මක් තිබෙන කෙනෙක් විධියට මා මේ කාරණය කිව්වා. කියන්න කනගාටුයි ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, වරාය හා මහාමාර්ග පිළිබඳ උපදේශක කාරක සභාවට යවාපු මහාමාර්ග දෙපාර්තමේන්තුවේ පිළිතුරු ලිපියේ තිබුණේ, "දැනට ප්‍රශ්නයක් නැත'" කියායි. මම සමරුවක් විධියට "දැනට" කියන වචනය underline කරලා මා ළඟ තබාගෙන ඉන්නවා, ගරු ඇමතිතුමනි. ඒක කළේ සතුටකින් නොවෙයි.

දැනට සිටින නිලධාරින්ගේ දුරදක්නා නුවණක් නැතිකම ගැන කවදා හෝ දවසක මතක් කර දෙන්නයි. ගැලනිගම A-8 මාර්ගයට උඩින් යන අධිවේගී මාර්ගයේ තිබෙන පාලම ප්‍රමාණවත් පළලකින් තිබෙනවා. හැබැයි, ඒ දෙපස A-8 මාර්ගය ඒ අධිවේගී මාර්ගයට කලින් තිබුණු ප්‍රමාණයමයි තිබෙන්නේ. එහෙම නැත්නම් ඊට වඩා සුළු ප්‍රමාණයක් පමණයි පළල් වෙලා තිබෙන්නේ. තව අඩි හතක් අටක් පළල් කළොත් මම මේ කියන මාර්ග තීරුවක් අඩුකමේ ප්‍රශ්නය වළක්වා ගන්න පුළුවන්. මේක තව අවුරුදු දෙක තුනකින් කරන්න ගියොත් වෙනත් ප්‍රශ්නයක් මතු වනවා. ඒ ප්‍රදේශවල ඉන්න අහිංසක මිනිස්සු "දැන් මාර්ගය පළල් වෙලා ඉවරයි, දැන් අධිවේගී මාර්ගය විවෘත වෙලා ඉවරයි." කියා හිතලා ඔවුන්ගේ ඉදිකිරීම් හැකි තරම් පාරට ආසන්නව ඉදි

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

කළාට පසු මහල් ගොඩනැඟිලි හැදුවාට පසු ආපහු පාර පළල් කරද්දි වන්දි ගෙවලා ඒ අහිංසක මිනිසුන්ගේ දේපළ කඩා බිඳ දමන්න අපට සිදු වනවා. ඒක සුදුසු නැහැ.

පර්චස් ගණනක් පමණයි මම මේ කියන ගැලනිගම ප්‍රවේශයේ අත්පත් කර ගන්න තිබෙන්නේ. ඒ නිසා සුදුසු වන්දියක් දීලා මේ සුළු ප්‍රශ්නය විසඳන්න. එහෙම නැත්නම් මේක ප්‍රදේශවාසීන්ටත් ගැටලුවක්; රටටත් ප්‍රශ්නයක්. ඒ වාගේම මේ පිළිබඳව සොයා බැලීමේදී ඉතාම කනගාටුදායක දෙයක් දැන ගන්න ලැබුණා. ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේදී අපට උත්තරයක් ලැබුණා. මොකක්ද, ලැබුණු උත්තරය? අධිවේගී මාර්ගය සැලසුම් කිරීමේදී අනෙකුත් මාර්ගවල ප්‍රවාහන තත්ත්වයන් පිළිබඳව සැලකිල්ලක් යොමු කළේ නැහැයි කියන කාරණය. කියන්නත් කනගාටුයි. මගේ ප්‍රාර්ථනය එහෙම වෙන්න දෙන්න එපා කියන එකයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රජය කියන පරිදි රට පුරාම විහිදිලා යන අධිවේගී මාර්ග පද්ධතියක් ජාලයක් ගොඩ නඟනකොට අනෙකුත් මාර්ගවල ප්‍රවාහන තත්ත්වයන්, අනෙකුත් මාර්ගවල ගමන් කරන්නාවූ වාහනවල සංඛ්‍යාවන් සහ ඒවායේ තිබෙන යම් ආකාරයක විශේෂිත තත්ත්වයන් සැලකිල්ලට භාජනය කිරීම අත්‍යවශ්‍යයි. මොකද, අධිවේගී මාර්ගයට ප්‍රවේශ වන්න සාමාන්‍ය ජාතික ප්‍රවාහන පද්ධතියේ තිබෙන අනෙකුත් මාර්ග හරහා එන්න ඕනෑ. ඒවා හිර වුණොත් ඒවායේ bottleneck තත්ත්වයන් මතු වුණොත් ලොකු ගැටලුවක් ඇති වනවා. සමහර ප්‍රදර්ශනාත්මක වැඩ කරන්න ගිහින් මුදල් කෝටි ගණන් නාස්ති වෙනවා අපි දැක්කා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගාලු පාරේ දෙහිවල හන්දියේ තිබෙන ගුවන් පාලම ඊට කදිම උදාහරණයක්. ගාලු පාරට ගුවන් පාලමක් හැදුවා. කලින් මේක හදන්න හැදුවේ පානදුරේ. අපේ ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ ඇමතිතුමා ගිහින් මුල්ගල තැබුවා. අපි කිව්වා, මේක පානදුරේට අවශ්‍ය නැහැයි කියලා. මොකද, පානදුරේ තිබෙන රථවාහන ප්‍රශ්නයට විසඳුම ගුවන් පාලමක් හදන එක නොවෙයි කියා අපි කිව්වා. යම් හේතුවකින් ඒක දෙහිවලට අරගෙන ගියා.

දෙහිවල ගුවන් පාලමක් තිබුණත් අද රථ වාහන ගමනා ගමනය මුලින් තිබුණ තත්ත්වයේමයි තිබෙන්නේ. රථ වාහන තද බදය ගුවන් පාලම උඩ. ඒ වාගේම අනතුරු රාශියක් සිදු වෙලා තිබෙනවා. ඒ ගුවන් පාලමෙන් කිසිම ප්‍රයෝජනයක් නැහැ. ඒ නිසා ඒ ප්‍රදර්ශනාත්මක දේවලින් එහා ගිහින් කරන ආයෝජනයට උපරිම ඵලයක් ලැබෙන්න අපි කටයුතු කළ යුතුව තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම වට රවුම් මාර්ගය සකස් කරද්දීත්, කොළඹ - නුවර අධිවේගී මාර්ගය සකස් කරද්දීත්, කටුනායක - කොළඹ අධිවේගී මාර්ගය සකස් කරද්දීත්, අනාගතයේදී ඉදි කරනවා කියන අනෙකුත් අධිවේගී මාර්ග සකස් කරද්දීත් සමස්ත ජාලයේම තිබෙන ප්‍රවාහන තත්ත්වයන් සලකා බලා, අනාගතයේ ඊ ළඟ අවුරුදු 25ට, 30ට, 50ට, ඇතැම් විට 100ක් දක්වා වූ කාලය සඳහා දුර දිග හිතලා කටයුතු කරන්නට අවශ්‍යයි. ඒ සඳහා කදිම උදාහරණයක් තිබෙනවා. විෂය භාර ඇමතිතුමා මේ ගරු සභාවට ඒන්නේ නැහැ. නියෝජ්‍ය ඇමතිතුමා මේ මොහොතේ නැහැ. නමුත් අපේ ගරු නිර්මල කොතලාවල නියෝජ්‍ය ඇමතිතුමාට ගන්න හොඳම උදාහරණයක් තිබෙනවා.

1960 ගණන්වල අවසාන භාගයේ, කළුතර නගරයේ අනාගතය ගැන හිතලා, අනාගතයට ගැළපෙන පරිදි සැලසුම් සකස් කරලා, රථ වාහන තද බදයක් නොමැති වන ආකාරයට මං තීරු 4ක් හැටියට මාර්ගයක් සකස් කළා. ඒ කාලයේ හිනා වුණා. ඒ කාලයේ විවේචනය කළා. හැබැයි ඒකේ ප්‍රතිඵලයක් විධියට අවුරුදු 40කට පසුවත් ප්‍රධාන නගරයක් වෙලත් කළුතර නගරයේ රථ වාහන තද බදය අවම තත්ත්වයකයි තිබෙන්නේ. හැබැයි අද කාලයටත් මදියි කියලා හිතෙන මං තීරු 6කට සැලසුම් කළ මාර්ගය -එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව ඒ සැලසුම සකස් කළේ.- අද අපි 4ක් කරලා හදනවා. ඒ වාගේම අද තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ ඉන්න රාජිත සේනාරත්න ඇමතිතුමා, ඒ වාගේම වජිර අබේවර්ධන හිටපු ඇමතිතුමා ඉඩම් අත් පත් කර ගැනීමේ ක්‍රියාවලියේදී ඇති වුණ ප්‍රශ්න විසඳන්න, විශේෂයෙන්ම බණ්ඩාරගම ගැලණිගම ප්‍රදේශයේ ඉඩම් අත් පත් කර ගැනීමේ ප්‍රශ්න විසඳන්න බොහොම මහන්සි වෙලා ක්‍රියා කළා. ජනතාවට අවම හානියක් වන ආකාරයෙන් ඒ ආරවුල් විසඳන්න විකල්ප යෝජනා අරගෙන ආවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ නිසා එක අතකින් ඉදිරි දැක්මක් තිබෙන පක්ෂයක් හැටියට, අනාගතය ගැන සැලසුමක් තිබෙන පක්ෂයක් හැටියට, දකුණු අධිවේගී මාර්ගය පිළිබඳව යෝජනා ඉදිරිපත් කළ පක්ෂය හැටියට, එහි මූලික සැලැස්ම ඉදිරිපත් කරලා අත් පත් කර ගැනීම් ආරම්භ කළ පක්ෂය හැටියට අපට මේ වැඩේ ඉවර වුණ එක ගැන සතුටක් තිබෙනවා. හැබැයි ඒ සඳහා ගත වෙලා තිබෙන කාලය කොපමණද? ඒ ගත වෙලා තිබෙන කාලය බොහොම අධිකයි.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Order, please! Hon. Member, please wind up you speech now.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

අපි මහවැලි යෝජනා ක්‍රමය වසර 6කින් අවසන් කළා වාගේ මේ මාර්ග පද්ධතිය කඩිනම් ව්‍යාපෘතියක් හැටියට අවසන් කිරීමට අවශ්‍ය සැලසුම සකස් කරලා, අපේ ගරු ඇමතිතුමා කියූ ආකාරයට මේ පද්ධතියම එකවර සකස් කර ගත්තොත් ඇති වන්නා වූ ප්‍රශ්න අවම වෙනවා. ඒ වෙනුවෙන් මහන්සි වෙලා කටයුතු කරමු. ඒ වාගේම රජයට සුබ පතනවා. මේ පිළිබඳ රජයේ කටයුතු, මේ මාර්ග පද්ධතිය සකස් කිරීම පිළිබඳ සැලසුම් හැකි ඉක්මනින් අවසන් කරන්න ලැබේවා කියන සුබ ප්‍රාර්ථනයත් කරමින් මාගේ කථාව නතර කරනවා. බොහොම ස්තුතියි.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

The next speaker is the Hon. (Mrs.) Sumedha G. Jayasena. You have 10 minutes.

[අ. භා. 3.42]

**ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය (පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன - பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Mrs.) Sumedha G. Jayasena - Minister of Parliamentary Affairs)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන්ම ශ්‍රී ලංකාව තුළ ඉදි වූ ජාතික මට්ටමේ අධිවේගී මාර්ගය; පළමුවෙන්ම අපේ ලංකාවේ ඉදි වූ අධිවේගී මාර්ගය; කොට්ටාවේ සිට පින්නදූව දක්වා කිලෝමීටර් 95ක දුර ප්‍රමාණයකින් යුක්ත දක්ෂිණ ලංකා අධිවේගී මාර්ගය අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් 2011 නොවැම්බර් මාසයේ 27 වන දා විවෘත කරනු ලැබුවා. ඇත්තෙන්ම අපේ රටේ ඉදි වූ පළමු වෙනි අධිවේගී මාර්ගය හැටියට මේ පිළිබඳව මුළු මහත් ජනතාව වාගේම අපි කවුරුත් සන්තෝෂ වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට පෙර කථා කළ අපේ ගරු අජිත් පෙරේරා මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා, විශේෂයෙන්ම මේ පාරවල් සකස් කිරීමේදී සැලසුම් සකස් කිරීම්, මූලික ආරම්භ කිරීමේ කටයුතු එතුමන්ලාගේ රජය කාලයේ ආරම්භ කළා කියලා. ඒ ගැනත් අපි විශේෂයෙන්ම සතුටු වනවා වාගේම එතුමා ප්‍රකාශ කළා මේ පාර හදන්න බොහොම කාලයක් ගත වුණා කියලා. ගරු මන්ත්‍රීතුමනි, මම ඒ පිළිබඳව වචනයක් කථා කරන්නට කැමැතියි. පසු ගිය කාලයේ අපේ රටේ උද්ගත වෙලා තිබුණු දරුණු ප්‍රශ්නය, ලෝකයේ තිබුණ දරුණුම ත්‍රස්තවාදය -එල්ටීටීඊ ත්‍රස්තවාදය- අපේ රටේ නොතිබුණා නම් මීට පෙර මේ පාරේ වැඩ කටයුතු ඉවර කරන්නට අපේ රජයට පුළුවන්කම තිබුණා.

යුද්ධය හමාර කරලා මේ වනකොට අවුරුදු දෙක හමාරකට ආසන්න කාලයක් තමයි ගත වෙලා තිබෙන්නේ. මෙවැනි කෙටි කාලයක් තුළ ශ්‍රී ලංකාවේ පළමු වතාවට අධිවේගී මාර්ගයක් ඉදි කිරීම පිළිබඳව මම හිතන්නේ ජාතික වශයෙන් අපි කවුරුත් සතුටට පත් වෙන්න ඕනෑ කියලායි. කෙසේ වෙතත් අධිවේගී මාර්ගය භාවිත කරන වාහනවල රියැදුරන්ගෙන් ගාස්තු අය කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය වන නීතිමය රාමුව සකස් කිරීමට අදාළව ජාතික මංමාවත් පනත යටතේ නියෝග සකස් කිරීම පිළිබඳව සාකච්ඡා කරන මේ අවස්ථාවේදී අදහස් ප්‍රකාශ කරන්නට ලැබීම සම්බන්ධයෙන් මම විශේෂයෙන්ම සන්තෝෂ වෙනවා. අපේ රජය බලයට පත් වෙලා, අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ පාලන කාලය තුළ කාටත් දැකිය හැකි, කාටත් හොඳට පෙනෙන්න තිබෙන, දකින්න තිබෙන දෙයක් හැටියට මේ වනකොට අපේ රටේ මාර්ග පද්ධතිය විශාල දියුණුවක් ලබා තිබෙනවාය කියන එක පිළිබඳව අපි සතුටට පත් වෙන්න ඕනෑ.

විශේෂයෙන්ම ජාතික මට්ටමේ අධිවේගී මාර්ග එකයි තවම ඉදි වෙලා තිබෙන්නේ. ඒ වාගේම අනිකුත් සියලුම මහා මාර්ග, පළාත් මට්ටමේ මාර්ග, ග්‍රාමීය මාර්ග සහ ප්‍රාදේශීය මට්ටමේ මාර්ග ආදී වශයෙන් මේ වනකොට සියලුම මාර්ග දියුණු වෙමින් පවතිනවා. එහෙම නැත්නම් දියුණු වෙලා තිබෙනවා. ඒක අද මේ රටේ කාටත් පෙනෙන්න, දකින්න තිබෙන දෙයක්. ඒ ගැන පක්ෂ, විපක්ෂ කාගේවත් විවාදයක් නැහැ කියන එකයි මගේ අදහස. ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමාත් මේ පිළිබඳව කතා කළා. විශේෂයෙන්ම එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේදී කරන ලද සැලසුම් හරියට ක්‍රියාත්මක කළේ නැහැ කියන එක එතුමා ප්‍රකාශ කළා. ඒ වාගේම එතුමා අපේ රජය පිළිබඳව චෝදනාත්මකව කතා කළා. අධිවේගී මාර්ගය සහ අනිකුත් කටයුතු පිළිබඳව චෝදනාත්මකව කතා කළා. ඒක අපි ප්‍රතික්ෂේප කරනවා. මොකද, සැලසුම් සකස් කළාට, ඒ කටයුතු ආරම්භ කළාට ඒ කාල වකවානුවලදී එතුමන්ලාට ඒ කටයුතු ඉටු කරන්න පුළුවන් වුණේ නැහැ. එතුමන්ලාගේ රජය බොහෝ කාලයක් මේ රට පාලනය කළා.

ඒ විතරක් නොවෙයි. ගරු ජෝන් අමරතුංග මන්ත්‍රීතුමා මේ පිළිබඳව කරුණු දැක්වූවා. ඇත්තෙන්ම එතුමා චෝදනාත්මකව නොවෙයි කතා කළේ. අධිවේගී මාර්ගය සහ විශේෂයෙන්ම අනිකුත් මාර්ගවල පවතින තදබදය සහ අඩු පාඩු පිළිබඳව එතුමා කරුණු පැහැදිලි කරලා පෙන්වා දුන්නා. ඇත්තෙන්ම ඒ පිළිබඳව අපි සතුටු වෙනවා. රජයක් හැටියට ඔබතුමන්ලා චෝදනාත්මක විවේචන පමණක් නොවෙයි අඩු පාඩු, ඒ වාගේම කළ යුතු දේවල් තිබේ නම් ඒවා ඉදිරිපත් කිරීමත් ඉතාම වැදගත් කියායි මා විශ්වාස කරන්නේ.

මේ අධිවේගී මාර්ගයේ පුංචි පුංචි අඩු පාඩුකම් තිබෙන්න පුළුවන්. වෙනදා පැය තුනක් පමණ ගත වුණත් අද කොළඹ, කොට්ටාවේ සිට විනාඩි 50කින්, 55කින් පමණ ගාල්ලට ළඟා වෙන්න පුළුවන් වෙලා තිබෙනවා. මොණරාගල දිස්ත්‍රික්කයේ කෙනෙක් වුණත් මමත් මෙම අධිවේගී මාර්ගය හරහා දෙතුන් වතාවක් කොළඹට පැමිණිලා තිබෙනවා. ඒ සඳහා විශේෂයෙන් මුදලක් ගෙවුවත් ඒකෙන් කිසියම් පාඩුවක් සිදු වෙනවා හෝ ඒක අපතේ යාමක් නොවෙයි. ඒ මුදලට සරිලන පරිදි ඉන්ධන ගාස්තු අඩුවෙන් වැය වීමත්, කාල කළමනාකරණය සඳහා එහෙම නැත්නම් කාලය ඉතිරි කර ගැනීම සඳහාත් විශාල පහසුවක් මේ මඟින් සැලසෙනවා. ඒ වාගේම තෙහෙට්ටු නොමැතිකම නිසා ගමන් පහසුව ආදී මේ සෑම දෙයකින්ම ලොකු සහන රාශියක් සැලසෙනවා.

අද අපේ රටේ මිලියනයකට ආසන්න වාහන ප්‍රමාණයක් තිබෙනවා. මුළු රටේම වාහන තදබදයක් ඇති වෙලා තිබෙන්නේ අපේ මේ පුංචි රටට ඔරොත්තු නොදෙන තරමට මිලියන 4කට ආසන්න වාහන ප්‍රමාණයක් තිබීම නිසයි. මාර්ග පද්ධතිය දියුණු වෙනවාත් සමඟම රටේ වාහන ප්‍රමාණයත් වැඩි වෙලා තිබෙනවා. මාර්ග පද්ධතිය ගැන කතා කරනකොට මා කියන්න ඕනෑ, සියලුම දිස්ත්‍රික්කවල, සියලුම ප්‍රදේශවල අද ඉතාම ලස්සනට කාපට් පාරවල් ඉදි වෙලා තිබෙන නිසා, ඒ මාර්ගවල ගමන් කිරීමේදී ඉක්මනින් ගමන නිම කර ගන්නට රියැදුරන් ඉතා වේගයෙන් රිය පදවනවාය කියලා. බොහොමයක් රිය අනතුරු සිදුවන්නේ ඒ හේතුව නිසායි.

ඇත්තටම මීට වඩා හොඳ දැනුමක් ඇති, බුද්ධිමත් උගත්, ඒ වාගේම විශේෂ පුහුණුවක් තිබෙන පිරිසක් රියැදුරන් හැටියට පත් කර ගැනීමෙන් මා හිතනවා වාහන අනතුරු බොහොමයක් වළක්වා ගන්නට පුළුවන්කම තිබෙනවාය කියා.

විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාත් යෝජනා කළා, රියැදුරන් පත් කිරීමේදී ඒ අයගේ සුදුසුකම් මත ඒ පත්වීම් ලබා දෙන්නය කියලා. රජයක් වශයෙන් අපිත් ඒක අනුමත කරනවා. එවැනි තත්ත්වයන් තුළ අපේ රටේ තිබෙන මේ වාහන තදබදය මඟ හරවා ගන්නත්, ඒ වාගේම රිය අනතුරු අවම කර ගන්නත් අපට පුළුවන්කම තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. අධිවේගී මාර්ගයේ අය කිරීම් ඇත්තටම සාධාරණයි. අපත් අධිවේගී මාර්ගයේ ගමන් කළා. දුර ප්‍රමාණය අනුව ඒ අය කිරීම් ඉතාමත් සාධාරණයි. ඒ වාගේම ඒ මාර්ගයේ නඩත්තුව, ඒ මාර්ගය සඳහා යොදවා ඉන්න පොලිස් නිලධාරින්ගේ සහ තවත් රාජකාරි කටයුතු රාශියක් ඉටු කරන සේවකයින්ගේ වියදම් දැරීමේදී ඒ අය කරන මුදල ප්‍රමාණවත් නොවේ කියලායි මගේ විශ්වාසය.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම ලෝකයේ ඉතාම දියුණු රටවල අධිවේගී මාර්ග ඉදි වෙලා ප්‍රවාහන පහසුකම් රාශියක් අද සැලසිලා තිබෙනවා. ජපානය, චීනය, කොරියාව, එංගලන්තය වැනි රටවල් ගත්තොත් වැඩි වශයෙන් වාහන තදබදය නතර කර ගැනීම සඳහාත් ඒ වාගේම මගීන්ගේ පහසුව සඳහාත් ඉතාමත්ම හොඳ දුම්රිය සේවාවන් ලබා දීලා තිබෙනවා. මා විශේෂයෙන්ම යෝජනා කරනවා, අපේ රටේත් දුම්රිය සේවාව දියුණු කළොත් හොඳයි කියා. මහාමාර්ග අමාත්‍යවරයා වශයෙන් අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමන් මේ ගෙන යන වැඩ පිළිවෙළ තුළින් ඉදිරියේදී මාර්ග පද්ධති තවත් දියුණු වේවි. ඇත්තටම පුංචි රටක් වන අපේ රටේ ප්‍රමාණයේ හැටියට මාර්ග පද්ධති අලුතින් ඉදි කරන්න ඉඩ කඩ නැති නිසා මේ දුම්රිය සේවාව වැඩි වශයෙන් දියුණු කිරීමෙන් මගීන්ට ඉතාමත් පහසුවක් ගෙන දෙනවා වාගේම රිය අනතුරු බොහොමයක් වළක්වා ගැනීමටත් හැකියාවක් ලැබේවිය කියා මා විශ්වාස කරනවා.

විශේෂයෙන්ම අපේ රට ආසියාවේ ආශ්චර්ය බවට පත් කරන්නට යන මේ අවස්ථාවේදී, අපේ රටේ ජාතික මට්ටමේ පාරවල් ඉදි කරනවා වාගේම දුම්රිය මාර්ගත් හොඳ තත්ත්වයේ මාර්ග බවට පත් කළොත් අපේ රටේ වාහන තදබදය, රිය අනතුරු, අනෙකුත් සියලුම අනතුරු සහ මගීන්ට ඇති වන අපහසුතාවන් බොහොමයක් වළක්වා ගන්නට පුළුවන්කම තිබෙනවා. අපට

[ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය ]

විශ්වාසයි අපේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමන් ඒ පිළිබඳවත් ඉදිරියේදී කටයුතු කරන බවට. දැනටත් කොළඹ වටරවුම් පාර, කොළඹ-කටුනායක අධිවේගී මාර්ගය ඉදි කිරීමේ කටයුතු ආරම්භ කර තිබෙනවා. කොළඹ - නුවර පාර, කොළඹ-කල්මුණේ දක්වා පාර ඉදිරියේදී අධිවේගී මාර්ග බවට සකස් කරන්නට අතිගරු ජනාධිපතිතුමන් දැනටමත යෝජනා කරලා තිබෙනවා. එතුමා විශේෂයෙන්ම අපිත් එක්ක ඒ ගැන කථා කරලා තිබෙනවා. ඒ පාරවල් සකස් කළොත් අපේ රටේ තිබෙන මේ මාර්ග තදබදයන් මහ හරවමින් මගීන්ට හොඳ ප්‍රවාහන සේවාවක් සහ මාර්ග පද්ධතියක් ලබා දෙන්නට පුළුවන්කම ලැබේවි. අනිවාර්යයෙන්ම අපේ රටේ ජනතාව සහ රජය බලාපොරොත්තු වන ආකාරයට ආසියාවේ ආශ්චර්ය බවට අපේ රට පත් කරන්න යන ගමනේදී, අතිගරු ජනාධිපතිතුමන්ගේ දූරදර්ශී මහ පෙන්වීම තුළ ලොකු ශක්තියක් ලැබී අපේ රට දියුණුව කරා ගෙන යන්නට හැකි වේවායි ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 3.53]

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන්ම ජාතික මංමාවත් පනත යටතේ නියෝග පිළිබඳව වචන ස්වල්පයක් කථා කරන්න අවස්ථාව ලැබීම පිළිබඳව මා ප්‍රථමයෙන්ම සතුටු වෙනවා. වර්තමාන ශ්‍රී ලංකාව දිහා බලන කොට සංවර්ධනයේ ප්‍රධානතම කේන්ද්‍රස්ථානයක් විධියට මහා මාර්ග සංවර්ධනය අපට පෙන්වා දෙන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ රටේ වෙනත් සංවර්ධන ව්‍යාපෘති රාශියක් ක්‍රියාත්මක වන අතරේ, මහාමාර්ගවලට ප්‍රමුඛස්ථානය ලබා දීලා ඒ මහාමාර්ග සංවර්ධනය කරන්නේ විශේෂයෙන්ම ජාතීන්, දිස්ත්‍රික්ක, පළාත්, ගම් යා කරමින් අන්තර් සම්බන්ධතාවක් ගොඩ නැඟීමේ බලාපොරොත්තුවෙනුයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම රටේ සංවර්ධනයට මහාමාර්ග ශක්තිමත් කිරීමෙන් ලබා දිය හැකි දායකත්වය බලාපොරොත්තුවෙන් තමයි අද රට පුරාම ගම් නියම්ගම් යා කරමින් දැවැන්ත සංවර්ධන වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක වන්නේ. මේ වන විට "ඒ" ශ්‍රේණියේ මාර්ග කිලෝමීටර් 5,200කට වැඩි ප්‍රමාණයක් සංවර්ධනය කර තිබෙනවා. "බී" ශ්‍රේණියේ මාර්ග කිලෝමීටර් 6,800කට වැඩි ප්‍රමාණයක් සංවර්ධනය කරලා තිබෙනවා. "ඒ" ශ්‍රේණියේ හා "බී" ශ්‍රේණියේ මාර්ග දිහා බලන කොට එය කිලෝමීටර් 12,500ක් ඉක්ම වූ ප්‍රමාණයක් බව අපට දැක ගන්න පුළුවන්.

අධිවේගී මාර්ගය පිළිබඳව බොහෝ දෙනෙක් කථා කරනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ අධිවේගී මාර්ගය විවෘත කරපු දවසේ සිට අද වන තෙක් ලක්ෂ හයහමාරකට වැඩි ප්‍රමාණයක් එය භාවිත කර තිබෙනවා. පක්ෂ විපක්ෂ භේදයකින් තොරව, ජාති ආගම් කුල භේදයකින් තොරව, තරාතිරමකින් තොරව අධිවේගී මාර්ගය භාවිත කිරීම දිනෙන් දින වර්ධනය වන බව අපට දකින්න පුළුවන්; අපට දැන ගන්න පුළුවන්. ඒ වාගේම මෙතෙක් අධිවේගී මාර්ගයේ සමස්ත ආදායම රුපියල් මිලියන 188ක් ඉක්මවා ගිහින් තිබෙනවා. එතරම් ආදායමක් මේ වන විට අධිවේගී මාර්ගය හරහා අපේ රටට ලැබිලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම තමයි අනාගත අධිවේගී මාර්ග සංවර්ධනය දිහා බලන විට තව නොබෝ දිනකින් අතිගරු ජනාධිපතිතුමා කොළඹ වටරවුම් මාර්ගයේ දෙවැනි අදියරට මුල් ගල තබනවා. ඒ වාගේම තමයි මේ අධිවේගී මාර්ගයේ ඉතිරි කොටස -ගාල්ල-මාතර දක්වා- ලබන වසරේ ජනතා අයිතියට පත් කරනවා. ඒ වාගේම මාතර-බෙලිඅත්ත, බෙලිඅත්තෙන් හම්බන්තොට, හම්බන්තොටින් නැඟෙනහිර මුහුදු තීරය දක්වා අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේ වැඩ පිළිවෙළ අපි ආරම්භ කරනවා. බොහෝ දුරට මේ අවුරුද්ද තුළ දී මාතර-හම්බන්තොට කොට්ඨාසයෙන් එය ආරම්භ කරන්නට අපි බලාපොරොත්තු වනවා. ඒ වාගේම තමයි මහනුවර දක්වා යන අධිවේගී මාර්ගය. අතිගරු ජනාධිපතිතුමාගේ විශාල බලාපොරොත්තුවක් තිබෙනවා කන්ද උඩරටත්, කොළඹත් යා කරමින් කුරුණෑගල හරහා අධිවේගී මාර්ගයක් නිර්මාණය කරන්න; බිහි කරන්න. තව නොබෝ දිනකින් ඒ වැඩ කටයුතුත් ආරම්භ කරන්න බලාපොරොත්තුවක් තිබෙනවා.

අධිවේගී මාර්ග හෝ මාර්ග සංවර්ධනය රටේ ආර්ථිකයට පමණක් නොවෙයි, එය සමස්ත ශ්‍රී ලාංකීය ජාතියට ලබා දෙන්නා වූ දායාදයක්. ඒ වාගේම ආර්ථික වශයෙන් ගම ශක්තිමත් වනවා. කොළඹට පමණක් සීමා වුණු කර්මාන්ත, කොළඹට පමණක් සීමා වුණු ව්‍යාපාර ගම්බද ප්‍රදේශවලට යනවා. අද අනුරාධපුරයට ගියාම, එහි නිර්මාණය වෙලා තිබෙන දැවැන්ත මාර්ග පද්ධතිය දකින්න පුළුවන්. අපේ ටීඑන්ඒ එකේ ගරු මන්ත්‍රීතුමන්ලා දන්නවා, උතුරට යන කොට "ඒ-32" මාර්ගය, "ඒ-35" මාර්ගය, "ඒ-9" මාර්ගය හා යාපනය නගර සංවර්ධනය වැනි මහා දැවැන්ත සංවර්ධනයක් මාර්ග පද්ධතිය කේන්ද්‍ර කොට ගෙන මේ වන විටත් ක්‍රියාත්මක වන බව.

අපේ ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා කිව්වා අධිවේගී මාර්ගයේ වැඩ කරන්න අර ගෙන තිබෙන්නේ හම්බන්තොට කට්ටිය විතරයි කියලා. පුදුම ඉරිසියාවක් නේ තිබෙන්නේ, හම්බන්තොටත් එක්ක. ඒක වෙනත් ප්‍රශ්නයක් ද කියන එක නම් මම දන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. හම්බන්තොට කට්ටිය විතරක් නොවෙයි, කළුතරින්, ගාල්ලෙන්, මාතරින් ආපු අය අධිවේගී මාර්ගයේ වැඩ කරනවා. හම්බන්තොටින් ආපු කට්ටියත් ඉන්නවා. සමස්ත දකුණු පළාතින්ම අධිවේගී මාර්ගයේ වැඩ කරන්න කට්ටිය අර ගෙන තිබෙනවා. පසු ගිය දවස්වල අධිවේගී මාර්ගයේ වැඩ කරන තරුණයෝ කණ්ඩායමක් මාව හමු වෙලා මට කිව්වා, ගයන්ත මන්ත්‍රීතුමා හැම හන්දියෙන්ම එළියට ගිහිල්ලා ඇතුළට එන ගමන් අහනවා කියලා, "මල්ලී ඔයාගේ ගම කොහේද, මල්ලී ඔයා කසාද බැඳලාද, මල්ලී ඔයාගේ පුංචි අම්මා කොහේද ඉන්නේ" කියලා. ඉතින් එතුමා අඩු ගණනේ අධිවේගී මාර්ගයේ හැම exit එකකින්ම එළියට ගිහිල්ලා, ඇතුළට ඇවිල්ලා තිබෙන එක ගැන මම සතුටු වනවා. ඒ ගැන මම ආඩම්බර වනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මගේ කථාව අවසාන කරන්න කලින් මම අලුත් යෝජනාවක් ගේන්න ඕනෑ. මේ අධිවේගී මාර්ගයේ වේග සීමාව පැයට කිලෝමීටර් 100කට වඩා පොඩ්ඩක් වැඩි කළාට ප්‍රශ්නයක් නැහැ. මොකද, ජනතාවගෙන් විශාල ඉල්ලුමක් තිබෙනවා. අපි නිතර දෙවේලේ එම පාර පාවිච්චි කරන අය. මමත් යනවා. ගයන්ත මන්ත්‍රීතුමාත් යනවා, එනවා මම දැකලා තිබෙනවා. පැයට කිලෝමීටර් 120ක වේගයකින්වත් යන්න දුන්නොත් අපට ගමේ ගිහිල්ලා ඉක්මනට එන්න පුළුවන්. මට විතරක් නොවෙයි, අපේ සජිත් මන්ත්‍රීතුමාටත් ඉක්මනට ගමේ ගිහිල්ලා එන්න පුළුවන්. ඒ එක්කම උදේ හවස යන එන කට්ටියට අඩු ගණනේ day pass එකක් introduce කරලා දුන්නොත් හොඳයි. මොකද, දැන් උදේටත් ගෙවන්න ඕනෑ. හවසටත් ගෙවන්න ඕනෑ. Day pass එකක් introduce කරලා දුන්නොත් අපේ ගාල්ල, මාතර, හම්බන්තොට පැත්තේ ඉන්න මන්ත්‍රීවරුන්ට විතරක් නොවෙයි, ජනතාවට, ව්‍යාපාර කරන අයට ආර්ථික වශයෙනුත් ලාභයක් එයි. ඒ වාගේම වැඩෙත් පොඩ්ඩක් පහසු වෙයි.

මේ රටේ ජනතාව අධිවේගී මාර්ගය දිහා කුහක සිතින් බලන්නේ නැහැ. මේ රටේ මහ ජනතාව අධිවේගී මාර්ගයට ඊරිසියා කරන්නේ නැහැ. අධිවේගී මාර්ගයේ යන්න අනුරාධපුරයෙන් එනවා. ඒ අය ඊර්ෂ්‍යා කරන්නේ නැහැ අනුරාධපුරයට අධිවේගී මාර්ගයක් නැහැ කියලා. යාපනයෙන් එනවා අධිවේගී මාර්ගයේ යන්න. ඒ අය ඊර්ෂ්‍යා කරන්නේ නැහැ, අධිවේගී මාර්ගයක් යාපනයට නැහැ කියලා. කුහක සිතින්, ඊර්ෂ්‍යා සිතින් අධිවේගී මාර්ගය දිහා බලන්න එපා කියන ඉල්ලීම මම අපේ විපක්ෂයේ සහෝදර මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා. ඒ වාගේම - [බාධා කිරීම්] ඔව්.ඔව්. අර කතාවම තමයි මට කියන්න වෙන්නේ. අම්මායි, තාත්තායි බැඳලා ළමයා හම්බ වුණාම මඟුල අත්සන් කරන එක් කෙනාගේ නම දාන්නේ නැහැ නේ. එහෙම දානවාද? නැහැ නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අතිගරු ජනාධිපතිතුමා පසු ගිය අය වැය කතාව පවත්වන කොට විපක්ෂයෙන් ඇහුවා, එතුමාගේ අය වැයේ සියඹලා ඇත්තේම නැද්ද කියලා. හැබැයි මේ වන සංවර්ධනය දැක්කාම, "දැයට කිරුළ" දිහා බලන කොට, උතුරට ගිහිල්ලා බලන කොට, දකුණට ගිහිල්ලා බලන කොට මට අතිගරු ජනාධිපතිතුමාගෙන් අහන්න හිතෙනවා, "තාත්තේ ඇත්තටම අය වැයේ තිබෙන්නේ සියඹලා විතරද?" කියලා. ස්තුතියි.

[பி.ப. 4.00]

**ගරු පී. අරියනේත්‍රන් මහතා**
(மாண்புமிகு பா. அரியநேத்திரன்)
(The Hon P. Ariyanethran)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்றைய தினம் இச்சபையிலே அதிவேக நெடுஞ்சாலைகள் தொடர்பாக நடைபெற்றுக்கொண்டிருக்கின்ற விவாதத்தில் தமிழ்த் தேசியக் கூட்டமைப்பின் சார்பில் கலந்துகொண்டு உரையாற்றுவதையிட்டு நான் மகிழ்ச்சியடைகின்றேன். அதிவேக நெடுஞ்சாலைகள் தொடர்பாக இன்று பலரும் பலவகையான கருத்துக்களைத் தெரிவித்திருக்கின்றார்கள். நான் அதிவேக நெடுஞ்சாலைகள் தொடர்பாகக் கதைப்பதற்கு முன்னர் வடக்கு, கிழக்குப் பிரதேசத்திலுள்ள சாதாரண நெடுஞ்சாலைகள் தொடர்பாகச் சில விடயங்களைக் கூறலாமென நினைக்கின்றேன்.

இப்பொழுது இந்த நாட்டிலே யுத்தம் முடிவுற்றிருக்கின்ற தென்றும் சமாதானம் ஏற்படுத்தப்பட்டிருக்கின்றது என்றும் அரசாங்கம் தெரிவித்துக் கொண்டிருக்கின்றது. மட்டக்களப்பு மாவட்டத்தில் கடந்த வாரம் பெய்த கடும் மழையினால் பல வீதிகள் வெள்ளத்தில் மூழ்கியுள்ளன. அதன் காரணமாக அவ்வீதிகளில் போக்குவரத்துச் செய்ய முடியாத நிலை ஏற்பட்டுள்ளது. குறிப்பாக மட்டக்களப்பு, அம்பாறை மாவட்டங்கள் மட்டுமன்றித் திருகோணமலை மாவட்டத்தி லுள்ள சம்பூர், வன்னி போன்ற இடங்களிலுள்ள வீதிகளும்கூட வெள்ளத்தில் மூழ்கியுள்ளன. ஒரு நாட்டில் மக்கள் வாழ்கின்ற அனைத்துப் பிரதேசங்களையும் பாரபட்சமின்றி அபிவிருத்தி செய்ய வேண்டிய கடமை அந்த நாட்டின் அரசாங்கத்துக்கு இருக்கின்றது. அவ்வாறே மக்களின் வாக்குகளின்மூலம் ஆட்சிக்குவந்த எந்த அரசாங்கமாக இருந்தாலும் நாட்டில் இருக்கின்ற வளங்களைப் பயன்படுத்தி, அந்த நாட்டின் பிரதேசங்களை அபிவிருத்தி செய்ய வேண்டியது அதன் கடமையாகும். அந்த வகையில் அவ்வீதிகள் அனைத்தையும் திருத்த வேண்டிய கடமை இந்த அரசாங்கத்துக்கு இருக்கின்றது. அவ்வாறு ஆட்சி செய்கின்ற ஓர் அரசாங்கமாக தமிழ்த் தேசியக் கூட்டமைப்பு இருந்தாலுங்கூட, இதே கடமையைத்தான் செய்யும் என்பதையும் இங்கு தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன்.

இன்று இந்நாட்டிலுள்ள பல வீதிகள் அபிவிருத்தி செய்யப்பட்டிருக்கின்றபொழுதிலும் இலங்கையிலே தினமும் மூன்று நபர்கள் வீதம் வீதி விபத்துக்களினால் இறந்து கொண்டிருப்பதைக் காண்கின்றோம். இப்பொழுது மிகவும் அதிகளவிலான வாகனங்கள் இறக்குமதி செய்யப்பட்டு வீதிக்கு வந்திருப்பதும் ஓட்டோ சாரதிகள் பூரணமான பயிற்சிகளைப் பெற்றிருந்தும் போக்குவரத்து வீதி ஒழுங்கு முறைகளை மீறித் தமது வாகனங்களைச் செலுத்துவதும் வடக்கு, கிழக்கு மாகாணங்களிலே அதிகமான விபத்துக்கள் இடம்பெறுவதற்குக் காரணமாக அமைந்துள்ளன என்பது தெரியவந்துள்ளது. ஆகவே, வாகன இறக்குமதியின்போதும் அந்தந்த வாகனங்களுக்குரிய வீதி ஒழுங்குமுறைகளை வகுத்துச் செயற்படுத்தும்போதும் அரசாங்கம் சரியான திட்டங்களை முன்வைத்துச் செயல்படவேண்டும்.

2010ஆம் ஆண்டில் மோட்டார் வாகனப் போக்குவரத்துப் பரிசோதகர் பதவிக்காக நடத்தப்பட்ட போட்டிப் பரீட்சையின் பிரகாரம் பெரும்பான்மை இனத்தைச் சேர்ந்த 17 பேருக்கு மட்டுமே நியமனம் வழங்கப்பட்டிருந்தது. அதேபோன்று 2011ஆம் ஆண்டில் அப்பதவிக்கு நியமனம் வழங்குவதற்காக விண்ணப்பங்கள் கோரப்பட்டபொழுது ஏறக்குறைய 329 பேர் விண்ணப்பித்திருந்தார்கள். அந்தப் போட்டிப் பரீட்சையின் மூலம் நேர்முகப்பரீட்சைக்கு 129 பேர் தகுதி பெற்றிருந்தார்கள். ஆனால், அவர்களில் 65 பேர் மட்டுமே எதிர்வரும் 17ஆந் திகதி நிமயமனம் வழங்குவதற்காக அழைக்கப்பட்டிருக்கிறார்கள். அவர்களில் சிங்கள இனத்தைச் சேர்ந்த 64 பேரும் கொழும்பைச் சேர்ந்த முஸ்லிம் இனத்தவர் ஒருவரும் அடங்குகின்றனர். அப்பரீட்சைக்கு வடக்கு, கிழக்கிலிருந்து 7 பேர் சென்றிருக்கிறார்கள். அவர்களில் ஒருவர்கூட நேர்முகப்பரீட்சைக்கு அழைக்கப்படவில்லை. அதற்கு முந்திய வருடமும் அங்கிருந்து 17 பேர் அழைக்கப்பட்டிருந்தார்கள். அவர்களுக்கும் நியமனம் வழங்கப்படவில்லை. இந்த அடிப் படையில் பார்க்கும்போது, இச்சபையிலுள்ள அமைச்சர்கள் பாரபட்சமற்ற விதத்தில் ஓர் இலங்கையைக் கட்டியெழுப் புவதாக இங்கு கூறுகின்றபோதிலும், நடைமுறையில் இலங்கையிலே எந்த ஒரு விடயத்திலும் தமிழ் மக்களின்மீதான பாரபட்சம் தொடர்ச்சியாக இருந்துகொண்டே இருக்கின்றது என்பதை நான் இச்சந்தர்ப்பத்தில் தெளிவாகக் கூறிவைக்க விரும்புகின்றேன்.

வீதி என்று குறிப்பிடும்பொழுது அதுவும் காணியுடன் தொடர்புடைய விடயம்தான். இன்று வடக்கு, கிழக்குப் பிரதேசத்திலே உள்ள பல காணிகள் அபகரிக்கப்பட்டு, அக்காணிகளிலே அத்துமீறிப் புத்த விகாரைகளை அமைக் கின்ற கெடுபிடியான நிலைமை காணப்படுகின்றது. மட்டக்களப்பு மாவட்டத்தின் மன்முனை தென்மேற்கு - பட்டிப்பளை பிரதேச செயலாளர் பிரிவிலே கச்சைக்கொடி சுவாமிமலை என்ற பழைமைவாய்ந்த தமிழ்க் கிராமமொன்று இருக்கின்றது. அகழ்வாராய்ச்சி செய்யக்கூடிய வகையில் பல இடங்கள் அங்கு அடையாளம் காணப்பட்டிருக்கின்றன. அந்த இடங்களுக்கு எவரையும் அனுமதிக்க வேண்டாமென்று அகழ்வாராய்ச்சித் திணைக்களம் அங்குள்ள பிரதேச செயலாள ருக்குக் கட்டளையிட்டிருக்கின்றது. அப்படி யிருந்தும், கடந்த ஜனவரி மாதம் 20ஆம் திகதி பொலிசாரும் படையினரும் சூழ்ந்துநிற்க, 11 பௌத்த பிக்குகள் அந்த பகுதியில் அத்துமீறி நுழைந்து, அங்கு விஹாரையொன்றைக் கட்டுவதற்கான முயற்சியை மேற்கொண்டிருக்கிறார்கள். இதுபற்றி அந்த மக்கள் என்னிடம் கூறியபோது நான் அந்த இடத்தை நேரடியாகச் சென்று பார்வையிட்டேன். அந்த இடம் அகழ்வாராய்ச்சி செய்யப்பட வேண்டிய ஒரு புனிதஸ்தலம்! ஏற்கெனவே அங்கு ஒரு தமிழ் மன்னன் ஆட்சியில் இருந்த

[ගරු පී. අරියනේත්‍රන් මහතා]

வரலாறு இருக்கிறது. அதனைத் திரிபுபடுத்தி அங்கு ஒரு விஹாரையை அமைப்பதற்கான முயற்சி இடம்பெற்றிருக்கிறது. இது தொடர்பாக நான் மேதகு ஜனாதிபதி அவர்களுக்கு கடந்த ஜனவரி மாதம் 27ஆம் திகதி ஒரு கடிதத்தை எழுதியிருந்தேன்; அதற்கான பதிலை எதிர்பார்த்துக் கொண்டிருக்கிறேன். அதுமட்டுமல்ல, புனாணையிலும் ஒரு விஹாரையை ஸ்தாபிப்பதற்கான முயற்சியை அங்கிருக்கின்ற பௌத்த பிக்குகள் மேற்கொண்டிருக்கிறார்கள். அந்த இடத்திலே பாரம்பரிய இந்துக் கோவிலொன்று இருந்தது. அதனை அழித்துவிட்டு அந்த இடத்திலே ஒரு விஹாரை நிர்மாணிக்கப்பட்டு வருவதாகத் தெரிய வந்திருக்கிறது. இவ்வாறான அத்துமீறல்கள் தொடர்ச்சியாக இடம்பெற்று வருகின்றன. இது தமிழ் மக்கள் மத்தியிலே - [இடையீடு]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

கௌரவ உறுப்பினர் அவர்களே, அப்படி ஒரு செய்தி வந்திருக்கின்றதென்று சொல்லி இப்படியான பயங்கரமான ஒரு செய்தியை இந்தச் சபையிலே நீங்கள் வெளியிடுவது கூடாது. இது இரண்டு இனத்தவருக்கும் மாத்திரமல்ல, இனங்களிடையேயான ஐக்கியத்துக்கும் பாதிப்பை ஏற்படுத்தும். ஆகவே, அது சம்பந்தமாக நன்றாகத் தேடிப்பார்த்து, அப்படியான ஒன்று நடைபெற்றிருந்தால் நீங்கள் சொல்லுங்கள்! அரசாங்கம் உடன் நடவடிக்கை எடுக்கும்.

**ගරු සීනිතම්බි යෝහේස්වරන් මහතා**
(மாண்புமிகு சீனித்தம்பி யோகேஸ்வரன்)
(The Hon. Seeniththamby Yoheswaran)

அப்படியொன்று நடந்திருக்கிறது!

**ගරු පී. අරියනේත්‍රන් මහතා**
(மாண்புமிகு பா. அரியநேத்திரன்)
(The Hon P. Ariyanethran)

ஐயா பயங்கரவாத செய்தி என்பது -

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

அதை ஊர்ஜிதப்படுத்த வேண்டும்.

**ගරු පී. අරියනේත්‍රන් මහතා**
(மாண்புமிகு பா. அரியநேத்திரன்)
(The Hon P. Ariyanethran)

அது ஊர்ஜிதப்படுத்தப்பட்டு பத்திரிகையிலும் அதுபற்றிய செய்தி வெளிவந்தது. அதனை நான் ஆதாரத்துடன், புகைப் படத்துடன் ஜனாதிபதிக்கு தெரியப்படுத்தியிருக்கிறேன். பயங்கர விடயங்களைக் கண்டவர்கள் நாங்கள்! பயங்கரமான செய்தியை மட்டுமல்ல, எந்தச் செய்தியையும் பாராளு மன்றத்தில் துணிவுடன் கூறுவதற்குத்தான் நாங்கள் இங்கு வந்திருக்கிறோம். உங்களைப்போன்று ஜனாதிபதியைப் பாராட்டுவதற்கோ, அமைச்சர்களைப் பாராட்டுவதற்கோ நாங்கள் வரவில்லை. இதை நீங்கள் புரிந்துகொள்ள வேண்டும்.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

நீங்கள் விடுதலைப் புலிகளுக்கு வால் பிடிப்பவர்கள்

**ගරු පී. අරියනේත්‍රන් මහතා**
(மாண்புமிகு பா. அரியநேத்திரன்)
(The Hon P. Ariyanethran)

ஐயா, விடுதலைப் புலிகள் இல்லையென்று கடந்த 2009ஆம் ஆண்டு மே மாதம் 19ஆம் திகதி கூறியவர்களும் நீங்கள்தான்! இப்பொழுது புலிகள் இருப்பதாகக் கூறுபவர்களும் நீங்கள்தான்! புலிகளைப் பற்றிப் பேசாமல் உங்களால் அரசியல் செய்ய முடியாது. ஆனால், எங்களுக்கு புலிகளை வைத்து அரசியல் செய்யவேண்டிய தேவையில்லை. வட, கிழக்கிலே இருக்கின்ற மக்களை வைத்து அரசியல் செய்வதற்குத்தான் நாங்கள் வந்திருக்கிறோம். இதை நீங்கள் புரிந்துகொள்ள வேண்டும். [இடையீடு]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

உங்களுடைய தலைவர் சம்பந்தன் அவர்கள் போய் diaspora வில் என்ன செய்தார்? [இடையீடு] உங்களுடைய அரசியல் தலைவர்கள் அங்கே diaspora வில் என்ன செய்கிறார்கள்? பாவம்! உங்களைப்பற்றி நான் அனுதாபப் படுகிறேன்.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)

They have a right. - [*Interruption.*] Sir, the mike -

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

You sit down, Hon. Jayawickrama Perera. - [*Interruption.*]

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

If the Hon. Ariyanethran agrees, you could be given the mike. - [*Interruption.*]

**ගරු පී. අරියනේත්‍රන් මහතා**
(மாண்புமிகு பா. அரியநேத்திரன்)
(The Hon P. Ariyanethran)

சம்பந்தன் ஐயாவைப் பற்றியோ அல்லது தமிழ்த் தேசியக் கூட்டமைப்பைப் பற்றியோ கதைப்பதற்கு உங்களுக்கு அருகதை இல்லை. வடக்கு, கிழக்கிலே இருக்கின்ற, எங்களுக்கு வாக்களித்த மக்களுக்குத்தான் அந்த அருகதை இருக்கிறது. இதை நீங்கள் புரிந்துகொள்ள வேண்டும். நீங்கள் அரசாங்கத்துடன் இருப்பவர்கள்; அரசாங்கத்தைப் புகழ்ந்து கதைக்கவேண்டிய நிலைமை உங்களுக்கு இருக்கின்றது. ஆனால், நாங்கள் உங்களைப் பற்றிக் கதைக்க விரும்பவில்லை. எங்கள் மக்கள் எதிர்நோக்குகின்ற பிரச்சினைகள் பற்றி, அங்கு இடம்பெறுகின்ற அத்துமீறிய நடவடிக்கைகள் பற்றி, அங்கு மேற்கொள்ளப்படவேண்டிய அபிவிருத்திகளைப் பற்றிக் கதைப்பதற்குத்தான் நாங்கள் பாராளுமன்றம் வந்திருக்கிறோம் என்பதை நீங்கள் தயவுசெய்து புரிந்துகொள்ள வேண்டும்.

மேலும், வீதிகள் தொடர்பாகவும் ஒருசில விடயங்களைக் குறிப்பிட வேண்டும். வடக்கு, கிழக்கிலே கொங்கிறீட் வீதிகள் அமைக்கப்பட்டுக் கொண்டிருக்கின்றன. அந்த வீதிகள் 10 அடி முதல் 12 அடி அகலமான வீதிகளாக இருப்பதால் 2 வாகனங்கள் ஒன்றையொன்று மாறிச்செல்லமுடியாத ஒரு

நிலை காணப்படுகின்றது. உண்மையாக அந்த வீதிகள் மக்களுக்கான வீதிகளாக இல்லை. அவை அரசாங்கத்துடன் இருப்பவர்களின் நலன்களுக்காக அமைக்கப்பட்ட வீதிகள்! வீதிகளுக்கு ஒதுக்கப்படும் பணத்திலிருந்து அவர்கள் தங்களுடைய தரகு வீதங்களைப் பெற்றுக்கொள்கிறார்கள். எனவே வடக்கு, கிழக்கிலே அமைக்கப்படுகின்ற வீதிகள் மக்களின் பாவனைக்கு உதவாத வீதிகளாகத்தான் இருக்கின்றன. இதுபற்றி நான் கடந்த பாராளுமன்ற அமர்விலே போக்குவரத்து தொடர்பான வரவு செலவுத் திட்ட குழுநிலை விவாதத்தின்போதும் தெளிவாகச் சுட்டிக்காட்டியிருந்தேன். ஆகவே, வீதிகளை அமைக்கும்போது சரியான முறையில் திட்டமிட்டுச் செய்தால், அவற்றின்மூலமாக மக்கள் தடங்கலின்றிச் செல்வதற்கு வாய்ப்பிருக்குமென்பதைத் தெரிவித்துக் கொள்கின்றேன்.

மட்டக்களப்பு மாவட்டத்திலே இருக்கின்ற ஏ-5 என்று குறிப்பிடப்படும் செங்கலடி - பதுளை வீதி மிகவும் பழமைவாய்ந்ததாகும். ஆனால், இதுவரை அந்த வீதி திருத்தப்படவில்லை. இதனால் மட்டக்களப்பிலிருந்து பதுளை நோக்கிச் செல்பவர்கள் பல இன்னல்களை எதிர்நோக்குகின்றார்கள். அந்த வீதியிலே இருக்கின்ற பல பாலங்கள் உடைந்திருக்கின்றன. அவையும் திருத்தப்பட வேண்டும் என்பதை நான் இங்கு தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன். இதைவிட மட்டக்களப்பு மாவட்டத்திலே ஒரு புனித ஸ்தலமாக இருக்கக்கூடிய தாந்தாமலைப் பிரதேசத்துக்குச் செல்கின்ற வீதி, அதாவது அம்பிளாந்துறையிலிருந்து மாவடி முன்மாரி - அத்தியா முன்மாரி - தாந்தாமலை வரையான அந்த வீதி கடந்த காலங்களில் பல அழிவுகளைச் சந்தித்திருக்கின்றபோதிலும், இதுவரையிலே திருத்தப்படாமல் இருக்கின்றது. இந்த வீதியையும் திருத்த வேண்டிய ஒரு கடமை அரசாங்கத்துக்கு இருக்கின்றது. எனவே, இந்த விடயத்தையும் கவனத்தில் எடுக்குமாறு நான் இவ்விடத்தில் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

வீதி என்பது ஒரு நாட்டின் அபிவிருத்திக்கு இன்றியமையாத ஒன்றாகும். அதேநேரம், அமைக்கப்படுகின்ற வீதிகள் சரியான முறையில், அதாவது விதிகளுக்கு அமைவாக அமைக்கப்படுகின்றதா என்றால், "இல்லை" என்றுதான் நாங்கள் கூறவேண்டியிருக்கின்றது. அங்கே சில இடங்களில் அந்த வீதிகள் சரியான முறையில் அமைக்கப்பட்டாலும்கூட பல இடங்களில் அந்த வீதிகளில் பல பிழைகள் ஏற்பட்டிருக்கின்றன. அந்தப் பிழைகள் ஏற்படுவதற்குப் பலர் துணைபோகின்றார்கள். ஆகவே, ஊழலற்ற ஒரு நாட்டைக் கட்டியெழுப்ப வேண்டும் என்று விரும்புகின்ற இந்த அரசாங்கம் இந்த வீதிகளைச் செப்பனிடுகின்ற பணியை நேர்மையானவர்களிடம் ஒப்படைக்க முன்வர வேண்டும். ஒரு விவசாய நிலமாக இருந்து கொண்டிருக்கின்ற மட்டக்களப்பு மாவட்டத்தில் மானாவாரி நெற்செய்கைக்கான அறுவடை ஆரம்பித்திருக்கின்ற இந்த வேளையிலே அங்கு பெய்த பெரும் மழை காரணமாக அந்த மக்கள் மிகவும் பாதிப்புக்குள்ளாகி இருக்கின்றார்கள். அந்த விவசாய நிலங்களுக்குச் செல்கின்ற வீதிகள்கூட சரியான முறையிலே செப்பனிடப்படாமல் இருக்கின்றன. ஏனெனில், அவற்றைச் செப்பனிடுவதில் குளறுபடிகளும் ஊழல்களும் நிறைந்து காணப்படுகின்றன. ஆகவே, குறித்த விடயங்களைக் கவனத்தில் எடுத்து ஆவன செய்ய வேண்டுமென்று கேட்டுக்கொள்கிறேன்.

அதிவேக வீதி அல்லது நெடுஞ்சாலைகளின் அமைப்புக்கு வெளிநாடுகள் இரண்டு விதமாக, அதாவது மானிய அடிப்படையிலும் கடன் அடிப்படையிலும், உதவி வருகின்றன. இந்தப் பாதை அமைப்பின்போது பாதிக்கப்படுகின்ற காணி மற்றும் வீட்டுச் சொந்தக்காரர்களுக்கு மானிய அடிப்படையிலான உதவித் திட்டத்தின்கீழ் நஷ்டஈடு கொடுக்கப்படுகின்றது. ஆனால், வடக்கு, கிழக்கில் கடன் திட்டத்தின் அடிப்படையிலேயே இந்த வீதி அமைப்பு வேலைகள் இடம்பெறுவதால் அந்த நஷ்டஈடு அங்குள்ள மக்களுக்குக் கிடைப்பதில்லை. ஆகவே, பல வருடங்களாகப் பல்வேறு வகையிலும் பாதிக்கப்பட்ட அந்த மக்களுக்கு குறித்த நஷ்டஈடுகளைக் கொடுப்பதற்கு முன்வரவேண்டும் என்று நான் கேட்டுக்கொள்கின்றேன். அவ்வாறு செய்வதுதான் அந்த மக்களுக்கு நன்மை பயக்கக்கூடியதாக இருக்கும். அதேநேரம், எந்தவொரு பாரபட்சமும் இல்லாமல் இந்த வீதி அமைப்பு வேலைகள் சரியான முறையிலே முன்னெடுக்கப்பட வேண்டும் என்றும் கேட்டு, விடைபெறுகின்றேன். நன்றி. வணக்கம்.

[අ. භා. 4.13]

**ගරු කනක හේරත් මහතා**
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජාතික මංමාවත් පනත යටතේ ඇති නියෝග පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන අවස්ථාවේදී මටත් අදහස් ප්‍රකාශ කරන්නට ලැබීම පිළිබඳව මා බෙහෙවින් සන්තෝෂ වනවා.

අතිගරු ජනාධිපතිතුමාගේ මහින්ද චින්තනය යටතේ දැවැන්ත සංවර්ධනයක් අද අප රට තුළ සිදු වෙමින් පවතින අවස්ථාවක්, මේ. විශේෂයෙන්ම මෙම දක්ෂිණ අධිවේගී මාර්ගය නොවැම්බර් මාසයේදී විවෘත කළා පමණක් නොවෙයි, අපේ ගම් ප්‍රදේශවල ඇති පළාත් සභා මාර්ග, පළාත් පාලන මාර්ග සහ අනෙකුත් මාර්ග පවා විශාල වශයෙන් සංවර්ධනය කරන අවස්ථාවක් තමයි අද තිබෙන්නේ. අපේ ප්‍රදේශයේත්, වතුකරයේත් ඇති මාර්ග සියල්ලක්ම සංවර්ධනය කිරීමක් අද අතිගරු ජනාධිපතිතුමාගේ රජය විසින් සිදු කරනු ලබනවා. ඒ යටතේ අපේ නගරවලට පමණක් නොවෙයි, ගමටත් කොන්ක්‍රීට් පාරවල් ලබා දීලා තිබෙනවා. අපේ ප්‍රදේශය වැනි කඳුකර ප්‍රදේශවලට මේ කොන්ක්‍රීට් මාර්ග ලබා දීම තුළින් එම ප්‍රදේශවල ජනතාවට විශාල සේවයක් වනවා. වසර ගණනාවක් පිළිසකර නොකර තිබූ එම මාර්ග මෙසේ සංවර්ධනය කිරීමෙන් පසු අපට එම මාර්ගවලින් නිසි ප්‍රයෝජනය ගත හැකි වනවා.

පසු ගිය වසරේදී සෑම ආසනයකටම කිලෝමීටර් තිහක කොන්ක්‍රීට් මාර්ග ලබා දුන්නා. ඒ වාගේම අද පළාත් මාර්ග සියල්ලක්ම කාපට් කරමින් පවතිනවා. ඒ පිළිබඳව අපි ඉතාම සන්තෝෂ වනවා.

මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීම තුළින් තමයි අප සියලු දෙනාම බලාපොරොත්තු වන පරිදි අපේ රට සමෘද්ධිමත් රටක් බවට පත් කරන්නට හැකියාවක් ලැබෙන්නේ. අද මේ සංවර්ධනය දකුණු ප්‍රදේශයට පමණක් සීමා නොවී, වසර තිහක යුද්ධයක් නිසා කිසිම සංවර්ධනයක් නොකෙරුණ උතුරු පළාතත් විශාල වශයෙන් සංවර්ධනය වනවා. යුද්ධය අවසාන වුණාට පසුව අපි ඒ ප්‍රදේශවල සංචාරය කරද්දී ඒ මාර්ගවල තිබුණු තත්ත්වය අපි දැක්කා. ඒ වාගේම ටික කාලයකට පසු අපි නැවතත් උතුරු ප්‍රදේශයේ සංචාරය කරද්දී අපට ඇස් පනාපිට දකින්නට ලැබෙනවා ඒ ප්‍රදේශවල සංවර්ධනය වෙච්ච මාර්ග. ඒ විතරක් නොවෙයි, අද මුළු ලංකාවේම මාර්ග පද්ධතිය විශාල වශයෙන් සංවර්ධනය වෙමින් පවතින අවස්ථාවක් තිබෙන්නේ.

පසු ගිය වසරේ නොවැම්බර් 27 වන දා ප්‍රථම වතාවට අපේ රටේ අධිවේගී මාර්ගයක් අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වයෙන් ජනතා අයිතියට පත් කළා. මේ අධිවේගී මාර්ගය

[ගරු කනක හේරත් මහතා]

කිලෝමීටර් 95ක් දුරට කොට්ටාවේ සිට පින්නදූව දක්වා දිවෙනවා. මේ මාර්ගය භාවිත කරන රියැදුරන්ගෙන් ගාස්තුවක් අය කිරීමේ කටයුත්ත තමයි ජාතික මංමාවත් පනත යටතේ ඉදිරිපත් කරන මේ නියෝග සම්මත කර ගැනීම තුළින් අප බලාපොරොත්තු වන්නේ.

මේ මාර්ගය සැලසුම් කරන්න, නිර්මාණය කරන්න, ඉදි කරන්න ඩොලර් මිලියන 750ක මුදලක් වැය වුණා. ඒ සියල්ල නැවතත් රජයට ලබා ගැනීමට පමණක් නොවෙයි, මේ මාර්ගය පවත්වා ගෙන යෑම - නඩත්තුවට- සඳහාත්, ඒ මාර්ගය සඳහා කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සඳහාත්, ඒ අය පුහුණු කිරීමට අවශ්‍ය මුදල් සපයා ගැනීම සඳහාත් තමයි මේ මාර්ගය භාවිත කරන රියැදුරන්ගෙන් යම් මුදල් ප්‍රමාණයක් අය කර ගන්නේ. එපමණක් නොවෙයි, මේ අධිවේගී මාර්ගය භාවිත කරන ඒ සියලු දෙනාටම අවශ්‍යතාවන් තිබෙනවා; අවශ්‍ය සේවාවන් තිබෙනවා. ඒ අනුව විශේෂයෙන්ම ගිලන් රථ සේවය, ප්‍රථමාධාර ඒකකය, ගිනි නිවන රථ, ගිමන් හරින ස්ථාන පහසුකම්, පොලිස් ඒකක සඳහා මේ ලබා ගන්නා මුදල් භාවිත කරනවා.

මේ මාර්ගයේ කොට්ටාවේ සිට පින්නදූව දක්වා කාර් එකක ගමන් කළොත් කිලෝමීටරයකට අපට වැය වන්නේ රුපියල් 4.20ක් පමණ. ඒ අනුව සම්පූර්ණ ගමනට අපට වියදම් කරන්න වන්නේ රුපියල් 400ක් පමණයි. මේ මුදලට වඩා වැඩි මුදලක් වැය කරලා තමයි පසු ගිය කාලයේ අපි කොළඹ සිට ගාල්ලට ගියේ. ඒ මාර්ගයෙන් ගාල්ලට යද්දී, කිලෝමීටර් 115ක් පමණ දුර යන්න පැය දෙකහමාරක්, පැය තුනක් පමණ කාලයක් අපි මිඩංගු කරනවා. නමුත් මේ අධිවේගී මාර්ගය තුළින් අද ඒ කාලයෙන් හරි අඩකටත් වඩා අඩු ප්‍රමාණයකින් -පැයකින් පමණ- කොළඹ සිට ගාල්ල දක්වා කාර් රියකින් ගමන් කරන්න හැකියාව ලැබී තිබෙනවා. මේ නිසා ජනතාවට තමන්ගේ කාලය ඉතුරු කර ගන්න පුළුවන් කියලා මම හිතනවා. එපමණක් නොවෙයි, මේ මාර්ගය පාවිච්චි කරන විට රියැදුරන්ට තවත් ප්‍රතිලාභ රාශියක් අත් වෙනවා. විශේෂයෙන්ම ඉන්ධන භාවිතය විශාල වශයෙන් අඩු කර ගන්න හැකියාවක් තිබෙනවා. ඒ වාගේම මේ මාර්ගයේ ගමන් කරන විට ටයර් සහ වාහනයේ අනිකුත් කොටස් ඉතාම අඩුවෙන් තමයි ක්ෂය වන්නේ. ඊට අමතරව කාර්යක්ෂමව මේ මාර්ගයේ වාහනය ධාවනය කරවන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ අධිවේගී මාර්ගය ඉතාම සුන්දර පරිසරයක තමයි පිහිටලා තිබෙන්නේ. අප වෙනත් මාර්ගවල ගමන් කරද්දී ඒවායේ පවතින වාහන තදබදය නිසා අපේ මානසික තත්ත්වය පහළ බහිනවා. විශේෂයෙන් මේ මාර්ගයේ ගමන් කරද්දී අපට මානසික සුවයක් ලබා ගන්න හැකියාවක් ලැබෙනවා.

ලංකාවේ සිදු වන රිය අනතුරු ප්‍රමාණය වසරින් වසර වැඩි වෙනවා. මේ අධිවේගී මාර්ගය ආරම්භ කරලා දැනට මාස දෙකක් වෙනවා. ඒ මාස දෙක ඇතුළතදී රිය අනතුරු 104ක් වෙලා, මරණ එකයි සිදු වෙලා තිබෙන්නේ. ඒ අනුව අනික් මාර්ග සමඟ සංසන්දනය කරද්දී මේ මාර්ගයේ සිදු වන රිය අනතුරු ප්‍රමාණයත්, මරණ ප්‍රමාණයත් ඉතාම අඩු බව අපට පෙනෙනවා. තිබෙන ගැටලු සියල්ලක්ම නිරාකරණය කර ගත්තොත් ඉදිරියේදී සිදු වන රිය අනතුරු ප්‍රමාණය ඊටත් වඩා අඩු වෙයි කියලා අප හිතනවා.

ඉදිරියේදී ඉදි වන මත්තල ගුවන් තොටුපොළ, හම්බන්තොට වරාය භාවිත කරද්දී මේ අධිවේගී මාර්ගය අපට ඉතාම වැදගත් වෙනවා. ඒ වාගේම නුදුරු අනාගතයේදී ඉදි වෙන්න නියමිතව තිබෙන කොළඹ-මහනුවර අධිවේගී මාර්ගය තුළින්, -

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
*දැන් අවසන් කරන්න ගරු මන්ත්‍රීතුමනි.*

**ගරු කනක හේරත් මහතා**
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)
පිටත වටරවුම මාර්ගය ඇතුළු ඒ සියලුම අධිවේගී මාර්ග තුළින් අපේ ජනතාවට විශාල සේවාවක් ලබා ගන්න හැකියාවක් ලැබෙයි කියන බලාපොරොත්තුව අප තුළ තිබෙනවා.

තාක්ෂණයත් සමඟ ඉදිරියට ගිහිල්ලා අනාගතයේදී වෙනත් රටවල් භාවිත කරන තාක්ෂණ ක්‍රම - e-tag, credit card - මේ මාර්ගයේ ගෙවීම් කටයුතු කිරීමට යොදා ගන්න හැකි වෙයි කියන අපේක්ෂාව අප තුළ තිබෙනවා.

මා මේ අවස්ථාවේදී අතිගරු ජනාධිපතිතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා, විශේෂයෙන්ම මෙවැනි අධිවේගී මාර්ග ඉතා ඉක්මනට අපේ රටට ලබා දීම ගැන. ඒ තුළින් අපේ ප්‍රවාහන පද්ධතියට විශාල සේවයක් සිදු වනවා වාගේම, මේ රට සමෘද්ධිමත් රටක් බවට පත් කරන්න යන මාර්ගයට අඩිතාලම වැටීමක් හැටියටයි අප එය දකින්නේ. බොහොම ස්තුතියි.

[பி.ப. 4.21]

**ගරු හුනෙයිස් ෆාරුක් මහතා**
(மாண்புமிகு ஹுனைஸ் பாறூக்)
(The Hon. Hunais Farook)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, தேசிய பொது வழிகள் சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள் பற்றிய இந்த விவாதத்தில் பங்குகொண்டு உரையாற்றுவதற்குச் சந்தர்ப்பம் கிடைத்தமைக்காக மகிழ்ச்சியடைகின்றேன். இலங்கையில் நிர்மாணிக்கப்படுகின்ற அதிவேகப்பாதை வலையமைப்பின் முதற்கட்டம், 2011ஆம் ஆண்டு நவம்பர் மாதம் 27ஆம் திகதி மேதகு ஜனாதிபதி அவர்களினால் திறந்துவைக்கப்பட்டது. இந்த அதிவேக நெடுஞ்சாலை உருவாக்கமானது, எதிர்காலத்தில் இலங்கையை ஆசியாவின் ஆச்சரியம் மிக்க நாடாக மாற்றும் எமது ஜனாதிபதி அவர்களின் தூரநோக்கை மிக விரைவில் எட்டக்கூடிய வாய்ப்பை ஏற்படுத்துவதற்கான ஓர் ஆரம்பம் என நான் நினைக்கின்றேன். ஏனென்றால், ஒரு மனிதனுக்கு அல்லது ஓர் உயிரினத்துக்குத் தலைப்பாகம் எவ்வளவு முக்கியமாக இருக்கின்றதோ அதேபோன்று ஒரு நாட்டின் அபிவிருத்திக்குப் பாதை வலையமைப்பு என்பது மிகவும் முக்கியமானதாக இருக்கின்றது. அந்த வகையில் மேதகு ஜனாதிபதி அவர்கள் ஆட்சியைப் பொறுப்பெடுத்த பின்னர் இலங்கையில் பாதையமைப்புக்காக அதிகளவான நிதி ஒதுக்கப் பட்டிருப்பதைக் காணலாம்.

ஒரு நாட்டில் எந்தத் துறையை நோக்கினாலும் அதன் அபிவிருத்திக்கும், குறிப்பாக தலைநகரோடு கிராமங் களையோ, ஏனைய பிரதேசங்களையோ இணைப்பதற்கும் தலைநகரத்தை நோக்கி மக்களின் வருகை அதிகமாக இருப்பதைக் குறைத்து, அவர்களின் பிரதேசங்களிலேயே அவர்களுக்கான தொழில்வாய்ப்புகளையும் ஏனைய தேவை களையும் நிறைவேற்றிக்கொள்வதற்கும் இந்தப் பாதைய மைப்பு மிகவும் அத்தியாவசியமாக இருக்கின்றது. இதனடிப் படையில், அதிவேகப் பாதைக்காக 2011ஆம் ஆண்டு 38,387

மில்லியன் ரூபாயும் 2012ஆம் ஆண்டு 40,767 மில்லியன் ரூபாயும் ஒதுக்கப்பட்டிருப்பதைக் காணலாம். இதேபோன்று எமது வட பிரதேசத்தை எடுத்துக்கொண்டால், தேசிய பாதை அபிவிருத்திக்காக 2011ஆம் ஆண்டு 11,592 மில்லியன் ரூபாயும் 2012ஆம் ஆண்டு 14,300 மில்லியன் ரூபாயும் ஒதுக்கப்பட்டிருக்கின்றது. இதேபோன்று ஏனைய பாதை ஒழுங்கமைப்பைப் பொறுத்தமட்டில், 2011ஆம் ஆண்டு 4,315 மில்லியன் ரூபாயும் 2012ஆம் ஆண்டு 5,050 மில்லியன் ரூபாயும் ஒதுக்கப்பட்டிருக்கின்றது. கடந்த முப்பது வருடங்கள் யுத்தத்துக்குள் மூழ்கடிக்கப்பட்ட இந்த நாடு சமாதானத்தையும் சுபிட்சத்தையும் நோக்கிப்போகின்ற இந்தச் சமயத்தில் இலங்கையின் தென் பகுதிக்கு மாத்திரமல்லாமல் வட பகுதிக்கும் பாதை அபிவிருத்திக்காகப் பாரிய தொகை ஒதுக்கப்பட்டிருக்கின்றது. இன்று வட பகுதிக்கான பாதைகளில் செல்கின்றவர்கள் அந்தப் பாதைகள் - ஏ-9 பாதையாக இருக்கலாம் அல்லது ஏ-32 பாதையாக இருக்கலாம் - மிகவும் குறுகிய நேரத்தில் செல்லக்கூடிய வகையில் அழகான முறையில் வடிவமைக்கப்பட்டிருப்பதைப் பார்க்கக்கூடியதாக விருக்கும்.

இங்கு எதிர்க்கட்சி சார்பில் உரையாற்றிய சிலர் இந்த அதிவேக நெடுஞ்சாலை அமைப்பின் காரணமாகப் பல விபத்துக்கள் ஏற்படுவதாகக் கூறினார்கள். அதிவேக நெடுஞ்சாலைகளில் அல்லாமல் ஏனைய வீதிகளில் சாதாரணமாக விபத்துக்கள் ஏற்படுவதில்லையா? எனவே, விபத்துக்களைப் பொறுத்தமட்டில், அவை ஏற்படுவதற்குக் காரணமாக இருப்பது பாதைகளல்ல, சாரதிகள்தான். வாகனத்தை ஓட்டுபவர்கள் கவனமாக ஓட்டினால் விபத்துகளைத் தவிர்க்கலாம்; பாதைகள் அதற்குக் காரணமல்ல. ஒருவேளை எதிர்க்கட்சியினரின் பார்வைகள் தான் அதற்குக் காரணமாக இருக்கலாம் என நான் நினைக் கிறேன். நாட்டில் நல்ல விடயங்களை முன்னெடுக்கும்பொழுது கட்சி பேதம் இல்லாமல், இன, மத பேதங்கள் இல்லாமல், பிரதேசவாதம் பார்க்காமல் அதற்கு ஒத்துழைக்கின்ற பட்சத்தில்தான் நாம் எமது நாட்டை அபிவிருத்தியடைந்த, சுபிட்சம் மிக்க ஒருநாடாக ஆக்கலாம். எனவே, அந்த வகையில் அபிவிருத்தி நடந்துகொண்டிருக்கின்ற இந்தச் சந்தர்ப்பத்தில் நான் வன்னி மக்கள் சார்பாக ஒரு முக்கியமான விடயத்தை இந்தச் சபையில் முன்வைக்க விரும்புகின்றேன்.

இன்று வட மாகாணத்தில் மீள்குடியேற்றம் மிகவும் துரிதமாக நடந்துகொண்டிருக்கின்றது. மன்னார் மாவட்டத் தைப் பொறுத்தமட்டில் 20 வருட காலத்துக்கு முன்னர் அங்கிருந்து வெளியேற்றப்பட்ட முஸ்லிம் மக்கள் தங்கள் பிரதேசங்களுக்கு மீள்குடியேற்றத்துக்காகச் சென்று கொண்டிருக்கின்ற இந்த வேளையில் முக்கியமான ஒரு விடயம் அவர்களுக்குத் தடையாக இருந்து கொண்டிருப்பதை நாங்கள் அந்த மக்கள்மூலம் அறியக்கூடியதாக இருக்கின்றது. அதாவது, 20 வருடங்களுக்கு முன்னர் அங்கு ஆசிரியர் நியமனங்களைப் பெற்ற நாற்பதுக்கும் மேற்பட்ட ஆசிரியர்கள் பின்னர் வட மேல் மாகாணத்தின் புத்தளம் போன்ற பிரதேசங்களுக்கு இடம்பெயர்ந்ததனால் வட மேல் மாகாண ஆசிரியர் சேவையில் தங்களைப் பதிவுசெய்திருந்தார்கள். சுமார் ஒன்றரை வருட காலத்திற்கு முன்னர் அதாவது எப்பொழுது அரசாங்கம் மன்னார் மக்கள் மீள்குடியேறலாம் என அறிவித்ததோ அன்றே அந்த நாற்பதுக்கும் மேற்பட்ட ஆசிரியர்களும் தங்கள் சொந்த மண்ணுக்கு, அதாவது தாங்கள் எங்கு ஆசிரியர் நியமனங்களைப் பெற்றார்களோ அந்த இடத்துக்குச் செல்ல விரும்பி, அந்த இடமாற்றத்தைப் பெற்றுத் தரும்படி வட மேல் மாகாண கல்வி அமைச்சுக்கு விண்ணப்பித்திருந்தார்கள். அவர்களில் சிலர் ஒவ்வொரு வாரமும் வட மேல் மாகாண கல்வி அமைச்சுக்குச் சென்று இதற்காக முயற்சி செய்திருக்கின்றார்கள் என்று நான் நினைக்கின்றேன். ஆனால், இதுவரை அவர்களுக்கு எந்தப் பலனும் கிடைக்கவில்லை. மிகவும் பயிற்சிபெற்ற ஆசிரியர் களான நாற்பதுக்கும் மேற்பட்ட இந்த ஆசிரியர்களுக்கும் மன்னார் மாவட்டத்திற்கு இடமாற்றம் கிடைக்கும் என்ற நம்பிக்கையோடு அங்கு மீள்குடியேறிய அந்தப் பெற்றோரும் பிள்ளைகளும் மீண்டும் வட மேல் மாகாணத்துக்குத் திரும்பக்கூடிய ஒரு நிலை இதனால் ஏற்பட்டுள்ளது.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

அவர்களுக்கு வடமேல் மாகாணத்தில் தற்காலிக இணைப்புத்தான் கொடுத்திருக்க முடியும். ஏனென்றால் வட மாகாணத்துக்குரிய வெற்றிடங்கள்தான் அவர்கள்மூலம் நிரப்பப்பட்டிருக்கின்றன. எனவே, எப்படி வடமேல் மாகாணம் அவர்களுக்கு நிரந்தர நியமனம் கொடுக்க முடியும்?

**ගරු හුනෛයිස් ෆාරූක් මහතා**
(மாண்புமிகு ஹுனைஸ் பாறூக்)
(The Hon. Hunais Farook)

ஏற்கெனவே இருபது வருடங்களுக்கு முன்னர் மன்னார், முல்லைத்தீவு, யாழ்ப்பாணம் போன்ற மாவட்டங்களில் நிரந்தர ஆசிரியர் நியமனங்களைப் பெற்ற இந்த ஆசிரியர்கள் இடம்பெயர்வின் காரணமாக புத்தளம் மாவட்டத்துக்கு வருகைதந்தபொழுது புத்தளம் மாவட்டத்திலுள்ள பாடசாலை களில் கற்பிக்க வேண்டிய நிர்ப்பந்தம் ஏற்பட்டதனால், அவர்களது சம்பளங்களை இலகுவாகப் பெறுவதற்கு ஏதுவாக வடமேல் மாகாண கல்வித் திணைக்களத்தில் தங்களது பதிவுகளை மேற்கொண்டிருந்தார்கள். ஆனால், இன்று வடமேல் மாகாணம் அவர்களில் உரிமையும் சொந்தமும் கொண்டாடுகின்றது .

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

அவர்கள் அங்கு தற்காலிக இணைப்பில்தான் இருந்திருக்க முடியும். அவர்களுக்கு வடமேல் மாகாணம் நிரந்தர நியமனம் கொடுத்திருக்க முடியாது. ஏனென்றால் வட மாகாண வெற்றிடங்களுக்கு ஊடாகத்தான் அவர்களுக்கு அந்த ஆசிரியர் நியமனங்கள் வழங்கப்பட்டன.

**ගරු හුනෛයිස් ෆාරූක් මහතා**
(மாண்புமிகு ஹுனைஸ் பாறூக்)
(The Hon. Hunais Farook)

நிச்சயமாக! உண்மையிலே அவர்களுக்கு உரித்தானது வட மாகாணம். இன்று அவர்களது உரித்துக்கும் விருப்பத்துக்கும் மாறாக வடமேல் மாகாணம் செயற்படுகின்றது என்பதை இங்கே சுட்டிக்காட்ட வேண்டும். நானும் வடமேல் மாகாண முதலமைச்சரிடமும் மாகாணக் கல்வி அமைச்சரிடமும் அங்குள்ள மாகாணக் கல்விப் பணிப்பாளரிடமும் இது தொடர்பாகப் பலமுறை கதைத்திருக்கிறேன். அதேபோன்று வன்னி மாவட்ட அபிவிருத்திக் குழுவின் தலைவர் மாண்புமிகு றிஸாத் பதியுதீன் அவர்களும்கூட கதைத்திருக்கின்றார். இன்றுகூட வட மாகாண ஆளுநரின் பிராந்தியங்களுக்கான ஆணையாளர் இது தொடர்பில் கல்வி அமைச்சின் அதிகாரி களைச் சந்திப்பதற்காகச் சென்றிருக்கின்றார். தற்பொழுது, நாட்டில் பல அபிவிருத்திப் பணிகள் நடைபெற்றுக் கொண்டிருக்கின்ற இச்சந்தர்ப்பத்தில், நவீன பாதைகளை அமைப்பதற்குத் திட்டமிடுகின்ற இச்சந்தர்ப்பத்தில், மீள்குடியேற்றத்தை வெற்றிகரமாக நடத்தி முடிக்க வேண்டு மென கொள்கை வகுத்து, அதற்கேற்ற நடவடிக்கைகளை

[ගරු හුනෙයිස් ෆාරුක් මහතා]

மேதகு சனாதிபதி அவர்கள் மேற்கொண்டுவருகின்ற இச்சந்தர்ப்பத்தில், ஒரு சில அதிகாரிகள் தங்களது சுயநலத்துக்காக செய்கின்ற வேலைகள், சனாதிபதி அவர்களுடைய நல்ல நோக்கங்களுக்கும் அவருடைய அரசாங்கம் செய்கின்ற நல்ல சேவைகளுக்கும் இழுக்காக அமைகின்றன. எனவே, வட மாகாணத்துக்கு இடமாற்றம் கோரி விண்ணப்பித்த 40க்கும் மேற்பட்ட ஆசிரியர்களின் விண்ணப்பங்களைக் கவனத்திலெடுத்து, அவர்களை உடனடியாக இடமாற்றம் செய்வதற்கான நடவடிக்கைகளை மேற்கொள்ள வேண்டுமென நான் வேண்டுகோள் விடுக்கின்றேன். இதன்மூலம் வட மாகாண முஸ்லிம்களுடைய மீள்குடியேற்றம் வெற்றிகரமாக அமையும் என்பதில் எந்தவித சந்தேகமுமில்லை.

இறுதியாக, இன்று விவாதத்துக்கு எடுத்துக்கொள்ளப் பட்டுள்ள பொது வழிகள் சட்டத்தின்கீழான ஒழுங்குவிதிகள், நிச்சயமாக எமது நாட்டினுடைய எதிர்கால அபிவிருத்திக்குத் தேவையானவையே எனத் தெரிவித்து, இன்று நாட்டில் எந்தவித பிரதேசவாதமோ, இனவாதமோ, கட்சி பேதமோ இன்றி வீதி அபிவிருத்தி போன்ற மேலும் பாரிய நல்ல பணிகளை மேற்கொண்டு வருகின்ற சனாதிபதி மஹிந்த ராஜபக்ஷ அவர்களுக்கு இந்த நாட்டு மக்கள் சார்பாக, குறிப்பாக எமது வன்னி மாவட்ட மக்கள் சார்பாக நன்றிகூறி, விடைபெறுகின்றேன்.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
நன்றி. The next speaker is the Hon. Gamini Jayawickrama Perera. Before that, will an Hon. Member propose the Hon. Alhaj A.H.M. Azwer to take the Chair?

**ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன)
(The Hon. (Mrs.) Sumedha G. Jayasena)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon MR. DEPUTY CHAIRMAN OF COMMITTEES left the Chair, and THE HON. ALHAJ A.H.M. AZWER took the Chair.*

[අ. භා. 4.32]

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුලින්ම මම මගේ ස්තූතිය පුද කරනවා, ගරු රවි කරුණානායක මැතිතුමාට, එතුමාගේ කථාවට ඉස්සර වෙලා මට අවස්ථාව දීම ගැන. මම හිතනවා, අප මේ රජයට අද නොබෙල් තෑග්ගක් දෙන්න ඕනෑ කියා. ඒ, දක්ෂිණ අධිවේගී මාර්ගය සම්බන්ධයෙන් විතරක් නොවෙයි. මොකද, මේ රජය හරි දක්ෂයි මහා මාර්ග හදන්න; premix කරන්න, carpet කරන්න, concrete කරන්න. අය වැය මඟිනුත් විශාල මුදලක් ණයට අර ගෙන තිබෙනවා. ඒ භාණ්ඩාගාරයේ සල්ලි නොවෙයි. අර ගෙන තිබෙන සම්පූර්ණ මුදල දිහා බැලුවාම ඒ අතරින් හුඟක් අර ගෙන තිබෙන්නේ පාරවල් හදන්නයි. පාරවල්වලට තමයි අද ප්‍රමුඛතාව දීලා තිබෙන්නේ. සමහර අය අහනවා, "අපට පාරවල් කන්නද?" කියලා. ඊයේ පෙරේදා එක්තරා පුවත් පතක් -මා හිතන්නේ "ද අයිලන්ඩ්" පත්තරය වෙන්න ඕනෑ- සමීක්ෂණයක් කරලා තිබුණා. ඔවුන් ඒ සමීක්ෂණයේදී දක්ෂිණ අධිවේගී මාර්ගය ගැන මහ ජනතාවගෙන් අහද්දී සියයට 70ක් විතර කියා තිබෙන්නේ, එයින් අපට ආර්ථික වශයෙන් ඵලදායකත්වයක් නැහැ කියායි. එවැනි මහ ජන මතයක් ඒ සමීක්ෂණයෙන් පෙන්නුම් කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මාර්ගය ගැන "රාවය" පත්තරයේ පළ වූ ඉතාම වැදගත් ලිපියක් මා ළඟ තිබෙනවා. "රාවය" කියන්නේ අපේ පත්තරයක් නොවෙයි. 1990 ගණන්වලදී එක්සත් ජාතික පක්ෂ රජය දක්ෂිණ අධිවේගී මාර්ගය පටන් ගන්න ගියා. පසුව චන්ද්‍රිකා රජය කාලයේ ඒ වැඩ නවත්තලා තිබෙනවා. ඊට පසුව චන්ද්‍රිකා රජයම -අද ඉන්න පාලකයන්ගේ රජය- එදා නීති කඩමින්, කිසිම ටෙන්ඩරයක් නොකැඳවා, ගිවිසුමක් අත් සන් කරලා හිතුවක්කාර ලෙස රුපියල් මිලියන 10,000කට කොරියන් සමාගමකට එහි කොන්ත්‍රාත්තුව දුන්නා. නමුත් භාණ්ඩාගාරයට සල්ලි නැතිව චන්ද්‍රිකා රජය කාලයේ ඒ පාර හදන වැඩ නැවතුණා. ඒ නිසා අන්තිමට එක්සත් ජාතික පක්ෂ රජයට -2001 පාලන බලයට ආපු රනිල් රජයට- සිදු වුණා රුපියල් මිලියන 10,000ක් වන්දි වශයෙන් ඒ කොරියන් සමාගමට ගෙවන්න. අපට අවුරුදු දෙකයි බලයේ ඉන්න දුන්නේ. බයේ පාර්ලිමේන්තුව විසුරුවා හැරියා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් -අස්වර් මැතිතුමාත්- එදා අපේ රජයේ හිටියා. මා සාක්ෂියට ඔබතුමාව ගන්නවා. ඒ එදා තත්ත්වය. 2011.12.11 වැනි දා "රාවය" පත්‍රයේ 7 සහ 19 පිටුවල ඒ මුළු සැලසුම පිළිබඳව සඳහන් කරලා තිබෙනවා. එහි පැහැදිලිව පෙන්වනවා, එදා එක්සත් ජාතික පක්ෂ රජයේ මහාමාර්ග ඇමතිවරයා ලෙස තිලක් මාරපන මහතා මේ කර්තව්‍යය ආරම්භ කළ බව. එදා රනිල් රජය අදාළ වන්දි ගෙවීම් සිදු කළා; මහ ජනතාවගේ සුභසාධනය ඇති කළා. මාර්ග පද්ධතිය සම්බන්ධයෙන් ණය ගැනීම් සිදු කළා. ඉතා අඩු පොලියට ණය ගනිමින්, අද වැය වූ මුදලින් සියයට 35කින් අඩියරෙන් අඩියර නිම කරන්න සැලසුම් කළ ඒ ව්‍යාපෘතිය වෙනුවෙන් අද මහා මුදලක් කාලා තිබෙනවා. එවැනි නාස්තියක් වූ අධිවේගී මාර්ගයක් තමයි අද ඇති කරලා තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම "රාවය" පත්‍රයේ පළ වූ එම ලිපිය **සභාගත*** කරනවා.

ඇයි, සමහරුන් ගල් ගහනවා කියන්නේ? යම් ව්‍යාපෘතියක් පටන් ගනිද්දී අපි බලන්න ඕනෑ ඒ ආශ්‍රිත ප්‍රදේශවල ජනතාවට එයින් ආර්ථික වශයෙන්, සමාජයීය වශයෙන් සුභදායක තත්ත්වයක්, යහපතක් සිදු වනවාද කියන එක. මමත් ඔය මාර්ගයේ ගියා. අනේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා දන්නා එක්තරා පවුලක් වාහනයකින් ඔය පාරේ ගියා.

මේ පාරේ යද්දී මේ අයට සෞඛ්‍ය හේතු මත හදිසි අවශ්‍යතාවක් මතු වුණා. ඔවුන්ට නවතින්න විධියක් නැහැ, බහින්න විධියකුත් නැහැ, ඒ අවශ්‍යතාව කරන්න විධියකුත් නැහැ. ඇයි? බහින්නත් බැහැ, තැනකුත් නැහැ, හෝටලයකුත් නැහැ, යන්න තැනකුත් නැහැනේ. අප දන්නවා පිට රටවල මේ වාගේ අධිවේගී මාර්ග හදන කොට ඒ පාරවල restaurants හදන බව. ඒ

***** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

වාගේම ඒ පාරවල hotels හදනවා; malls හදනවා. [බාධා කිරීමක්] ඔය

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

සෞඛ්‍ය නියෝජ්‍ය ඇමතිතුමා බාධා කරන්න හැදුවාට මට කරන්න දෙයක් නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ පවුල ඒ වාගේ ඇබැද්දියකට ලක් වෙලා මට ඇවිත් කිව්වා, "මෙන්න මෙහෙම දෙයක් අපට වුණා, හරිම ඇබැද්දියක්, ඊට පස්සේ ඒ මාර්ගයේ කොහෙන්ද ගිහිල්ලා, තව කිලෝමීටර් ගණනක් ගිහිල්ලා තමයි ඒක කර ගත්තේ" කියලා.

**ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)
ඒවා හදනවා.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
හදන එකක් හදන්න. හදලා නැති දෙයක් ගැන මම මේ කියන්නේ. තවම ඒවා නැහැ. ඒකයි [බාධා කිරීමක්]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ප්‍රකාශ කරනවා ඒ- [බාධා කිරීමක්] තමුන්නාන්සේලා කිව්වාට ඒ හදන්න තියෙන ඒවා හදලා කථා කරන්න. සැලසුමක් කියන්නේ ඒ සැලසුමත් එක්ක එන්න ඕනෑ කියන එකයි. සැලසුමක් එක්ක ඇවිල්ලා නැහැ. සැලසුමක් එක්ක එන්න ඕනෑ. [බාධා කිරීම්] සැලසුමක් ඇවිල්ලා නැහැ. රනිල් රජය මේවා ඔක්කොම ඇතුළු කරලායි තිබුණේ. එවැනි දෙයක් අද ඇත්තේ නැහැ. තමුන්නාන්සේලා පාර විතරක් හැදුවා. අනික් ඒවා ටික බැලුවේ නැහැ. වාහනයේ දොරක් අරින්න බැහැ. ඉඩ මදි. [බාධා කිරීම්] Lanes කීයක් තියෙන්න ඕනෑද? ඒක අඩු කරලා. ඒවා ඔක්කොම කියපු නිසා මම මේ වෙලාවේ ඒ ගැන කථා කරන්නේ නැහැ . ඒවා ඔක්කොම කියවුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ව්‍යාපෘතියක් ආරම්භ කරද්දී මහාමාර්ගය දෙපැත්තේ ඉන්න ජනතාවගේ පහසුකම් බලන්න ඕනෑ. අධිවේගී මාර්ගයේ speed කරලා වාහන යනවා. පාර දෙපැත්තේ ඉන්න මිනිස්සු බලාගෙන ඉන්නවා. මේ පාරේ ඉඳලා තමන්ගේ වෙලට කිලෝමීටර් ගණනක් යන්න ඕනෑ. ඒකද සුහදායකත්වය කියන්නේ? ඔළුව පාවිච්චි කරලා අත් දැකීම් ලබාගෙන මීත් ඉදිරියටවත් හරියට වැඩ කරන්න කියන එකයි කියන්නේ. මම විවේචනයක් නොවෙයි කරන්නේ. අත් දැකීම් තුළින් වුවත් ඔළුවක් ඇතුව ඔළුවෙන් වැඩ කරන්න කියන එකයි මම කියන්නේ. [බාධා කිරීම්] මේවා ගැහිලි. [බාධා කිරීම්] තමුන්නාන්සේ දන්නවා ගැහිලි ගැන. සෝමාවතිය පාරේ කොන්ත්‍රාත් එක දැන් පස්වැනි එක් කෙනාටත් දීලා තිබෙනවා. සෝමාවතිය පාරේ ගැහිලි. [බාධා කිරීම්] දන්නේ නැතිව වාගේ කථා කරන්න එපා. ගැහිලි. බුදු හාමුදුරුවෝත් විකුණලා.

සෝමාවතියේ වැඩවලට ජනාධිපතිතුමා කෝටි 40ක් දුන්නා. කෝටි 40කට වැඩියි, ඔක්කොම කෝටි 70ක් විතර. දැන් ඒ සල්ලි කොන්ත්‍රාත්කාරයන් ගසා කනවා. මහ නැගුමේ සභාපතිවරයෙක් හිටියා. හිල්ටන් හෝටලයේ කාමරයක කාර්යාලය තිබුණේ. එහෙම ගසා කාලා අද මොකද වෙලා තිබෙන්නේ? ඊයේ පෙරේදාත් මම සෝමාවතියට ගියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ කොන්ත්‍රාත්කාරයාත් මාරු කරලා. ජනාධිපතිතුමා ගිහිල්ලා ඒ රන් වැට විවෘත කරලා ආවා. ජනාධිපතිතුමාට මම ස්තුතිය පුද කරනවා. නමුත් කරන්නෝ මොකද කරන්නේ? ගසා කනවා ඔක්කොම එක්කහු වෙලා. පුදුම වැඩක් මේ වෙලා තිබෙන්නේ. සෝමාවතිය පාරේ මම දකින එකයි කියන්නේ. හැම කාපට් පාරෙන්ම ගසා කනවා. මෙන්න මේකයි වෙලා තිබෙන්නේ. මේ තත්ත්වය නැහැයි කියනවා නම් - [බාධා කිරීම්] තමුන්නාන්සේලාට මේ තත්ත්වය ගැන කියද්දී අමාරුයි. ඇත්ත මේක. අසත්‍යයක් නොවෙයි. තමුන්නාන්සේලා නැහැ කියනවා නම් එන්න මාත් එක්ක යන්න ගණන් හිලවු අරගෙන. [බාධා කිරීම්] මොකක්ද ඔය කියන එක? ඔබතුමාත් ගියා නේ සෝමාවතියේ. අපහාස කරනවා මෙතැන ඉඳලා. පුතා කිව්වා සෝමාවතී යමු කියලා. ඔබතුමාට යන්න සිදු වුණා. ඔව්, පසු ගිය අවුරුදු තුන හතරකට ඉස්සෙල්ලා සිදු වුණු දේවල් මතක නැහැ නේ.

**ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා (පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார - தெங்கு அபிவிருத்தி, மக்கள் தோட்ட அபிவிருத்தி அமைச்சர்)
(The Hon. A.P. Jagath Pushpakumara - Minister of Coconut Development and Janata Estate Development)
ඒ තමයි අපට තිබෙන අයිතිය.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
හරි, හරි. ඔබතුමාට ඒකෙන් දඬුවමක් ලැබුණා. ඒකයි මම කියන්නේ. [බාධා කිරීමක්] මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාරවල් සම්බන්ධයෙන් මේ රජයට තිබෙන ප්‍රතිපත්තිය තුළ මම කථා කරන්නේ.

මම දැන් ණය ගැන කථා කරනවා. අද ජපන් ණය ආධාර වශයෙන් මුදල් ලැබෙනවා. ජපානයත් එක්ක තිබෙන Agreement එක අනුව ඒ ණය මුදල් ලැබෙන්නේ කීයේ පොලියටද? The Agreement states, “The borrower shall pay interest to the bank semi-annually at the rate of 1.4 per cent per annum on the principal corresponding....”

බොහොම හොඳයි. මෙන්න, නියම ණය ගැනිලි! මේ ණය ගැනිලි හරියට හරි. නමුත් අද චීනයේ සමාගම්වලින් සියයට 7 පොලියට ණය ගන්න හදනවා. මේ තිබෙන්නේ Asian debits. ඒ සියලුම Agreements මගේ ළඟ තිබෙනවා. මොකටද ඒ වාගේ ණය ගන්නේ? කවුද ඒවායින් කොමිස් කුට්ටි ගන්නේ. කටුනායක අධිවේගී මාර්ගය ඉදි කිරීම සඳහා චීන සමාගමකට දුන්නේ ටෙන්ඩර් කැඳවීමකින් තොරවයි. ඒ, චීන රජයෙන් වැඩි පොලියකට ණය අරගෙන. අපේ කළමනාකාරී මණ්ඩල රැස්වීමේදී අපි තීරණයක් ගත්තා. නායකතුමා යම් ප්‍රකාශයක් කළා. හැම ව්‍යාපෘතියක් සඳහාම පරම්පරා ගණනක් පවුල් උකසට තියලා ණය අරගෙන තිබෙනවා. හරියට වැඩක් කෙරුණා නම් කමක් නැහැ. ණය ගන්න ඕනෑ. අපි එපා කියන්නේ නැහැ. ණය ගන්නේ නැතුව සංවර්ධනයක් කරන්න බැරි එක හරි. නමුත් ඒවායින් සාක්කුවලට කොච්චර යනවාද කියලා මම අහනවා.

ලංකාවේ කොන්ත්‍රාත්කාරයෝ කිහිප දෙනෙක් ලංකාවෙන් භාගයකට වැඩි ප්‍රමාණයක් වුණත් සල්ලිවලට ගන්න පුළුවන් තරම් අද හම්බ කිරීමක් කරනවා. ඊයේ-පෙරේදා මඟුල් උත්සවයකුත් තිබුණා. ඒ කොන්ත්‍රාත්කාරයකුගේ එක දුවෙක් මහ ඇත්තන්ගේ පුතෙක් බැන්දා. ඕවා තමයි වෙලා තිබෙන්නේ. අපි බලයට ආවට පස්සේ මේවා නියමිත තත්ත්වය අනුව කෙරෙනවාද කියලා පරීක්ෂණයක් කරන්න තීරණයක් ගත්තා. මේවා බාල තත්ත්වයෙන් කරනවා කියලා ඒ සේවකයෝ අපට කියනවා. RDA එකෙන් අපට තොරතුරු එනවා. මෙන්න මේ වාගේ බාල තත්ත්වයේ කටයුතුවල නිරත වන බව අපට පෙනෙනවා. වැස්ස වහින කොට කාපට් පාර අවුරුද්දෙන් ගැලවෙනවා. වැසි වෙලාවේ

[ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා]

premix දානවා. මම නම් එහෙම එකක් අහලා නැහැ. රට වැස්සෙත් premix දානවා. අධික වැස්ස තිබෙන වෙලාවට premix දාලා හය මාසයක්, අවුරුද්දක් යන කොට ගැලවෙනවා. තුන්වැනි වතාවටත් premix දාපු පාරවල් කුරුණෑගල දිස්ත්‍රික්කයේ තිබෙනවා. එක සැරයක් premix දානවා, ඊට පස්සේ ආයෙත් තට්ටුවක් දානවා කියලා එනවා. පුදුම ගෑහිල්ලක් මේක. මෙන්න මේ වාගේ තත්ත්වයක් වෙලා තිබෙන්නේ. මේක කනගාටුදායක තත්ත්වයක්. අපි පාරවල් හදන්න ඕනෑ. මම නැහැයි කියන්නේ නැහැ. මම විවේචනය කළත් අර්ථවත්වයි කථා කරන්නේ.

සුද්දා ලංකාවට ඇවිල්ලා ඉස්සෙල්ලාම කඳුරට පළාතේ තේ, කෝපි වැව්වේ නැහැ. ඉස්සෙල්ලා පාරවල් හැදුවා. ඒ පාරවල් තවම තිබෙනවා. නමුත් පාරවල් හදන මුවාවෙන් අද කරන්නේ ගැහිල්ල; හම්බ කිරීම. ඒක අද පුදුම විධියේ ව්‍යාපාරයක් බවට පත් වෙලා තිබෙනවා. අධිවේගී මාර්ග සෑදීමේදී හෝ වෙනත් ව්‍යාපෘතියකදී හෝ වේවා, ජනතාවට වන්දි ගෙවන්න සාධාරණ විසඳුමක් ඇති කිරීමට පාලකයෝ විධියට කාගේත් යුතුකමක් තිබෙනවා. රනිල් රජයේ සම්පූර්ණයෙන් ඒ සැලසුම තිබුණා. තව අවුරුදු හයක් තිබුණා නම් අපි එය ක්‍රියාත්මක කරනවා. දක්ෂිණ අධිවේගී මාර්ගය වේවා, වෙනත් කටයුත්තකදී වේවා එවැනි කටයුතු කිරීමේදී ජනතාවට අද ඉතාමත්ම කනගාටු තත්ත්වයක් තමයි ඇති වෙලා තිබෙන්නේ.

ඉස්සෙල්ලා කථා කරපු මන්ත්‍රීතුමා කිව්වා අධිවේගී මාර්ගයේ ආදායමින් ලැබෙන මුදල් එම මාර්ගයේ රාජකාරි කරන පොලීසියේ අයටත් යොදනවා කියලා. ඊ ළඟට වෙනත් නොයෙකුත් කටයුතුවලටත් වියදම් කරනවා කියලා කිව්වා. මම තමුන්නාන්සේලාගෙන් අහනවා, අවුරුදු 32ක් ඇතුළත මේ ණය මුදල ගෙවන්න ස්ථාවර තැන්පත් අරමුදලක් ඇති කරලා තිබෙනවාද කියලා. ඒකට වෙනම අධිකාරියක් ඇති කරලා තිබෙනවාද?

නැත්නම් අතීසාරයට අමුඩ ගහනවා වාගේ තමුන්නාන්සේලා ඒ මුදල් ටිකත් වියදම් කරනවාද? තමුන්නාන්සේලා භාණ්ඩාගාරය හරහා මේ රටේ සල්ලි අච්චු ගහලාද ඒ ණය ගෙවන්න ලැහැස්ති වෙන්නේ කියලා මම අහනවා. රට විකුණලා අවුරුදු 32ක් යන කල් ගෙවන මේ මුදල දැවැන්ත මුදලක්. මේ මුදල වෙනම fund එකක් නොවෙයි. පිට රටවල, there are companies that maintain the roads, the super highways with their funds. They maintain, they spend for that and they do the development work. I do not know what has happened. I do not know whether it has been handed over to the Sri Lanka Insurance Corporation? Where is this money going? Who is maintaining that? Is there any account that will come up for the public to see? Are you going to pay back that loan from this generating income? We have our experts here like the Hon. (Dr.) Harsha De Silva. The Central Bank is encouraging repayments to control imports. Here, the interest rates will go up even to control loans in the country.

මේ ආණ්ඩුව මහා දැවැන්ත මුදලක් වියදම් කරලා මේ රටේ පාරවල් හදන එකේ ප්‍රතිඵල -ඒ විපත- තමයි දැන් එන්න පටන් අරගෙන තිබෙන්නේ. EPF එකේ සල්ලි අරගෙන Central Bank එක Stock Market එකේ ආයෝජනය කළා. අතීසාරයට අමුඩ ගහන රජයේ ප්‍රතිපත්තිය තුළයි අපි මේ විපත දකින්නේ. එක්සත් ජාතික පක්ෂයයි, මේ රජයයි අතර වෙනස ඔන්න ඔතැනයි. එක්සත් ජාතික පක්ෂය කෙටි කාලීන, මධ්‍ය කාලීන, දීර්ඝ කාලීන ආර්ථික ස්ථාවරත්වයක් ඇති කරලා ගමේ මිනිහාට ප්‍රතිඵලයක් ලැබෙන විධියට කටයුතු කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනුරාධපුරයේ exhibition එකක් තිබෙනවා, මොකක්ද නමක් කියලා. ගම්උදාවෙන් මුළු දිස්ත්‍රික්කයේම -මොනරාගල වේවා, අනුරාධපුරය වේවා- පාරවල් හැදුවා; ආරෝග්‍යශාලා හැදුවා; අධ්‍යාපන ආයතන හැදුවා; නිවාස වැඩ පිළිවෙළවල් ඇති වුණා; වැව් හැදුවා. මේ සෑම දෙයකින්ම එදා ගමට දැනෙන ආර්ථික හා සමාජයීය සංවර්ධනයක් ඇති වුණා. අනුරාධපුරයේ exhibition එක ඒ නගරයේ කිහිප දෙනෙකු හම්බ කරන ප්‍රදර්ශනයක් බවට පුම්බා ගෙන කරනවා. මේක නොවෙයි "දැයට කිරුළ" කියන්නේ. හදවතට දැනෙන, සාක්කුවට දැනෙන, ආර්ථිකයට දැනෙන දෙයක් කරන්න ඕනෑ. කාපට් එකක් දානවා වෙන්න පුළුවන්, මොනවායින් හරි මෙන්න මේ- [බාධා කිරීමක්] ඔය සෝභන වැඩ ගැන අපි දන්නවා. බලන්න දෙයක් නැහැ. තව හය මාසයක්, අවුරුද්දක් යන්න ඉස්සෙල්ලා රජය මේ ආර්ථිකයට කරපු විනාශය තමුන්නාන්සේලාට දැක ගන්න පුළුවන්. අද Central Bank Report එක බලන්න. තව ටික දවසකින් Central Bank එකේ Governorට ඉල්ලා අස් වෙන්න වෙනවා. ජනාධිපතිතුමා ඔහුට කියාවි "උඹ රට කෑවා" කියලා. අජිත් නිවාඩ් කබ්රාල්ව බිල්ලට දෙනවා. මේ රට මහා භයානක තත්ත්වයකට එනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රජය IMF එක අඩු පොලියට දීපු ණය ගන්නේ නැතුව චීනයෙන් සියයට හතේ අටේ පොලියට ණය ගන්නද හදන්නේ? බැංකුවලින් ණය ගන්නද හදන්නේ? තමුන්නාන්සේලා ඔළුවක් ඇතුව වැඩ කරනවා නොවෙයි. ඔළුවක් නැති හින්දා තමයි යූඑන්පී එකේ දේශපාලකයන් ටික අරගෙන ඉන්නේ. දැන් ඉල්ලන් කනවා; අනා ගන්නවා; ගහ ගන්නවා. ඔළුවක් තිබෙන අපේ අය අර ගත්තා කියලා කඳක් තිබෙන අය අරගෙන දැන් තමුන්නාන්සේලාට විපත එන්න පටන් අරගෙන තිබෙනවා; boomerang එකක් වෙලා. ඕකට තමයි "දිට්ඨධම්ම වේදනීය කර්මය" කියලා කියන්නේ. මම මේ තමුන්නාන්සේලාට විහිළුවට කොලොප්පම් කරනවා නොවෙයි. මම අර්ථවත්වයි කථා කරන්නේ. කොතලාවල මැතිතුමාට මම බොහොම ආදරෙයි. එතුමා හොඳ කෙනෙක්. නමුත් පඹයෙක් විධියට එතුමා අහිංසක වෙලායි ඉන්නේ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ වෙලාව හරි.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
තව ටික වෙලාවයි ගන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
දැන් අවසන් කරමු.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කථාව අවසන් කරනවා. ඉතින් මේ තත්ත්වය උඩ මේ රටේ ජනතාව කියනවා, පාරවල් ෂෝක්, හරි ලස්සනයි, හොඳයි කියලා. නමුත් කාපට් කරලා හය මාසෙන් කට්ටියක් ඇවිල්ලා නැවත කාපට් දානවා. ආපහු හය මාසයකින්- [බාධා කිරීමක්] නැත්නම් මම තමුන්නාන්සේට සංඛ්‍යා ලේඛන ගෙනැත් පෙන්වන්නම්. ඉදිරියේදී මේවාට කොමිෂන් පත් කරලා කටයුතු කරනවා. ඒ චෝදනා නිලධාරින් පිට දාන්න ලැහැස්ති වෙන්න එපා. නිලධාරින් අහිංසකයි. අපි ඒවා

ගැන දන්නවා. එක්සත් ජාතික පක්ෂය වශයෙන් අපේ ආණ්ඩුවක අයටවත් එවැනි දේවල් නොකරන්න ඒ නීති අංශ ශක්තිමත් කරනවා. මේ රට විනාශ කරන්න, අසාධාරණ ලෙස හම්බ කරන්න ඉඩම් කොල්ල කාලා විදේශිකයන්ට දෙනවා. මම ප්‍රධාන ඇමති කාලයේ කල්පිටියේ - ගරු අස්වර් මන්ත්‍රීතුමා දන්නවා. එතුමා එතකොට සභාපතිතුමායි - Sir, do you know what I did in those islands. I opened the police station. I have brochures on the development of tourism. Today those islands have been sold and fishermen have been chased away. Is this the development you are referring to? You are signing the agreements with various multinational companies and you are selling this country. You will see international terrorism coming very soon.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Hon. Member, let us observe silence by winding up your speech.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)

Okay. Mr. Presiding Member, but I have to state the facts. You talk about red carpets, horse carpets and all that. All those are bullshit talks. These are temporary. But, I have to say what is happening in this country.

[අ. භා. 4.51]

**ගරු තිලංග සුමතිපාල මහතා**
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)

නමෝ බුද්ධාය! අද දින මෙම විවාදයට සම්බන්ධ වී වචන ස්වල්පයක් එකතු කිරීමට අවස්ථාව ලැබීම ගැන මා ප්‍රථමයෙන්ම සන්තෝෂ වනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ අවස්ථාව ලබා දීම ගැනත් ඔබතුමාට ස්තූතිවන්ත වනවා. විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ගේ කථා අහගෙන සිටිනකොට හැමෝටම ප්‍රහේලිකාවක් වුණා, මේ අය සාධාරණ විවේචනයක් කරනවාද, නැත්නම් යම් කිසි කුහකත්වයකින් කථා කරනවාද කියලා. මොකද, අධිවේගී මාර්ගය කියන එක අද මුළු රටම පිළිගත්, එකඟ වෙච්ච, කැමැත්ත දක්වන, මුළු රට පුරාම එහි අවශ්‍යතාව හඳුනා ගෙන තිබෙන දෙයක්.

අද ඉදිරිපත් කර තිබෙන මේ නියෝග පිළිබඳව කථා කරන අවස්ථාවේදී සඳහන් කරන්නට ඕනෑ, ඒකෙන් අපේ රටට අපි බලාපොරොත්තු වන දේවල් මොනවාද කියලා.

මට පෙර කථා කළ විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා නැඟූ හඬ පිළිබඳව මම කරුණු කිහිපයක් කියන්න කැමැතියි. එකක් තමයි මේ මාර්ගයේ ඇති වුණු අනතුරුදායක තත්ත්වය ගැන සඳහන් කළා. නමුත් කියන්නට ඕනෑ, වැඩි හරියක්ම මේ රිය අනතුරු සිදු වෙලා තිබෙන්නේ මාර්ගයේ ධාවනය වන අතරතුර සිදුවුණු කාර්මික දෝෂ නිසා බව. Engine repairs 294යි, එන්ජිම heat වුණු අවස්ථා 1060යි, tyre punctures 419යි, ඉන්ධන ප්‍රශ්න - fuel problems - ඇති වුණු අවස්ථා 156යි, බැටරිය ක්‍රියා විරහිත වීම යනාදී වශයෙන් repairs 2100ක් ඇති වෙලා තිබෙනවා. ඒ නිසා මේ වාහන කඩා ගෙන වැටෙනවා.

මේ තත්ත්වය අධිවේගී මාර්ගයේ වරදක් නිසා ඇති වුවක් නොවෙයි. අපේ ප්‍රජාව අපි දැනුවත් කරන්නට උත්සාහ කරන්න ඕනෑ, අධිවේගී මාර්ගයක යනකොට තමන්ගේ වාහනයේ තත්ත්වය පිළිබඳව සුපරික්ෂාකාරී වන ලෙසට. ඒ වාගේම රටේ සිදු වුණු අනෙකුත් රිය අනතුරුත් එක්ක සාපේක්ෂව බැලුවාම එක රිය අනතුරක් නිසා එක් අයෙකු මිය ගිහින් තිබෙනවා. නමුත් ඒක එම රියදුරා රාත්‍රියේ රිය පැදවීමේදී සිදු වුණු ඔහුගේ අතපසු වීමක් නිසා කියන කාරණය තමයි ස්ථාපිත වෙමින් පවතින්නේ.

තව කාරණයක් කිව්වා, මේ අධිවේගී මාර්ගයේ යනකොට විවේකය සඳහා නවත්වන්න පුළුවන් ස්ථාන මදි කියලා. එතකොට මෙහි දුර කිලෝමීටර් 90යි තිබෙන්නේ. සාමාන්‍යයෙන් ලෝකයේ අධිවේගී මාර්ගයක ගමන් කරනකොට අවම වශයෙන් කිලෝ මීටර් 75ක් වාගේ යන්නට ඕනෑ, ඒ නවත්වන ස්ථානයක් වෙත යන්න. කිලෝමීටර් 75ක් කියලා කියන්නේ අධිවේගී මාර්ගයක විනාඩි 35ක්, 40ක් විතර කාලයක් ධාවනය වන දුරක්. ඉතින් අපේ අධිවේගී මාර්ගයේ ඒ විවේක ගන්නා තැන් නැති වුණත් ස්ථාන හයකින් ඉවත් වීමට exit gates තිබෙනවා. ඉතින් මේ ලංකාව ඇතුළේ, අපි දන්නා රටේ තමන්ට විවේකයක් ඕනෑ නම් එම exit gate එකකින් එළියට ගිහිල්ලා තමන්ගේ සැලසුම අනුව ආපසු ඇතුළට එන්න පුළුවන්.

මෙහි අනෙක් පැත්ත හැටියට අපි දකින දෙයක් තමයි මේ අධිවේගී මාර්ගයේ ධාවන වේගය වැඩි නිසා, ජනතාවට තමන්ගේ ගමනාන්තය දක්වා ඉක්මනට යා ගන්න පුළුවන් වීමෙන් ඒ අයගේ කර්තව්‍යයන් සඳහා ඇති වී තිබෙන පහසුව. මට මතකයි අපි ඉස්කෝලේ යන කාලයේ අවිස්සාවේල්ල වාගේ ප්‍රදේශවල ඉඳන් උදේ පාන්දර හතරට නැඟිටලා දරුවන් පාසලට එනවා. ඊළඟට පානදුර වාගේ ප්‍රදේශවල ඉඳලා පාන්දර 4.00ට බස් එකට නැඟලා දරුවන් පාසලට එනවා. අද මේ අයට ගාල්ලේ ඉඳලා පැය දෙකහමාරක් විතර කාලයකින් කොළඹ ආනන්ද, නාලන්ද වැනි පාසල්වලට එන්න පුළුවන්. මෙහි ප්‍රායෝගික තත්ත්වය මේකයි. මම කියන්නේ නැහැ, එච්චර දුර ඉඳලා දරුවන් උදේ පාන්දර නැඟිටලා මේ පාසල්වලට එන එක තමන්ගේ ප්‍රදේශයේ පාසල්වලට යන එක තරම් සාර්ථක වෙයි කියලා. නමුත් එදා දරුවන් ඒ වින්ද දුක අද දරුවන්ට විඳින්නට සිදු වන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මේ දත්තයන් දිහා බැලුවොත්, මෙවරත් අය වැයෙන් රුපියල් මිලියන 40,000ක් වෙන් කර තිබෙනවා, අධිවේගී මාර්ග සඳහා. ඒ වාගේම මහාමාර්ග සඳහා රුපියල් මිලියන 57,000කුත්, මාර්ග පුළුල් කිරීම සඳහා රුපියල් මිලියන 10,000කුත්, පාලම් සහ ගුවන් පාලම් සඳහා රුපියල් මිලියන 4,000කට කිට්ටු ප්‍රමාණයකුත් අය වැයෙන් වෙන් කර තිබෙනවා. එයින් මූලික වශයෙන් කඩුවෙල - කඩවත අදියරත්, ඒ වාගේම කඩවත - කෙරවලපිටිය අදියරත් ගත්තොත් ඇමෙරිකන් ඩොලර් මිලියන 400ක් සහ ඇමෙරිකන් ඩොලර් මිලියන 290ක් වෙන් කර තිබෙනවා. ඉතින් මෙහිදී අප කල්පනා කරන ආකාරයට මේ අධිවේගී මාර්ගවලින් සිදු වන වාසිය වාගේම එක දෙයක් ගැනත් නිර්මල කොතලාවල නියෝජ්‍ය ඇමතිතුමාගේ අවධානයට මා යොමු කරවන්න කැමැතියි. එතුමා ඒ සඳහා යම් කිසි මහන්සියක් ගන්නා අවංක ජන නායකයෙක්. අතිගරු ජනාධිපතිතුමා ඔහු කෙරෙහි යම් කිසි විශ්වාසයක් ඇතිව භාර දීලා තිබෙන වගකීම අකුරටම ඉෂ්ට කරන්නට උත්සාහ දරන, මහන්සි වන, ඒ වෙනුවෙන් කැප වන නියෝජ්‍ය ඇමතිවරයෙක් හැටියට එතුමාට මේ ගැනත් මා කියන්නට ඕනෑ.

ලෝකයේ දියුණු රටවල්වල තමන් අවුරුද්දකට ගෙවන වරිපනම් මුදලට අමතරව ඒ රටේ මාර්ග පද්ධතිය පාවිච්චි කරනවාට යම් කිසි මුදලක් ගෙවනවා. අපි සිංගප්පූරුවට ගොඩක් කැමැතියි. අපේ එක්සත් ජාතික පක්ෂය දන්නවා, ඒ රටේ ඒ මාර්ගවල තමන් දවසකට යන්නේ කිලෝමීටර් 32යි නම්, මාසයකට යන්නේ කිලෝමීටර් 400යි නම්, ඒ පාරේ ගත කරපු

[ගරු තිලංග සුමතිපාල මහතා]

කාලය පරිගණක ක්‍රමයෙන්, ඒ වාගේම චන්ද්‍රිකා තාක්ෂණය - සැටලයිට් එක- හරහා ගණනය කරලා, වාහනයේ සවි කරන e-tag කියන යන්ත්‍රය තුළින් මාසය අන්තිමට බිලක් එනවාය කියලා. ඒකේ යම් කිසි සාධාරණත්වයක් තිබෙනවාය කියලා මා හිතනවා. ඒකට හේතුව අපි අවුරුද්දකට වරිපනම් tax එකකුත් ගෙවා, දවසකට වාහනය පාවිච්චි කරන්නේ කිලෝමීටර් 300ක් නම්, තවත් කෙනෙක් පාවිච්චි කරන්නේ කිලෝමීටර් 3,000ක් නම් ඔවුන් දෙදෙනාම එකම මුදලක් තමයි ගෙවන්නේ. නමුත් තමන් පාර පාවිච්චි කිරීමට සාපේක්ෂව usage tax එකක් ඇති කළාම, ඒ ලැබෙන ආදායම ඒ ඒ ප්‍රධාන පාරවල නඩත්තුව සඳහා අයෝජනය කරන්න අපට පුළුවන් වනවා.

අපේ විපක්ෂයේ මන්ත්‍රීවරුන් එක්කෝ ඒ පාරේ ගිහින් නැහැ. එහෙම නැත්නම් ඒ ගැන අවබෝධයක් නැහැ. අවශ්‍ය සියලුම පහසුකම් ලබා දෙනවා. මා කලින් කියපු පරිදි කැඩුණු වාහන 2,160ක් අදින්න සිද්ධ වුණා. නොමිලයේ ඇද ගෙන ගිහින් ඒ පද්ධතියෙන් ඉවත් කරන්න සිද්ධ වුණා. මේ සියලුම මුදල් ආදායමක් හැටියට දැක්කාට, ඒ ආදායම මේ මාර්ගය නඩත්තු කිරීම සඳහා වන මුදලක්. එහෙම වුණොත් තමයි මේ අධිවේගී මාර්ගය කාලයක් පවත්වා ගෙන යන්න පුළුවන් වන්නේත්, ඊ ළඟ අදියරට යන කොට ජනතාව පෙළ ගැසෙන්නේත්. ඉතින් මේක අපි පිළිගන්න ඕනෑ දෙයක්.

මේ රටට අධිවේගී මාර්ග අලුත් අත් දැකීමක්. මේ අලුත් අත් දැකීමේදී අත් හදා බැලීම් තිබෙනවා. පරිපාලනමය වශයෙන් මෙන්ම මේ පාර පාවිච්චි කරන අපේ රියැදුරන්ට මේක අලුත් අත් දැකීමක්. අධිවේගී මාර්ග පද්ධතියේ ධාවනය කරන විධිය, signal දමන විධිය, තමන් යන්න ඕනෑ lane එක යනාදී වශයෙන් ඒ මාර්ගය ගැන යම් යම් අයට අවබෝධය අඩුයි. මේ පාරේ වාහනයක් signal දමා overtake කරන්න ඕනෑ විධිය ගැන ඒ අයට තිබෙන අවබෝධය අඩුයි. ඉතින් මේක අලුත් අත් දැකීමක් නිසා හැම ක්ෂේත්‍රයකම -පරිපාලනයේ වන්න පුළුවන්, දේශපාලන තීන්දු ගැනීමේදී වන්න පුළුවන්, ඒ වාගේම පාරිභෝගිකයාගේ පැත්තෙන් වන්න පුළුවන්- හැම දෙනාගේම අත් දැකීම් වැඩිදියුණු කර ගන්න ඕනෑ. ඊ ළඟ අදියරට යන කොට ජනතාවට තිබෙන අවශ්‍යතාව සහ මෙහිදී පරිපාලනය කළ යුතු දේ ගැන වැඩසටහන් තුළින් ජනතාව දැනුවත් කරන්න සිද්ධ වනවා. නමුත් මේ අධිවේගී මාර්ගය ගත්තොත් කොළඹ වටේට යන මාර්ගයෙන් - Outer Circular Road එකෙන්- විශාල වශයෙන් ඉන්ධන ඉතුරුවක් ඇති වනවා. ඒ වාගේම අපේ සම්පූර්ණ මාර්ග පද්ධතියේ අවශ්‍යතාව වැඩිදියුණු වනවා.

අද එංගලන්තයේ M25 කියා මාර්ග පද්ධතියක් තිබෙනවා. අපට තවම motorways නැහැ. අපට තිබෙන්නේ expressway එකක්. අපට lanes දෙකයි තිබෙන්නේ. එංගලන්තයේ ලන්ඩන් නුවර වටේම motorway එකක් යනවා. ඊට පස්සේ තමයි මහාමාර්ගයට සම්බන්ධ වන්නේ. දැන් අපේ අරමුණත්, කොළඹ වටේට Outer Circular Road එකක් හදලා, හැම වාහනයක්ම නගරයට එන එක වැළැක්වීමයි. Katunayake International Airport එකේ සිට එන කෙනකුට අධිවේගී මාර්ගයෙන් පැය දෙකක වාගේ කාලයකින් මාතරට යන්න පුළුවන්. නමුත් වර්තමාන තත්ත්වය අනුව ඒ අය කොළඹ හරහා ඇවිත්, ගාලු පාර දිගේ මාතරට යන්න පැය 4 ½ක්, 5ක් ගත වනවා. මේ යන අතර තුර වාහනයට දෙන harassment එක බලන්න. කිහිප වතාවක් brake ගහන්න ඕනෑ, නවත්වන්න ඕනෑ, gear මාරු කරන්න ඕනෑ. වාහනයේ නඩත්තුවට ඒක බලපානවා. කිසිම අමතර කොටසක් - spare part එකක්- ලංකාවේ හදන්නේ නැහැ. ඒවා පිට රටින් ගෙනෙන්න ඕනෑ. ඉන්ධන නාස්තියක් වනවා. අධිවේගී මාර්ගය පාවිච්චි කිරීමෙන් වක්‍රව පෙනෙන්නේ නැති විශාල ලාභයක් - වාසියක්- තිබෙනවා. ඒක අපේ කාර්යක්ෂමතාවට වාගේම ඉන්ධන සඳහා විදේශයට යන මුදල්වලටත් බලපානවා. ඒ වාගේම කාලය ඉතිරි වීම තුළින් තමන්ගේ එදිනෙදා ජන ජීවිතයේ කටයුතු වැඩිදියුණු කර ගැනීමේ හැකියාවකුත් තිබෙනවා.

මෙහිදී අපි Outer Circular Road එක ගැන කිව්වා. අපේ අවසාන බලාපොරොත්තුව වන්නේ මේකයි. දැන් ගාල්ලේ සිට එන කෝච්චිය කොටුවට එනවා. පුත්තලම සිට එන එන කෝච්චියත් කොටුවට එනවා. නුවර සිට එන කෝච්චියත් කොටුවට එනවා. හැම පැත්තෙන්ම එන කෝච්චි කොටුවට එනවා. ලෝකය දියුණු වුණාට පස්සේ මුළු රටේම සියලුම වාහන අග නුවරට එන්නේ නැහැ. යම් කිසි ක්‍රමයකට ඒකේ පරිපාලනයක් වන්න ඕනෑ. අන්තිමට අධිවේගී මාර්ගත් සමඟ අපේ දුම්රිය මාර්ග පද්ධතිය සාර්ථකව සම්බන්ධ වනවා. එතකොට කෝච්චියෙන් එන කෙනකුට නැවත මහාමාර්ගයට යන්න පුළුවන්. එහෙම නැත්නම් මහාමාර්ගයෙන් එන කෙනකුට වාහනය railway station එකේ නවත්වා අධිවේගී මාර්ගයෙන් එළියට ආපු ගමන්ම ළඟ තිබෙන railway station එකෙන් සම්බන්ධ වන්න පුළුවන්. ඒක ජාතික වැඩසටහනක්. ඒ දිහා බලන්න ඕනෑ අපේ පරම්පරාව ගැන හිතලා නොවෙයි; අපේ ජීවිත කාලය දිහා බලලා නොවෙයි; අපේ වර්තමාන ජනාධිපතිතුමාගේ යුගය දිහා බලලා නොවෙයි. දුර දැක්මක් තිබෙන නායකයකු හැටියට, අපේ යුග පුරුෂයා හැටියට එතුමා හදන්නේ ඒ මාර්ග පද්ධතියේ ජාතික සැලැස්ම ක්‍රියාත්මක කරන්න අඩිව තල්ලු කරලා, අඩිව පෙළගස්සවන්නයි. ඉතින් එයින් ලැබෙන ප්‍රතිඵලය අපි සියලු දෙනාගේ සහභාගිත්වයේ, උත්සාහයේ හා මහන්සියේ ප්‍රතිඵලයක් කියලා තමයි අපි හිතන්නේ. සමහර විට අපේ පරම්පරාවට ඒ අත්දැකීම සම්පූර්ණයෙන් ලබන්න බැරි වෙයි.

අවසාන වශයෙන් අපි හැමෝම හිතන්න ඕනෑ තව දෙයක් තිබෙනවා. ඒ තමයි ජාතික වශයෙන් අපිට ජනවාර්ගික ප්‍රශ්නයක් තිබුණ බව. අපිට ඒක නැහැ කියන්න බැහැ. ඒ තිබිච්ච ප්‍රශ්නයටත්, හේතුවක් වුණා අප අතර තිබුණ සහසම්බන්ධතාව නැති වීම. අපිට A-9 පාරෙන්, යාපනයේ සිට දඹුල්ල දක්වා අධිවේගයකින්, අඩු කාලයකින් යන්න පුළුවන් වුණොත් ඒ තුළින් අපේ සමාජයීය සම්බන්ධතා කටයුතු ඉක්මන් වෙනවා. අපේ මාර්ග පද්ධතිය නුවර, ගාල්ල - මාතර, අම්පාර-මොනරාගල, යාපනය - ත්‍රිකුණාමලය පමණක් නොවෙයි මුළු රටේම ක්‍රියාත්මක වෙන්න ඕනෑ.

දැන් අපේ ආර්ථිකය සම්බන්ධව අලුතින් පැහැදිලි අවබෝධයක් ඇති වී තිබෙනවා. දැන් රටේ මුදල් සංක්‍රමණය වෙනවා. මුදල් සංක්‍රමණය තුළින් තමයි ගම් මට්ටමේ සිට සංවර්ධනය, දියුණුව ඇති වෙන්නේ. ඒ දියුණුව ඇති කිරීම සඳහා දරන උත්සාහයට අපේ අමාත්‍ය මණ්ඩලයේ සියලු දෙනාටම මම විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා.

මම තව එක කාරණයක් කියන්න ඕනෑ "දැයට කිරුළ" ගැන. මෙතුමන්ලා කිව්වා "දැයට කිරුළ" ප්‍රදර්ශනය "ගම්උදාව" වාගේ නොවෙයි කියලා. නමුත් "දැයට කිරුළ" කියන්නේත් ගමට වැඩ කරන සාර්ථක ව්‍යාපෘතියක්. ඒ හරහා ඒ ප්‍රදේශවල විශාල සංවර්ධනයක් ඇති වෙලා තිබෙනවා. ඒක පවත්වා ගෙන යෑම සඳහා, නඩත්තුව සඳහා,- [බාධා කිරීමක්] නැහැ, නැහැ. ඒ ගැන කියපු වෙලාවේ ඔබතුමා හිටියේ නැහැ. ඒ ගැන අපේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගාමිණී ජයවික්‍රම පෙරේරා මන්ත්‍රීතුමා කියපු දෙයට මට කනගාටු හිතුණා. ඒ ව්‍යාපෘතිය ගැන ඒ ප්‍රදේශයට ගිහිල්ලා අත් දැකීමක් ලබන්න ඕනෑ. මම හිතන හැටියට එතුමාගේ ප්‍රකාශය ගමට දියුණුව ලැබෙන එකට කරන අපහාසයක් කියලායි.

බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

[අ. භා. 5.03]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ වැදගත් මාතෘකාව සම්බන්ධයෙන් කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන බොහොම ස්තුතියි.

ඇත්ත වශයෙන්ම මම බොහොම අගය කරනවා, මගේ ප්‍රතිවිරුද්ධ කණ්ඩායමේ සිටින, කොළඹ දිස්ත්‍රික්කය නියෝජනය කරන තිලංග සුමතිපාල මන්ත්‍රීවරයාට පස්සේ කථා කරන්න ලැබීම ගැන. එතුමා ඉතා ඕනෑකමින් අධිවේගී මාර්ගය ගැන කථා කළා. අධිවේගී මාර්ගයේ යන කොට brake ගහන්න වෙන්නේ නැහැ, කාර් කැඩෙන්නේ නැහැ කියලා එතුමා කිව්වා. මම හිතන හැටියට තව අවුරුද්දක්, දෙකක් ගියාට පස්සේ එතුමාම කියයි, අධිවේගී මාර්ගයේ යනවාට වැඩිය හොඳයි "මිහින් ලංකා" එකෙන් කෙළින්ම කොළඹින් මත්තල airport එකට යන එක කියලා. එතකොට brake ගහන්න ඕනෑ නැහැ, බහින්න ඕනෑ නැහැ, මොකුත් ඕනෑ නැහැ කියයි.

අපි අධිවේගී මාර්ග අගය කරනවා. ඒක කළාය කියලා ආණ්ඩුව සම්පූර්ණයෙන් ලකුණු ගත්තාට,මතක තියා ගන්න ඒක එක්සත් ජාතික පක්ෂය කාලයේ පටන් ගත්තු ව්‍යාපෘතියක් බව. ඒකට අවශ්‍ය සල්ලි ටික ආසියානු සංවර්ධන බැංකුවෙන් - ADB - හොයා දුන්නේත් අපි. ඒ මාර්ගය සෑදීමේදී තිබුණු බාධක ඔක්කෝම අපි ඉවත් කළත්, ඒ හෙණ ටික වැදුණේත් අපිට තමයි. සංවර්ධන කටයුතු කවදා, කවුරු කළත් ඒ කරන දේවල් අපි බොහොම අගය කරනවා. අපි ඒවා ගැන කිසිම දේශපාලන වෛරයකින් නොවෙයි කථා කරන්නේ. නමුත් අපට ප්‍රශ්න ටිකක් තිබෙනවා. ඒ ප්‍රශ්න අපි අහන්නේ ජනතාවගේ අභිවෘද්ධියට මිසක් දේශපාලන වාසි ලබා ගන්න නොවෙයි.

අපි අද කථා කරන්නේ ජාතික මංමාවත් පනත යටතේ අධිවේගී මාර්ගවලට අය කරන්න යන ගාස්තු සහ කවුද ඒවා ගෙවිය යුත්තේ කියන කරුණු. සරලව කිව්වොත්, ජනාධිපතිගේ කාර් එකත්, අගමැතිගේ කාර් එකත් ඔය ගෙවන්න තිබෙන රුපියල් 400 ගෙවුවා නම් ප්‍රශ්නයක් නැහැ නේ. හොඳයි, ඒත් කමක් නැහැ. අපි කියමුකෝ ජනාධිපතිගේ කාර් එකත්, අගමැතිගේ කාර් එකත් විතරක් නිදහස් කරනවා කියලා. එතකොට ඒ අය එක්ක ආරක්ෂකයෝ සිය දෙනෙක් ගියොත් ඒ සිය දෙනාම යන වාහනත් ඒ ගාස්තුවෙන් නිදහස් කරනවාද? එහෙම කරනවා නම් දකුණු ප්‍රදේශයේ ජීවත් වන මන්ත්‍රීවරුන්ටත් ඇයි ඒ සහනය නැත්තේ? නමුත් ඊට වැඩිය හොඳයි ඒ හැම දෙනාම ඒ රුපියල් 300 හෝ 400 ගෙවන එක. මොකද, කොහොමත් ඒ මුදල් ගෙවන්නේ ජනතාවගේ සල්ලිවලින් නේ. ඒ නිසා ඒ මුදල ගෙවුවා නම් කිසිම ප්‍රශ්නයක් නැහැනේ. දැන් නිරුපමා රාජපක්ෂ මැතිනියට ඒක කිසිම ප්‍රශ්නයක් නැහැ නේ.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)

ගරු මන්ත්‍රීතුමා, ගරු ජනාධිපතිතුමා මුදල නොගෙවා යනවා වාගේම, ඒ ආරක්ෂක රථවලටත් මුදල ගෙවලා යන්න විධියක් නැහැ. ඒ නිසා ඒ සියලු වාහන නිදහස් කරලා තිබෙන්නේ. ජනාධිපතිතුමා සහ අගමැතිතුමාගේ වාහන විතරයි නිදහස් කරලා තිබෙන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මම කියන්නේ මේකයි ගරු නියෝජ්‍ය ඇමතිතුමා. ඊට වඩා හුඟක් හොඳයි එතුමන්ලාගේ වාහනත් ඒ මුදල ගෙවුවා නම්. කොහොමත් ගෙවන්නේ අපේ සල්ලි නේ. එතුමන්ලාගේ සාක්කුවෙන් නොවෙයි නේ ගෙවන්නේ.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)

නැහැ. නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඊට වඩා හුඟක් වරප්‍රසාද ලැබෙනවා.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)

ඔබතුමා ගෙවන්නේත් ජනතාවගේ සල්ලිද? නැහැ නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

නැහැ. මම මගේ මහන්සියෙන් වැඩ කරනවා.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)

එහෙම නම්, ඔබතුමා ගෙව්වත් ගෙවන්නේ ජනතාවගේ සල්ලි නොවෙයි නේ. ඔබතුමාගේ සල්ලි නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

නිකම් පටලවා ගන්නවා නේ.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)

ඔබතුමාගේ අදහස වැරදියි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake

මම රජයේ සේවකයෙක් නොවෙයි. මම මගේ මහන්සියෙන් හම්බ කරලා මගේ වැඩ ටික කර ගන්නවා. ජනාධිපති එහෙම නොවෙයි නේ. එතුමා රටේ ජනාධිපති. එතුමාට ගෙවනවා. එම නිසා තමයි මම කිව්වේ, එතුමාත් මේ මුදල ගෙව්වාට කිසි ප්‍රශ්නයක් නැහැ කියලා.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)

ඔබතුමාත් මහජන නියෝජිතයකු විධියට වැටුපක් ලබනවා නේ, එහෙම බැලුවොත්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මගේ වැටුප ඔක්කෝම ආරක්ෂක හමුදාවට, පිළිකා රෝහලට දෙන බව කවුරුත් දන්නවා නේ. මගේ වත්කම් ප්‍රකාශ අරගෙන ඒවා බලන්න පුළුවන්. අපි මහන්සියෙන් වැඩ කරනවා. මම මෙතැන කිව්වේ, ආණ්ඩුවට හොඳ දෙයක්. ඔබතුමාට හොඳ

[ගරු රවි කරුණානායක මහතා]

දෙයක් මම මේ කියන්න හදන්නේ. එතුමන්ලා ඔය රුපියල් හාරසියය ගෙව්වත් නැතත් ප්‍රශ්නයක්ද? එතුමන්ලා කොහොමත් යන්නේ හෙලිකොප්ටරයෙන්. ඕනෑ නම් අධිවේගී මාර්ගයේ අවුරුද්දකට සැරයක් යයි. ඒ නිසා මේ යෝජනාව ගෙනාවේ නැත්නම් හුඟක් හොඳයි. ඔබතුමන්ලාත් ඇමතිවරු. [බාධා කිරීමක්] ඔබතුමන්ලාටත් ගෙවන්නේ නැතිව යන්න තිබුණානේ.

මම කියන්නේ දැන් වුණත් මේ මාර්ගයේ තත්ත්ව පාලනය ටිකක් බලන්න අවශ්‍යයි කියලායි. ඔබතුමා ඇමතිතුමා වශයෙන් මේ අදහස් භාර ගන්න. මම මේවා කිසිම කුහකකමකින් නොවෙයි කියන්නේ. මෙතැන ප්‍රශ්න ගණනාවක් තිබෙන බව පෙනෙනවා. දළ වශයෙන් මේ මාර්ගයෙන් දවසකට ලක්ෂ පණහක ආදායමක් එකතු කළ යුතුයි. දැන් මම මේ කරුණු කියන්නේ feasibility වාර්තාවෙන්. සාමාන්‍යයෙන් කොළඹ සිට මේ කිලෝ මීටර් 105 ඉදි කරන්න කෝටි 8000ක් විතර වියදම් කර තිබෙනවා නේද? කෝටි 8200ක් වියදම් කරලා තිබෙනවා. අපි මේ මාර්ගයට ඇස්තමේන්තු කළේ කෝටි 4200යි. අද ඒක කෝටි 8200 කට වැඩි වෙලා තිබෙනවා. මේ මාර්ගයෙන් දවසකට ලක්ෂ 50ක් හෙව්වොත්, දවස් 17,800ක් යනවා, ගත්ත ණය ප්‍රමාණය විතරක් ගෙවන්න, පොලී ප්‍රමාණය නැතිව. දවස් 17,800ක් කියන්නේ අවුරුදු 48ක්. ඔබතුමන්ලා හොයන්නේ දවසකට ලක්ෂ 12යි. ඊට හතර ගුණයක් වැඩි ලක්ෂ 50ක් හොයන්න තව අවුරුදු ගණනාවක් යාවි. එතකොට මේ වාගේ පාරක් හදලා, ඒ ණය ගෙවන්න අවුරුදු 80ක් විතර යනවා නම් ඒක සාර්ථකද? ගරු ඇමතිතුමනි, මේ ණය ගෙවන්න තිබෙන්නේ ඔබතුමන්ලා පාලනය කරන ආණ්ඩුවෙන්. චන්ද්‍රිකා මැතිනියගේ කාලය වාගේ, ඔබතුමන්ලා ආර්ථිකය බිංදුවට වට්ටලා අපට භාර දුන්නොත් මේ බර උසුලන්න වෙන්නේ අපට. දැන් කියයි විපක්ෂය,- [බාධා කිරීමක්]

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ඔබතුමා කියන විධියට,-[බාධා කිරීමක්]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අනේ මේ, ඔබතුමාගේ රෝහල් ටික බලා ගන්නකෝ. කරන්න බැරි වැඩ. මුස්ලිම් පල්ලි ටික කඩන්නේ නැතිව,- [බාධා කිරීමක්] කරුණාකර අහගන්න. ඔබතුමන්ලාගේ ප්‍රශ්නය තිබෙන්නේ,- [බාධා කිරීමක්]

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
මේක සේවාවක්.[බාධා කිරීමක්]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
සේවාවක්? කොහොමද සේවාවක් වුණේ? [බාධා කිරීම්] කවදාද මේක සේවාවක් වුණේ? සේවාවක් නම් මුදල් ගෙවන්නේ නැතිව නිකම් ඒ මාර්ගයේ යන්න කියන්නකෝ. [බාධා කිරීම්] නැහැ. නැහැ. සේවාවක් නම්,- [බාධා කිරීම්]නැහැ, දෙපැත්තක් නැහැ. අපේ නායකයා රනිල් වික්‍රමසිංහ. එච්චරයි.[බාධා කිරීම්] ඔබතුමන්ලාගේ කට්ටිය තමයි හුළං ගහන්නේ. බෝලයකට හුළං ගැහුවාම පිපිරෙනවා නේ. ඔබතුමන්ලා ඒක තමයි කරන්නේ. ඒක කරන්න. අපට ප්‍රශ්නයක් නැහැ. ඔබතුමන්ලාගේ ප්‍රශ්න ඔබතුමන්ලා බලා ගන්නකෝ. අපේ වැඩේ අපි කරන්නම්කෝ. ඔබතුමා රෝහල්වලට බෙහෙත් ටික දෙන්නකෝ. ඒ ඇති.

වරාය හා මහාමාර්ග නියෝජ්‍ය ඇමතිතුමනි, මා ඔබතුමාට මා ගරු කරනවා. එම නිසායි මේවා කියන්නේ. සේවයක් කරනවා නම් කරුණාකර ඒ රුපියල් හාර සියය අය කිරීමත් අහක් කරන්නකෝ. ඔක්කොම සේවය නේ. මහින්ද චින්තනයේ හැම එකම සේවයක් නේ. උදේ පාන්දර නැඟිට්ට වෙලාවේ ඉඳන් වුවමනා හැම දෙයම නිකම් නේ ලැබෙන්නේ. පාන් ගෙඩිය, බිත්තරය ඔක්කොම නිකම් දෙනවා කියලානේ ඔය කියන්නේ. අනේ, අර අහිංසක කුඩා දූ දරුවන් ඉස්කෝලයට ගියාම කන්න දෙන කෑම වේල ලබා දෙන්න. ඒ අයට පාඩම් කරන්න තිබෙන පොත් ටික ලබා දෙන්න; පාසල් නිල ඇඳුම් ටික ලබා දෙන්න. අධිවේගී පාරේ යන්න ඉස්සෙල්ලා අඩු ගණනේ පාසලට ගිහින් ඉගෙන ගන්න ඕනෑ නේ. අධිවේගී පාරේ යන්නේ දෙවනුවනේ. ඕවා කියන්න ගියාම නිකම් අනවශ්‍ය දේවලට පැටලෙනවා. ඔබතුමා කියනවා නම් සේවයක් කියලා, කරුණාකර මුදල් ගෙවන්නේ නැතිව ඒ පාරේ යන්න දෙන්න. එතකොට ඒක සේවයක් කියලා අපි කියන්නම්.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
ගාස්තුවක් අය කළාට ලාභයක් සොයා යන්නේ නැහැ. ලාභය සොයා ගන්නා මාර්ගයක් නෙවෙයි මේක. මේක ජනතාවට ලබා දෙන සේවාවක්. ඒ සේවාවට ගාස්තුවක් අය කරනවා. ඒ අය කරන ගාස්තුවෙන් මේ සියලුම කටයුතු කරන්න බැහැ. අපි ඒ මුදලින් ලාභයක් බලාපොරොත්තු වන්නේ නැහැ. ඒ මාර්ගය නඩත්තු කිරීම සඳහා පමණයි ගාස්තුවක් අය කරන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
රුපියල් හාරසියයක් අය කරමින් සේවාවක්ද ඇති කරලා තිබෙන්නේ? නැහැනේ.

ඔබතුමන්ලා ණයට සල්ලි ගන්නවා. කොහෙන්ද ගන්නේ? ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සල්ලි දෙන්න බැහැ කිව්වාම, චීනයට යනවා; සියයට අටේ පොලියට ණය ගන්නවා. ඒ විධියට මිලියන 8,800ක් අරගෙන තිබෙනවා. අපේ එක්සත් ජාතික පක්ෂය කාලයේ මේ මාර්ගය හදන්න ඇස්තමේන්තු කළේ මිලියන 4200යි. මතක තියා ගන්න. ඒක වැඩි වුණානේ දෙගුණයකින්.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
ඒ කාලයේ සැලසුම් කරලා තිබුණේ මං තීරු දෙකකට ගරු මන්ත්‍රීතුමා. අපි මං තීරු හයක් සැලසුම් කරලා, මං තීරු හතරක් ඉදි කළා. ඔබතුමන්ලා මිලියන 4200 යට හදනවා කිව්වේ මං තීරු දෙකයි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා අද හදලා තිබෙන්නේ මං තීරු හතරනේ. ඔබතුමන්ලාගේ මහින්ද චින්තනයේ ඉදිරි දැක්ම වාගේ ඔක්කොම සිහිනයක් නේ. [බාධා කිරීම්]

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
මං තීරු දෙකක් හදන්න ඔබතුමන්ලා මිලියන 4,200ක් ඇස්තමේන්තු කළා. මං තීරු හතරක් හදන්න අපට කීයක් යනවාද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

නැහැ, නැහැ. මං තීරු දෙකක් තිබුණේ එක කොටසකට විතරයි. කොහොමත් සැලසුම් කරලා තිබෙන්නේ ගාල්ලේ සිට මාතරට මං තීරු තුනකට.

මම මේ ගැන COPE එකේදී බැසිල් රාජපක්ෂ ඇමතිතුමාගෙන් ප්‍රශ්න කර තිබෙනවා. මෙහි මං තීරු තුනක් තිබෙන්නේ කොහේද කියා මට කියන්න. [බාධා කිරීමක්] එහෙම කියන්න එපා. එක්සත් ජාතික පක්ෂ රජය කාලයේ සංවර්ධන වියදම්වලට ආසියානු සංවර්ධන බැංකුවෙන් සල්ලි හොයන්න තිබුණු අමාරුව කැබිනට් මණ්ඩලයේ හිටපු ඇමතිවරයෙක් වශයෙන් මා දන්නවා. වියදම වැඩි වුණා. [බාධා කිරීමක්] ඔබතුමා ඔහොම කියනවා නම් මා වෙනත් උදාහරණයක්; සරල උදාහරණයක් කියන්නම්. 1999 දී කොළඹ-කටුනායක අධිවේගී මාර්ගය හදන්න රුපියල් මිලියන 1990යි ගියේ. අද මේක හදන්න කීයක්ද? මේක හදන්න රුපියල් බිලියන 46,800ක් යනවා. විසි ගුණයක් වැඩි වනවා, අවුරුදු එකොළහකින්. මොන අපරාධයක්ද? මේක නැහැයි කියන්න පුළුවන්ද? ඔය පැත්තෙනුත් කෑ ගහනවා. මේ පැත්තෙනුත් කෑ ගහනවා. මොනවාද, මේ කථා? එහෙම උත්තර දුන්නේ කවුරුත් නොවෙයි මගේ මිත්‍ර ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ මැතිතුමායි. මතක තියා ගන්න.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawela)

ඔබතුමන්ලාගේ රජය කාලයේ හිටපු මහාමාර්ග ඇමතිතුමා නවත්වලා තමයි වෙනත් ගනුදෙනුවක් ඉල්ලා සිටියේ. ඒක ලිඛිතව ඔප්පු කරන්න පුළුවන්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඉතින්, කොතලාවල නියෝජ්‍ය ඇමතිතුමනි, 1999 දී මිලියන 1990යි. 2000 වර්ෂය වන විට 10,800ට වැඩි වුණාම ඒ හොර වංචාව නැති කරන්න මිස ඒක ඇති කරලා ගෙන යන්නද කිව්වේ? කොරියාවේ ගිහිල්ලා කාටද දුන්නේ? කොරියාවේ ඩාවූ කොම්පැනිය කාටද දුන්නේ? කවුද රොනී කියන්නේ? කවුද පීරිස් කියන්නේ? මේක පස් ගුණයක් වැඩි වුණේ කොහොමද? තවත් හෙළිදරව් කරන්න ඕනෑද? ඒක දැන දැන අපට වරමක් දුන්නේ දූෂිත ක්‍රියා නවත්වන්න මිස ගෙන යන්න නොවෙයි.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawela)

ඒ කාලයේ ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ - [බාධා කිරීමක්] ඒ අයත් කියන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

කියන්න. අපේ පක්ෂය වෙනුවෙන් මම කථා කරනවා. මා වෙනුවෙන් මට කථා කරන්න පුළුවන්. වෙනත් ඒවා ගැන ඔබතුමාට සාධක තිබෙනවා නම් කරුණාකර කියන්න. ඔබතුමන්ලා චරිත ඝාතනය කරන්න බොහොම දක්ෂයි. ඔබතුමා නොවෙයි ඔබතුමාගේ ආණ්ඩුව. හැබැයි, ඒ කියන දේවල් ඔප්පු කරන්න බැරි ආණ්ඩුවක් තමයි ඔබතුමන්ලාගේ ආණ්ඩුව. 1999 දී රුපියල් මිලියන 1990ක් ගියා. මේක 48,600කට වැඩි වුණා කියලා කවුරුත් නොවෙයි කිව්වේ. මගේ මිත්‍ර දිවංගත ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ ඇමතිතුමායි. මා ඒක අගය කරනවා. ඊට පසු අපට ඒක හොයා ගන්න බැරි වුණා. හැන්සාඩ් වාර්තාවේ ඒ උත්තරය තිබෙන නිසයි මා කියන්නේ.

2009 අග භාගයේ දුන්න උත්තරයට අනුව විසි ගුණයකින වැඩි වුණා. ඒ වැඩි වීම සම්බන්ධයෙන් තමයි මා ප්‍රශ්න කරන්නේ. එතකොට අපි දේශද්‍රෝහියෝ. වැඩ කරන අය දේශප්‍රේමියෝ. මා උදාහරණයක් දුන්නේ මේ අධිවේගී මාර්ගය කොට්ටාවේ සිට පින්නදූවට යනතුරු 101ට කෝටි 8,800ක් වැඩි වුණා. දවසකට ලක්ෂ 15ක් හොයනවා නම්, හොයන්න තිබෙන්නේ ලක්ෂ 50ක් නම්, ඒ හොයන්න තිබෙන ලක්ෂ 50න් දවස් 17,800ක් යනවා නම් තව මොනවාද අහන්නේ? මේක ගෙවන්න අවුරුදු 46ක් යනවා නම්, මේක අසාර්ථක නොවේද? මම කියන්නේ මේක සාර්ථක කරන්න අවශ්‍ය බවයි. ආණ්ඩුව ඔබතුමාට වැරදි කියලා හරි යන්නේ නැහැ. ඔබතුමන්ලා වට්ටන ආණ්ඩු අපට හදන්න තිබෙනවා. යථාර්ථය අනුව ප්‍රායෝගික මට්ටමින් කියන්න ඕනෑ. දැන් නුවරට යනවා. නුවරට යන්න හදනකොට, ත්‍රිකුණාමලයට ගෙන යන්න හදනවා. මෙහෙම පාරවල් හදන්න ගියොත් හොඳ හොද්දක් තිබෙනවා නේ. දෙහිවල අධිවේගී මාර්ගයේ ගුවන් පාලම කැඩිලා තිබෙනවා කියා අපි පෙන්නුවා. එහෙම කිව්වාට පසු ඔබතුමා එතැනට ගිහින් ඒක යම් විධියකින් හදන්න පටන් ගෙන තිබීම අපි අගය කරනවා. වර්ග අඩියකට 1,23,000ක් වුණාම ඒක අධික වියදමක් නොවෙයිද? ඇමතිතුමනි, අපි ප්‍රසිද්ධ විපක්ෂයක් වශයෙන් අපට වග කීමක් තිබෙනවා. අපි ඉන්නේ ජනතාව ආරක්ෂා කරන්න මිසක් පට්ටපල් හොරු ටික ආරක්ෂා කරන්න නොවෙයි. මතක තියා ගන්න. ආණ්ඩුව ආරක්ෂා කරන්න නොවෙයි. හැබැයි, ඒ කියන ගමන්ම තියෙන වැරදි නිවැරදි කර ගන්න ඕනෑ.

දැන් බලන්න. මාලදිවයිනට මොකද වුණේ? මෙහෙ වාගේම අර චින්තනය තිබුණාය මේ චින්තනය තිබුණාය කියනවා. දවස් දෙකකට ඉස්සෙල්ලා රෑ නිදියලා පසුවදා නැඟිටිනකොට පොලීසිය කිව්වා, "පලයල්ලා යන්න" කියලා. මෙහෙම බොරු කරන්න එපා; හොර කරන්න එපාය කිව්වා. මෙහෙ සුදු වැන් වාගේ එහෙ තිබෙන්නේ සුදු බෝට්ටු. පොලීසියට ගිහින් රැකවරණයක් ඉල්ලුවාම පොලීසිය මොනවාද කිව්වේ? ජනාධිපති මෙහෙම ආරක්ෂා කරන්න බැහැයි කිව්වා. සිර දඬුවමකට අරගෙන තිබෙන උදවිය කෝ? ඒ උසාවියේ ඉන්න judgesලා කෝ? අන්තිමට යුද හමුදාවත් පොලීසියත් ඔක්කොම එකතු වෙලා - [බාධා කිරීමක්] ඒක අර සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ කාලයේ 1977, 1994ට කළා වාගේ කියන්න පුළුවන් නේ. ඔබතුමන්ලා මතක තියා ගන්න, වැඩියෙන්ම ශබ්ද කරන අවස්ථාවේ තමයි අඩුවෙන්ම ශක්තිය තිබෙන්නේ කියා පෙන්වා තිබෙනවා. ඕක හත අටකට කැඩිලා තිබෙනවා නේද? අද ජනාධිපති එක පැත්තක. එහෙම නේද? ආර්ථික සංවර්ධන ඇමති තව පැත්තක. අගමැති තව පැත්තක. [බාධා කිරීමක්]

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ඔක්කොම එක පැත්තේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඔව්, එක පැත්තක හිටියාට වෙනත් පැති බලා ගෙනයි සිටින්නේ. ඒකට මයි දේශපාලනය කියන්නේ. [බාධා කිරීමක්] අපි ආණ්ඩුවේ ඉන්නකොට හැම එක්කෙනාම කකුල් ළඟ. අපි විපක්ෂයේ ඉන්නකොට - [බාධා කිරීමක්] අපි ආණ්ඩුවේ ඉන්නකොට හැම එක්කෙනාම කකුල් ළඟ. ඔය කිව්ව හැටියට විපක්ෂයේ හැම එක්කෙනාම බෙල්ල ළඟ. ඔබතුමා තමයි බෙල්ල ළඟ.[බාධා කිරීමක්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Hon. Member, do not refer to His Excellency the President. That will be expunged.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඔබතුමන්ලා මුස්ලිම් පල්ලි ටික කඩලා කරපු වැඩේ- [බාධා කිරීමක්] ඉතින් වැඩිය ශබ්ද කරන්න එපා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මොකක්ද ඔබතුමා කිව්වේ?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Do not refer to the Executive. You can refer to others. Have a safe sailing.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

නිර්මල කොතලාවල නියෝජ්‍ය ඇමතිතුමා වාගේ කට්ටියට අපි කියන්නේ මෙයයි. කරුණාකරලා අපි පක්ෂය හඳනවා වාගේ ඔබතුමන්ලාගේ ආණ්ඩුව හදන්න. ඔබතුමන්ලාට පාලනය කරන්න බලයක් ලැබිලා තිබෙන්නේ එක්සත් ජාතික පක්ෂයට ඇඟිල්ල දික් කරලා එක්සත් ජාතික පක්ෂයේ තිබෙන ප්‍රශ්න විසඳන්න නොවෙයි. [බාධා කිරීම්] ඔබතුමන්ලාගේ ප්‍රශ්නය මේකයි. අහිංසක රජයේ සේවකයින්ට මාසයේ පඩිය සුමානයකට මදි නේද? මොනවාද කරන්නේ ඉතින්. පඩිය වැඩි කරනවා කියලා තිබෙනවා. තවම වැඩි කරලා තිබෙනවාද?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ලක්ෂ 6කට රක්ෂාවල් දුන්නා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

අනේ මොන කෙහෙල් මලක්ද? ලක්ෂ 6ක්. කොහේද ලක්ෂ 6ක විරැකියාව තිබෙන්නේ? අපට පෙන්වන්න කොහේද මේක කරලා තිබෙන්නේ කියලා. අපි ඔප්පු කරනවා. [බාධා කිරීම්] ඊට පසුව මම තවත් කාරණයක් කියනවා. ඔබතුමන්ලා අධිවේගී මාර්ගය ගැන කථා කරනවා. මේ ආණ්ඩුව තව සුමාන 2කින් පෙට්‍රල් මිල රුපියල් 25කින් වැඩි කරනවා. ඩීසල් මිල රුපියල් 20කින් විතර වැඩි කරනවා. ඇයි එහෙම කරන්න අවශ්‍ය වන්නේ? ඔබතුමන්ලා හෙජින් සූදුව පැරදුණාට පසුව ගෙවන්න තිබෙන සල්ලි නිසා, ඔබතුමන්ලාගේ ඇමති මණ්ඩලය රකින්න බැරි නිසා, ඔබතුමන්ලාගේ පඩි ටික වැඩි කරන්න සල්ලි ගෙවන්න බැරි නිසා තමයි වැඩි කරන්නේ. [බාධා කිරීම්] නැත්නම් අද ඉරානයේ ප්‍රශ්නය තියා ගෙන තෙල් මිල US Dollars 119යි. අතිගරු ජනාධිපති මුදල් ඇමති වශයෙන් දැන් මාස 3කට ඉස්සෙල්ලා පාර්ලිමේන්තුවට ආවාම කිව්වේ බොර තෙල්, බනිජ තෙල් බැරලයක මිල ඩොලර් 139යි කියලා. අද ඩොලර් 119යි. අද කොළඹ වරායට තෙල් ලීටරයක් රුපියල් 69කට ගේන්න පුළුවන්. ඉතින් 125ට විකුණලා සියයට 100ක කළු කඩ ව්‍යාපාරයක් කරන්න ඕනෑද? මේක තවත් රුපියල් 25කින් වැඩි කරන්නේ මොකද? අපි ආණ්ඩුවෙන් අහනවා, මේ වාගේ දේවල මිල අඩු වන විට ඇයි අඩු කරන්නේ නැත්තේ කියලා. තමුන්නාන්සේලා මේ කළු කඩ ව්‍යාපාරය කරන්න එපා. අද ජනතාවට ජීවත් වෙන්න බැරි තත්ත්වයක් තිබෙන්නේ. එහෙම තිබියදී ඩීසල් මිල වැඩි වෙනවා නම් තව කොතරම් දේවල්වල මිල වැඩි වෙනවාද? ඩීසල් මිල රුපියල් 20කින් වැඩි කළොත් බස් ගාස්තු, එළවලු ආදී දේවල්වල මිත් අනිවාර්යයෙන්ම වැඩි වෙනවා. ජීවන වියදම වැඩි වෙනවා. ඒ වාගේම අද ඒ කියන දේට හාත්පසින්ම වෙනස් දෙයක් නේ ආණ්ඩුව- [බාධා කිරීමක්]

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

නිකම් කථා කරන්නේ නැතිව. ඉස්පිරිතාලවල බෙහෙත් ටික දෙන්නේ නැතිව- [බාධා කිරීමක්] මේ ආණ්ඩුව කියනවා, අද මේ ලෝකයේ හොඳම ආර්ථිකය තිබෙනවාය කියලා. අද කොටස් වෙළෙඳ පොළ කඩා වැටෙනවා නේද? [බාධා කිරීම්] අපට තිබෙනවා, Jack of all trades, master of none. මේක තමයි තිබෙන්නේ. හැම එක්කෙනාම දක්ෂයි කියලා පෙන්වන්න හදනවා. එක්කෙනෙක්වත් දන්නේ නැහැ එකයි, එකයි කීයද කියලා. දහතුන ප්ලස් කියලා අහන කොට උත්තර දෙන්නේ නැහැ නේ. [බාධා කිරීම්] මේ අවස්ථාවේදී අපි අහන්නේ මේකයි. ඊයේ කොටස් වෙළෙඳ පොළ 2.1කින් වැටුණා. අද 2.3කින් වැටෙනවා.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

නඟිනවා, බහිනවා. ඒක තමයි කලාව.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඔබතුමා නැඟිටිනවා, බහිනවා. ඒක ඔබතුමාගේ වැඩක්. නමුත් රටේ ආර්ථිකයට එහෙම වෙන්න ඉඩ දෙන්න බැහැ. [බාධා කිරීමක්] මොන පිස්සුද? ඔබතුමා උඩට වෙනවා, මෙහාට වැටෙනවා වාගේ උච්චාවචනය වෙනවා නම් ඒක ඔබතුමා කර ගන්න. නමුත් රටේ ආර්ථිකයත් එක්ක, රටේ ජනතාවත් එක්ක සෙල්ලම් කරන්න ඉඩ දෙන්න බැහැ. [බාධා කිරීම්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා. [බාධා කිරීමක්]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඉස්පිරිතාලේ බෙහෙත් දෙන්න බැරි නියෝජ්‍ය ඇමතිවරයෙක්. අද කොටස් වෙළෙඳ පොළ 2.3කින් වැටිලා තිබෙනවා. මම ගරු කරන සුගතදාස මැතිනිය ගෙදර ගියේ මොකද? මේ තිබෙන දූෂිත වංචාව, මාෆියාව නවත්වන්න බැහැයි කියලා. එයාට ඉස්සෙල්ලා හිටපු Director-General, Malik Cader මැතිතුමාව ගෙදර යැව්වා.

ඒකට හේතුව තවම සොයා ගන්න බැරි වුණා. කොටස් වෙළෙඳ පොළ කඩා ගෙන වැටෙනවා. ආර්ථිකය කඩා ගෙන වැටෙනවා. කවුරුවත් ඒකට උත්තරයක් දෙන්නේ නැහැ. දැන් තිබෙන බලපෑම මොකක්ද? ඩොලර් එක වැටෙනවා. 113ට තිබුණ ඩොලර් එක නොවැම්බර් මාසයේ අය වැයට පසුව ක්ෂණිකව රුපියල් 3කින් අවප්‍රමාණය කළා. ඒක කරන දවසේ-

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
දැන් ඔබතුමාට ලබා දී තිබුණ වෙලාව අවසන් වෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
දැන් ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමාත් සභාවට පැමිණිලා තිබෙනවා. අපට ඕනෑ තරම් වෙලාව තිබෙනවා. අපේ ජයවික්‍රම පෙරේරා මැතිතුමා මිනිත්තු 20කින් මිනිත්තු 12යි කථා කළේ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
නැහැ, නැහැ. He spoke for 12 minutes. He was assigned 20 minutes.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
හරි, හරි. ඇත්ත කියනවා නේ. මේ අවස්ථාවේදී කොටස් වෙළෙඳ පොළ කඩා ගෙන වැටෙනවා වාගේම ඩොලර් එක රුපියල් 3කින් අවප්‍රමාණය කිරීමෙන් රුපියල් මිලියන 8,000ක් ඒ දවසේ නැති වුණා. ඊයේ සිට අද වනතුරු ශත 75කින් පමණ අවප්‍රමාණය වෙලා තිබෙනවා. මේ අවප්‍රමාණය වීම බිලියන 20යි. ඒ කියන්නේ කෝටි 2,000ක් නැති වුණා. මොකක්ද ඇමතිතුමා මේ වෙන්නේ? ඔබතුමා ජ්‍යෙෂ්ඨ ඇමතිවරයෙක් වශයෙන් උදේ පාන්දර pressurize කරලා ආණ්ඩුව ආරක්ෂා කරන්න හදනවා. ඉතින් මේ ආරක්ෂා කිරීමේ ගමන තුළ අපි අවප්‍රමාණය වෙනවාට එක පැත්තකින් හොඳයි කියනවා, තව පැත්තකින් නරකයි කියනවා. නරක වන්නේ ඇයි? චීනයෙන් ණය අරන් ගෙවන්න ගියාම 112ට ගත්ත එකට ගෙවන්න වෙන්නේ 115ට, 116 වුණාම ඒ අවප්‍රමාණයට මොනවාද කරන්නේ? ඒවා තමයි අපි මේ අවස්ථාවේදී කියන්නේ. කරුණාකරලා මේ ආර්ථිකය හදා ගන්න. ජීවන වියදම වැඩි වීම සම්බන්ධයෙන් ඔබතුමන්ලාගෙන් ප්‍රශ්න කළත් උත්තරයක් නැහැ. අඩු ගණනේ - [බාධා කිරීමක්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! Hon. Member, please wind up now.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sr, give me two more minutes. I will just take two minutes.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Member, you have exceeded your time.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
You have three more speakers and 10 minutes for each of them is 30 minutes altogether.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
It is my business to manage the House. I am asking you to kindly wind up because your time is over.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
When you have a little bit of extra time, you must be magnanimous with it.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
That is why I gave you one more minute. You have hardly touched on the subject.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
දැන් බලන්න, මේ අවස්ථාවේදී ඇමෙරිකන් ඩොලරය ආරක්ෂා කළේ නැත්නම් මේ වියදම දරන්න වෙන්නේ ඔබතුමන්ලාටයි. ඒ නිසා කරුණාකර-

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මනුෂ නානායක්කාර මන්ත්‍රීතුමා. We have many more speakers to speak.

[අ.භා. 5.22]

**ගරු මනුෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හිතන්නේ මේක ඉතාමත්ම වැදගත් අවස්ථාවක් කියලායි. රටේ සන්ධිස්ථානයක් හැටියට අධිවේගී මාර්ග පද්ධතියේ ආරම්භය සනිටුහන් කරමින් පසුගිය දවසේ කොළඹ, කොට්ටාවේ සිට ගාල්ලේ, පින්නදූව දක්වා අධිවේගී මාර්ගය විවෘත කරලා ලංකාවේ මාර්ග පද්ධතියේ කේන්ද්‍රස්ථානයක් හැටියට සලකන්න පුළුවන් අවස්ථාවක් අපට උදා කර දුන්නා. විශේෂයෙන්ම ගාල්ල දිස්ත්‍රික්කයේ ජනතාව නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් හැටියටත්, ගාල්ල නගරය භාරව කටයුතු කරන මන්ත්‍රීවරයා හැටියටත් මා විශේෂයෙන්ම අතිගරු ජනාධිපතිතුමාටත්, ඒ වාගේම නියෝජ්‍ය ඇමතිතුමාටත්, මාර්ග සංවර්ධන අධිකාරියේ ලේකම්තුමන්ලා ඇතුළු ඒ සියලුම කණ්ඩායම්වලට ස්තුතිවන්ත වෙනවා, මේ මාර්ගයේ ඉදි කිරීම් කටයුතු අවසන් කරලා ඒ තුළින් ගාල්ලට සුවිශාල සේවාවක් ලබා දීම සම්බන්ධයෙන්.

ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා මේ සභාවෙන් පිට වෙලා යන්න ඉස්සෙල්ලා මම මතක් කරන්න ඕනෑ එතුමාගේ කතාවේ එක කොටසක ඇත්තක් තිබෙනවාය කියන එක. ඒ තමයි මේ

[ගරු මනුෂ නානායක්කාර මහතා]

පාර හදන්න පටන් ගත්තේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවය කියන එක. ඒ ගැන විවාදයක් නැහැ. මං තීරු දෙකකින් යුත් මාර්ගයක් මිලියන හාරදහස් ගණනකින් අවසන් කරන්න ගිවිසුම් අත්සන් කළා. ඒකට ආසියානු සංවර්ධන බැංකුවෙන් මුදල් සෙව්වා. එවකට මහාමාර්ග ඇමතිවරයාව හිටපු තිලක් මාරපන මැතිතුමාත්, ගාල්ල ප්‍රදේශය භාරව හිටපු එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීතුමන්ලාත් එකතු වෙලා මං තීරු හතරකින් නිම කරන්න සල්ලි පවා සොයා ගත්තු අධිවේගී මාර්ගය මං තීරු දෙකට බැස්සා. ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමාගෙන් මම ඇහුවා, "ඇයි අර කොමිස් ගැන මතක් කළේ? නිකම් නා ගන්න කතාවක් නේද කිව්වේ?" කියලා. Highway එක හදන්න පටන් ගන්න ගිහින් සල්ලි හොරකම් කළේ කවුද කියන එක මේ මුළු රටම දන්නවා. ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා එහෙම කිව්වේ, මේක ඇදගන්න ඕනෑ නිසාද, ගාල්ලේ වජිර අබේවර්ධන මහත්මයාගේ නම මතක් කරන්න ඕනෑ නිසා කිව්වාද කියාත් මට හිතුණා. අද මේ රටට ගෙවන්න සිද්ධ වෙලා තිබෙන මුදල් ගෙවන්න සිද්ධ වෙලා තිබෙන්නේ ඒ කට්ටියට හොරකම් කරන්න, කොමිස් ගහන්න - [බාධා කිරීමක්]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Member, what is your point of Order?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
He referred to the Hon. Vajira Abeywardana who was a Minister, as if he was a scandalous person. Please ensure that he either takes full responsibility for what he is saying. You cannot just let somebody -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
වගකීම භාර ගන්නවාද?

**ගරු මනුෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)
ඔව්. වගකීම භාර ගන්නවා. මම කිව්වේ එතුමාගේ නම මතක් කරන්නද ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා එහෙම කිව්වේ කියන එකයි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කතාව කරගෙන යන්න.

**ගරු මනුෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)
ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමාට විතරක් නොවෙයි ඔබතුමන්ලාටත් ඒ නම මතක් කරන්න ඕනෑ. අවුරුදු 46කින් සල්ලි ගෙවන්න තිබෙනවාය කියා, ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ගණන් හදා පෙන්නුවා. හොරකම් කරපු සල්ලි තමයි ඒ ගෙවන්න වෙලා තිබෙන්නේ. කොළඹින් ගත්තු ගෙවල්වලට, කොමිස් ගහපුවාට තමයි අද අහිංසක මහ ජනතාවට ඒ සල්ලි ගෙවන්න සිද්ධ වෙලා තිබෙන්නේ. එතැනිනුයි පටන් ගන්නේ. මං තීරු දෙකකට සැලසුම්ගත වෙලා තිබුණු මේ අධිවේගී මාර්ගය මේ වනකොට මං තීරු හතරක් දක්වා හදා නිම කරලා ඉදිරි අවුරුදු කිහිපයේදී මං තීරු හයක් දක්වා වර්ධනය කරනවා. මේ උත්තරීතර පාර්ලිමේන්තුවේදී මේ සම්බන්ධයෙන් කතා කරන්න මම අවසර පැතුවේ දැනට මේකෙන් වැඩිපුරම වාසි ලබන ජනතාව ගාල්ලේ ඉන්න නිසයි. ගාලු ජනතාවට තමයි මේකෙන් වැඩිම ප්‍රතිලාභයක් හම්බ වෙන්නේ. සමහර වෙලාවට මාසෙකට දවස් 15ක්, 20ක් මේ මාර්ගයේ ගාලු ගිහිල්ලා එද්දී කාලය වාගේම මුදලුත් ඉතිරි වෙනවා. අපට විතරක් නොවෙයි ගාල්ල, මාතර ආදී හැම ප්‍රදේශයකම ජනතාව කොළඹට එන්න ගත කරන කාලය ඉතාමත්ම කෙටි වෙලා තිබෙනවා. මේ රටේ ජාතික ධනස්කන්ධය විනාශ කරමින්, ඉන්ධන නාස්ති කරමින්, වාහනවල අංගෝපාංග විනාශ කරමින් කොළඹට එන්න පැය දෙකක්, තුනක්, හතරක් ගත කරපු කාලය කෙටි වීම නිසා විදේශයන්ට යන්න තිබුණු දැවැන්ත මුදලක් ඉතිරි කර ගන්න අපට පුළුවන් වෙලා තිබෙනවා.

අද මේ අධිවේගී මාර්ගය නිසා එක පැත්තකින් ගාල්ල නගරය, ගාල්ල දිස්ත්‍රික්කය සංචාරක කේන්ද්‍රස්ථානයක් විධියට පත් වී තිබෙනවා. විදේශීය විතරක් නොවෙයි, දේශීය සංචාරකයින්ටත් ඉතාමත්ම ඉක්මනින් ගාල්ල නගරයට එන්න පුළුවන්කම ලැබිලා තිබෙනවා. අද ගාල්ල නගරයේ සංචාරක හෝටලයක එකම දවසකවත් කාමරයක් හොයා ගන්න නැහැ. දවල් කෑම වේලක් කන්න තැනක් හොයා ගන්න නැහැ ගාල්ල නගරයේ. ඇයි ඒ? ඒ තරමට අතිවිශාල ජනස්කන්ධයක් හැමදාකම මේ අධිවේගී මාර්ගය හරහා ගාලු නගරයට යනවා. ඒකේ ස්තුතිය, ප්‍රණාමය අපි පුද කළ යුතුයි. කුහක විධියට බලන්න නරකයි. මේ අධිවේගී මාර්ගය නිසා ඇති වෙලා තිබෙන සෙත අද ගාල්ලට විතරක් සීමා වෙලා නැහැ. ගාල්ල අවට නගරවලට විහිදිලා යන මේ ප්‍රතිලාභ හෙට අනිද්දා වන කොට මාතරට, හම්බන්තොටට මේ මුළු රටේ හැම කෙනෙකුටම භුක්ති විඳින්න ලැබෙනවා. ඒ නිසායි මම කිව්වේ අපේ අතිගරු ජනාධිපතිතුමන්ට අපි ස්තුතිවන්ත වෙනවා කියලා, මේ මාර්ගය හදා දීම සහ ඉදිරියේදී කරන්න හදන වැඩ කටයුතු සම්බන්ධයෙන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අපි සුවිශේෂී වශයෙන් මතක් කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. එනම් ඇතැම් ගරු මන්ත්‍රීවරුන් මාර්ග අනතුරු සම්බන්ධයෙන් කථා කළා. ගාලු පාරේ අපි වෙනදාට පැය තුන හතරක් ගමන් කරලා කොහේ හරි වාහනයක් වද්දාගෙන තමයි යන්නේ. මාසයකට සැරයක් කොහේ හරි අනතුරක් සිද්ධ වෙනවා. හැබැයි අද කිසිම අනතුරක් නැතිව මේ අධිවේගී මාර්ගය හරහා ගමන් කරන්න පුළුවන්කම ලැබිලා තිබෙනවා. අනතුරු ප්‍රතිශතය ගණන් හදලා බැලුවාම අදටත් අධිවේගී මාර්ගයේ සිද්ධ වෙන අනතුරු සංඛ්‍යාව අද ගාලු පාරේ ඇති වන අනතුරු සංඛ්‍යාවට වඩා අඩුයි. එහෙම නම් සිද්ධ වන අනතුරු සංඛ්‍යාවේ පහළ යාමකුත් වෙලා තිබෙනවා. ආර්ථික වශයෙනුත් වාසියක් ඇති වෙලා තිබෙනවා. ඒ වාගේම කාලය ඉතිරි වීම හරහා රටට ජාතික වශයෙන් දැවැන්ත ඉතිරියක් ඇති වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අද මේ highway එක විතරක් නොවෙයි, අතිගරු ජනාධිපතිතුමා මහාමාර්ග ඇමතිවරයා විධියට මුළු රටේම මාර්ග පද්ධතියේ දැවැන්ත සංවර්ධනයක් ඇති කරලා තිබෙනවා. මීට අවුරුදු 10කට, 12කට ඉස්සෙල්ලා කාලවකවානුව අපි සිහිපත් කළොත් මේ රටේ එක තැනක ඉඳලා තවත් තැනකට ගමන් කරන කොට අපේ කාලය වැඩිපුරම ගියේ මාර්ගයට. කොළඹ ඉඳලා ත්‍රිකුණාමලයට ගියත්, කොළඹ ඉඳලා අම්පාරට ගියත් මේ මොන තැනකට ගියත් මාර්ගයට ගත කරන කාලය තමයි වැඩි වුණේ. හැබැයි කුහක

සිතින් සිතන්නේ නැතිව නිකමට කල්පනා කරලා බලන්න අද තිබෙන තත්ත්වය. අද අපි පාරට බැහැලා කොහේ හරි දුරකට ගමන් කරලා එන්න ගියොත් අපට හිතෙනවා, "දෙයියනේ! මේ රටේ නොහදාපු පාරක් නැහැනේ" කියලා. යන යන හැම තැනකම මාර්ග පද්ධති අලුත්වැඩියා කරලා. මාර්ග පද්ධතිය කාපට් කරලා.

ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමාගේ නිර්දේශය අනුව මේ දවස්වල පළාත් මාර්ග පද්ධතිය වෙනමම අලුත්වැඩියා කෙරෙනවා. මේ හැම ක්ෂේත්‍රයක් හරහාම ගමේ පාර හැදිලා මාර්ග පද්ධතිය සකස් වෙනවා කියන්නේ, ප්‍රධාන වශයෙන් රටේ ආර්ථිකය ගොඩ නැඟෙන්න ඕනෑ කරන යටිතල පහසුකමක් තමයි මේ සංවර්ධනය වෙලා තිබෙන්නේ. අපි අමතක කරන්න නරකයි, යටිතල පහසුකම් හැටියට මාර්ග පද්ධතිය හැදෙන කොට, විදුලිය ලැබෙන කොට, ජලය ලැබෙන කොට තමයි රටක ආර්ථික වශයෙන් සංවර්ධනයක් ආරම්භ වෙන්නේ කියන එක. අපි යුද්ධය ඉවර කරපු රටක්. අවුරුදු 30ක් පැවතුණු යුද්ධය අවසන් කරපු රටක් හැටියට එතැනින් අලුත් පිම්මක් පනිද්දී පළමුවෙන්ම යටිතල පහසුකම් සියල්ල සම්පාදනය කර ගෙන ඉන්න ඕනෑ. එතැනදී ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමන්ලා බලනවා වාගේ හැම තිස්සේම ලාභ බිස්නස් කරන්න නොවෙයි, මහින්ද චින්තනය තුළින් බලාපොරොත්තු වෙන්නේ.

මහින්ද චින්තනය තුළින් බලාපොරොත්තු වෙන්නේ මේ වෙලාවේ ජනතාවගේ යටිතල පහසුකම් හදලා ඒ හරහා පුද්ගල ආර්ථිකය ගොඩ නඟලා, ගෘහස්ත වශයෙන් තනි පුද්ගලයකුගේ ආර්ථික මට්ටම වර්ධනය කරලා, රටක් හැටියට සංවර්ධිත රටක් කරා ඉස්සරහට යන්න; ආසියාවේ ආශ්චර්ය කරා යන්න. අද දකින දකින පාරක් හැදෙන කොට, ඒ පාරවල් කාපට් වෙන කොට මේවා දිහා බලාගෙන ඉන්න බැරි ඊර්ෂ්‍යාවක් සමහර අයට ඇති වෙනවා. ඒ ඊර්ෂ්‍යාව ඇති වෙද්දී තමන් සතොස විකුණපු හැටි මතක් වෙන කොට, එයාර් ලංකා එක විකුණපු හැටි මතක් වෙන කොට, තමන් ඒ කරපු සිද්ධි මතක් වෙන කොට, තමන්ගේ පුරුද්දට අනෙක් අයත් මේවායිනුත් හොරකම් කරනවා ඇති කියලා හිතාගෙන මේ උදවිය කතා කියන්න පටන් අරගෙන තිබෙනවා.

ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමාට මම කාරණයක් මතක් කරනවා. එතුමා කිව්වා, හම්බන්තොටින් විතරයි අධිවේගී මාර්ගයට පත්වීම් කරලා තිබෙන්නේ කියලා. නැහැ. මම මතක් කරනවා, එතුමාගේ ගමෙනුත් පත් කරලා තිබෙන බව. ගාල්ලෙනුත් පත් කරලා තිබෙනවා. දකුණු පළාතේ සියලුම ආසනවලින් ඔය අධිවේගී මාර්ගය සඳහා පත්වීම් කරලා තිබෙනවා. ඒ නිසා ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමාට මම ඒක මතක් කරනවා. ඒ වාගේම ඒ මාර්ග පද්ධතිය සකස් කිරීමේදී මාර්ග සංවර්ධන අධිකාරිය හරහා ගරු නාමල් රාජපක්ෂ මැතිතුමාත් ගාල්ල නගරයේ මාර්ග පද්ධතිය සකස් කරන්නට මේ වන කොට බිලියනයකට අධික මුදලක් ගාල්ල නගරයට ලබා දීලා තිබෙනවා. ඒ සම්බන්ධයෙනුත් මා ස්තුතිවන්ත වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මේ මාර්ග පද්ධතියේ මුදල් අය කිරීම සම්බන්ධයෙනුයි අද මේ නියෝග ඉදිරිපත් කරලා තිබෙන්නේ. මේ පාරේ ගාල්ල පැත්තට යන උදවිය කියන්නේ මේ ගණන නොවෙයි මීටත් වඩා වැඩි ගණනක් දුන්නත් කමක් නැහැ කියලායි. හැබැයි මීට වඩා ටිකක් හයියෙනුත් යන්න අපට ඉඩ දෙන්නය කියලා කියනවා. මොකද, අපිත් සමහර වෙලාවට යනකොට අන්තිමට දඩ කොළයක් අරගෙන යන්න තමයි සිද්ධ වෙන්නේ. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

බොහොම ස්තුතියි. මීළඟට ගරු ජානක වක්කුඹුර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.31]

**ගරු ජානක වක්කුඹුර මහතා**
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු මන්ත්‍රීතුමන්ලා කිව්වා වාගේ මේ රටේ විශාල පිරිසකට අධිවේගී මාර්ගයක් දැක ගන්නවත් ලැබුණේ අතිගරු ජනාධිපතිතුමා කෙටි කාලයක් තුළ මේ දක්ෂිණ අධිවේගී මාර්ගය හදලා ඉවර කරපු නිසායි. ගොඩාක් වෙලාවට මෙම මාර්ගය භාවිත කරන කෙනෙක් තමයි මම. මම රත්නපුරේ හිටියාට දැන් මේ අධිවේගී මාර්ගයට ඇවිල්ලා තමයි හැමදාම එන්නේ. එක්කෝ පානදුර මාර්ගයෙන් ඇවිල්ලා අධිවේගී මාර්ගයට එනවා. කලවානේ ඉඳලා එන කොට මතුගමට ගිහිල්ලා අධිවේගී මාර්ගයේ එනවා. මේ අධිවේගී මාර්ගය, ගාල්ල ප්‍රදේශයේ අයට විතරක් නොවෙයි, ප්‍රයෝජනවත් වෙලා තිබෙන්නේ. මේ රටේ විශාල පිරිසකට මේ අධිවේගී මාර්ගය ප්‍රයෝජනයට ගන්න පුළුවන්කම ලැබිලා තිබෙනවා.

දැනට මේ මාර්ගය මං තීරු හතරකින් හදලා තිබෙනවා. පාලම් තිබෙන තැන්වල විතරක් ටිකක් පටු බවක් තිබෙනවා. ඒ හැර ඒ මාර්ගයේ අනෙක් ඕනෑම තැනක කිසිම කරදරයක් නැතිව යන්න එන්න පුළුවන්. ඕනෑම කටයුත්තක් කරන්න ගියාම ඒකේ ඇද කුද සොයන්න නම් කට්ටිය ඉන්නවා කියලා අපි දන්නවා. හැබැයි, ඒක පාවිච්චි කරන ගමන්ම තමයි හොඳ නැහැයි කියන්නේ. මම දන්නා හැටියට ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමාට වෙන්න ඕනෑ high-speed ගිහිල්ලා දඩ කොළයක් දුන්නේ. එතකොට එතුමා ඒ පාර පාවිච්චි කරලා තිබෙනවා. එතුමා ඒ මාර්ගයේ නීති කඩලා තිබෙනවා. එදා කලවාන පැත්තේ ඉන්න කෙනකුට කොළඹට එන්න පැය තුනහමාරක් ගියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද පැය එකහමාරෙන් කොළඹට එනවා. පැය දෙකක ඉතිරියක් තිබෙනවා. ආපසු යන්න ගියාම නැවතත් පැය තුනහමාරක් යනවා. ඒ ගමනට පැය හතක් ගිය කෙනකුට අද පැය තුනකින් කලවානේ ඉඳන් කොළඹට ඇවිල්ලා යන්න පුළුවන්. ඒ කියන්නේ මේ රටේ තිබෙන දුෂ්කරම ප්‍රදේශයක ඉඳලා ඒ තරම් කෙටි කාලයකින් එන්න පුළුවන්. අපි කලවානට යනවා නම් අධිවේගී මාර්ගයේ මතුගමට යන්න අය කරන්නේ රුපියල් 200යි. ඊට මෙහා තැනකට යනවා නම් රුපියල් 100යි අය කරන්නේ. හැම තැනකටම එකම ගණනක්, ඒ කියන්නේ රුපියල් 400ක් අය කරන්නේ නැහැ. ගාල්ලට ගියොත් විතරයි රුපියල් 400ක් ගන්නේ. ඒ නිසා වාහනයේ ඉන්ධනවලට, ඒ වාගේම අනෙකුත් වියදම්වලට යන මුදලට වඩා ඉතිරියක් මේ අධිවේගී මාර්ගයේ ගමන් කිරීම නිසා ලැබෙනවා. ඒ වාගේම ඉක්මනින් ගමනක් යන්න පුළුවන්. මම අද පත්තරයකත් දැක්කා මහරගම ලොකු පෝලිමක් ඉන්නවා, දැනට තිබෙන බස් රථ ප්‍රමාණය මදි, බස් රථ ප්‍රමාණය වැඩි කරන්න කියලා. බස් එකක් පැය භාගයකට වරක් ආවත්, ලොකු පිරිසක් අධිවේගී මාර්ගයේ යන්න ඉන්නවා. එහෙම නම් මේ රටේ ජනතාවට මේ අධිවේගී මාර්ගය නිසා ලොකු පහසුවක් ඇති වී තිබෙනවා. ඒ මාර්ගයේ නඩත්තු කටයුතු කරන්න, මේ මාර්ගය පවත්වා ගෙන යන්න තමයි මුදල් අය කරන්නේ. එහෙම නැතිව ආණ්ඩුව ලාභ ලබන්න නොවෙයි.

අතිගරු ජනාධිපතිතුමා මේ මාසයේ 18 වැනිදා කොළඹ වටරවුම් මාර්ගයට මුල් ගල තබනවා. ඒ වාගේ කටයුතු රාශියක් කර ගෙන යනවා. අධිවේගී මාර්ග හදනවා වාගේම ගමේ තිබෙන පුංචි පාරේ සිට සියලුම මාර්ග හදනවා. මම පැය එකහමාරක් යනවා කිව්වේ කලවානේ ඉඳන් එන මාර්ගයේයි. දැන් සුමාන තුනකට කලින් අපේ ගරු නිර්මල කොතලාවල නියෝජ්‍ය ඇමතිතුමා රුපියල් කෝටි ගණනක් වැය කරලා කලවාන - මතුගම මාර්ගය කාපට් කරන්න වැඩ ආරම්භ කළා. එතකොට තවත් ලෙහෙසියි. ඒ වාගේම ලොකු මුදලක් වැය කරලා අද කලවානේ සිට රත්නපුරයට එන මාර්ගය හදා ගෙන යනවා. ඒ

[ගරු ජානක වක්කුඹුර මහතා]

විධියට මහා මාර්ග අමාත්‍යාංශය යටතේ මේ රටේ හැම තැනකම තිබෙන මාර්ග පද්ධතිය හදනවා. මම දන්නා විධියට මහාමාර්ග අමාත්‍යාංශය යටතේ රත්නපුර දිස්ත්‍රික්කයේ තිබෙන මාර්ගවලින් තවමත් කාපට් නොකරපු මාර්ග දෙකයි තිබෙන්නේ. ඒ මාර්ග දෙකත් කාපට් කරන්න දැනට ටෙන්ඩර් කැඳවන්න කටයුතු කර ගෙන යනවා. එකක් මාදම්පේ හරහා රක්වානට යන මාර්ගය. අනෙක මම ඉන්න පැත්තේ තිබෙන කරවිට මාර්ගය. අනෙක් සෑම පාරක්ම දැන් කාපට් කරලා හදලා තිබෙනවා.

අපේ ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමාගේ මැදිහත් වීම යටතේ පළාත් සභා මාර්ග විශාල ප්‍රමාණයක් සකස් කර ගෙන යනවා. "ගම නැඟුම" වැඩසටහන යටතේ පුංචි පාරවල් රාශියක් හදනවා. මේ වාගේ සංවර්ධනයක් වෙන කොට ඒ දිහා බලා ගෙන ඉන්න බැරි අය තමයි යම් යම් දේවල් කියන්නේ. සමහර වෙලාවට කොහේ හරි කොන්ක්‍රීට් කරලා පාරක් හැදුවාම ඒ පාරේ ගලක් ගැලවුණොත් ඒක අර ගෙන එනවා. එහෙම නැත්නම් ඒ පාරේ කොහේ හරි වලක් තිබෙනවා කියනවා. අන්න එහෙම තමයි ඒවා පෙන්වන්නේ. වැඩක් කරන කොට කොහේ හරි අඩු පාඩුවක් තියෙන්න පුළුවන්. අපි නැහැයි කියන්නේ නැහැ. ඕනෑම වැඩක් කරන කොට අඩු පාඩුවක් තියෙන්න පුළුවන්. අඩු පාඩුවක් තිබෙනවා නම් අපි ඒක හදනවා.

"ගම නැඟුම" වැඩසටහන කරන කොටත් අපි දන්නවා, මේ කොන්ත්‍රාත් කරන අය යම් යම් ඒවා කරනවාය කියලා. හැබැයි අපට ඒවා ජනතාව කියපු ගමන් අපි ඒවාට ගෙවන මුදල් නවත්වලා ඒවා හරියාකාරව කරවන්න කටයුතු කරලා තිබෙනවා. මේ රටේ අධිවේගී මාර්ග පද්ධතියම හැදුවාට පස්සේ අපට බොහොම ලේසියෙන්, ඉක්මනින් ගමන් බිමන් යන්න පුළුවන්කම ලැබෙනවා.

අද අනුරාධපුරයේ "දැයට කිරුළ" ප්‍රදර්ශනය තියෙද්දී අපේ පෙළක් මන්ත්‍රීවරු උදේ 4.30ට කොළඹින් පුත්තලමට ගිහිල්ලා අනුරාධපුරයට ගියා. ඉස්සර එහෙම යන්න පුළුවන්කමක් තිබුණාද? උදේ 8.30ට අනුරාධපුරයේ ඉන්න ඕනෑ නම් කොළඹින් පාන්දර 1.00ටවත් යන්න ඕනෑ. මේ මාර්ග පද්ධතිය හදපු එකේ වාසිය මේ රටේ සෑම ජනතාවකටම තිබෙනවා. අතිගරු ජනාධිපතිතුමා ඒ කටයුත්ත හරියාකාරව අද ඉෂ්ට කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ ඇමතිතුමා නැති වුණේ මට මතක හැටියට 2008 දීයි. රවි කරුණානායක මන්ත්‍රීතුමා කිව්වා 2009 හැන්සාඩ් වාර්තාවේ එතුමාගේ නම තිබෙනවාය කියලා. හැබැයි 2009 නොවෙයි, 2010න් පස්සේ නම් අපේ ගරු සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ මන්ත්‍රීතුමිය මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා ඉන්නවා. ඒ නිසා 2009 හැන්සාඩ් වාර්තාවේ එතුමාගේ නම තියෙන්න විධියක් නැහැ. මොකද එතුමා එවකට පාර්ලිමේන්තුවේ හිටියේ නැහැ. එතුමා 2008 දී තමයි නැති වුණේ. ඒකවත් හරියට දැන ගන්නේ නැතිව වගකීමෙන් කියන්නේ කියලා කියනවා. වගකීමක් වෙන්නේ කොහොමද මේ පාර්ලිමේන්තුවේ හිටපු නැති එක් කෙනෙක්ගේ නම 2009 හැන්සාඩ් වාර්තාවේ තියෙනවා නම්. ඒක පුදුමයක්. එහෙනම් හැන්සාඩ් එකට වරදින්න ඇති. කවුරු හරි මොනවා හෝ කිව්වොත් ඒ දේ බලලා තමයි ඇවිල්ලා කියන්නේ.

මේ අධිවේගී මාර්ගය ජාතික මාවතක් හැටියට නම් කර ගැසට් කරලා තිබෙනවා. රුපියල් 400ක උපරිමයකට යටත් කර ගාස්තු අය කරන එක ගැන කිසිම කෙනෙක් වරදක් කියන්නේ නැහැ කියලායි අපි දකින්නේ. කිසිම කෙනෙක් මේකේ ගණන වැඩියි කියන්නේ නැහැ. හැබැයි මීට වඩා ගණනක් වුණත් දීලා මේ මාර්ගය පාවිච්චි කරන්න මේ රටේ ජනතාව කැමැතියි. අපි සියලු දෙනාම -මේ රටේ බහුතර ජනතාවත්- කැමැතියි කීයක් අය කළත් මේ වාගේ මාර්ග පාවිච්චි කරන්න.

අපි ගරු නිර්මල කොතලාවල නියෝජ්‍ය ඇමතිතුමාගෙන් ඉල්ලනවා, පුළුවන් නම් අඩුම ගණනේ මෙන්න මේ අධිවේගී මාර්ගයට එන්න අවිස්සාවේල්ල දක්වා මාර්ගයත් මං තීරු 4කට පළල් කරලා හදා දෙන්න කියලා. කෑගල්ල පැත්තට එහෙම නැත්නම් හැටන් පැත්තට යන්න ගොඩාක් දෙනෙක් ආවාට පස්සේ අවිස්සාවේල්ලෙන් කොළඹට එන්න ටිකක් අමාරුවක් තියෙනවා. හැම පැත්තෙන්ම ඇවිල්ලා වාහන එකතු වුණාම කොළඹ පැත්තට එන්න අමාරුයි. අපි වැඩි හරියක් රත්නපුර පැත්තේ අය පාවිච්චි කරන්නේ පානදුර පාර.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගෙන් මා ඉල්ලීමක් කරනවා. ඔබතුමාගේ ආසනය පැත්තෙන් මේ අධිවේගී මාර්ගයට එන කොට රත්නපුර පානදුර පාරේ ඉංගිරිය දක්වා කිලෝමීටර් 14කට වංගු 110ක් තිබෙනවා. ඒ වංගුත් හරියටම "U" හැඩයට තිබෙන වංගු. ඒවා තව කෙළින් කරලා හදන්න පුළුවන්. අඩුම ගණනේ ඉංගිරියට ආසන්නයේ හැරණියාවක හන්දියේ සිට මීටර් 100ක් විතර මාර්ගය කුඹුරක් මැද්දෙන් කෙළින් කළොත් කිලෝමීටරයක් විතර අඩු කර ගන්න පුළුවන්. එහෙම තැන් කීපයක් තිබෙනවා. ඒ නිසා මේ ගැනත් ඔබතුමා කටයුතු කළොත් හොඳයි. මා හිතන හැටියට මේ මාර්ගයට එන පිවිසුම් මාර්ග ටික හැදුවොත් මීටත් වඩා ප්‍රයෝජනයක් වෙනවා. අතිගරු ජනාධිපතිතුමා, ඔබතුමා ඇතුළු ඒ අමාත්‍යාංශයේ සියලු දෙනාටම අපේ ප්‍රදේශයේ ජනතාවගේ ස්තුතිය ප්‍රකාශ කරමින් මා නිහඬ වනවා. ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඊළඟට, ගරු ලලිත් දිසානායක නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට මිනිත්තු දහයක් තිබෙනවා.

Order, please! කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු ශ්‍රියානි විජේවික්‍රම මන්ත්‍රීතුමියගේ නම යෝජනා කරන්න.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු ශ්‍රියානි විජේවික්‍රම මන්ත්‍රීතුමිය දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. ALHAJ A.H.M. AZWER *left the Chair and* THE HON. (MRS.) SRIYANI WIJEWICKRAMA *took the Chair.*

[අ.භා. 5.40]

**ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද අපි සතුටු වෙනවා මේ අධිවේගී මාර්ගය ගැන මේ විධියට මේ සභාවේ කථා කරන්න ලැබීම ගැන. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ නායකත්වයට,

රජයට පින් සිද්ධ වෙන්න අර ගැලරියේ ඉන්න අපේ පාසල් දරුවන්ට අපේ කාලයේ වාගේ නොවෙයි අධ්‍යාපන චාරිකාවක් යන කොට අධිවේගී මාර්ගයක යන්න පුළුවන්කම ලැබිලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, රටක නායකයෙකුගේ, රටක රජයක වගකීම තමයි මේ නව දේවල්, ලෝකයේ තිබෙන නව තාක්ෂණය, නව දැනුම, නව ආර්ථික ප්‍රවේශ රටට ලබා දීම. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ඒවා ලබා දුන්නා. පළමුව එතුමා දරුවාට නිදහස ලබා දුන්නා. අවුරුදු තිස්තුනක් තිස්සේ තිබුණු යුද්ධය නවත්වලා පුරවැසියන්ට නිදහස ලබා දුන්නා. මේක අප හැම දාම කියනවා. හැම කථාවකදීම කියනවා. ඇයි අප එහෙම කියන්නේ? මේක තමයි මේ හැම දේටම ප්‍රධාන වුණේ. ලක්ෂ දහයක් සංචාරකයෝ මේ රටට එන්නේ මේ හින්දායි. ඒ නිසා මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා, ඒ රජය මේ රටට නිදහස දුන්නා කියන එක යූඑන්පී එක කියන්න එපා කිව්වාට, ජේවීපී එක කියන්න එපා කිව්වාට අප නිතර කියන්න ඕනෑ. මොකද අප ඉස්සර මැරි මැරී ඉපදුණා. අද අපි නිදහසේ ජීවත් වෙනවා.

මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා එදා අපේ හිටපු ජනාධිපතිතුමියට ආරම්භ කරන්න බැරි වුණු නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතිය, කරු ජයසූරිය විදුලිබල ඇමතිතුමාට ආරම්භ කරන්න බැරි වුණු ඉහළ කොත්මලේ ජල විදුලි ව්‍යාපෘතිය ආරම්භ කළා. නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරය ආරම්භ කිරීම නිසා පසු ගිය නියං කාලයේ විදුලිය කපන්නේ නැතිව දිගටම විදුලිය දෙන්න අපට පුළුවන්කම ලැබුණා. කලින් එහි විදුලි ධාරිතාව අපට ප්‍රයෝජනයට ගන්න බැරි වුණා. හැබැයි චීනයෙන් තමයි ආධාර ගත්තේ. විපක්ෂයේ මෙතුමන්ලා කෑ ගහනවා, "කැඩිලා" කියලා. කැඩිලා නම් හදා ගන්න පුළුවන්. නමුත් නොරොච්චෝලේ වාගේ ව්‍යාපෘතියක් එක පැයෙන් හදන්න බැහැ නේ. මෙතුමන්ලා හැම වෙලාවේම කියන්නේ "චීන ආධාර ගත්තා" කියලායි. දැන් මොහොතකට කලින් රවි කරුණානායක මන්ත්‍රීතුමා මොකක්ද කිව්වේ? අධිවේගී මාර්ගයට මේ ගත්ත ගණන වැඩියි ලු; එතුමන්ලා ඒක ඇස්තමේන්තු කළේ මිලියන හාරදහසට ලු. ඒ මං තීරු දෙකකට. අද දෙපැත්තට දෙක ගණනේ මං තීරු හතරක් තිබෙනවා. එතුමන්ලා අමූලික බොරු ප්‍රකාශ කරනවා එතුමන්ලාගේ ඇස්තමේන්තුව මෙච්චරයි කියලා. මේවා කෙරෙන්න ඕනෑ දේවල්.

එදා අප පාසල් දරුවෝ හැටියට කිරිබත්ගොඩ පාලම පහු කර ගෙන එන කොට අර උඩින් බාගෙට හදලා තිබුණු පාලම් දෙක දිහා බලලා කනගාටු වුණා. ඒ අධිවේගී මාර්ගය එදා ආරම්භ කරලා නිම කළා නම් අපට ඔහොම සතුටු වෙන්න තිබුණා. මෙච්චර වියදමක් යන්නේ නැහැ. නමුත් අද එහෙම නැහැ. අද මේ මාර්ග පද්ධතිය මං හිතන්නේ ඉතා විශිෂ්ට ලෙස හදලා තිබෙනවා කියලායි. 2012 ජනවාරි 27වැනි දා වෙන කොට රුපියල් මිලියන 151ක් මේ අධිවේගී මාර්ගයෙන් අප හම්බ කර තිබෙනවා. මේක ඉතාම වැදගත්. ඒ වාගේම මේ නිසා අද මාර්ග පද්ධතියේ විනයක් ඇති වෙලා තිබෙනවා. අද අධිවේගී මාර්ගයකට වාහනයක් දමන කොට අපි බොහොම පිළිවෙළකට යනවා. ඒක වැදගත්. ඒ වාගේම එහි සපයන සේවාව ඉතා වැදගත්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, බුදු හාමුදුරුවන්ටත් දේවදත්ත කෙනෙක් හිටියා නේ. මේ අධිවේගී මාර්ගයේත් පසු ගිය කාලයේ පාලම් උඩ නැඟලා ගල් ගහන අයත් හිටියා. ඒක හරියට අර හඳට ගල් ගැහුවා වාගේ තමයි. නමුත් අද අධිවේගී මාර්ගය තිබෙනවා; එහි මිනිසුන් යනවා. අපේ රවි කරුණානායක මන්ත්‍රීතුමන්ලා, විපක්ෂයේ ඉන්න ඔය සමහර මන්ත්‍රීවරු ඇරෙන්න, අවංකව කියනවා නම් මේක හදා දීපු එකට පිට රට ඉඳන් ආපු ශ්‍රී ලාංකිකයෝ ඇතුළු මේ රටේ ඉන්න සියලුම ජනතාව අපේ ජනාධිපතිතුමාට ස්තුති කරනවා.

ගරු නිර්මල කොතලාවල නියෝජ්‍ය ඇමතිතුමනි, අප කියනවා නුවර අධිවේගී මාර්ගයත් හදන්න කියලා. ඉතුරු අධිවේගී මාර්ගත් හැදීමේ වැඩ ආරම්භ කරන්න. මේ වාගේ ව්‍යාපෘති තමයි අප කරන්න ඕනෑ. එතකොට ජනතාව දන්නවා අප මේ කරන වැඩේ වටිනාකම. මෙතුමන්ලා කොච්චර කෑ ගැහුවත් කමක් නැහැ. චීනයෙන් සියයට හතට ණය ගත්තා කියයි, ඇස්තමේන්තුව ලක්ෂ ගණන් කියයි. හැබැයි එතුමන්ලා කරපු වැඩක් නැහැ. එදා අපේ ත්‍රිවිධ හමුදාව යුද්ධ කරන්න කිලිනොච්චියට යන කොට, මැදවච්චියට යනවා කියලා රවි කරුණානායක මන්ත්‍රීතුමා කිව්වා. ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා තමයි "ඕනෑ ගොනෙකුට යුද්ධ කරන්න පුළුවන්" කියලා එදා හිටපු හමුදාපති හැල්ලුවට ලක් කළේ. මෙතුමන්ලා එහෙම කිව්වා. ඒවා හැන්සාඩ් වාර්තාවල සඳහන්ව තිබෙනවා. ඒ නිසා මේ රටේ ජනතාව අද මේ අය කියන දේවල් විශ්වාස කරන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අප සතුටු වෙනවා දක්ෂිණ අධිවේගී මාර්ගය ගැන. හැබැයි ඉතින් මේකේ අනතුරුත් සිද්ධ වෙලා තිබෙනවා. දක්ෂිණ අධිවේගී මාර්ගයේ මේ දක්වා මාර්ග අනතුරු එකසියහතරක් සහ මරණ එකක් සිදු වෙලා තිබෙනවා. ඒකට කරන්න දෙයක් නැහැ. ජනතා විමුක්ති පෙරමුණේ හිටපු මන්ත්‍රීවරයකු වන ලාල්කාන්ත මහත්මයා කියා තිබෙනවා, "මේ මාර්ගයේ යන කොට බල්ලෝ මැරෙනවා, දඩ මස් කන්න පුළුවන්" කියලා. මේ වාගේ ඉගෙන ගත්ත මිනිස්සු මේ රටේ මහ ජනතාව වෙනුවෙන් නේද මේ කථා කරන්නේ? එතකොට මිනිස්සු හිනා වෙනවා. මේ වාගේ දැවැන්ත ව්‍යාපෘතියක නිමාව, ඒකේ ප්‍රයෝජනය කොයි තරම්ද? පැය දෙකහමාරෙන්, පැය තුනෙන් ගිය ගමන අද විනාඩි හතළිස්පහෙන් යන්න පුළුවන්. ඒ වාගේ හොඳ සංවර්ධනයක් සිදු වෙලා තිබෙන නිසා අප මේක අගය කරන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ජාතික මංමාවත් පනත යටතේ අද මේ නියෝග ගෙන එන්නේ අධිවේගී මාර්ගවලින් මුදල් අය කරන්න. ඒක අවශ්‍යයි. අප සතුටු වෙනවා. ඒ වාගේම එම මාර්ගයේ ඉතුරු ටිකත් ඉතා ඉක්මනින් නිම කරන්න අප බලාපොරොත්තු වෙනවා. කොට්ටාව සිට ගාල්ල දක්වා දක්ෂිණ අධිවේගී මාර්ගයේ දුර ප්‍රමාණය කිලෝමීටර් 96යි. ඊළඟට නිම කිරීමට බලාපොරොත්තු වන අධිවේගී මාර්ග අතර මාතර සිට හම්බන්තොට දක්වා, කොළඹ සිට කටුනායක කියන මාර්ගත් තිබෙනවා. මේ සියලු මාර්ග ඉදි වුණාම අපේ රටේ මාර්ග පද්ධතියේ විශාල දියුණුවක් ඇති වෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මෙතුමන්ලා හැම තිස්සේම චීනය ගැන කථා කරනවා. චීනයෙන් විතරක් නොවෙයි අපට ආධාර ලැබෙන්නේ. උතුරු පළාතේ සහ උතුරු මැද පළාතේ වර්ග කිලෝමීටර් 170ක් පුනරුත්ථාපනය කිරීම සඳහා උතුරු මැද මාර්ග සංවර්ධන ව්‍යාපෘතියට මූල්‍ය අනුග්‍රහය ලැබෙන්නේ ආසියානු සංවර්ධන බැංකුවෙනුයි.

විශේෂයෙන්ම කල්අඩි පාලම සාදන්න ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය අරමුදල් සපයා තිබෙනවා. දැනට එහි විශාල කොටසක වැඩ අවසන් වෙලා තිබෙනවා. ඉදිරි කාලයේ එය නිම කරන්න අපට පුළුවන් වනවා.

උතුරු මාර්ග පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා චීන රජයෙන් ඇමෙරිකන් ඩොලර් මිලියන 498.6ක මුදලක් අපට ලැබිලා තිබෙනවා. මේ මාර්ගය සඳහා කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරලා දැනට මෙහි වැඩ ආරම්භ කරලා තිබෙනවා. මේවා ගැන අපට සතුටු වන්නට පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි ඉස්සර මහියංගනයේ යන කොට ඒ මාර්ගයේ බොහොම භයෙන් ගියේ. අපේ ප්‍රදේශවල වැලි ප්‍රවාහනය කරන ලොරිවල අය භයෙන් ගියේ. මොකද, දහ අට වංගුව. අද මොකක්ද වෙලා තිබෙන්නේ? අද ගිහින් මේ මාර්ග බලන්න ඕනෑ. අද දහ අට වංගුව highway එක වාගේ. මේවා කළේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමායි. මේවා ගැන අපි කථා

[ගරු ලලිත් දිසානායක මහතා]

කරන්න ඕනෑ. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ගැන කථා කරන්න ඕනෑ. එහෙම කථා කරන්නේ විපක්ෂයෙන් කියන ආකාරයට අපට ඇමතිකම් ගන්න නොවෙයි. එතුමා කළ වැඩ ගැනයි අපි කියන්නේ. හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි, ඔබතුමා ඊයේ පෙරේදා මහියංගනයට ගියාද? දැන් දහ අට වංගුව නැහැ, භය වෙන්න දෙයක් නැහැ. වාහනවලට භය නැතුව ඒ මාර්ගයේ යන්න පුළුවන්. එතකොට කියයි, චීනයෙන් මුදල් අරන් හදනවා කියලා. කොහෙන් මුදල් අරන් හැදුවත් ඒ මාර්ග මේ රටේ ජනතාව වෙනුවෙන් හදලා තිබෙන්නේ.

ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා කිව්වා, අවුරුදු හතළිස්හයක් එනම් දින දහහත්දහස් අටසිය ගණනක් යනවා කියලා, මේ මුදල් ගෙවන්න. මම කියනවා, අපි අදත් පාවිච්චි කරන්නේ එදා සුද්දා හදපු පාරවල් බව. භූමි කම්පාවක් ඇවිල්ලා කඩා ගෙන ගියේ නැත්නම් මේ මාර්ග මේ රටේ ජනතාවට තිබෙනවා; සදාකාලිකව පවතිනවා; පාවිච්චි කරන්න පුළුවන්. ලබා ගන්නා මේ මුදල් ගෙවන්න අවුරුදු හතළිහක් යනවායි කියලා මේ පාරවල් හැදුවේ නැත්නම් මොකද වෙන්නේ? මේක තමයි මේ විරුද්ධ පාර්ශ්වයේ අය නිතර කළේ. මේ විධියට කරන්න තමයි ඒ අයට පුරුදු. ජේන බැලුවා මිස මේ දේවල් ආරම්භ කළේ නැහැ. ඒත් අද මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ජේන බලන්නේ නැහැ, වැඩේ ආරම්භ කරලා තිබෙනවා. යුද්ධය දිනනවා කියලා කිව්වා; දිනුවා. ඒකට ජේන බල බලා සිටියේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද පාරේ එන කොට අර එහා පැත්තේ තිබෙන වැව දිහා බලන්න. හොඳින් බලන්න. එදා වැව තිබුණේ කොහොමද? අද එහි බෝට්ටු යනවා. ශාරීරික ව්‍යායාමවලට මං තීරු තිබෙනවා. මේ නිර්මාණ. ආරක්ෂක ලේකම්තුමාට ඒ කටයුතු භාර දෙන කොට කිව්වා, ආරක්ෂක ලේකම්තුමාට දෙන්නේ සහෝදරයා හින්දා කියලා. එහෙම නැත්නම් කිව්වා, යුද හමුදාවේ මිනිසුන් වෙන වැඩවලට ගන්නවා කියලා. අද බලන්න, කොච්චර ලස්සනට ඒ වැඩ කරලා තිබෙනවාද කියලා. ඒ නිර්මාණ ශක්තිය. මුදල් තිබුණාට බැහැ, යමක් නිර්මාණය කරන්න හැකියාව තිබෙන නායකත්වයක් තිබෙන්නට ඕනෑ. අපි යන කොට ඒ වැඩ අපට පෙනෙනවා. අපේ ඇස්වලට බලන්න පුළුවන්, එදා වැව තිබුණේ කොහොමද, අද ඒ වැව කොහොමද හදලා තිබෙන්නේ කියලා. අපි සියලු දෙනාම එදා ප්‍රදර්ශනයක් තියන්න ගියේ, විහාර මහා දේවි පාර්ක් එකටයි. අද ඒ දේ මෙතැන ලස්සනට කෙරෙනවා; මෙතැන හොඳට ඉඩකඩ තිබෙනවා. අලුත් විධියට සිදු වෙනවා. මේ වෙනස තමයි අද මේ රටේ ඇති වෙලා තිබෙන්නේ. ඒ නිසා තමයි මම ඊයේ පෙරේදාත් කිව්ව විධියට පොල් ගෙඩිය රුපියල් හැටපහයි කියලා කිව්වත් පළාත් පාලන මැතිවරණයේදී මේ රටේ ජනතාව අපට ඡන්දය දුන්නේ. මේ හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමන්ලා මොනවා කිව්වත් - චීනෙන් එනවා, චීනයෙන් ණය අරන් එනවා කියලා කිව්වත්- මිනිසුන්ට ඕනෑ, තමන්ගේ අවශ්‍යතාව ඉටු කර ගන්නයි.

ඊයේ උගුර ලේ රහ වෙන කල් කෑ ගැහුවා, "හාල් පිටි ගෙන්වනවා" කියලා. අපි කියනවා, ඔව්, හාල් පිටි ගෙනැල්ලා අපේ රටේ ජනතාවට කන්න දෙනවා කියලා. හර්ෂ ද සිල්වා මහත්තයාලා පිටි කන්නේ නැහැ. එතුමා කොළඹ ලොකුවට ඉන්න කෙනෙක්; ජාතික ලැයිස්තුවෙන් පත් වුණ මන්ත්‍රී කෙනෙක්; ජනතාව ගැන දන්නේ නැහැ. අපේ ජනාධිපතිතුමා එහෙම නොවෙයි. හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමන්ලාගේ නායකයා වාගේ නොවෙයි. ගමේ වෙලේ යන්න පුළුවන් නායකයෙක්. එතුමා ජනතාව බඩගින්නේ තියන්නේ නැහැ. හැබැයි එතුමා එක දෙයක් කළා. හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාටත් එය නැහැයි කියන්න බැහැ. මේ රට සහලින් ස්වයංපෝෂිත කළ එකම නායකයා තමයි මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා. ඒක නැහැයි කියලා කාටවත් කියන්න බැහැ. [බාධා කිරීම්] තමුන්නාන්සේලා බෙරිහන් දෙනවා. ඒක නැහැයි කියලා කාටවත් කියන්න බැහැ. අද සහල් ඇටයක්වත් පිට රටින් ගෙන්වන්නේ නැහැ.

අද එනකොට මරදානේදී මම බැලුවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අල කිලෝවක් රුපියල් තිහයි; පොල් ගෙඩියක් රුපියල් හතළිහයි. හාල් කිලෝවක් රුපියල් හතළිහට ඉහළ මිලකට ගන්න පුළුවන්. මේ රටේ ආර්ථිකය හොඳ නැහැයි කියලා තමුන්නාන්සේලා ඔළුවෙන් හිට ගෙන කෑ ගැහුවත් අද මේ රටට සංචාරකයෝ දස ලක්ෂයකට වැඩිය ඇවිල්ලා තිබෙනවා. සංචාරකයෝ එන්නේ නිකම්ද, empty pocket ද? නැහැ. සංචාරකයෝ එන්නේ සල්ලි අරන්. ඉතින් හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කෑ ගහනවා, කොටස් වෙළෙඳ පොළ අඩු වෙලාලු. අපේ කොටස් වෙළෙඳ පොළ මේ කලාපයේ හොඳම කොටස් වෙළෙඳ පොළ බවට පත් වුණා. යම් යම් අඩු පාඩුකම් තිබෙනවා. මේ අඩු පාඩුකම් සකස් කර ගෙන තමයි අපි ඉදිරියට යන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ රටේ ලොකු සංවර්ධනයක් තිබෙනවා. මේ සංවර්ධනය නැහැයි කියලා කියන්න කාටවත් බැහැ. ඒ නිසා විරුද්ධ පාර්ශ්වය කෑ ගැහුවාට වැඩක් නැහැ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
නියෝජ්‍ය අමාත්‍යතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
තව එක කාරණයක් කියලා මම කථාව නවත්වනවා.

හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා අහ ගන්න. විශේෂයෙන්ම උතුරු මාර්ග පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය ගැන අපි බොහොම සතුටු වනවා. මහනුවර - යාපනය මාර්ගයේ ගල්කුලම සිට කිලෝමීටර් 230 කණුව දක්වා දිග කිලෝමීටර් 63ක් හදන්න ආරම්භ කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ වාගේම මහනුවර-යාපනය-ජේදුරුතුඩුව මාර්ගය, මුලතිව්-කෝකිලායි-පුල්මුඩේ මාර්ගය, ඔඩ්ඩුසුඩාන්-නැදුන්කර්නි-මුලතිව් මාර්ගය, නාවක්කුලි-මන්නාරම් මාර්ගය අපි හදනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ පාරවල් හදද්දී TNA කණ්ඩායමේ අපේ මන්ත්‍රීවරු කෑ ගහනවා, Thirteen Plus ගැන කියමින්. ජනතාවට අද ඕනෑ Thirteen Plus නොවෙයි, තමන්ගේ වැඩ කර ගන්න පුළුවන්, තම අවශ්‍යතා ඉටු වන පරිපාලනයක්. ඒ අවශ්‍ය පරිපාලනය අපි දැන් ලබා දීලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එදා කවුරුත් උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ ජනාධිපති කොමිෂන් සභාව ගණන් ගත්තේ නැහැ. නමුත් එහි වාර්තාව ආවා විතරයි, ඔළුවෙන් හිට ගෙන කියනවා, ඒ තිබෙන දේවල් ක්‍රියාත්මක කරපන් කියලා. ඇමෙරිකාවටත් ගිහිල්ලා කියනවා, ඒ වාර්තාවේ තිබෙන දේවල් ක්‍රියාත්මක කරන්න කියලා මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාට බල කරපන් කියලා. මෙතුමන්ලා ඇමෙරිකාවට ගිහිල්ලා කොච්චර ඇඬුවත් අපි කියනවා, අපේ නායකතුමාගේ කල දසාව හොඳයි කියලා. අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුව යටතේ, එතුමාගේ නායකත්වය යටතේ, එතුමාගේ රජය යටතේ, මේ එක්සත් ජනතා නිදහස් සන්ධාන රජය යටතේ අපි ඉදිරියේදී තව තවත් අධිවේගී මාර්ග හදනවා. අපි අපේ ගරු මහාමාර්ග නියෝජ්‍ය ඇමතිතුමා අපේ ගමේ පාරවල් ටික හදා ගන්න, ඒවාට කාපට් දමන්න සල්ලි දුන්නා. අපි ඒ ගැන එතුමාට ස්තුතිවන්ත වෙනවා. කැට ව්‍යාපෘතිය යටතේ අපි අද ගමේ පාරවල් හදා ගෙන යනවා. අපි එතුමාගෙන් තවත් ඉල්ලීමක් කරනවා. එන අවුරුද්දේත් වැඩි වැඩියෙන් අපට මුදල් දෙන්න කියලා අපි ගරු

මහාමාර්ග නියෝජ්‍ය ඇමතිතුමාට කියනවා. කළුතර පැත්තට විතරක් නොවෙයි, අපේ සබරගමුව පැත්තටත් මුදල් දෙන්න කියමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

[5.52 p.m.]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

*Bismillahir Rahmanir Raheem.*

Madam Chairperson, I think President Mahinda Rajapaksa's regime will go down in history as an era of great revival and renaissance. It is a revival of the country after it was completely destroyed; a renaissance after the great and mega development schemes were initiated through the "Mahinda Chintana" by the President himself. It is very much evident to anybody who travels around the country.

In this whole process of development, the most striking feature is the building of roads. We have heard about the Thomas Skinner, a prominent Road Engineer, Sir Henry McCallum, a British Governor, Captain Dawson, in whose memory, a pillar has been erected at the Kadugannawa hill. They were great men. We have also heard about the road builders in Rome.

Now, Sri Lanka, in the 21st Century, has shown what road building is to the world at large. From the time of Independence or going beyond that, for centuries, there was no development in road building. Now, if you go to any part of the country, you can see the development of roads.

My Friend, the Hon. Hunais Farook spoke about Mannar, which was completely destroyed through human brutality - through the killing of human beings by the LTTE and through natural calamities. Now, there are beautiful roads being built all over there. The Southern Expressway is very much known to the whole world. Earlier it took about three to four hours to to reach Galle from Colombo. Now, we can go there within one hour and come back at the same speed.

What has happened to the Opposition, particularly to the UNPers? I ask. They say, "None is so blind as those who refuse to see". These people, not that they cannot see, they refuse to see, . In this instance, they are blind too. From morning, the speakers who spoke from the Opposition, from the UNP benches, did not discuss the Regulations under the National Thoroughfares Act. They were talking, if I may put it in Sinhala, w*alpal*. "*Koheda yanne? Malle pol*" - "Where are you going? Coconuts in my bag." That is the blindness with which they suffer.

It is no surprise, Madam Chairperson, you, coming from the woods of Ampara, dedicated to social life, working for the toiling masses could understand what development is. Those days, we could not go from Colombo through Padiyatalawa, Maha-Oya or other places to the Eastern Province through dilapidated roads. Today, we can motor through a chain of beautifully carpetted roads covering thousands of square miles, from Mahiyanganaya to Akkaraipattu, to Kalmunai, to Pottuvil. If you go from Polonnaruwa to Welikanda and then reach Oddamavadi, you can see there a beautiful bridge built through the efforts of Mr. M.S.S. Ameer Ali, former Minister of Disaster Relief Services, with aid received from *spanchy* - Spain.

This is the way the Government has revived the country. This is renaissance. A new history is being born. You should be proud, Madam, that you belong to the regime of President Mahinda Rajapaksa, who has ushered this revival and renaissance. You also know how your past leader, Mr. Philip Gunawardena, a great socialist leader - and a man of the soil, gave a new lease of life to the toiling masses of Ampara, Hambantota and other areas.

These are the leaders who helped build Sri Lanka together with late Hon. D.A. Rajapaksa, the father of the illustrious sons, who are in the helm of affairs in this country today, democratically elected by the people, of course.

Look at the Hon. Nirmala Kotalawala. නිර්මල චරිතයක් ඇති කොතලාවල කෙනෙක් මොන තරම් දක්ෂව, ලස්සනට වැඩ කරනවාද? අර බලන්න, මෙසේ පවසන විට අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා අර පැත්තේ ඉඳන් අත් පොළසන් ගහනවා. එතුමාත් කලුතර දිස්ත්‍රික්කයේනේ? ඒකත් "සත්‍යය දත්තෝ ජය වේවා" කියලා මම එතුමාට කියනවා.

Now, what is happening in the Northern Province today? The "Thinakaran" - Yaal edition - reports :

"ஹாட்லி கல்லூரியின் உள்ளக வீதி நாமல் எம்.பியால் திறந்து வைப்பு"

A distinguished Speaker of our Parliament, the late Hon. K.B. Ratnayake, studied at this College. ஹாட்லி கல்லூரியின் உள்ளக வீதி திறந்துவைக்கப்பட்டுள்ளது. ஆனால், இவர்களு டைய மனம்தான் திறப்பதில்லை.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

තව මිනිත්තු දෙකක් තිබෙනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. අන්තිමට මම මෙහෙම කියලා කථාව අවසන් කරන්නම්. A friend of mine, *Badr-ul-Millath* S.M.A. Jabbar has written a book about the Holy Prophet called "இறைதூதர் முஹம்மத்" and it will be released at a function at Zahira College, Maradana, tomorrow. Our Hon. Prime Minister will grace the occasion as the Chief Guest. Jabbar

[ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා]

is in Sri Lanka now and has come back after several years abroad. He exclaimed in sheer excitement: "Have I come to Sri Lanka or to Heaven?" That is the first impression of the new Sri Lanka of Abdul Jabbar, my classmate.

The "Daily News" of 8th February, 2012 states, I quote:

"Communities must cooperate with President"

It is a lovely piece of article penned by Atapattu Bandara of the "Daily News". In that article, Dr. Subramaniyam Swami has been quoted as follows:

"Nobody can divide Sri Lanka in two and resolve the ethnic crisis. The minority communities should place their trust in President Mahinda Rajapaksa and cooperate with him in finding a solution. No other country can solve Sri Lanka's internal problem"

Who has said this? It was said by none other than Dr. Subramaniyam Swami, Leader of the "Janatha Party" when he arrived in Sri Lanka on a private visit. He went on a pilgrimage to Kataragama on Monday and later met media personnel. கேளுங்கள்! காது இருந்தால் கேளுங்கள், கண் இருந்தால் திறந்து பாருங்கள்!

He has made a very important speech. He comes from Tamil Nadu, and sees the light of day, the light of the new era and the renaissance brought about. I only request you not go to the diaspora. The Hon. Sampanthan has been behind the door speaking to some people who have come here. They wanted to influence the outsiders before the Geneva Conference. But, I say, they will fail utterly, I know that. Therefore, if you want to live in this country peacefully, together with the Sinhalese and the Muslims, I call upon the Tamil leaders to cooperate with the Government as Dr. Subramaniyam Swami says. By doing this only, you can ensure a peaceful and better living for your people. I am addressing the empty benches of the TNA. They are not even here to listen.

Thank you.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

## ශ්‍රී ලංකා රජය සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල අතර වූ සමීපස්ථ ණය ගිවිසුම
## இலங்கை அரசாங்கத்துக்கும் சர்வதேச நாணய நிதியத்துக்குமிடையிலான துணைநில் கடன்வசதி உடன்படிக்கை
STANDBY AGREEMENT BETWEEN GOVERNMENT OF SRI LANKA AND INTERNATIONAL MONETARY FUND

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද දින සභාව කල් තබන අවස්ථාවේදී මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ශ්‍රී ලංකා රජය ආර්ථික සහ මූල්‍ය ප්‍රතිපත්ති සංදේශයක් මත පදනම් වෙමින් රුපියල් බිලියන 1.65ක විශේෂ ගැනුම් හිමිකම් සමීපස්ථ ණය ගිවිසුමක් ඉල්ලුම් කළ අතර, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ ශ්‍රී ලංකා රජය 2009 වර්ෂයේ මැද භාගයේදී එකඟ වන ලද "ආර්ථික ප්‍රතිසංස්කරණ වැඩසටහන"ට සහාය වීම පිණිස ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් එය අනුමත කරන ලදී. 2010 වර්ෂයේ අග භාගය පමණ වන තෙක් ශ්‍රී ලංකා රජය මෙම ණය කොන්දේසිවලට අනුකූලව කටයුතු කළ නමුත් එම වර්ෂයේ අවසානය වන විට, එක්සත් ජාතික පක්ෂය සිදු වෙතැයි පෙන්වා දුන් පරිද්දෙන්ම රජය ඉලක්ක හා කොන්දේසි සපුරාලීමට අසමත් වීම ඇරඹුණි. 2011 වර්ෂයේදී තත්ත්වය වඩාත් නරක අතට හැරුණු අතර, එහි ප්‍රතිඵලය වූයේ 2011 අප්‍රේල් පමණ වන විට සමීපස්ථ ණය ගිවිසුම ක්‍රියාත්මක කිරීම අත් හිටුවීමයි. ඉන් අනතුරුව මුදලේ තිරසාර නොවන ආරක්ෂාව සම්බන්ධයෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල දැඩි ලෙස සිය අප්‍රසාදය ප්‍රකාශ කිරීම සිදු විය. මෙම කරුණු කෙසේ සිදු වුවත්, මහ බැංකුව ශ්‍රී ලංකා රුපියල කෘත්‍රිම ලෙස ආරක්ෂා කිරීමේ කාර්යයයේ දිගින් දිගටම නිරත වූ අතර, එම ක්‍රියාවලියේදී එක්සත් ජනපද ඩොලර් බිලියන 8.0ක ඉහළ අගයක සිට 2011 අවසාන වන විට එක්සත් ජනපද ඩොලර් බිලියන 5.9 තෙක් බාහිර සංචිතවලින් සියයට 15ක් අහිමි කර ගන්නා අතර ගෙවුම් ශේෂ අර්බුදයක් නිර්මාණය කළේය.

රජය ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ වූ සමීපස්ථ ණය ගිවිසුම අත හැර දමා තිබේද සහ එසේ නම් ගෙවුම් ශේෂ අර්බුදය සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා යොදා ගැනීමට අපේක්ෂිත විකල්ප කවරේද යන්න සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව දැනුවත් කළ යුතු යැයි මෙම ගරු සභාව යෝජනා කර සිටී."

මේකේ typo එකක් තිබෙනවා. ඒක සියයට 25ක් කියලායි මම සඳහන් කර තිබුණේ. නමුත්, ඒක සියයට 15ක් කියලා තමයි මේකේ සඳහන් වෙලා තිබෙන්නේ. අනෙක් එක in the English one, I have said, "suspended for all practical purposes". ඒක සිංහල translation එකේදී නිවැරදිව සඳහන් වෙලා නැහැ. "Suspended for all practical purposes" කියන තැනට අදාළ සිංහල translation එකක් හරියට නැතුවා වෙන්න පුළුවන්.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

සිංහලෙන් ලියලා දෙන්න බැරි මොකෝ?

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

අයියෝ! වාඩි වෙන්න කෝ.

In fact, we really do not need to have this Debate today. I submitted this yesterday and I do not know whether my Adjournment Motion was leaked to Mr. Ajith Nivard Cabraal. By 10 o'clock this morning, the answer to my question was quite obvious. What I am saying, Madam Presiding Member, is that the Central Bank has finally decided to let go off the hold on the rupee. As of this afternoon, the rupee had fallen to

something like 115.30 or 115.40. Unfortunately, this process was delayed. Anybody who has read a book on Economics would understand that there are certain economic theories. No person can say, " I do not care about the theories". Some people say, "Harsha is a bookworm and he only talks about what is in the book". As a matter of fact, that is not the case. I know what is in the book and I also know in practice how to manage institutions and companies. I was responsible for the entire treasury of one of the large banks in the private sector when I came back after my PhD. I was the Chief Economist of a very large bank. So, I know how these things work and it is not only what is in the book. Subsequently, I founded a company and managed on my own.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
That was bankrupt.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
He says that the bank was bankrupt but subsequently, maybe about a year after my joining, that bank won the "Best Managed Company" Award in Sri Lanka. I will tell you which bank. It was the DFCC Bank. Mr. M.R. Prelis, who was my boss, went and collected the Award for the "Best Managed Company". What I am trying to say is, people must not think that they can erase what is in the theory books. You cannot. It is not possible. You may try but you just cannot because the theory of demand and supply is the ultimate basic fundamental law in Economics. What happened was, the Government was attempting to manage the value of the currency artificially for political purposes. I will **table*** the Letter of Intent written to Mr. Dominique Strauss-Kahn, Managing Director of the IMF, signed by the Hon. Ranjith Siyambalapitiya, Deputy Minister of Finance and Planning at that time and also by Mr. Ajith Nivard Cabraal, Governor of the Central Bank.

In that, they request the Board of the IMF for a Stand-By Arrangement of 400 per cent of our quota to the value of 1.6 billion of SDR**.** Approximately, it is US Dollars 2.6 billion. The Hon. (Dr.) Sarath Amunugama knows very well that before this letter was written requesting for this amount, certain conditions had to be met.

However much we tried to explain in this House that the Government in fact increases taxes as a part of meeting these conditions, the Government denied it. But, let us be truthful. I have the document here with me. It says, “actions already taken by the Government”. That is, actions taken prior to requesting the loan from the IMF.

The second point is, “Amendments to the Nation Building Tax to raise the rate from 1 to 3 per cent”. That was done. It is okay for political reasons but the Ministers in this House denied it. That was done because there was a problem on the fiscal side. We were running large budget deficits and the revenues were not sufficient to meet the expenditures. In the conditions that were laid upon the Government, which were agreed by the Hon. Ranjith Siyambalapitiya and Mr. Ajith Nivard Cabraal, it is said, I quote:

> “In particular, the program -which is expected to run through 2011 - envisages (i) fiscal adjustment sufficient to reduce the central Government budget deficit to 5 per cent of GDP by 2011.”

So, this was clearly one condition that the Government of Sri Lanka and the IMF agreed upon. I am not going to stand here and say that this is a bad thing. I have to be truthful. But, sustenance of a large budget deficit is going to impact upon the future generations because this has to be financed in some way. You have to borrow or print money to do this. So, you had to do it.

The second condition in that was, I quote:

> " (ii) continued flexibility in the exchange rate.”

That means the Government had to follow the Supply and Demand principle and let the market determine the value of our currency. What is important is, the Memorandum has what is called, a set of Quantitative Performance Criteria. Technically, it is the Net International Reserves of the Central Bank of Sri Lanka. We talk about this Net International Reserves of the Central Bank of Sri Lanka. Mr. Cabraal and the rest of the officials, and of course, His Excellency the President and all the Ministers of the Government have been saying,“Look, our external reserves have been climbing.” They also say, “Look, never before have we had so much reserves”. True and that is because we borrowed a lot of money. If you really analyse what those reserves are, you will realize that there is a large amount of dollars that have been borrowed to build these reserves. So, when the quantitative conditions were laid down, why they said "Net International Reserves" was because the IMF was not willing to agree with the Government’s request at the time to borrow these reserves and then use that amount as the amount of reserves available. "Net" meant that you could not count the borrowed amount in reserves.

Like I said in the Motion, what happened was, at the beginning of the programme, the Government was able to meet the quantitative conditions and then the IMF released tranches: on the 24th of July, 2009, 6th of November, 2009, 28th of June, 2010, 24th of September, 2010, 2nd of February, 2011 and 4th of April, 2011. That was the last time they disbursed any money. Now, the reason for that is, the Government was not able to meet the conditions that they had agreed upon. That is the fact.

---

***** *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා]

On the 7th of September, 2011, the IMF issued a press release - Press Release No. 11/325 dated 7th September, 2011. What it states is this. I quote:

" The uncertain global environment underscores the importance of continuing to build foreign exchange reserves. While headline reserves are at a comfortable level, buoyed by the Central Bank's purchase of the proceeds from the recent 10-year Eurobond,…' "

What does that mean, "purchase of a 10-year Eurobond"? Sometimes people do not understand these technicalities. A 10-year Eurobond is nothing but the billion dollar sovereign bond which we floated, which we borrowed at 6.25 per cent. So, it is a very high rate of interest. Again I quote:

" '……nonborrowed reserves-…..' "

They go on to explain -

" '……that is, excluding Eurobonds, IMF disbursements, and foreign holdings of Treasuries - have steadily declined, reflecting foreign exchange sales by the Central Bank. This policy does not seem to be in line with the current fundamentals of the economy.

In responding to market pressures, the Central Bank should henceforth…' "

This is important -

" 'In responding to market pressures, the Central Bank should henceforth limit its intervention and allow more exchange rate flexibility.' "

When was this issued? This was issued on the 7th of September, 2011 - when the Budget was being designed. Obviously His Excellency the President and people working with him in preparing the Budget understood the problem. That is why, I think in November, when the Budget was presented in this House, the President devalued the currency by 3 per cent. However, when that happened, the Governor of the Central Bank said, I remember this very clearly, "This is one of the devaluations. It will not happen again". How can he say like that? If it cannot happen again, that means he has to do something to ensure that it does not happen again. How do you hold the value of the currency? Let us suppose we are talking about coconuts.

පොල් ගෙඩියක මිල වෙළෙඳ පොළේ ඉහළ යන්න හේතුව ඒ පොල් ගෙඩියට තිබෙන ඉල්ලුම වැඩි වීමයි. මිනිසුන්ට පොල් ඕනෑ. නමුත් පොල් නැහැ. එහෙම නම් පොල් ගෙඩියේ මිල රුපියල් 35 ඉඳන් 40ට, 40 ඉඳන් 45ට, 50ට වැඩි වෙනවා. ඒක අපට වුණා. ජොන්ස්ටන් ඇමතිතුමා එතකොට මොකද කළේ? ඉන්දියාවෙන් පොල් ගෙඩි ගේනවාය කිව්වා. ඉන්දියාවෙන් පොල් ගෙඩි ගෙනැල්ලා වෙළෙඳ පොළට පොල් ගෙඩි දැම්මා.

වෙළෙඳ පොළට පොල් ගෙඩි දැම්මාම ඒ සැපයුම වැඩි වෙච්ච නිසා පොල් ගෙඩියේ මිල නැවතත් රුපියල් 35ට බැස්සා. දැන් රුපියලත් ඒ වාගෙයි. රුපියලට තිබෙන ඉල්ලුම වැඩි වෙන්නේ ඇයි? ඒක වැඩි වෙන්න හේතුව අපි ඊයෙත් දීර්ඝ ලෙස සාකච්ඡා කළා. වෙළෙඳ ශේෂයේ මහා විශාල පරතරයක් තිබෙනවා. ඇමෙරිකන් ඩොලර් බිලියන 8ක පරතරයක් තිබෙනවා. ඒ නිසා ඩොලරයට තිබෙන ඉල්ලුම වැඩි වුණා. ඩොලරයට තිබෙන ඉල්ලුම වැඩි වෙන කොට රුපියලට මොකද වෙන්නේ? රුපියලේ අගය අවප්‍රමාණය වෙනවා. ඒ කියන්නේ අද ඩොලරය 110ට තිබෙනවා. නමුත් ඩොලරයේ ඉල්ලුම වැඩි වෙන නිසා මේක 112ට,113ට,114ට යන්න පුළුවන්. එහෙම නම් අපේ ජොන්ස්ටන් ඇමතිතුමා කළා වාගේ වෙන රටකින් පොල් ගෙඩි ගෙනැල්ලා වෙළෙඳ පොළට දාලා ඒ පොල් ගෙඩියේ මිල පල්ලෙහාට දාන්න පුළුවන් වාගේ ක්‍රමයක් ඩොලරයටත් තිබෙනවාද? ඔව්, ක්‍රමයක් තිබෙනවා. ඒ ක්‍රමය තමයි සංචිත මුදා හැරීම. දැන් වුණේ මොකක්ද? සංචිත කන්දක් වාගේ ගොඩ ගැහුවා. හැබැයි මේක හොඳට කල්පනා කරලා මතක තියා ගන්න ඕනෑ. අපි උපයපු සංචිතවලට වඩා එතැන තිබුණේ ණයට ගත්ත සංචිතයි. මේ ණයට ගත්තු සංචිත පොල්ගෙඩි මුදා හරිනවා වාගේ වෙළෙඳ පොළට මුදා හැරියා. එතකොට මොකද වුණේ? රුපියලේ මිල ඒ ආකාරයට පාලනය කර ගන්න හැකි වුණා.

So, by doing this activity what happened was, the amount of reserves we had, something like US Dollars 8 billion, finally dropped to about US Dollars 5.5 billion. That means, we sold about US Dollars 2.5 billion worth of our reserves in this exercise to defend the currency at what I call "an arbitrary level". Of course, we knew that the rupee was overvalued. Of course, it was written about. If you had looked at the Real Effective Exchange Rate, which is calculated by the economists of the Central Bank, anybody would have realized that the rupee was overvalued. If you had looked at the export growth, you would have realized that the rupee was overvalued. If you had looked at the import growth, you would have seen that the rupee was overvalued. That is why politicians, who may not necessarily understand the technicalities - and I am not expecting them to understand - always said, "Things are being dumped here; Cheap imports are coming." It is not that imports are cheap. It is just that our currency was severely overvalued. Now, what has happened? We have lost all the money that was borrowed from the IMF. By that time we had borrowed roughly US Dollars 1.7 billion from the IMF. But, we sold about US Dollars 2.5 billion of our reserves. That included the money borrowed from the IMF and a part of other borrowings.

The next point is what I want you to understand because that is really what caused this crisis.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, දැන් අපට අවශ්‍ය වනවා, එක අතකින් රුපියලේ අගය අධි ප්‍රමාණ කරලා සීමාවක තියාගෙන ඉන්න. ඒක ආණ්ඩුවේ දේශපාලන වුවමනාවක් කියලා අපි කියමු. ඒක පැත්තකින් තියමු. අපි වෙළෙඳ පොළට ඩොලර් මුදාහරිනකොට වෙළෙඳ පොළේ තිබෙන රුපියල්වලට මොකද වෙන්නේ? සමහර කට්ටිය මේ ප්‍රශ්නය තේරුම් ගන්නේ නැහැ. අපි පොල් ගෙඩි මිල දී ගන්නේ මොනවායින්ද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි? අපි පොල් ගෙඩි මිල දී ගන්නේ රුපියල්වලින්. පොල් ගෙඩියක මිල අපි ඉදිරිපත් කරන්නේ රුපියල්වලින්. රුපියල් තිස් පහයි. ඒ වාගේම තමයි ඩොලරයේ මිල අපි රුපියල්වලින් තමයි විදහා දක්වන්නේ. එතකොට අපි ඩොලර් ගන්න මොනවාද දෙන්නේ? පොල් ගෙඩි ගන්න රුපියල් දෙනවා වාගේ ඩොලර් ගන්නත් දෙන්න ඕනෑ රුපියල්. එතකොට වෙළෙඳ පොළේ තිබෙන රුපියල් ප්‍රමාණය අඩු වනවා, අපි වෙළෙඳ පොළට ඩොලර් මුදා හරිනකොට. ඒක තමයි මෙතැන තිබෙන සමහරවිට දේශපාලනඥයෝ තේරුම් නොගත් ප්‍රශ්නය. එතකොට

වෙළෙඳ පොළේ තිබෙන රුපියල් ප්‍රමාණය අඩු වනකොට අපි දන්නවා ඒකේ මිල ඉහළ යනවා.

රුපියල්වල මිල අපි කොහොමද අපි තීරණය කරන්නේ? අපි රුපියල් ගන්නේ මොනවා දීලාද? රුපියලේ මිල කොහොමද අපි කියන්නේ? එක්කෝ ඩොලර්වලින් කියන්න පුළුවන්, එහෙමත් නැත්නම් අපි කියන්නේ පොලී අනුපාතය. පොලී අනුපාතය ඉහළ යනකොට ආයෝජකයන් කියනවා, "අපෝ දැන් හරි ගණන්, ආයෝජනය කරන්න අපහසුයි" කියලා. ඉතින් බැසිල් රාජපක්ෂ ඇමතිවරයා ඇතුළු අනෙකුත් රට සංවර්ධනය සඳහා කැප වෙලා සිටින ඇමතිවරුන්ට අවශ්‍යයි, පොලී අනුපාතය පහළ මට්ටමක තියා ගන්න. පොලී අනුපාතය පහළ මට්ටමක තියා ගන්න පුළුවන් වුණොත් තමයි ආයෝජනය වැඩි වන්නේ. ඒ නිසා ආණ්ඩුව බල කරනවා, කරුණාකරලා මේ පොලී අනුපාතය ඉහළ දමන්න එපා, හැකිතාක් දුරට උත්සාහ කරන්න, පොලී අනුපාතය පහළ තබා ගන්න කියලා. එතකොට මෙතැන ලොකු පරස්පරයක් තිබෙනවා. මොකද, අපි වෙළෙඳ පොළෙන් රුපියල් එළියට ගන්නකොට පොලී අනුපාතය ඉහළ යනවා. එහෙම නම් මොකක්ද කරන්න වෙන්නේ, පොලී අනුපාතය පහළට ගෙනෙන එකයි. කරන්න පුළුවන් එකම දෙයයි. අර පොල් ගෙඩි කථාවම තමයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

අපට තව පුළුවන් නම් රුපියල් මේ වෙළෙඳ පොළට දමන්න, අපිට පුළුවන් පොලී අනුපාතය පහළට ගෙනෙන්න. ඉතින් ඒක තමයි මහ බැංකුව කළේ. රුපියල් අච්චු ගැහුවා.

දැන් අද තිබෙන දත්තවලට අනුව අපි දන්නවා, 2011 සැප්තැම්බර් මාසයේ ඉඳලා අද වනකොට රුපියල් බිලියන 205.3ක් අච්චු ගහලා තිබෙන බව. රුපියල් බිලියන 205.3ක් අච්චු ගහලා තිබෙනවා. ඒ අච්චු ගහලා තිබෙන්නේ අර වෙළෙඳ පොළෙන් ඉවත් වන රුපියල් නැවත වෙළෙඳ පොළට දැමීම සඳහා පොලී අනුපාතය පහළ මට්ටමක තබා ගන්නයි. සමහරවිට සමහරුන් කල්පනා කරනවා ඇති, මේ රුපියල් අච්චු ගහනවා කියලා කියන්නේ, මේ මුදල් නෝට්ටු අච්චු ගහලා බෙදන එක කියලා. එහෙම නොවෙයි. මේක පොඩ්ඩක් සංකීර්ණයි. නමුත් මා ඉතාමත්ම කෙටියෙන් පැහැදිලි කරන්නම්. ඒ කියන්නේ මහ බැංකුව භාණ්ඩාගාර බිල්පත් මිලදී ගන්න එකට තමයි අපි කියන්නේ මුදල් අච්චු ගහනවා යි කියලා. නැතිව මේ රුපියල් අච්චු ගහලා බෙදන එක නොවෙයි. එතකොට මොකක්ද වෙන්නේ? එතකොට අපි දන්නවා අඩු පොලී අනුපාතයක් තිබෙනවා. අධි ප්‍රමාණ වෙච්ච රුපියලක් තිබෙනවා. එතකොට ජනතාව වැඩි වැඩියෙන් පෙළඹෙනවා, ණය ගන්න. ණය ගන්න ප්‍රමාණය එන්න එන්න, එන්න එන්න වැඩි වනවා. ඒක නේ ගිය සතියේ කිව්වේ. අපේ පෞද්ගලික අංශය ණය ගන්න ප්‍රමාණය සියයට 35කින් වැඩි වෙලා තිබෙනවා.

So, what happens is, when the credit growth is beyond acceptable levels, that reflects in greater import demand. You think about it. When the credit is easy, the interest rates are low and the currency is overvalued, what happens is, you create further and further import demand. This is a vicious cycle. So, you borrow at cheap rates and our consumption basket is fairly import-heavy. දැන් අපි ගත්තොත්, පිට රටින් ගෙන්වන ගොඩාක් භාණ්ඩ තිබෙනවා. So, that is what happened. That, Hon. (Dr.) Sarath Amunugama, is the problem. Sometimes, people are unable to appreciate the holistic problem. People look at the exchange rate; people look at the money markets, but you have to be able to put both together to understand the problem. That is why the day before yesterday when a person from a newspaper company called and asked me, I said, "Very good, Mr. Cabraal has done what needs to be done. He has understood the problem. Let us wait and see". The editor of that newspaper called me in the evening when I was leaving Parliament and asked me, "Harsha, did Nivard send you a bouquet?" I said, "No, he did not send me a bouquet but I got brickbats from my boss". Then, he said, "You must remember that you are also a politician". So, I had to explain to him, "I agree I am a politician, I am an economist, but I have to be truthful and that is what I have always been doing. When something is good, I must say it is good and that is what I did".

Finally, the realization has come about the Central Bank unfortunately very late in the day that you cannot do what they attempted to do. So, now what has happened? Today, they have said, "We are removing the ban on the rupee" and they have taken out the ban and the rupee went up to 115.90 and settled at 115.30 - 115.40 levels. Also, I was wondering why is that? Will it go to 116? Will it go to 117 or 118? Where will it stop? I do not have the answer. The answer is out there in the market. All I know is that Mr. Cabraal cannot say that it will be at this point. I want to remind this House, I have said it before and I have told His Excellency the President at Consultative Committees, "Sir, you cannot do this". People sometimes laughed at me saying, "What nonsense is Harsha talking" You tell me today whether I have been talking nonsense for the last four months or not. I have told repeatedly, "this is a futile exercise, you cannot do it". Today, the people who ridiculed me would have to eat their own words. I do not want to say I said so. That is okay. This is our country and at the end of the day, our people are going to suffer. Now, what is going to happen is that the exchange rate has depreciated, interest rates have gone up and the prices of all goods and services will rise.

One last thing I would like to say, before I let my Colleague second this Motion is very important and that is, people have said that what I had said before is not true. But, the fact is that according to the conditions agreed upon - I will read you one sentence : "Specifically, the aim is to ensure that the Ceylon Electricity Board (CEB) and the Ceylon Petroleum Corporation (CPC) break even by end-2011."

Unfortunately, the problem has even got worse than what it was before and I am telling you today, Hon. Chairperson, that within the next two weeks, the Government will have no choice, but to increase the price of fuel because otherwise you cannot control the emerging complexities if you look at the global environment. So, I do not want to take pleasure when things are sour. But, I want to tell you that next time around, please listen to us also because we make constructive criticism. If you had listened to us, - not now because now we have to say, "we have told you, Sir" - this problem would not have been this bad.

Thank you very much.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
යෝජනාව ස්ථිර කිරීම, ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, පසු ගිය වසරකට ආසන්න කාලය තිස්සේ අපේ හිතවත් මන්ත්‍රී ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මැතිතුමා මේ සභාවේ මේ තර්ක මේ විධියටම ඉදිරිපත් කරන කොට අපට ලැබුණු ප්‍රතිචාර ගොඩාක් වෙනස්. මේ පාර්ලිමේන්තුවට තමයි මූල්‍ය පාලනය පිළිබඳව ප්‍රධාන වගකීම තිබෙන්නේ. මේ පාර්ලිමේන්තුවට තමයි මේ රටේ ජනතාවගේ මූල්‍ය පාලනය පිළිබඳ වගකීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පවරා තිබෙන්නේ. මේ පාර්ලිමේන්තුවේ ඉන්න ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට වාගේම විපක්ෂයේ මන්ත්‍රීවරුන්ටත් මූල්‍ය පාලනය පිළිබඳ කාරණයේදී තමන්ගේ අදහස් ප්‍රකාශ කරන්න, තමන්ගේ දැනුම අනුව කරුණු කියන්න අයිතියක් තිබෙනවා; යුතුකමක් තිබෙනවා. හැබැයි, මේ ආණ්ඩුව එක්සත් ජාතික පක්ෂයේ ආර්ථික ප්‍රතිපත්ති ඒ විධියටම අනුගමනය කරන ආණ්ඩුවක් වෙලාත් එක්සත් ජාතික පක්ෂයේ ආර්ථික විශේෂඥයන් මේ රටේ තිබෙන ආර්ථිකය ගැන වැදගත්, තර්කානුකූල අදහස් ප්‍රකාශ කරන කොට ඒවා හරි බව තේරුම් ගන්න මෙතරම් කාලයක් ගත වීම නිසා සියයට 25කට ආසන්න ජාතික ධනයක් අපට අහිමි වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අජිත් නිවාඩ් කබ්රාල් මැතිතුමා පසු ගිය විසර්ජන පනත් කෙටුම්පත පිළිබඳව කථා කරමින් කියපු කාරණය තමයි, "ඔව්, එක සැරයයි. සියයට තුනයි. මම නම් හරියටම මේක දන්නේත් නැහැ. ජනාධිපතිතුමා කියපු නිසා පිළිගන්නවා. හැබැයි, එච්චරයි." කියන එක. නමුත් අද, පාලනය සියයට සියයක් අත හැර දමනවා. එහෙම නම් මෙච්චර කාලයක් දැන දැනම ආර්ථික මූල ධර්මවලට පටහැනිව වැරදි ප්‍රතිපත්තියක් අර ගෙන ගිය අජිත් නිවාඩ් කබ්රාල් මැතිතුමාට එතුමාගේ තනතුරේ ඉන්න සදාචාරාත්මක අයිතියක් තිබෙනවාද කියලා මම අහන්න කැමැතියි. වෙනත් වැදගත් රටක නම්, වැදගත් වෘත්තිකයකු නම් ඒ තනතුරෙන් ඉල්ලා අස් වෙන්න ඕනෑ. ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මීළඟට ගරු සරත් අමුණුගම අමාත්‍යතුමා. ගරු අමාත්‍යතුමනි, ඔබතුමාට විනාඩි 20ක කාලයක් තිබෙනවා.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා (ජාත්‍යන්තර මූල්‍ය සහයෝගීතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம - சர்வதேச நிதிய கூட்டிணைப்பு அமைச்சர்)
(The Hon. (Dr.) Sarath Amunugama - Minister of International Monetary Co-operation )
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද අප ඉතාම වැදගත් ශාස්ත්‍රීය මෙන්ම දේශපාලන විවාදයකට සම්බන්ධ වෙලා ඉන්නවා.

මගේ මිත්‍ර හර්ෂ ද සිල්වා මැතිතුමා කිව්ව පරිදි වර්තමාන තත්ත්වය දිහා බලපුවාම එතුමාගේ කල් තැබීමේ යෝජනාව සාකච්ඡා කිරීම අවශ්‍ය නැහැ. ඒකේ ඉතිහාසය එතුමාගේ දර්ශන පථයෙන් එතුමා ඉදිරිපත් කළා. මම ඊට පිළිතුරු දෙන්නයි බලාපොරොත්තු වන්නේ.

ඉස්සෙල්ලාම එතුමා කියෙව්වා, 2011 සැප්තැම්බර් මාසයේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල නිකුත් කරපු ප්‍රකාශනයක්. නමුත් ඊට වඩා අලුත් ප්‍රකාශනයක් තිබෙනවා. එතුමාත් ඒ බව දන්නවා. ඒකේ දිනය 2012 පෙබරවාරි 03වැනි දා. ඒ කියන්නේ දැනට දින කිහිපයකට ඉස්සෙල්ලායි. IMF එකේ ළඟම තිබුණු Mission එකට පස්සේ, එතුමන්ලා වොෂින්ටන් නුවර ඉඳන් නිකුත් කරපු ප්‍රකාශනය මා ළඟ තිබෙනවා. මම එතුමාට ඒක කියවන්න කැමැතියි. මම ඒ ප්‍රකාශනය හැන්සාඩ්ගත කිරීම සඳහා **සභාගත*** කරනවා.

මුලින්ම එහි නම් ගම් කියවලා ඊට පසුව මෙහෙම කියනවා. I quote:

"The economy continued to expand rapidly in 2011, with growth likely to come in around 8 percent, and inflation continued to moderate to solid mid-single digit levels. The Government budget deficit also declined further, to under 7 percent of GDP.

However, a strong rebound in domestic demand, supported, in part, by increased bank lending, resulted in a larger-than-anticipated surge in imports, causing the current account deficit to widen significantly in 2011, despite healthy growth in exports and remittances. External reserves declined markedly in the second half of 2011. The discussions focused largely on the government's strategy to address the external imbalances that emerged in the second half of 2011 and ensure that the economy's recovery continued without undue disruption. There was broad agreement that a decisive policy response was needed to put the economy on a sounder macroeconomic footing, especially given the current uncertain global environment.

In this context, we are encouraged by the recent adjustments in the monetary and exchange rate policy stance, as well as the strong commitment of the government to further reduce the budget deficit to 6.2 per cent of GDP in 2012 and address the losses of key state owned enterprises."

මේක තමයි ඒ දූත මණ්ඩලය වොෂින්ටන්වලට ගියාට පස්සේ පෙබරවාරි 03වන දා නිකුත් කරපු ප්‍රකාශනය. එතකොට ඒකෙන් පැහැදිලි වනවා, අපි මේ ගන්න තීරණයන්. බොහොම සන්තෝෂයි, ඔබතුමන්ලාත් ඒවා මතක් කරපු එක ගැන. නමුත් ඊට හුඟක් ඉස්සර ඉඳලා, සති කිහිපයකට ඉස්සෙල්ලා ඉඳලා අපි සාකච්ඡා කරලා ගත්ත තීරණ තමයි දැන් මේ ක්‍රියාත්මක වන්නේ. එම නිසා මේ සභාවේ ඉදිරිපත් කරපු කරුණු අනුව ප්‍රතිපත්ති වෙනසක් සිද්ධ වුණේ නැහැ කියලා අපට සාක්ෂි ඇතිව ඉදිරිපත් කරන්න පුළුවන්. එහෙම දෙයක් සිද්ධ වුණේ නැහැ. රජය යම් කිසි ආර්ථික තත්ත්වයක් විමර්ශනය කරමින් ගත්ත පියවරවල් මා තමුන්නාන්සේලාට පෙන්වා දෙන්නම්.

මේකෙන් පැහැදිලි වන දෙයක් මා ප්‍රකාශ කරන්න කැමැතියි. මොකද, බොහෝ විට ඔබතුමන්ලා කියා තිබෙනවා, "රජයත් IMF එකත් අතර විශාල ගැටුමක් තිබෙනවා. ඒ මතභේදය තුළින් අටවන සලාකය අපට ලැබෙන්නේ නැහැ"යි කියලා. දැනට අපට ලැබී තිබෙන්නේ ඇමෙරිකානු ඩොලර් බිලියන 1.76යි. නමුත් නොයෙක් කොන්දේසි කඩ කරපු නිසා ඉතුරු මිලියන 800 ලැබෙන්නේ නැහැයි කියලා තමයි තමුන්නාන්සේලා මේ සභාවට කරුණු ඉදිරිපත් කළේ. නමුත් ඒක, කරුණු වැරදි විධියට වටහා ගැනීමක්. මොකද, තමුන්නාන්සේලා තවම කථා කරන්නේ ඓතිහාසික අතීතයේ IMF conditionalities ගැන තිබෙන තර්කයයි. සමහර විට ඇත්ත වශයෙන් වෙන්න පුළුවන්.

---

*** කථාව අවසානයේ පළ කර ඇත.**
* *உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
* *Produced at end of speech.*

1970 ගණන්වල, 1980 ගණන්වල නැඟෙනහිර ආසියාවේ - in East Asia - අර්බුදය තිබුණු වෙලාවේ, ඉන්දුනීසියාව, මැලේසියාව වැනි රටවල් තායිලන්තය සමඟ සාකච්ඡා කරන වෙලාවේ, වෙන පරිපාලනයක් තිබෙන වෙලාවේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ඒ විධියේ conditionality regime එකකට ගියා. නමුත් විශේෂයෙන්ම ඩොමිනික් ස්ට්‍රවුස්-කාන්ගේ පරිපාලනය යටතේ conditionalities කියන සංකල්පයෙන් ඒ ගොල්ලෝ බොහෝ දුරට ඈත් වුණා. ඒ රට host country එකක්. මේ ප්‍රතිපත්ති ගැන අයිතිවාසිකමක් දක්වන්න ඕනෑය කියලා ඒ ගොල්ලෝ කිව්වා. මා ගරු මන්ත්‍රීතුමාට කියන්න කැමැතියි, මේ ලිපියේ සඳහන් කරුණු හුඟක් දුරට අපි අභ්‍යන්තරික වශයෙන් මුදල් අමාත්‍යාංශයෙන්, මහ බැංකුවෙන්, ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා ඇතුළුව අපේ වෙනත් විද්වත් අර්ථ ශාස්ත්‍රඥයින් නිර්දේශ කර තිබුණු දේවල් කියලා. මේ රටට IMF එක ආවේ නැතත්, ඔබතුමා කිව්ව විධියටම policy prescriptions මේ ආර්ථිකයට අවශ්‍ය දේවල්. ඇත්ත වශයෙන් වාමාංශික වාග් මාලාවේ - Socialist rhetoric එකේ - කොටසක්ව තිබුණා,"IMF එක ඇවිල්ලා මේ විධියේ කොන්දේසි දමනවා. ඒ කොන්දේසිවලට එකඟ වෙන්න. එහෙම නැත්නම් අපි සල්ලි දෙන්නේ නැහැ"යි කියන එක.

අද IMF එක ලංකාවට විතරක් නොවෙයි, මුළු ලෝකයටම එහෙම කථා කරන්නේ නැහැ. අද හුඟක් වෙන්නේ ඒ රටත්, ඒ රටේ මූල්‍ය නායකයනුත්, අනික් පැත්තෙන් IMF එකත් සංවාදයට ලක් වෙලා, පොදුවේ නිගමනවලට එන එකයි. තමුන්නාන්සේට මා ඒ ගැන කියන්නම්. ඇත්ත වශයෙන් අපි මුලින් සාකච්ඡා කර ගෙන යන කොට අර 6.5ක fiscal gap එකක් තිබුණා. අපි කල්පනා කළේ ඊටත් වඩා දැඩි ලෙස අපේ ඉලක්ක තබන්න ඕනෑය කියලායි. ඊට පස්සේ අපි දෙ ගොල්ලන් සාකච්ඡා කරලා ඒ ඉලක්ක කරා යන්න අපට ඊට වඩා සහනයක් ලබා දුන්නා; කාලයක් ලබා දුන්නා. මා හිතන හැටියට ඒ ගැන වාද විවාද කරන්න ඕනෑ නැහැ. අද IMF එකේ නූතන ආර්ථික සහ දේශපාලන දර්ශනය සලකන ඕනෑම කෙනකුට පෙනෙනවා, අර පරණ conditionalities කියන තර්කය නැහැයි කියලා. ඔබතුමා පැහැදිලිව කිව්වා වාගේ අර්ථ ශාස්ත්‍රය කාටත් එකයි. IMF එකේ ඉඳ ගෙන ලිව්වත් එකයි. විශ්වවිද්‍යාලයේ ඉඳ ගෙන ලිව්වත් එකයි. මුදල් අමාත්‍යාංශයේ ඉඳ ගෙන ලිව්වත් එකයි. ඒ හැම තැනම මූලික සනාතනික න්‍යායයන්වලට අපි යටත් වන්න ඕනෑ.

ඒ හන්දා අද මම පැහැදිලිව කියන්න ඕනෑ, අපි කිසි විධියකින් IMF එකත් සමඟ තිබෙන ඒ එකඟතා, ඒ මුදල් ලබා ගන්න තිබෙන අවශ්‍යතා නවත්වලා නැහැ කියලා. ඔබතුමන්ලා කියලා තිබෙනවා ඒක ගැන ප්‍රකාශයක් කරන්න කියලා. අපි කියලා තිබෙන්නේ, අපි තවදුරටත් සාකච්ඡා කරනවාය කියන එක. ඒකට අපිට තව වෙලාව තිබෙනවා. මොකද, අපි ඒ මුදල් ගන්න නම් මාර්තු මාසය වන කොට අලුත් LoI එකක් අත්සන් කරන්න ඕනෑ, වර්තමාන තත්ත්වය අනුව. ඒ හන්දා මම ප්‍රකාශයක් කරන්න කැමැතියි, අපි ඒ මුල් සැලැස්ම යටතේ තිබුණු ඇමෙරිකන් ඩොලර් බිලියන 2.6ක මුදල ගැනීම කිසි විධියකින් අතහැර දමලා නැහැ කියලා.

මීට ඉස්සරත් Mission එකක් ආවාට පස්සේ අපේ ප්‍රතිපත්ති ගැන වොෂින්ටන්වලදී අපි සාකච්ඡා කරනවා. තමුන්නාන්සේලා හොඳට දන්නවා අපේ මහ බැංකුවේ සහකාර අධ්‍යක්ෂවරයෙක් IMF එකේ ඉන්නවා කියලා. එතුමා එතැන වැඩ කරනවා. එතුමා අපේ අදහස් ප්‍රකාශ කරනවා. ඒ වාගේම අපේ කලාපීය අධ්‍යක්ෂවරයෙක් ඉන්නවා IMF එකේ. ඒ නිසා අපේ අදහස් නිතර සංවාදයට ලක් වෙනවා. ඒ හන්දා අපි නිසා මේ ප්‍රශ්නය ඇති වුණාය කියලා කියන්න බැහැ.

දැන් මම අවධාරණය කරන්න කැමැති දේ තමයි අපේ ලංකා ආර්ථිකයේ එක්තරා සුවිශේෂ සංයුතියක් තිබෙනවාය කියන එක. ඒ සංයුතිය තුළ අපිට විවිධ උපාය මාර්ග යොදා ගන්න සිද්ධ වෙනවා. විපක්ෂයේ හිටියත් ආණ්ඩු පක්ෂයේ හිටියත් ඒ සම්බන්ධව විචාරය කරන්නත්, උපදෙස් දෙන්නත් පුළුවන්. නමුත් ඒ සම්බන්ධව ක්‍රියා කරන්න සිද්ධ වන අයට, ඒ තනතුරුවල ඉඳ ගෙන ඉන්න අයට යම් යම් උපාය මාර්ග ගැන කල්පනා කරන්න සිද්ධ වෙනවා. තමුන්නාන්සේලා දන්නවා ලස්සන ඉංග්‍රීසි කවියක තිබෙන විස්තරයක්. අපි ගොන් පොර - bullfights - බලන කොට, බලන කොට ඒ වේදිකාවේ ඉඳ ගෙන අපට සතුටු වෙන්න පුළුවන්. තරගකරුවා හොඳට තරග කරනවාද, නරකට කරනවාද, හරියට කඩුවෙන් අනිනවාද කියන ඒවා බලන්න පුළුවන්. නමුත් සටන කරන්න වෙන්නේ matadorට. කඩුව අරගෙන ඒ සතාට මුහුණ දෙන කෙනා තමයි ඒ සටන් කරන එක ගැන තීන්දුව ගන්නේ. ඒ ද්වන්ද සටන වෙන්නේ ඒ දෙන්නා අතර. ඒ වෙලාවේදී ඒ matadorට නොයෙක් විධියේ උපාය මාර්ග යොදන්න වෙනවා. මේ පැත්තෙන් අනිනවාද, අනෙක් පැත්තෙන් අනිනවාද, පැනලා දුවනවාද කියන ඒ තීරණ ඒ ඔක්කෝම එයා ගන්න ඕනෑ. අන්න ඒ වාගේ අපි බලන්න ඕනෑ ඒ වෙලාවේ රජය, මුදල් අමාත්‍යාංශය, මහ බැංකුව කොයි විධියට ඒ සංයුතිය තුළ අවශ්‍ය තීරණය ගනියිද කියලා.

දැන් අපේ ලංකාවේ ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. ඇත්ත වශයෙන් එකක් නොවෙයි ප්‍රශ්න දෙකක් තිබෙනවා. එක ප්‍රශ්නයක් තමයි තෙල් ප්‍රශ්නය. අපි ලංකාවේ තෙල් නිපදවන්නේ නැහැ. අපි පිට රටින් තෙල් ගෙන්වන්න ඕනෑ. එතකොට හුඟක් දුරට අපි අසරණ වෙනවා. මම ඊයේ කිව්වා මාතෘකා තුනක් ගැන අපිට අවධානය යොමු කරන්න සිද්ධ වෙනවා කියලා. එක මාතෘකාවක් තමයි තෙල් ප්‍රශ්නය. දෙවැනි මාතෘකාව තමයි ආහාර ප්‍රශ්නය. තුන්වැනි මාතෘකාව තමයි මූල්‍යමය ප්‍රශ්නය. ඒවා එකින් එකට සම්බන්ධයි. නමුත් එතැන ප්‍රධාන වශයෙන් තිබෙන්නේ තෙල් ප්‍රශ්නය. අද වුණත් අපි දන්නේත් නැහැ, තමුන්නාන්සේලා දන්නේත් නැහැ ඉරානයේ ඇති වෙලා තිබෙන ප්‍රශ්නය නිසා මොකක් වෙයිද කියලා. දැන් මගේ හිතවත් සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමා ඒ ගැන කථා කරයි.

අද අපි ඒ ගැන සාකච්ඡා කර ගෙන යනවා. ඒ නිසා අද අපි විතරක් නොවෙයි ඉන්දියාවත් විමතියට පත් වෙලා; චීනය විමතියට පත් වෙලා; ජපානය විමතියට පත් වෙලා. දින පතා අපේ ඇමතිතුමා සාකච්ඡා කර ගෙන යනවා මේ ගැන. අපි කොහෙන්ද තෙල් ගන්නේ, ඕමානයෙන් ගන්නවාද, එහෙම නැත්නම් සවුදි අරාබියාවට කථා කරලා බලනවාද, ඒ ගොල්ලන් මොන පිළිතුරු දෙනවාද කියලා සාකච්ඡා කරනවා. සවුදි අරාබියේ මුදල් ඇමති අසාඩ්, මගේ පුද්ගලික මිත්‍රයෙක්. මම වොෂින්ටන්වලට ගිහිල්ලා ඒ ගොල්ලොත් එක්ක කථා කළා. ඒ ගොල්ලෝ කියන්නේ අපිට spot විකුණන්න බැහැ, අපි විකුණන්නේ දීර්ඝ කාලීනව කියලා. නේද ඇමතිතුමා? ඒ වාගේ ගොඩක් අභ්‍යන්තර ප්‍රශ්න තිබෙනවා. ඒ වාගේම මේ තෙල්වලට අපි ගෙවන්නේ මොන මිලක්ද කියන ප්‍රශ්නයට අපිට මුහුණ දෙන්න වෙනවා. ඒ ප්‍රශ්නය නිසා අපිට අනාගතය හසුරුවන්න බැරි කිසියම් තත්ත්වයක් තිබෙනවා.

අනාගතයේදී තෙල් මිල කොයි විධියට ඉහළ නඟියිද කියලා අපි දන්නේ නැහැ. අපි දන්නා එකම දෙය, තෙල් මිල ඉහළ නඟින බවයි. ඒක අපට හසුරුවන්නට පුළුවන් දෙයක් නොවෙයි; අපේ ගරු සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමාට හසුරුවන්නට පුළුවන් දෙයකුත් නෙවෙයි. තෙල් මිල කොයි තරම් ඉහළ නඟිනවාද කියලා අපි දන්නේ නැහැ. ඒක අපට බලපාන්නේ කොහොමද කියලා අපි දන්නේ නැහැ. අපේ ආර්ථිකයේ හැම දෙයක්ම හසුරුවන දෙයක් බවට පත් වෙලා තිබෙනවා, energy. එතකොට කොහොමද මේ ආර්ථිකයේ අපි කටයුතු කරන්නේ? ඒ අභියෝගවලට අපට අනාගතයේදී මුහුණ පාන්න සිද්ධ වෙනවා. අතීතයේදී ටිකක් ඒක කළමනාකරණය කරන්න අපට සිද්ධ වුණා.

[ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා]

අනෙක් එක තමයි අවුරුදු තිහක යුද්ධයකින් පස්සේ අපේ රට ගොඩ නඟන්න අවශ්‍ය භාණ්ඩ අපි ගේන්න ඕනෑ. එක පැත්තකින් අවුරුදු තිහක යුද්ධයකින් පස්සේ අපි මිනිසුන්ටත් තරමක සහනයක් දෙන්න ඕනෑ, ඒ ගොල්ලන්ගේ ජීවිත මීට වඩා ටිකක් හොඳ පැත්තට හැරෙන විධියට.

මම තමුන්නාන්සේලාට කෙටියෙන් විස්තර කියන්නම්. අපේ import bill එක දිහා බැලුවාම, consumption goods සඳහා 2010 වර්ෂයේදී වියදම මිලියන 2820 යි. 2011 අවුරුද්දේ ඒ වියදම මිලියන 4137යි. ඒ විධියට ඉහළට නැඟලා තිබෙනවා. Motorcycle, electrical appliances සඳහා මිලියන 632 සිට 1,121 දක්වා වැඩි වෙලා තිබෙනවා. යුද්ධයකට පස්සේ තරමක් දුරට consumption goods මිනිසුන්ට දෙන්න ඕනෑ. ඒ වාගේම ඒ ඔක්කොටම වඩා petroleum , intermediate goods සඳහා වියදම වැඩියි. 2010 වර්ෂයේ මිලියන 3019ට තිබුණු එක 2011 වර්ෂයේ 4505ට ගිහින්. 2012 වර්ෂයේ ඒක කීයක් වෙයිද කියලා අපි දන්නේ නැහැ. අපේ import bill එක වැඩි වෙන්න, balance of payments වැඩි වෙන්න ප්‍රධානම තක්සේරු කළ නොහැකි හේතුව - imponderable reason එක- තමයි තෙල් මිල.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අනෙක් පැත්තට හොඳ දේවලුත් තිබෙනවා. Machinery and equipment, transport equipment, building materials, වැඩි වැඩියෙන් ගෙනැවිත් තිබෙනවා. එතකොට අපි පිළිගන්නවා, අපේ balance of payments පුළුල් වුණා කියලා. 2009 වර්ෂයේදී ඒක මිලියන 2,725ක අතිරික්තයක් තිබුණා. 2010 වර්ෂයේ ඒක මිලියන 921ක් වුණා. නමුත් 2011 වනකොට ඒක මිලියන 1,060ක සෘණ පැත්තට ගියා. 2012 වර්ෂය වනකොට අපි ඇස්තමේන්තු කර තිබෙනවා, නැවත වරක් plus 825කට යන්න. නමුත් ඒ ගැන අපට සියයට සියයක් නිවැරදිව දැන් කියන්න බැහැ, petroleum prices ගොඩාක් තිබෙන නිසා.

අතීතයේදී අපි අර ප්‍රතිපත්තියට ගියේ, ණය bunch වෙලා තිබුණ නිසා. ගරු ඇමතිතුමා ඒ ගැන පැහැදිලි කරයි. අපේ තෙල් ණය ආපසු ගෙවීම් විශාල ප්‍රමාණයක් bunch වෙලා තිබුණා. ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ දන්නවා, ලංකාවේ ණය වාරික GDP එක අනුව 120 සිට 80 දක්වා අඩු කර තිබෙන බව. ඔබතුමා ඒ ගැන හොඳ කියලා තිබෙනවා. අපි තවත් එක අඩු කරන්න බලන්න ඕනෑ. ඒ වෙලාවේදී උපක්‍රමශීලීව - strategically -අපට මේ exchange rate එක ගැන කල්පනා කරන්න සිද්ධ වුණා.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මා ලියා තිබෙන ලිපිවල එය බලන්න. ඒවායේ හැම තැනම කියන්නේ real economy ගැන. Manufacture, manufacture, manufacture; export, export, export, ඒක තමයි ආර්ථිකයේ හදවත හැටියට තිබෙන්නේ. ඒකට අපි මුල් තැන දෙන්න ඕනෑ. හැම තැනම අපි ඒක පිළිගන්නවා. අපට තව සල්ලි එන එක ගැන බලාපොරොත්තු වෙන්න පුළුවන්. අපේ foreign remittances තියෙනවා. ඒ වාගේම tourism තිබෙනවා. අද අපි වර්තමානයට ඇවිත් තිබෙනවා. වර්තමානයේ අපට කල්පනා කරන්නට සිද්ධ වෙනවා, කොයි විධියේ උපක්‍රමශීලී ක්‍රමයකට අපි යන්නට ඕනෑද කියලා. 2011 තරම් imports වලට අපට මේ අවුරුද්දේ වියදම් කරන්න බැහැ. Import target එක පහළට ගෙනෙන්න තමයි අපි කල්පනා කරන්නේ. ගිය සැරේ තිබුණු ඒ ගණනෙන්, 18 billion දක්වා අඩු කරන්න තමයි අපේ කල්පනාව තිබෙන්නේ. ඒ සඳහා අප උපයෝගී කර ගන්නා මාර්ග මොනවාද? නිකම් බණ කිව්වාට හරි යන්නේ නැහැ. ඒකට exchange rate එකයි අපේ interest rate එකයි -ඒ policies දෙක- අප හරියට සකස් කර ගන්න ඕනෑ. මේ අර්බුදය අපට විතරක් නොවෙයි, මුළු ආසියාවටම මුහුණ පාන්න තිබෙන ප්‍රශ්නයක්. ඒක ගැන හැම එක්කෙනාම අත්හදා බලනවා. ඉන්දියාවත් දැන් අත් හදා බලනවා. Interest rate එක adjust කරන්නේ කොහොමද, exchange rate එක adjust කරන්නේ කොහොමද කියා අපි බලනවා. ඔබතුමන්ලාත් කිව්වා. ඊට අමතරව ඒ ගැන ක්‍රියාශීලීව කටයුතු කරන අය හැටියට strategize කරන්න අපට සිදු වනවා. අපේ සල්ලිවලින් ඒක ක්‍රියාත්මක කරන තත්ත්වයකට අපිට මුහුණ දෙන්න සිදු වනවා. ඒ නිසා මා දීර්ඝ වශයෙන් කියන්න ඕනෑ නැහැ. මගේ සහෝදර ඇමතිතුමාට කථා කරන්න ඉඩ දෙන්න ඕනෑ.

අවසාන වශයෙන් මා නැවත වරක් අවධානය යොමු කරන්න ඕනෑ, මේ තත්ත්වය තුළ exchange rate එක ගැන. තමුන්නාන්සේ දැක්කාද, අද Reuters messaging එකේ දමා තිබෙනවා, අපේ වර්තමාන stance එක. ඒ ගැන කොහොමද කටයුතු කරන්නේ? ඒ තෙල් බිල අයින් කරලා අනෙක් දේවලට ඇමෙරිකානු ඩොලර් 350 දක්වා -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**

(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)

(The Presiding Member)

ගරු ඇමතිතුමනි, ඔබතුමාට වෙන් කර තිබෙන කාලය අවසානයි.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**

(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)

(The Hon. (Dr.) Sarath Amunugama)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, තව විනාඩියකින් මගේ කථාව අවසාන කරනවා. ඒක කරන ගමන් සෙසු මුදල් සාමාන්‍ය වෙළෙඳ පොළේ ක්‍රියාත්මක වන විධියට දීර්ඝ කාලීනව බලපායි. ඔබතුමා ඒක හොඳට දන්නවා. මා මේ Reuters messaging එක **සභාගත*** කරනවා.

අවසාන වශයෙන් මට කියන්න තිබෙන්නේ මේ කාරණයයි. මේ වෙලාවේ අපි රටට දෙන්න ඕනෑ පණිවුඩය මේකයි. අපි පුළුවන් තරම් ඉක්මනින් මේ තෙල් ප්‍රශ්නය, energy කළමනාකරණය කරන්න ඕනෑ. We cannot be profligate in the use of imported oil. විශේෂයෙන්ම තෙල් භාවිතය අඩු කරන එක විධියක් තමයි අපේ imports අඩු කරන එක. Imports අඩු කරන එක සමහර විට වකිතයට හේතු වන කාරණයක් වන්න පුළුවන්. ඒ සඳහා අපි තෙල් පාවිච්චි කරන ප්‍රමාණය, ගෙනෙන ප්‍රමාණය සැලකිය යුතු විධියට සීමා කරන්න සිද්ධ වනවා. ඒක ජනතාවට පැහැදිලි කරලා, අද ගෝලීය වශයෙන් තිබෙන තර්ජනයට මුහුණ දෙන්නේ කොහොමද කියා මේ අවස්ථාවේදී ජනතාව සන්නද්ධ කරන්න ඕනෑ. අපේ කලාපයේ ඒ වාගේ තීන්දු අරගෙන තිබෙනවා. ඉන්දියාව ඒ ගොල්ලන්ගේ පෙට්‍රල් ගහන තැන - pump head එක- මිල වැඩි කර තිබෙනවා. තායිලන්තය මිල වැඩි කර තිබෙනවා. ඒ නිසා අනාගතයේදී අපට ඉතා සියුම්ව කල්පනා කරන්න සිද්ධ වනවා, අහස උසට නැඟී ගෙන එන තෙල් මිලට අපි රටක් හැටියට මුහුණ දෙන්නේ කොහොමද; අපේ සංවර්ධන වේගයට ඒක බලපාන්නේ කොහොමද සහ අපේ ජන ජීවිතය අවම ලෙස පීඩනය වන විධියට ඒක කළමනාකරණය කරන්නේ කොහොමද කියන එක ගැන. අපේ ක්‍රියාවන්, ප්‍රතිපත්තීන් අපි දන්නවා. ඒ policies අපි දන්නවා. ඒවා strategically ක්‍රියාත්මක කරන්නේ කොහොමද කියා අපි කල්පනා කළ යුතු වෙනවා. ඒ

***** **පුස්තකාලයේ තබා ඇත.**

* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

* *Placed in the Library.*

හැම වෙලාවකම කිසිම සැකයක් නැතුව, කිසිම රහසක් නැතුව අපි මේ ගරු සභාවටත් ඔබතුමාටත් දන්වන්න තීරණය කර තිබෙනවාය කියමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

***සභාමේසය මත තබන ලද ප්‍රකාශනය:***
*** சபாபீடத்தில் வைக்கப்பட்ட ஆவணம்:*
** Statement tabled:*

INTERNATIONAL MONETARY FUND EXTERNAL RELATIONS DEPARTMENT

Press Release No.
FOR IMMEDIATE RELEASE
February 3, 2012

International Monetary Fund
Washington, D.C. 20431 USA

**Statement at the Conclusion of the IMF Staff Mission to Sri Lanka**

A staff mission led by Dr. Brian Aitken visited Colombo January 25 – February 3 to discuss economic developments and policies. The team met with government and Central Bank officials, as well as representatives of civil society and the private sector. The team issued the following statement today at the conclusion of its visit:

"The economy continued to expand rapidly in 2011, with growth likely to come in around 8 percent, and inflation continued to moderate to solid mid-single digit levels. The Government budget deficit also declined further, to under 7 percent of GDP. However, a strong rebound in domestic demand, supported, in part, by increased bank lending, resulted in a larger-than-anticipated surge in imports, causing the current account deficit to widen significantly in 2011, despite healthy growth in exports and remittances. External reserves declined markedly in the second half of 2011.

The discussions focused largely on the government's strategy to address the external imbalances that emerged in the second half of 2011 and ensure that the economy's recovery continued without undue disruption. There was broad agreement that a decisive policy response was needed to put the economy on a sounder macroeconomic footing, especially given the current uncertain global environment. In this context, we are encouraged by the recent adjustments in the monetary and exchange rate policy stance, as well as the strong commitment of the government to further reduce the budget deficit to 6.2 percent of GDP in 2012 and address the losses of key state owned enterprises.

The team will return to Washington and continue to assess policy actions and economic developments. We look forward to moving toward completion of the next review of the Standby Arrangement."

Washington, D.C. 20431 • Telephone 202-623-7100 • Fax 202-623-6772 • www.imf.org

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා (ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த - பெற்றோலியக் கைத்தொழில்கள் அமைச்சர்)
(The Hon. A.D. Susil Premajayantha - Minister of Petroleum Industries)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ විවාදයේදී මම ඉතාම කෙටියෙන් කරුණු ස්වල්පයක් ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන්ම ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා මේ විවාදයේදී යෝජනාව ඉදිරිපත් කරමින්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ අවසන් වාර්තාවේ ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ ලංකා විදුලිබල මණ්ඩලය ගැන කර තිබෙන සඳහන ගැන කිව්වා. මා එය කියවන්න බලාපොරොත්තු වන්නේ නැහැ. ඒක මා ළඟ තිබෙනවා. ඇත්ත වශයෙන්ම මා මේ ගරු සභාවට සඳහන් කරන්න ඕනෑ, අද දවස වන විටත් -පසු ගිය අවුරුද්දේ සැප්තැම්බර් මාසයෙන් පසු- තෙල් මිල වැඩි කර නැති බව.

ඒ අවස්ථාවේ ඉඳලා ගත්තත්, අද වන විටත් අපි විකුණන සෑම භූමිතෙල් ලීටරයක්ම රුපියල් 41ක් පාඩු පිට තමයි විකුණන්නේ. රුපියල් 41ක් පාඩු පිට තමයි රුපියල් 61කට විකුණන්නේ. විකුණන හැම ඩීසල් ලීටරයක්ම දැන් රුපියල් 84යි. දැන් පවතින මිල ගණන් අනුව ලංකාවට ගොඩ බාන අවස්ථාවේ ඉඳලා petrol shed එකෙන් ඩීසල් ගහන අවස්ථාව වන විට හැම ඩීසල් ලීටරයකටම රුපියල් 22ක් අපට පාඩුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේකේ පාඩුවේ ප්‍රමාණය තව වැඩි වෙන්නේ පසු ගිය කාලය පුරාම නිසි කාලයට අපිට වැසි ලැබුණේ නැති නිසායි. අපේ reservoirs වල levels අඩු වුණා. විදුලිබල අංශය භාර අපේ ගරු චම්පික රණවක ඇමතිතුමා මේ ගැන වතාවන් කිහිපයකදීම සඳහන් කරලා තිබුණා. ජල විදුලියේ තිබෙන අඩුකම නිසා තෙල්වලින් - furnace oilවලින්- ඉන්ධන භාවිත කරලා විදුලිය නිෂ්පාදනය කිරීම මේ වන විට සියයට 75ක් දක්වා ඉහළට ගිහින් තිබෙනවා. එහෙම නැත්නම් සාමාන්‍යයෙන්

[ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා]

සියයට 45යි 55යි හෝ සියයට 50යි 50 වාගේ තමයි ජල විදුලිය සහ තාප විදුලිය නිෂ්පාදනය කළේ. විදුලිබල ක්ෂේත්‍රයට furnace oil දෙන විට, ඉන්ධන දෙන විට සාමාන්‍ය average cost එක - මේක ඊට වඩා වැඩි වෙන්න පුළුවන්- රුපියල් 85ක් වන ලීටරයක් අපි දෙන්නේ රුපියල් 52ට. එතැනින් හැම ලීටරයකටම රුපියල් 33ක් පාඩුයි. අවසාන වශයෙන් මේ සහනය කාටද දීලා තිබෙන්නේ? මේ සියල්ලේම පාඩුව කියලා ගන්න කොටසේ සහනය කාටද දීලා තිබෙන්නේ? මේ රටේ ජනතාවට. ව්‍යාපාරිකයින්ට, කර්මාන්තකරුවන්ට සහ ජනතාවට තමයි මේ සහනය දීලා තිබෙන්නේ. අපි සරල උදාහරණයක් ගනිමු. මාතර සිට කොළඹට එන පෞද්ගලික බස් රථයකට ඇවිල්ලා යන්න ඩීසල් ලීටර් 100ක් යනවා නම්, ඒ බස් රථයට ඩීසල් ලීටර් 100ක් ගහන කොට රුපියල් 22 ගණනේ ආණ්ඩුව එයාගේ අතට රුපියල් 2,200ක් දීලා තිබෙනවා.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
කවුද ගෙවන්නේ?

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
ගෙවන්න වෙන්නේ අවසාන වශයෙන් භාණ්ඩාගාරයට.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
නැහැ, ජනතාවට.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
හරි, භාණ්ඩාගාරය කියන්නේ ජනතාව නේ. බදු මුදල් එකතු කරන්නේ එතැනින්. ඉන්න කියන්නම්. මම කිව්වේ නොපෙනෙන දේ. මේක කිසි කෙනෙකුට පේන්නේ නැහැ. තාප විදුලියෙන් විදුලි ඒකකයක් නිෂ්පාදනය කිරීම සඳහා එහෙමත් නැත්නම් ඉන්ධන භාවිත කිරීමෙන් විදුලි ඒකකයක් නිෂ්පාදනය කිරීමට සඳහා විදුලි ඒකකයකට යන පිරිවැය අද ගණනය වෙලා තිබෙන්නේ මම කිව්ව විධියට ලීටරයක් රුපියල් 52ට ගණන් හදලායි. රුපියල් 85ට ගණන් හැදුවොත් ඒක ඊට වඩා වැඩි ගණනක් වෙනවා. මම සඳහන් කළේ මේ තිබෙන තත්ත්වයයි. අපි මේක තේරුම් ගන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අනෙක් පැත්තෙන් වෙන්නේ මොකක්ද? එහෙම නම් අනෙක් පැත්තෙන් වෙන්නේ ඉන්ධන භාවිත කිරීම අඩු කරනවා. වැසි අඩු වෙලා තිබෙන නිසා power cut එකකට යනවා. එතකොට මොකද වෙන්නේ? එතකොට ආර්ථිකයට බලපෑමක් වෙනවා. නිෂ්පාදනයට සහ ව්‍යාපාර සියල්ලටම එය බලපානවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, power cut එකකට ගියොත් විපක්ෂයට හොඳ ආයුධයක් ලැබෙනවා. එහෙම කාලයක් තිබුණා. එහෙම යුගයක් තිබුණා. ගරු මන්ත්‍රීතුමනි, ලංකාව හැර නේපාලය, පාකිස්ථානය වාගේ රටවල් -මම රටවල් නම් කරන්න යන්නේ නැහැ- ගත්තොත්, ආසියාකරයේ රටවල් තිබෙනවා අදටත් පැය 10,12,14 විදුලිය නැති. මේක තමයි තත්ත්වය. නමුත් අපි ඒක කළේ නැහැ. අපි ජනතාවට පැය 24ම විදුලිය දුන්නා. අපි ජනතාවට සහන මිලට ඩීසල් දුන්නා; භූමිතෙල් දුන්නා. මේ සියල්ල අපි කර ගෙන එනවා. ඒ නිසා IMF එකෙන් කියලා තිබෙන්නේ මොකක්ද? එහෙම නම් මේක නියම මිලට ගේන්න කියලා. අද ඩීසල් ලීටර් එකක landed cost එක -ගොඩ බාන කොට මිල- රුපියල් 106යි.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
බදුත් එක්කද, බදු නැතිවද?

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
ඩීසල් ලීටරයකට බද්ද රුපියල් 2යි නේ. ඒ රුපියල් 2 අයින් කළත්, රුපියල් 104යි නේ. මම පැහැදිලිව කියන්නේ, පෙට්‍රල්වලට විතරයි බද්දක් තිබෙන්නේ කියලායි. ඒ එදා ඉඳලාම තිබුණ බද්ද. ලීටරයකට රුපියල් 25යි. නමුත් භූමිතෙල්වලටවත්, ඩීසල්වලටවත් ඒ ආකාරයේ බද්දක් නැහැ. ඒ බදු නැතිව. මේක තමයි තිබෙන තත්ත්වය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ වාගේම මෙහිදී මම සඳහන් කරන්නට ඕනෑ කාරණයක් තිබෙනවා. විශේෂයෙන්ම ඒ කාරණය -මේ තත්ත්වයන් බලපාන බව- අපේ ගරු ආචාර්ය අමුණුගම ඇමතිතුමාත් සඳහන් කළා. එක අවුරුද්දක් ඇතුළත තෙල් බිල ඩොලර් බිලියන 3 සිට 4.5 දක්වා වැඩි වෙලා තිබෙනවා. මේ එක්සත් ජනපදයෙන් සහ යුරෝපා සංගමයෙන් ඉරානයට තහංචි පැනවීමට පෙර. තහංචි පැනවීම නිසා පසු ගිය සතිය වන විට refined barrel එකක්, පිරිපහදු කළ භූමිතෙල්, පෙට්‍රල්, ඩීසල් බැරල් එකක් රුපියල් 121ට, 122ට, 123ට තිබුණ එක අද මම බලන විට හැම එකක්ම රුපියල් 130න් එහා. අපි ගන්න බොර තෙල් වර්ගය රුපියල් 92ට, 93ට, 94ට ගත්ත එක අද වන විට 101යි. Brent crude oil එක තව වැඩි වෙලා. ඒක අපි භාවිත කරන්නේ නැහැ. මේක තමයි ලෝක තත්ත්වය. මේ වෙනස්වීමත් එක්ක තමයි අපට මේක ගළපා ගන්න වෙන්නේ. ඔබතුමා කිව්වා හරි. න්‍යායට අනුව අපි ඉන්න ඕනෑ. හැබැයි න්‍යායාත්මකව ගත්තාම අනෙක් පැත්තෙන් මොකක්ද වෙන්නේ?

අනෙක් කාරණය තමයි බටහිර යුරෝපයේ සහ නැගෙනහිර යුරෝපයේ රටවලට ඉතාම severe winter එකක් දැන් ඇවිත් තිබෙනවා කියන එක. ඒකත් එක්ක තෙල් ඉල්ලුම වැඩි වෙනවා. මේ පැත්තෙන් තහංචි එනවා. එතකොට අනිවාර්යයෙන්ම තෙල් මිල ඉහළ යාම සිදු වෙනවා. [බාධා කිරීමක්] ඔබතුමාත් එකඟ වෙනවා ඇති. අවසාන වශයෙන් මේ දෙන සහනාධාරය කවුද දරන්නේ? ජනතාවයි. සවුදි අරාබියේ තානාපති කාර්යාලයටත් ඩීසල් ලීටරය රුපියල් 84 ගණනේ තමයි අපි දෙන්නේ. ඉරානයේ තානාපති කාර්යාලයටත් ඩීසල් ලීටරය රුපියල් 84 ගණනේ තමයි දෙන්නේ. එහෙන් තමයි අපි තෙල් ගෙනෙන්නේ. ඉතින් මෙන්න මේකයි තිබෙන තත්ත්වය.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට නියමිත කාල අවසානයි.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ නිසා රජය හැම විටම රටේ ආර්ථිකය සුරක්ෂිත කිරීම සඳහා කටයුතු කරමින් තමයි හැම ප්‍රතිපත්ති තීන්දුවක්ම ගන්නේ කියන එක මෙහිදී මම සඳහන් කරනවා. මට වෙලාව නැති නිසා මම කියනවා, "The Wall Street Journal" - [බාධා කිරීමක්] තෙල් මිල වැඩි කරනවාද නැද්ද, සංශෝධනය කරනවාද කියන එක ලෝක තෙල් මිලේ

උච්චාවචනයත් එක්කයි තීරණය වෙන්නේ. ලෝක තෙල් මිලේ උච්චාවචනයත් එක්ක තමයි ඒක තීරණය වෙන්නේ. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න. මට විනාඩියක් දුන්නොත් මම ඔබතුමාට පිළිතුරු දෙන්නම්. 2007, 2008 වෙනකොට තෙල් මිල ශීඝ්‍රයෙන් ඉහළ ගියා; රුපියල් 147.50ට ගියා. ඒ වෙලාවේ නේ hedgingවලට ගියේ. ඊට පසුව මොකද වුණේ? ලෝක ආර්ථික අවපාතයක් ආවා. ඇයි? අසීමිත ලෙස භාණ්ඩයක මිල වැඩි වුණාම ආර්ථික න්‍යාය අනුව මොකක්ද වෙන්නේ කියා ඔබතුමා දන්නවා. මොකද වෙන්නේ? සැපයුම වැඩි වෙලා නොවෙයි, ඉල්ලුම අඩු වෙලා මිල පහළ බහිනවා. සැපයුම වැඩි වෙලා නොවෙයි නේ, අවපාතය ආවේ. මිල දරා ගන්න බැරි නිසා ඉල්ලුම අඩු වුණා. අන්න ඒක අද නැඟෙනහිර යුරෝපයේ රටවල්වල සිදු වෙමින් පවතිනවා. එතකොට වෙන්නේ අවපාතය ඇවිල්ලා නැවත තෙල් මිල අඩු වෙන එකයි. එතකොට ඒ උච්චාවචනය අනුව තමයි තෙල් මිල තීන්දු වෙන්නේ කියන එක මෙහිදී මම සඳහන් කරනවා. ඔබතුමා කියපු අවසාන කාරණයට ගළපා මට කියන්න ඕනෑ වුණේ, අපි පසු ගිය කාලය පුරාවටම මේ රටේ ජනතාවට අඛණ්ඩව විදුලිය දුන්නාය; කුමන මිලකට ගියත් අපි දරා ගන්න පුළුවන් ප්‍රමාණයට තෙල් දුන්නාය කියන එකයි. අවසාන වශයෙන් ඒ සියලු බර භාණ්ඩාගාරයට දරන්න වුණා. ඒ සියල්ල මේ තුළ ගැබ් වෙලා තිබෙනවා. මේ ආර්ථික කළමනාකාරණයේදී ගන්නා තීන්දු මත තමයි මේ ආකාරයේ ප්‍රකාශ නිකුත් වෙලා තිබෙන්නේ කියන එක සඳහන් කරමින් මට නියමිත කාලය අවසාන නිසා මගේ කතාව අවසන් කරනවා. ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 7.00ට, 2012 පෙබරවාරි 10 වන සිකුරාදා අ. භා.1.30 වන තෙක් කල් ගියේය.***
*அதன்படி பி. ப. 7.00 மணிக்கு பாராளுமன்றம், 2012 பெப்ரவரி 10, வெள்ளிக்கிழமை பி. ப.1.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*
*Adjourned accordingly at 7.00 p.m. until 1.30 p.m. on Friday, 10th February, 2012.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to be Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts**
**Received from Parliament :**

**Printed copies dispatched :**

 දායක මුදල් : පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 2178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු. 2.50කි. කොළඹ 6, කිරුළපන, පාමංකඩ පාර, අංක 102, පියසිරි ගොඩනැගිල්ලේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දාට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබා ගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම් පත් භාර ගනු නොලැබේ.

**சந்தா** ; ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15. தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக **அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 102, பியசிறி கட்டிடம், பாமன்கடை வீதி, கிருளப்பனை, கொழும்பு 6** என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப்பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

**Subscriptions :** The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, No. 102,Piyasiri Building, Pamankada Road, Kirulapone, Colombo 6. The fee should reach him on or before November 30 each year . Late applications for subscriptions will not be accepted.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.